# ආත්මික අස්වැන්න

# උදෙසා

# උපක්‍රම

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි.
මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිත කරන්නේ කෙසේද? . . . . . I

කණ්ඩායම් අධ්‍යයනය සඳහා යෝජනා . . . . . . II

හැඳින්වීම . . . . . . . . . 1

පාඨමාලාවේ අරමුණු . . . . . . . . 2

**පළමුවන කොටස: මනැසින් මවා ගැනීම**

1. දර්ශනයක උපත . . . . . . . . 3

2. දර්ශනය . . . . . . . . . 13

3. උන්වහන්සේගේ දෑස ජාතීන් වෙත යොමුවී තිබේ . . . . . 22

**දෙවන කොටස: සංකල්පමය බිහිවීම**

4. වචනයෙහි සඳහන් ලෝකය. . . . . . . 28

**තුන්වන කොටස: අරමුණු නංවාලීම**

5. මලබැඳුනු දෑකැති, හිස් කුඹුරු . . . . . . 35

6. ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම – I කොටස . . . . . 51

7. ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම – II කොටස . . . . . 60

8. එළිදරව්ව තුළින් නෙලාගැනීම . . . . . . . 68

**සතරවන කොටස: බලාපොරොත්තුවීම**

9. වියගහ කඩා දැමීම. . . . . . . . . 82

10. ජාතීන්ට ආශිර්වාද කිරීම . . . . . . . . 90

11. දර්ශනය යථාර්ථයක් බවට පත්වේ . . . . . . . 101

ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . . . 107

# අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ:

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණයද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයින්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයින්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයින් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයන කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා,** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ජා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයින්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්**: ශිෂ්‍යයින් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයින් අතට යැමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**ඒකකය:** මනැසින් මවාගැනීම

# හැඳින්වීම

බයිබලයෙහි හිතෝපදේශ 29:18 හි සඳහන් වන පරිදි "දර්ශනයක් නැති කල සෙනඟ හිතුවක්කාර වෙති"' ලොව මුළුල්ලෙහි නැවත උත්පාදනය ලද ඇදහිලිවන්තයෝ විනාශවෙමින් සිටිති.

ඔවුහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ගැළවීම අත්පත් කරගෙන සිටින බැවින් ඔවුහු තම පාපයෙහි විනාශ නොවෙති. මොවුහු දේවස්ථානයෙහි රැස්වීම් වලට සහභාගි වෙති, බයිබලය කියවති, සමහරවිට සභාවෙහි නායකයෝ ද විය හැක.

එනමුත් ඔවුහු ආත්මිකව වියළී යති. ඇදහිලිවතුන් ලෙස ඔවුන්ගේ ජීවිත ඒකාකාරී බවට පත්වෙයි. ඔවුනට ආත්මික උද්යෝගී බවක් නොමැත. එසේම ඔවුන් සතුව ඉලක්කයක් හෝ පරමාර්ථයක් නැත. දර්ශනයක් ද නොමැත.

අප මෙහිදී කතා කරන්නාවූ දර්ශනය ඇසින් දකින්නාවූ දර්ශනයක් නොවේ. එය ස්වභාවික දර්ශනයක් ද නොවේ. එය ආත්මික වූ දර්ශනයකි.

- ඔබට ආත්මිකව හිස් බවක් හැඟේ නම් ...
- ඔබව දෙවියන්වහන්සේ පාවිච්චි කරාවි යයි ඉතා ඕනෑකමින් අපේක්ෂා කළද එතුමාගේ සැලැස්මෙහි ඔබ සතු කොටස අවබෝධ නොවේ නම් ...
- ඔබගේ ජීවිතය දැනට පත්වී තිබෙන ඒකාකාරී බවට වඩා යමක් කිතුනු ජීවිතයෙහි ඇතැයි ඔබට හැඟේ නම්...

ඔබට ඇත්තාවූ පිළිතුර දර්ශනය වේ!

දෙවියන්වහන්සේ, ආත්මිකව වියලී මියගොස් සිටින ස්ත්‍රී පුරුෂයන් රැගෙන ආත්මිකව ජීවමාන කරන සේක. දර්ශනය, ජීවත්වීමට නව අරුතක් හා මඟපෙන්වීමක් අපට ලබා දෙයි. එය ක්‍රිස්තුස් වහන්සේගේ සිරුර වන සැබෑ සභාව පොදු පරමාර්ථයක් උදෙසා එකමුතු කරවයි. මෙම පාඨමාලාවෙහි විෂය වනුයේ එම දර්ශනයයි. එනම් "ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම" නම් වේ. දර්ශනය අත්පත් කරගැනීම සඳහා මෙම පාඨමාලාව පියවර හතරකින් ඔබට මඟ පෙන්වනු ඇත. එනම්:

- **මනැසින් මවාගැනීම**: මෙහිදී දර්ශනය හඳුනා ගනු ලැබේ.
- **සංකල්පමය බිහිවීම**: දර්ශනය පසුපස පවතින පරමාර්ථයෙහි සංකල්පය අධ්‍යයනය කරනු ඇත.
- **අරමුණු නංවාලීම**: දර්ශනය සම්පූර්ණ කිරීමෙහි අරමුණු ඉගෙන ගනු ඇත.
- **බලාපොරොත්තුවීම**: ඔබ දර්ශනයෙහි පංගුකරුවෙකු වීමත් සමඟ ඔබගේ අපේක්ෂාව ඉටු වනු ඇත.

# පාඨමාලාවෙහි අරමුණු

මෙම පාඩමාලාව අවසානයෙහි ඔබ හට:

- අස්වැන්නෙහි දර්ශනය ස්වභාවික උදාහරණයක් හා සමාන්තරව ආත්මිකව පැහැදිලිකර දීමට හැකි වනු ඇත.
- ඔබගේ ජීවිතයෙහි සහ සේවාවෙහි ආත්මික අස්වැන්න උදෙසා කාර්යක්ෂමවූ උපක්‍රම භාවිත කිරීමට හැකි වනු ඇත.
- ආත්මික අස්වැන්න වළකාලන සාධක හඳුනා ගැනීමට හැකිවනු ඇත.
- දෙවියන්වහන්සේ දකින අයුරින් ලොව දැකීමට හැකිවනු ඇත.
- එළිදරව්වෙහි අස්වැන්න නෙලීමට හැකිවනු ඇත.

**පළමුවන අංශය: මනැසින් මවාගැනීම**

**දර්ශනය හඳුනාගැනීම**

# පළමුවන පරිච්ඡේදය

## දර්ශනයක උපත

**අරමුණු:**

පළමුවන පරිච්ඡේදය අවසානයෙහි ඔබහට කළ හැකි වන දෑ:

- "ආත්මික දර්ශනය" අර්ථ දැක්වීම
- ආත්මික දර්ශනයක් බිහිවීමෙහි ක්‍රියාපටිපාටිය පැහැදිලි කිරීමට
- දර්ශනයක ආත්මික බිහිවීම, ස්වභාවික බිහිවීමේ ක්‍රියාදාමය හා සැසැඳීම

**ප්‍රධාන පදය:**

**දර්ශනයක් නැති කල සෙනඟ හිතුවක්කාර වෙති. (හිතෝපදේශ 29:18)**

### හැඳින්වීම

බයිබලයෙහි හිතෝපදේශ 29:18 හි "දර්ශනයක් නැති කල සෙනඟ හිතුවක්කාර වෙති" යි පවසයි. මෙහි සඳහන් දර්ශනය ආත්මික දර්ශනයකි.

ආත්මික දර්ශනය යා යුතු දිශාවක් සපයයි. ජිවිතය උදෙසා අභියෝගයක් මෙන්ම ආකෘතියක් සපයයි. එයින් තොරවූ සෙනඟ ආත්මිකව මලානික වෙති. ආත්මික දර්ශනයක් සංවර්ධනය කිරීම නම් ඔබව දේව රාජ්‍යයට ගෙනැවිත් ඇත්තාවූ පරමාර්ථය කුමක්දැයි වටහාගෙන හඳුනාගන්නාවූ ක්‍රියා දාමය වේ. මෙම පරිච්ඡේදයෙහි මෙම සංවර්ධනය "දර්ශනයක බිහිවීම" නමින් හඳුන්වනු ඇත.

### ආත්මික දර්ශනයක් මන්ද?

ආත්මික දර්ශනයක් අවශ්‍ය ඇයි? එයින් තොරව සෙනඟ විනාශ වනුයේ ඇයි?

පිළිතුර, බයිබලයෙහි ආත්මික දර්ශනය පිළිබඳ විවිධ උදාහරණ අතුරින් එකකින් සැපයේ. 2 රාජාවලිය 6:15-17 දක්වා ප්‍රොපේතවර එලිෂා සහ ඔහුගේ සේවක ගෙහාසි පිළිබඳ කතාව කියවන්න.

දෙවියන්වහන්සේගේ ජනතාව වන ඉශ්‍රායෙල් සෙනඟ තම සතුරන් වන සිරියන්වරුන් විසින් වටලාගෙන තිබුණි. සිරියන්වරු සතුව බොහෝ හේවායින්, අශ්වයින් හා යුද්ධ රථ පැවතිනි. එලිෂාගේ සේවක ගෙහාසි මෙම මහත් බලමුළුව දැක බියට පත්විය. ඔහු එලිෂා වෙතට දිවගොස් "අපි කුමක් කරමුදැයි" එලිෂාගෙන් විමසීය. එලිෂා ඔහුට කතාකොට:

> **"භයනොවන්න, මක්නිසාද ඔවුන් සමඟ සිටින්නන්ට වඩා අප සමඟ සිටින්නෝ බොහෝය"යි කීවේය. (2 රාජාවලිය 6:16)**

ඉන්පසු එලිෂා දෙවියන්වහන්සේට යාච්ඤා කරමින් ගෙහාසි හට ආත්මික ලෝකය දැකීමට සලස්වන්න යැයි අයැදිය. ඔහුගේ ඉල්ලීමට පිළිතුරු සැපයුනු අතර ගෙහාසි ඉශ්‍රායෙල් වටකර සිටි දෙවියන්වහන්සේගේ ආත්මික මහත් බලමුළුව දුටුවේය.

මෙම උදාහරණයෙහිදී දෙවියන්වහන්සේ ගෙහාසි හට ආත්මික දර්ශනය, පියවි (ස්වභාවික) දෑසින් දකින්නට ඉඩ හළ සේක. මෙහිදී වැදගත් කාරණය වන්නේ ආත්මික දර්ශනයකින් තොරව දෙවියන්වහන්සේගේ ජනතාවට ජීවිතයෙහි තමා සිටින්නාවූ ස්වභාවික තත්වයන්ට එහායින් නොපෙනෙන බවය.

ගෙහාසි මෙන්, තමා අවට ස්වභාවික ලෝකයෙහි ක්‍රියා කරන්නාවූ සතුරු බලවේග දැක ඔවුහු පරාජයට පත්වෙති. ඔවුන්ගේ දර්ශනය යොමුවී ඇත්තේ ඔවුන්ගේ ගැටලු කෙරෙහි බැවින් එම ජීවිත නිරන්තරයෙන්ම "අපි දැන් කුමක් කරමුදැයි" ප්‍රශ්න නඟන්නාවූ චක්‍රයක් වී ඇත. ආත්මික දර්ශනයකින් තොරව ඔවුන්හට දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්ම දැකීමට හෝ අවබෝධ කරගැනීමට නොහැකි වනු ඇත.

### ආත්මික ඇස් වර්ධනය කිරීම

ඔබ නැවත උත්පාදනය ලැබීමට පෙර පාපයෙන් අන්ධව සිටිය. ගැළවීම තුළින් යේසුස්වහන්සේගේ ලෙය කරණකොටගෙන ඔබගේ මූලික අන්ධභාවය සුවපත් වී ඇත. ඉන්පසුව ඔබගේ ආත්මික දර්ශනය වර්ධනය කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍යව පවතී.

මෙම ක්‍රියාවලිය යේසුස්වහන්සේගේ සේවාවෙහිදී සිදුකළාවූ සත්‍ය සිදුවීමක ආත්මික සමාන බවකින් යුක්ත වූවකි.

> **ඔවුහු බෙත්සයිදාවට පැමිණියෝය. එවිට ඔව්හු උන්වහන්සේ වෙතට අන්ධයෙකු ගෙනැවිත් ඔහු පිට අත් තබනමෙන් උන්වහන්සේගෙන් උදක්ම ඉල්ලුවෝය' උන්වහන්සේ අන්ධයා අතින් අල්ලා, ගමෙන් පිටතට ගෙනැවිත් ඔහුගේ ඇස්වලට කෙළගසා, ඔහු පිට අත් තබා: නුඹට යමක් පෙනේදැයි ඔහුගෙන් ඇසූසේක. ඔහු ඇස් ඔසවා කියනුයේ: මට මනුෂ්‍යයන් පෙනේ, මක්නිසාද ගස් වාගේ (ඔවුන්) ඇවිදිනවා මට පෙනේයයි කීවේය. එවිට උන්වහන්සේ ඔහුගේ ඇස් පිට නැවත අත් තැබූසේක. ඔහු ස්ථිර ලෙස බලා, සුවය ලැබ, සියල්ල පැහැදිලි ලෙස දුටුවේය. (මාර්ක් 8:22-25)**

මෙම හාස්කම සැබවින්ම යේසුස්වහන්සේ මිහිපිට සේවය කරන විට සිදුකළාවූ ශාරීරික සුව කිරීමකි.

යේසුස්වහන්සේ පළමු වරට එම මිනිසා ස්පර්ශ කළ විට ඔහු සුවය නොලද්දේ මන්ද? යේසුස්වහන්සේට සියලු බලය හිමිව තිබුණා නොවේද? උන්වහන්සේ ජීවමානවූ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් නොවේද? යේසුස්වහන්සේ ආත්මික සත්‍යයක ස්වභාවික ආදර්ශයක් අපට සපයා දුන්සේක. යේසුස්වහන්සේ ස්වභාවික ශාරීරික සුවයේදී කළ අයුරින්ම ඔබව ආත්මිකව ද ස්පර්ශ කිරීමට කැමතිව සිටින සේක. පළමුව උන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි ඇති මූලික අන්ධභාවය නැමති පාපය ඉවත් කර දමන සේක. ඉන්පසුව එතුමා ඔබගේ ආත්මික දර්ශනය වර්ධනය කරනු ඇත.

### ආත්මික දර්ශනය යනු කුමක්ද?

ආත්මික දර්ශනය නම් ස්වභාවික ලෝකයෙන් එපිටට ඇති ආත්මික ලෝකය දෙස දැකීමකි. එනම් දෙවියන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය අවබෝධකර ගැනීම සහ එතුමාගේ සැලැස්මෙහි ඔබට හිමි කොටස හඳුනා ගැනීමය.

ආත්මිකව "විනාශවන්නාවූ" ඇදහිලිවතුන් පහත සඳහන් කොටස් වලින් එකකට අයත් වෙති.

- ඔවුනට ආත්මික දර්ශනයක් නොමැත.
- ඔවුන්ට ආත්මික දර්ශනයක් ලැබී ඇතත් එයට අකීකරුවී සිටිති.
- ඔවුනට දර්ශනයක් තිබෙන නමුත් එය ඉටු කරන ක්‍රමය නොදනිති. ඔවුහු සමහරවිට උත්සාහ දරා අසමත්ව හෝ කිසිම උත්සාහයක් නොදරා සිටිනු විය හැක.

ආත්මික දර්ශනය ඔබහට දෙවියන්වහන්සේ විසින් කිරීමට අපේක්ෂා කරන දෙය පිළිබඳව පැහැදිලි රූපයක් සපයනු ඇත. ඉන්පසුව එම ඉලක්කය සපුරා ගැනීම පිණිස ඔබගේ කිතුනු දිවියේ සෑම පියවරක්ම එදෙසට යොමු කරවනු ඇත.

**පාවුල්ගේ දර්ශනය**

ප්‍රේරිත වූ පාවුල් හට ආත්මික දර්ශනයක් පැවතිනි. ඔහු කථාකොට "මම ස්වර්ගීය දර්ශනයට අකීකරු නොවිමි" යි පැවසීය.

> **මම ස්වර්ගීය දර්ශනයට අකීකරු නොවී, (ක්‍රියා 26:19)**

පාවුල් තුමාගේ ජීවිතය මෙහෙය වූ බලවේගය වූයේ ස්වර්ගයීය (ආත්මික) දර්ශනය වේ. දර්ශනයක් තිබීම පමණක් නොසෑහෙන බවත් එම දර්ශනය අත්පත් කර ගැනීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍ය බවත් ඔහු හඳුනාගත්තේය.

දර්ශනයක් "දර්ශනයක්" ලෙසට පමණක් පැවතිය හැකිය. එහි අර්ථය නම් දර්ශනයට අනුකූලව ඔබ ක්‍රියා නොකළහොත් එය කිසිවිට සැබෑ නොවන බවය. දෙවියන්වහන්සේ කිසියම් දර්ශනයක් දුන් කල එය ඉටු කිරීම සඳහා ආත්මික මෙන්ම ප්‍රායෝගික උපක්‍රම ද සපයන සේක.

දෙවියන්වහන්සේ පාවුල්ට ආත්මික දර්ශනයක් දුන් කල, එය සම්පූර්ණ කිරීම සඳහා විශේෂිත වූ කාරණා කිහිපයක් පැවරූ සේක.

> **නුමුත් නැගිට කෙලින් සිටපන්න. මක්නිසාද යම් යම් දේ සඳහා නුඹ මා දුටුයෙහිද, නුඹට ප්‍රකාශවන්නෙම්ද, ඒ දේවල් ගැන නුඹ සේවකයෙක් ද සාක්ෂිකාරයෙක් ද කොට නියමකරන පිණිස මම නුඹට පෙනුණෙමි. සෙනඟගෙන් ද අන්‍යජාතීන්ගෙන් ද නුඹ ගළවන්නෙමි. මා කෙරෙහි ඇදහීමෙන් ඔවුන් පව් කමාවද පිරිසිදු කරනු ලැබූ අයවලුන් අතරෙහි උරුමයක් ද ලබන පිණිස, ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයට ද සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට ද හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහදවන්ට ඔවුන් වෙතට නුඹ යවමියි කීසේක.** (ක්‍රියා 26:16-18)

දෙවියන්වහන්සේ පාවුල්ට දේව සේවකයෙකු හා සාක්ෂිකරුවෙකු කරන පිණිස ඔහුට ආත්මික දර්ශනයක් දුන් සේක. ඔහුගේ සේවාව විශේෂ ජනකොටසක් උදෙසා විය. එනම් අන්‍යජාතිකයන්ටය. අන්‍යජාතිකයන් ලෙසට හඳුන්වනුයේ ජුදෙව් ජාතිය හැර ලොව මුළුල්ලේ වෙසෙන අනෙක් සියලුම ජාතීන්ය.

දෙවියන්වහන්සේ පාවුල්හට දර්ශනය අත්පත් කරගැනීමට අරමුණු (සැලැස්මක්) දුන්සේක. පාවුල්තුමා කළ යුතු දෑ වූයේ:

- ඔවුන්ගේ දෑස් ආත්මික අන්ධකාරයෙන් ආලෝකය කෙරෙහි විවර කිරීම
- ඔවුන්ව සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේගේ බලය වෙත හැරවීම
- ඔවුන්ව පාපය උදෙසා ඇත්තාවූ සමාව වෙතට යොමු කිරීම
- ඇදහිල්ල තුළින් ඔවුන් සතුවිය හැකි ආත්මික උරුමය හෙළිදරව් කරදීම

**දර්ශනයක බිහිවීම**

දෙවියන්වහන්සේ පාවුල්ට දුන් අයුරින්ම ඔබටත් ආත්මික දර්ශනයක් දීමට කැමතිව සිටින සේක. එසේම දර්ශනය සම්පූර්ණ කිරීම සඳහා ඔබට සහාය වීමට හා එහි පරමාර්ථය සහ අරමුණු එළිදරව් කරදීමට එතුමා සතුටු වන සේක.

ඔබ "දර්ශනයක බිහිවීම" අත්දකින කල දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැලැස්මෙහි ඔබ නරඹන්නෙකු නොව කොටස් කරුවෙකු වනු ඇත.

ස්වභාවික ලෝකයෙහි බිළිඳෙකු ලොවට බිහිවීමේ ක්‍රියාදාමය ආත්මික ලෝකයෙහි දර්ශනයක බිහිවීම හා බොහෝ සෙයින් සමානය. ඔබ ආත්මික දර්ශනයකට උපත ලබා දෙන කල පහත සඳහන් අදියරයන් අත් දකිනු ඇත.

**ගැබ්ගැනීම:**

"ගැබ්ගැනීම" යනු මැවීමකි. දෙවියන්වහන්සේ විසින් ඔබගේ ආත්මයෙහි ආත්මික දර්ශනයක් මවනු ඇත.

දෙවියන්වහන්සේ පාවුල්හට ආත්මික දර්ශනය දුන් කල එම දර්ශනය දුන් පුද්ගලයා හඳුන්වා දුන් සේක. උන්වහන්සේ කථාකොට, "මම යේසුස් වෙමි" (ක්‍රියා 26:15) යි කීසේක. දෙවියන්වහන්සේ පාවුල්ගේ දර්ශනය ඔහු තුළ මැවූසේක.

**වර්ධනය:**

ඔබ පළමුවර දර්ශනය ලැබූවිට එය "කලලයක්" අයුරින් පවතී. කලලයක් යනු ජීවිතයක ප්‍රාථමික මූලික අවදියයි. ස්වභාවික කලලයක් වර්ධනය වන්නාසේ ඔබද දෙවියන්වහන්සේ තුළ වර්ධනය වීමෙහිදී දෙවියන්වහන්සේ ඔබගේ දර්ශනය වර්ධනය කරන සේක.

මිනිස් කලලය ජීවියාගේ මූලික සෛලය වේ. එයින් මිනිසාගේ සියලුම අංගෝපාංග වර්ධනය වේ. ඔබ එම කලලය වෙනස් කිරීමට උත්සාහ දැරුවහොත් කලලය විකෘති වීමකට හෝ දරුවා මිය යාමට භාජනය විය හැකිය.

දෙවියන්වහන්සේ ඔබ තුළ මූලික ආත්මික දර්ශනය ජනිතවීමට සලස්වන සේක. සියලු අංග උපාංග වර්ධනය වන එම මූලික කලලය ලෙස දර්ශනය ඔබ තුළ පැවතිය යුතුය. දෙවියන්වහන්සේ ඔබට දුන්, දර්ශනය වෙනස් කිරීමට උත්සාහ කළහොත් දෙවියන්වහන්සේගේ සර්වසම්පූර්ණ සැලැස්මට වෙනස් වූ විකෘතියක් හෝ ගබ්සාවක් විය හැකිය.

මෙම පාඩමාලාවෙහි විස්තර කර ඇති දර්ශනය දෙවියන්වහන්සේ ඔබගේ ආත්මය තුළ ජනිත කළ විට, එය ඔබ සම්පූර්ණ කරන ක්‍රම විවිධාකාර විය හැකි වුවද සැමවිටම දර්ශනය නොවෙනස්ව පැවතිය යුතුය.

ඔබ ආත්මිකව වර්ධනය වී පරිනත වීමත් සමඟම දර්ශනය වර්ධනය වනු ඇත. එහි හැඩරුව ඊයේ" පසුගිය සතියේ හෝ පසුගිය මාසයෙහි තිබූ අයුරින් නොපවතිනු ඇත. එනමුත් ඔබව කැඳවනු ලැබූ දිව්‍යමය පරමාර්ථය වන ඔබගේ මූලික දර්ශනය ඔබ කිසිවිටක අමතක නොකළ යුතු වේ.

ස්වභාවික ලෝකයෙහි මව් කුසය තුළ ළදරුවෙකු වර්ධනය වීම ප්‍රසාරණයවීමේ අත්දැකීමක් මෙන්ම ආත්මික දර්ශනය වර්ධනයවීම ද ව්‍යාප්තවීමේ අත්දැකීමක් වනු ඇත. දර්ශනය ඔබ තුළ වර්ධනය නොවුවහොත් එය ඔබ තුළ මිය යනු ඇත.

මවක් තම කුස තුළ බිළිඳා දරා සිටින ලෙසට, ඔබත් දර්ශනය ලැබූ කල නිරතුරු එය ඔබ තුළ පවතිනු ඇත. එය ඔබ ජීවිතයෙහි ජීවමාන ඉතා වැදගත් අංගයක් වනු ඇත. එය ඔබගේ ජීවිතයෙන් හා එය පිළිසිඳ වූ දිව්‍යමය සැපයුම් මාධ්‍යයෙන් පෝෂණය ලබා ගනී.

බිළිදෙකු කුස තුළ හොවාගෙන සිටින ගැබිනි මවක් සමහර දේ වලින් වැළකී සිටී. ඔබගේ ආත්මික දර්ශනය වර්ධනයවීමේදී ඔබට ද මෙලෙස කිරීමට සිදුවනු ඇත.
ඔබහට ඔබගේම සැලසුම් සහ බලාපොරොත්තු පසෙකලා ඉවත්කර ගැනීමට සිදුවේවි. සමහරවිට ලෞකික වස්තුව අත්හරින්නට සිදුවේවි. නිරාහාරව සිට යාච්ඤා කරන පිණිස කාලය පූජාකිරීමට සිදුවේවි.

**විළිරුජාව:**

දේශනාකාරයා 5:3 හි සඳහන් වනුයේ:

**ස්වප්නය කාරණ රාශියක් ඇතුව පැමිණෙන්නේය. (දේශනාකාරයා 5:3)**

මෙහි "රාශියක්" යන්නෙහි අර්ථය ශ්‍රේෂ්ඨ යන්නය. කාරණා ලෙසට අර්ථකථනය කර ඇති පදයෙහි හෙබ්‍රෙව් අර්ථය නම් විළිරුජාව (අපහසුතාවය) යන්නය. එබැවින් ස්වප්නයක් හෝ දර්ශනයක් පැමිණෙන්නේ "ශ්‍රේෂ්ඨ විළිරුජාවකිනි".

ස්වභාවික උපතකදී ඇතිවන විළිරුජාව හා සම්බන්ද කරුණු වලට සමාන්තරවූ විළිරුජාවක් ආත්මික දර්ශනයක් බිහිවීමේදී පවතී. ස්වභාවික විළිරුජාව දරුවෙකු මෙලොවට බිහිකිරීම සඳහා අති මහත් ප්‍රයත්නයක් කැටිකොට දැඩි බලයකින් ක්‍රියාත්මක වන කාල සීමාවකි. මෙම විළිරුජා කාලය බිහිකිරීමේ වෙහෙස කර "ප්‍රසව වේදනාව" ලෙස ද හැඳින්වේ.

ළදරුවෙකු බිහිකිරීමෙහි දී මෙන්ම ආත්මික දර්ශනයක් බිහිවීමේදී ද මානසික, ශාරීරික හා ආත්මික දැඩි වෙහෙසකර, ප්‍රයත්නයන් එකට කැටිකළ කාලසීමාවක් වනු ඇත.

ඔබ මෙම අධ්‍යයනයෙහි යෙදෙන අතර දෙවියන්වහන්සේ ඔබගේ ආත්මයෙහි බිහිකිරීමට කැමති වන දෙය පිළිබඳව ඉතා අවධානයෙන් පසුවන්න.

ස්වභාවික දරු ප්‍රසූතියකදී දරුවා ප්‍රසූත කරන තැනැත්තිය ස්වභාවික බලවේගයකට ඒ සඳහා ඉඩ හැ×ය යුතුය. දරුවා ප්‍රසූත මාර්ගයකට පිවිසීමට පෙර බලහත්කාරයෙන් එයට යොමුකළහොත් එනම් මාර්ගය විවර වනතුරු බලා නොසිටියහොත් දරුවා මිය යා හැකිය.

ආත්මික ලොවෙහි ද මෙය සත්‍යයකි. දෙවියන්වහන්සේට ඔබගේ ජීවිතයෙහි පාලනය භාර කරන්න. ඔබ, ඔබගේම ශක්තියෙන් දර්ශනය බිහිකිරීමට ප්‍රයත්න දැරීමෙන් දේව සැලැස්ම ගබ්සාවකට ලක් විය හැකිය.

ඔබ තුළ ඇති සියලුම ශක්තීන් දර්ශනය තල්ලු කොට ස්වභාවික හැකියාවක් තුළින් එය බිහිකිරීමට පොලඹවනු ඇත. එනමුත් ස්ව-ප්‍රයත්නයෙන් දර්ශනය විනාශ වී යා හැක.

ක්‍රිස්තුස්වහන්සේ පේතෘස්ව කැඳවන්නේ මොනයම් ආකාර සේවයක් සඳහාදැයි ඔහු වටහාගත් කල "මා කෙරෙන් දුරු වුව මැනව, මක්නිසාද මම පව්කාරයෙක්මි" යි ඔහු පැවසීය. (ලූක් 5:8) තමාගේ ස්වභාවික ශක්තියෙන් හා හැකියාවෙන් ඉටු කළ නොහැකි තරම් දර්ශනය වඩා උතුම් බව ඔහු දැන සිටියේය.

විළිරුජාව සහිත මවක් ප්‍රසිද්ධ ස්ථානයක සැමගේ බැල්මෙන් ඉවත් වී සැඟවෙන්නාක් මෙන් ආත්මික දරු ප්‍රසූතියකට සූදානම් වන අය ද දෙවියන්වහන්සේ සමඟ හුදකලා විය යුතු වේ.

**සංක්‍රමණික කාලය:**

ස්වභාවික දරු ප්‍රසූතියකදී විළිරුජා කාලය අතරතුර ඉතාමත්ම වේදනාකාරී "සංක්‍රමණික කාලය" නම් කාලයක් ඇතිවේ. එම කාලයෙහිදී දරුවා මෙලොවට බිහිවීමට ප්‍රසූත පිවිසුම් මාර්ගය විවර වීමට පෙර පවතින්නාවූ කාලයයි.

මෙය ආත්මික ලොවෙහි දර්ශනයක් බිහිවීමට සමාන ලෙසම සිදුවේ. දෙවියන්වහන්සේ ඔබ තුළ ආත්මික දර්ශනයක් තැන්පත් කළ විට ඔබ ආත්මික සංක්‍රමණික කාලයක් අත්දකිනු ඇත.

සංක්‍රමණය යනු වෙනස්වීමකි. දෙවියන්වහන්සේ ඔබහට ආත්මික දර්ශනයක් දෙන විට ඒ හා සමඟම ඔබගේ ජීවිතයෙහි වෙනස්වීම් ද සිදුවනු ඇත. ඔබට නව කැපවීම් හා ඕනෑකමින් වැඩ කිරීමකට යොමුවීමට සිදුවේ.

ඔබගේ ‰විතයෙහි සෑම අංශයකින්ම ඔබට පීඩනය එල්ල විය හැක. ඔබ තුළ ඇති සෑම දෙයක්ම දෙවියන්වහන්සේ ඔබ තුළින් ප්‍රසූත කිරීමට යන දෙයින්, විළිරුජාවෙන් ඔබව මුදා හරින මෙන් අයැද මොර ගසනු ඇත.

බොහෝ දෙනෙකු දර්ශනය අහිමි කර ගන්නා අවස්ථාව වනුයේ මෙම අවස්ථාවෙහිදිය. නොයෙක්වර දෙවියන්වහන්සේ තම ජනතාව තුළ එතුමාගේ දර්ශනය බිහිකිරීමට සංක්‍රමණික අවදියට රැගෙනවිත් ඇත.

එනමුත් සංක්‍රමණය ඉතා අපහසු බැවින් බොහෝ දෙනෙකු ආපසු හැරී ගොස් තිබේ. ඔවුනට මෙම දැඩිපීඩාකාරී කාලයෙහි පීඩනය උසුලාගැනීමට අපහසු වී ඇත.

මේ සඳහා ඔවුන්ගේ සිතුවිලි රටාව හා ජීවන රටාව වෙනස් කිරීමට සිදුවූ අතර ඔව්හු එසේ වෙනස් කිරීමට කැමති නොවූහ. ඔවුන්ට ස්වයං-ප්‍රයත්නය සහ ගතානුගතිකත්වය බැහැර කළ නොහැකි විය. ඔවුන්ට දෙවියන්වහන්සේගේ සැලැස්ම වැළඳගැනීම සඳහා ඔවුන්ගේම ආශාවන් හා අපේක්ෂාවන් පසෙකට දැමීමට නොහැකි වී තිබේ. ඉශ්‍රායෙල් ජාතියට සිදුවූ දේ මෙයයි.

> **ගර්භණියක් වදන්ට ළංවෙන විට විළිරුදාවෙන් මිරිකී කෑගසන්නාක්මෙන්, ස්වාමින්වහන්ස, ඔබ ඉදිරියෙහි අපි සිටියෙමුව. අපි ගර්භණීව සිට වේදනා විඳිමින් හුළඟ වැදුවාක්මෙන් වැදුවෙමුව. දේශයෙහි කිසි මිදීමක් ඉෂ්ට නොකෙළෙමුව. ලෝවැසියෝද නොවැටුණෝය. (යෙසායා 26:17-18)**

විළිරුජාව ශෝකය ගෙන දෙන නමුත් ප්‍රීතිය ගෙන දෙන්නාවූ දරු ප්‍රසූතියට එය මඟ පෙන්වයි.

> **ස්ත්‍රියෙක් වදන වේදනාවෙන් සිටින කල, ඇගේ වේලාව පැමිණි නිසා ඈට ශෝකය තිබේ. නුමුත් ඈ දරුවා වැදූ පසු, ලෝකයට මනුෂ්‍යයෙක් උපන්නේය යන ප්‍රීතිය නිසා, වේදනාව තවත් සිහි නොකරන්නීය. (යොහන් 16:21)**

යෙසායා 53:11 හි අපට පවසා ඇත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ විළිරුජාව දෙවියන්වහන්සේගේ දෑසින් දුටු බවත් උන්වහන්සේ එය පිළිබඳව තෘප්තිමත් වූ බවත්ය. එදින කල්වාරියෙහිදී දර්ශනයක් සම්පූර්ණ විය. මිනිසාගේ වැටීමේ සිට පොරොන්දු වී තිබූ දර්ශනය (උත්පත්ති 3:15) එදින සම්පූර්ණ විය. වේදනාකාරී විළිරුජාව තුළින්, පාපයෙන් මිදීමේ දර්ශනය යථාර්ථයක් බවට පත්විය.

විළිරුජාව ඉතාමත්ම වේදනාකාරී අත්දැකීමකි. එනමුත් දර්ශනයක් බිහිවිය හැක්කේ විළිරුජාවකින් පසුව පමණකි.

> **මෙබඳු දෙයක් ඇසුවේ කවුද? මෙබඳු දේ දුටුවේ කවුද? එක දවසකදී දේශයක් උපදිනවා ඇද්ද? නොහොත් සෙනඟක් එකවිටම උපදිනවා ඇද්ද? සියොන් ප්‍රසව වේදනා වින්ද ඇසිල්ලෙහිම ඇගේ දරුවන් වැදුවාය. බිහිවෙන්ට ළංකරන්නාවූ මම උපදින්ට නොසලස්වන්නෙම්දැයි ස්වාමින්වහන්සේ කියන සේක. නොහොත් බිහිවෙන්ට සලස්වන්වාවූ මමම ගර්භය පියන්නෙම්දැයි නුඹේ දෙවියන්වහන්සේ කියන සේක. (යෙසායා 66:8-9)**

**උපත:**

ආත්මික දර්ශනයක වර්ධනයෙහි අවසාන ඉලක්කයක් පවතී. ස්වභාවික කලලයක සිදුවන්නාක් මෙන් එහි අවසන් ඵලය වනුයේ දරුවෙකු උපත ලැබීමය. නියමිත කලට පෙර ප්‍රසූතිය හෝ පසු ප්‍රසූතිය ස්වභාවික දරු උපතකදී මෙන්ම ආත්මික දර්ශනය උපතකදී ද මරණය ගෙන දිය හැක.

ස්වභාවික වර්ධන ක්‍රියා පටිපාටියෙහිදී දරුවෙකු බිහිවීමෙන් අනතුරුව තවදුරටත් වර්ධනය වෙමින් පවතිනු ඇත. ආත්මික දර්ශනය බිහිවූ පසුව ද එය තවදුරටත් වර්ධනය වෙමින් ගොඩනැඟෙනු ඇත. එය වර්ධනය වීමෙහිදී නව මුහුණුවරකින් අලුත් උපාංග සහිතව වර්ධනය විය හැකි නුමුත් ඒ සියල්ල ආත්මික දර්ශනය නම් වූ මූලික සෛලයෙන් බෙදී ආ දේ විය යුතුය.

## ආබ්‍රහම්ගේ දර්ශනය

ආබ්‍රහම්ට දෙවියන්වහන්සේ දී තිබූ දර්ශනය ස්ව-ප්‍රයත්නයෙන් ඉෂ්මායෙල්ගේ උපත තුළින් ඉටු කිරීමට උත්සාහ කළේය. දෙවියන්වහන්සේ ආබ්‍රහම්ව මහත් ජාතියක් කිරීමට අවශ්‍යව සිටි බව

ඔහු දැන සිටියේය. ඔහුගේ භාර්යාව වූ සාරා මගින් ඔවුනට උරුමක්කාරයෙක් බිහිකළ නොහැකි යයි ඔහු කල්පනා කළේය.

එබැවින් ඔහු ඒ පිළිබඳව යමක් කළ යුතුවේ යැයි සිතා ඉෂ්මායෙල් බිහිකළේය. එනමුත් ඉෂ්මායෙල් පසුපස පැවති බලය කා සතුවිද? එය ආබ්‍රහම්ගේ බලය ද දෙවියන්වහන්සේගේද? ඉෂ්මායෙල් තුළින් දර්ශනය ඉටුවීම මනුෂ්‍යයාගේ නිෂ්පාදනයක් ද දෙවියන්වහන්සේගේ නිෂ්පාදනයක් ද?

ඔබහට ඔබගේම උත්සාහයන්ගෙන් ඉෂ්මායෙල්ව දර්ශනයට ගෙන ආ හැකිය. ඉෂ්මායෙල් නියෝජනය කරනුයේ ස්වභාවික හැකියාවන් භාවිතයෙන් ඔබගේම සැලැස්මට හා ක්‍රමයට අනුව දේව කැමැත්ත ඉටු කිරීමට යාමය. එනමුත් ස්වර්ගීයය දර්ශනය නියෝජනය වන ඊසාක් දෙවියන්වහන්සේ තුළින් උපත ලැබිය යුතුවේ.

ආත්මික දර්ශනයෙහි සම්පත් උල්පත කවුද?

"අප දෙවියන්වහන්සේගේ කාර්යය කරන පිණිස කුමක් කරමුදැයි ?" යේසුස්වහන්සේගෙන් විමසූ කල උන්වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ "දෙවියන්වහන්සේගේ වැඩය නම් උන්වහන්සේ බවය." ඉන් අදහස් කරනුයේ උන්වහන්සේම සැපයුම් උල්පත බවය (යොහන් 6:28-29).

ස්වර්ගීයය දර්ශනයේ සැපයුම් මාධ්‍යය ආබ්‍රහම් වීම දෙවියන්වහන්සේගේ බලාපොරොත්තුව නොවූසේක. එසේම අද දින අප මිනිසුන් විසින් සාදන ලද හෝ සංවිධාන මගින් බිහිකරන ලද දර්ශන ඉටු කිරීම අපගෙන් දෙවියන්වහන්සේ බලාපොරොත්තු නොවන සේක.

ආත්මික දර්ශනයෙහි සැපයුම් මාධ්‍යය දෙවියන්වහන්සේය. මෙම පාඨමාලාවෙහි දී ඔබ ලබන්නාවූ දර්ශනය නම් එතුමාගේ සැලසුමය. එය මනුෂ්‍යයෙකුගේ නිකායක හෝ සංවිධානයක සැලසුමක් නොවේ.

ඉෂ්මායෙල්ගේ උපතින් පසු වසර 13 ක් ගතවන තුරු දෙවියන්වහන්සේ ආබ්‍රහම් සමඟ කතාකළ බවට ශුද්ධ ලියවිල්ලෙහි කිසිම සඳහනක් නැත. ආබ්‍රහම්ට ස්වභාවික අන්දමින් දරුවෙකු ලැබීමට හැකියාවක් කෙසේවත් නොමැති වන තුරු දෙවියන්වහන්සේ ඔහු තුළ නැවතත් දර්ශනය පුබුදුවාලූයේ නැත. ඒ වනවිට ස්වයං-උත්සාහය මියගොස් තිබුණි.

ඉන්පසුව දර්ශනය බිහිවිය. දෙවියන්වහන්සේ සර්ව සම්පූර්ණ වූ නියමිත කාලයෙහි දී හාස්කමකින් ඊසාක් උපත ලැබීය. දෙවියන්වහන්සේගේ සැලසුමෙහි උපත සමඟ (ඊසාක්), ඉෂ්මායෙල් (ස්වයං-උත්සාහය) ඉවත් කළ යුතු විය.

ඔබගේ ආත්මයෙහි ඊසාක් (දේව සැලැස්ම) බිහිවීමට කාලය දැන්ය. මේ දේ සිදුවනු පිණිස ඉෂ්මායෙල්ව ඉවත් කළ යුතු වේ.

ඔබගේ ස්වං-උත්සාහය, ඔබගේ සැලසුම්, අපේක්ෂාවන්, චාරිත්‍ර වාරිත්‍ර, සංවිධානාත්මක වැඩ සටහනක් යනාදිය ඉවත ලෑම වේදනාකාරී අත්දැකීමකි.

එනමුත් දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පැවසූ අයුරින්ම ඔබට ද කියා සිටින්නේ "ඉෂ්මායෙල් (ස්වයං-උත්සාහය) උදෙසා නොතැවෙන්න, ඔබගේ බීජය ගණන් ගනු ලබන්නේ ඊසාක්ගෙනි." ඊසාක් තුළ දර්ශනයෙහි සැපයුම් උල්පත දෙවියන්වහන්සේ විය.

**ඔබ සූදානම්ද?**

උපත සඳහා වෙනස්වීමක් අවශ්‍යය. ස්වභාවික ලෝකයෙහි බිළිඳා මව් කුසයෙහි සුරක්ෂිත බවින් මිදීමට අවශ්‍ය වේ. ඔබ නැවත-උත්පාදනය ලද කල ඔබගේ පාපි වූ පැරණි ජීවිතය අත්හැරීමට සිදු විය. ඔබහට ඔබගේ සිතුවිලි රටාව හා ක්‍රියා කලාපය වෙනස් කිරීමට යේසුස්වහන්සේට ඉඩ හැරීමට සිදුවිය.

ආත්මික දර්ශනයකට උපත සැපයීම සඳහා ද වෙනස්කම් සිදුකළ යුතු වේ. දන්නා දෙයින් නොදන්නා දෙයට පා තැබීම සඳහා ධෛර්යය අවශ්‍ය වේ.

ඔබ එම ආත්මික දර්ශනය ලැබීමට සූදානම් ද? ඔබගේ ක්‍රිස්තියානි ජීවිතයෙහි ඉතා වටිනා අලුත් අත්‍යවශ්‍ය දෙයක් උපදවන පිණිස ආත්මික විළිරුජාව අත්දැකීමට ඔබ සූදානම්ද? ඔබ එසේ කිරීමට අකමැති නම් දැන්මම ඔබගේ අධ්‍යයනය මෙතැනින් නිම කරන්න. මන්ද, මෙම පාඩමෙහි බෙදාගෙන ඇති දර්ශනයෙහි එක් බිඳක් දුටුවායින් අනුතුරුව ඔබගේ ජීවිතය කිසිදාක පෙර තිබූ ජීවිතය මෙන් නොවනු නොඅනුමානය.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

______________________________________________

______________________________________________

2. ආත්මික දර්ශනය අර්ථ දක්වන්න.

______________________________________________

3. පහත සඳහන් ලැයිස්තු අංක 1 සහ 2 බලන්න. අංක 1 යටතෙහි නම් කීපයක් ද අංක 2 යටතෙහි ප්‍රකාශන කිපයක් ද සපයා ඇත. දී ඇති හිඩැසේ ප්‍රකාශනයට ගැළපෙන නම ඉදිරියෙන් ප්‍රකාශන අංකය ලියන්න. පළමුවන එක උදාහරණයක් සේ පෙන්වා දී ඇත.

| අංක 1 ලැයිස්තුව | අංක 2 ලැයිස්තුව |
|---|---|
| ___2__පාවුල් | 1. ඉෂ්මායෙල් තුළින් දර්ශනය බිහිකිරීමට උත්සාහ කළේය. |
| ______ ගෙහාසි | 2."ස්වර්ගියිය දර්ශනයට මම අකිකරු නොවීමි" |
| ______ ආබ්‍රහම් | 3."අපි කුමක් කරමුද?" |
| ______ දෙවියන්වහන්සේ | 4."උපත දෙන මම උපත සිදුවීමට නොසලස්වන්නෙමිද?" |
| ______ යේසුස්වහන්සේ | 5."මා කෙරෙන් අහක්වන්න, මම පාපිෂ්ඨ මිනිසෙක් වෙමි" |
| ______ පේතෘස් | 6.දෙවියන්වහන්සේ එතුමාගේ විළිරුජාව දැසින් දැක එය පිළිබඳ තෘප්තිමත් වූ සේක. |

4. දෙවන ලැයිස්තුවේ ඇති වාක්‍ය කියවා බලන්න. අංක 1 ලැයිස්තුවෙහි දී ඇති වචන වඩාත් හොඳින් අර්ථ දක්වන කියමන සඳහන් අංකය වචනයට ඉදිරියෙන් හිඩැසේ ලියන්න.

| අංක 1 ලැයිස්තුව | අංක 2 ලැයිස්තුව |
|---|---|
| ______ ගැබ්ගැනීම | 1. ඔබ තුළ දර්ශනය ආත්මිකව වැඩෙන්නාවූ කාල සීමාව |
| ______ වර්ධනය | 2. ප්‍රසුතියට ඉතා සමීප කාලය. ඉතාමත්ම අපහසුම අවදිය. මෙහිදී ඔබගේ ස්වයං-උත්සාහය පසෙකලා දෙවියන්වහන්සේට දර්ශනය ප්‍රසුත කිරීමට ඉඩ හළ යුතුය. |
| ______ විළිරුජාව | 3. දර්ශනය දෙවියන්වහන්සේ ඔබ තුළ පැළ කරන ආරම්භක අවදිය. |
| ______ සංක්‍රමණය | 4. ආත්මික ප්‍රසව වේදනා, දැඩි ශාරීරික මානසික හා ආත්මික වෙහෙස දැනෙන අවදිය. |

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. පහත සඳහන් ශුද්ධ ලියවිලි කොටස් අධ්‍යයනය කිරීම තුළින් ආත්මික විළිරුජාව නම් ක්‍රියා දාමය පිළිබඳ ඔබගේ දැනුම පුළුල් කරගන්න.

   යොහන් 16:21: එය දුක ගෙනෙන නමුත් උපතත් සමඟම ප්‍රීතිය හිමි වේ.
   1 තෙසලෝනික 2:9: එය ආත්මිකව හා ස්වභාවිකව යන අංශ දෙකෙහිම දැඩි වෙහෙසකරය.
   ගලාති 4:19: ඔබ තුළ ක්‍රිස්තුස්වහන්සේගේ හැඩරුව බිහිවීමත් සමඟ ඇතිවේ.
   රෝම 8:22-25: බලාපොරොත්තු ගෙන දේ
   යෙසායා 66:7-9: දෙවියන්වහන්සේගේ ආශාව නම් ආත්මික විළිරුජාවෙහි m%තිඵලයක් ලෙසට ආත්මික උපතක් (ප්‍රජනනයක්) ඇතිවනු දැකීමය.

2. මෙම ප්‍රකාශ පිළිබඳව සිතා බලන්න.

   "ක්‍රියාවකින් තොර දර්ශනය නිකම්ම දර්ශනයක් පමණකි.
   දර්ශනයකින් තොර ක්‍රියාව මහා කරදරයකි.
   දර්ශනයක් සහිත ක්‍රියාව මිෂනාරි සේවයයි."

3. දුෂ්ට මනුෂ්‍යයෝ දුෂ්ට සැලසුම් ජනිත කරති.

   **බලව, ඔහු අයුතුකම ප්‍රසූතකිරීමට වේදනා විඳියි. එසේය, ඔහු නපුරුකම ගැබ්ගෙන බොරුව ප්‍රසූත කෙළේය. (ගීතාවලිය 7:14)**

4. ස්වභාවික ලෝකයෙහි "වඳ" භාවය යනු දරුවන් ලැබීමට නොහැකියාවය. ඔබ ආත්මිකව "වඳ" බවින් සිටීද?

   බයිබලයෙහි සඳහන් වන බොහෝ කාලයක් වඳව පැවති, දෙවියන්වහන්සේගේ ස්පර්ශයෙන් ශ්‍රේෂ්ඨ දරුවන් බිහිකළ කාන්තාවෝ..

   -සාරා ඊසාක් බිහි කළාය
   -රාබෙල් යෝසෙප් බිහි කළාය
   -මානෝවා සම්සොන් බිහි කළාය
   -හන්නා සාමුවෙල් බිහි කළාය
   -රූත් ඕබෙත් බිහි කළාය
   -එලිසබෙත් යොහන් බිහි කළාය

# දෙවන පරිච්ඡේදය

## දර්ශනය

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසානයෙහිදී ඔබ හට පහත සඳහන් කාරණා කළහැකි වනු ඇත. එනම්,

- "ආත්මික සත්‍යතාවයක ස්වභාවික සමාන්තරකම" යන්න පැහැදිලි කිරීමට.
- ස්වභාවික අස්වැන්නෙහි ආදර්ශය දෙවියන්වහන්සේ ඔබ තුළ බිහිකිරීමට කැමති වන දර්ශනය හා සංසන්දනය කිරීමට හඳුනාගැනීම
- දර්ශනය ලබාගැනීමෙහි මග පාදන පියවර පැහැදිලි කිරීමට
- 

**ප්‍රධාන පදය:**

> **තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි. නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැසී තිබෙන බව බලාපල්ලා.** (යොහාන් 4:35)

### හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙහි ආත්මික දර්ශනය වර්ධනය කරගතහැකි ක්‍රියාදාමය විස්තර කෙරුණි. මෙම පරිච්ඡේදයෙහිදී ඔබගේ ආත්මය තුළ යේසුස්වහන්සේට ජනිත කරවීමට අවශ්‍යව ඇති දර්ශනය හඳුන්වා දෙන අතර එය හිමි කරගත හැකි ක්‍රමය පැහැදිලි කරනු ඇත.

දර්ශනය නම් මීට වසර 2000 කට පෙර එතුමාගේ ගෝලයන්ට අභියෝග කළාවූ දර්ශනයම වේ. එම දර්ශනයෙහි අර්ථය තේරුම් ගැනීම සඳහා දේව වචනයෙහි ඇති එක් මූලික ප්‍රතිපත්තියක් හඳුනාගැනීම අවශ්‍ය වේ. එම ප්‍රතිපත්තිය ආත්මික සත්‍යතාවයන් හා ස්වභාවික සමාන්තර කාරණා සම්බන්ධයෙනි.

මෙම පරිච්ඡේදය එම ප්‍රතිපත්තිය අර්ථ දක්වා ඔබ තුළ දෙවියන්වහන්සේ ජනිත කිරීමට කැමැත්තෙන් සිටින දර්ශනයට එය අදාළ කොට දක්වයි.

### ස්වභාවික සහ ආත්මික සත්‍යයන්

දෙවියන්වහන්සේගේ වචනයෙහි ලිඛිත වාර්ථාව වන බයිබලය මනුෂ්‍යයන්, පොරොන්දු, අනාවැකි හා ප්‍රතිපත්ති යන විෂයයන් පිළිබඳව අවධානය යොමු කරයි.

බයිබලයෙහි වැඩි කොටසක් යොමු වී ඇත්තේ මනුෂ්‍යයන් සම්බන්දයෙන් වේ' දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා සමඟ ගණුදෙනු කළ ආකාරයත් මනුෂ්‍යයා එතුමාට ප්‍රතිචාර දැක්වූ ආකාරයත් විස්තර කිරීමටය. එසේම අනාගතයෙහිදී සිදුවීමට යන සිදුවීම් පිළිබදවත් දෙවියන්වහන්සේගේ ජනතාවට දුන් බොහෝ පොරොන්දු පිළිබඳවත් බයිබලයෙහි විස්තරාත්මකව සඳහන් වේ. එසේම බයිබලයෙහි දෙවියන්වහන්සේ ඔබට පවසන දෙය අවබෝධකර ගැනීම සඳහා ඔබ විසින් වටහාගත යුතු හඳුනාගත යුතු වැදගත් ප්‍රතිපත්ති ද ඇතුළත් වේ.

මෙවන් ප්‍රතිපත්ති අතුරින් එක් වැදගත් ප්‍රතිපත්තියක් නම්, ආත්මික සත්‍යතාවයන් හි ස්වභාවික සමාන්තරකමය. "සමාන්තර" යනු යමක් හා සමානතාවයක් දැක්වීමය. අප "ආත්මික සත්‍යතාවන්හි ස්වභාවික සමාන්තරකම" යයි පවසන කල ඉන් අදහස් කරනුයේ දෙවියන්වහන්සේගේ ආත්මික සත්‍යතාවයක් පැහැදිලි කිරීමට හෝ පෙන්වාදීම සඳහා ස්වභාවික උදාහරණයක් භාවිත කිරීමය.

යේසුස්වහන්සේගේ උපමා කතා ආත්මික සත්‍යතා සඳහා භාවිත කළ ස්වභාවික උදාහරණ වේ. එක් උපමාවකදී උන්වහන්සේ කාන්තාවක් විසින් රොටි සෑදීමට පිටි අනා එයට මුහුන් බිඳක් මුසු කිරීමේ

ස්වභාවික උදාහරණය භාවිත කළ සේක. මුහුන් බිඳ මුළු පිටි පිඩ පුරාම පැතිරී යාම ලොව මුළුල්ලෙහිම දේව රාජ්‍යය පැතිරියාම උදාහරණවත් කළේය.

උන්වහන්සේ ආත්මික සත්‍යතාවයන් පහදා දීම සඳහා ස්වභාවික උදාහරණ බොහෝ සේ භාවිත කළ අතර මෙය ඉන් එක් උදාහරණයක් පමණකි.

ස්වභාවික හා ආත්මික සමානභාවයේ ප්‍රතිපත්තිය 1 කොරින්ති පොතෙහි විස්තර කර දී තිබේ.

> **ස්වභාවික ශරීරයක්ව වපුරනු ලැබේ( ආත්මික ශරීරයක්ව නැගුටුවනු ලැබේ. ස්වභාවික ශරීරයක් තිබේ නම් ආත්මික ශරීරයක් ද තිබේ. එසේම: පළමුවෙනි මනුෂ්‍යයා වූ ආදම් ජීවමාන ප්‍රාණයක් වුණේයයි ලියා තිබේ. අන්තිම ආදම් ජීවනදායක ආත්මයක් විය. එසේ වී නුමුත් ප්‍රථමවන්නේ ආත්මික එක නොව ස්වභාවික එකය. පසුව ආත්මික එක විය. (1 කොරින්ති 15:44-46)**

මෙය ආත්මික සත්‍යතාවයක ස්වභාවික සමානතාවය පිළිබඳ විශිෂ්ට උදාහරණයකි. දෙවියන්වහන්සේ පළමුව මැවූ මිනිසා ස්වභාවික මිනිසාය. ඔහුගේ නම ආදම් විය. අවසාන ආදම් ලෙස හඳුන්වනු ලබන යේසුස්වහන්සේ ආත්මික මිනිසා වූ සේක.

දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් එළිදරව් කිරීමට යන්නාවූ ආත්මික සත්‍යයෙහි ස්වභාවික උදාහරණය වූයේ ආදම්ය. ස්වභාවික මිනිසා හේතුකොටගෙන පාපය සහ මරණය ඇතිවිය. ආත්මික මිනිසා හේතුකොටගෙන ගැළවීම සහ ජීවනය ඇතිවිය.

ස්වභාවික දෙය ඔබගේ ස්වභාවික සංවේදී ඉන්ද්‍රියනට නිරීක්ෂණය කළ හැකිය. ඔබට එය දකින්නට, අසන්නට, හෝ ස්පර්ශ කිරීමට පුළුවන. ආත්මික වූ දෙය නිරීක්ෂණය කළ හැක්කේ ආත්මික සංවේදී භාවයෙන් පමණකි.

ස්වභාවික උදාහරණ ශාරීරික සංවේදී ඉන්ද්‍රියන්ගෙන් හඳුනාගත හැකිය. එහෙත් ආත්මික සමානතාවයක් හඳුනාගත හැක්කේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ එළිදරව්වීම තුළින් පමණකි.

ආත්මික සත්‍යතාවයන් හී ස්වභාවික සමාන්තර ආදර්ශය නම් ප්‍රතිපත්තිය අවබෝධ කරගැනීම තුළින් ඔබට දේව වචනය වටහාගැනීම වැඩි දියුණු කරනු ඇත.

### අස්වැන්න

යේසුස්වහන්සේ තම ගෝලයන්ට අභියෝග කළාවුත් ඔබගේ ආත්මය තුළ ජනිත කරවීමට ආශා කරන්නාවුත් දර්ශනය ආත්මික සත්‍යතාවයක සමාන්තර ස්වභාවික උදාහරණයක් මගින් හෙළිදරව් කොට තිබේ.

යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසූයේ:

> **තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි. නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැසී තිබෙන බව බලන්න. (යොහාන් 4:35)**

යේසුස්වහන්සේ මෙම වදන් පවසන කල පැවසුවේ ඔවුන් ඉදිරියෙහි දක්නට ලැබූ කුඹුරු යායෙහි ස්වභාවික අස්වැන්න පිළිබඳව නොවේ. උන්වහන්සේ කතාකළේ ආත්මික අස්වැන්න පිළිඳවය.

යේසුස්වහන්සේ තම ගෝලයන්ගේ ජීවිතවල ආත්මික අර්ථයක් හා මඟපෙන්වීමක් සැපයීම සඳහා දර්ශනය පිළිබඳව ස්වභාවික නිදර්ශනයක් භාවිත කළේය.

### එහි අර්ථය කුමක්වීද?

අස්වැන්න පිළිබඳ ස්වභාවික නිදර්ශනයෙහි ආත්මික තලයෙහි අර්ථය කුමක්වීද?

යොහන් 4:3-35 දක්වා කියවන්න. යේසුස්වහන්සේ යුදයට යන ගමනෙහිදී සමාරිය මැදින් ගියසේක. උන්වහන්සේ ළිඳක් ළඟ විවේකගත් විට ගෝලයෝ ආහාර සොයා නුවරට ගියහ.

ගෝලයෝ නුවරට ගිය අතර සමාරිය ස්ත්‍රියක් ජලය රැගෙන යාමට ළඳ ළඟට පැමිණයාය. යේසුස්වහන්සේ ඇය සමඟ ශුභාරංචිය බෙදාගත් සේක.

එතුමාගේ ගෝලයෝ ආහාර රැගෙන පැමිණි කල, යේසුස්වහන්සේ ඔවුනට පැවසුවේ

> **"නුඹලා නොදන්නා කෑමක් මට තිබේ... මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය." (යොහන් 4:32,34)**

යේසුස්වහන්සේ හට තිබූ ඉතාමත්ම වැදගත්ම කාර්යය නම්, ස්වභාවික කෑමටත්, ජීවිතයේ අවශ්‍යතාවයනටත් වඩා දෙවියන්වහන්සේගේ කැමැත්ත කොට, එතුමාගේ කාර්යය ඉටු කිරීමය.

යේසුස්වහන්සේ ස්වභාවික අස්වැන්නෙහි නිදර්ශනය භාවිත කළේ මෙම සාකච්ඡාවෙහිදීය. උන්වහන්සේ එය භාවිත කළේ දැනටමත් ගෝලයන්ට පවසා ඇති දෙය පැහැදිලි කිරීමට උදාහරණයක් විලසිනි. එනම් ජීවිතයෙහි ඉතාමත්ම වැදගත් දෙය වනුයේ දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීම හා එතුමාගේ කාර්යය ඉටු කිරීම වේ.

## දෙවියන්වහන්සේගේ කැමැත්ත සහ එතුමාගේ කාර්යය

දෙවියන්වහන්සේගේ කැමැත්ත කුමක්ද? එතුමාගේ කාර්යය කුමක්ද? අස්වැන්නෙහි දර්ශනයෙහි එය එළිදරව් කොට ඇත. යේසුස්වහන්සේ තම ගෝලයන් හට ඇස් ඔසවා බලා ස්වභාවික අස්වැන්න නෙලීමට කරල් පැසී ඇති බව දැනගන්නා ලෙසට පැවසූ සේක. යේසුස්වහන්සේ මෙම නිදර්ශනය පාවිච්චි කළේ ලොව මුළුල්ලේ දේව රාජ්‍යයට අස්වැන්න ලෙස නෙලා ගැනීමට සූදානම්ව සිටින ස්ත්‍රී පුරුෂ මහත් සමූහය පිළිබඳව කතා කිරීමටය.

යේසුස්වහන්සේ ටික මොහොතකට පෙර කතාකළාවූ සමාරියෙහි ස්ත්‍රිය මෙම මහත් ආත්මික අස්වැන්නට කදිම නිදර්ශනයකි. ඇය ශුභාරංචිය ලැබීමට සූදානම්ව සිටි අතර ප්‍රීතියෙන් යුතුව එය හිමිකරගත්තාය. එක් කාන්තාවක් නෙලා ගැනීම තුළින් මුළු නගරයක් යේසුස්වහන්සේ දැනගැනීමට පැමිණියහ.

> **මා කළ සියල්ල උන්වහන්සේ මට කීසේකැයි සාක්ෂිදුන් ස්ත්‍රියගේ වචන නිසා ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. අප දැන් අදහන්නේ නුඹේ කීම නිසා නොවේ, මක්නිසාද අපිම අසා, සැබැවටම මුන්වහන්සේ ලෝකයාගේ ගැළවුම්කාරයාණන් බව දනිමුයයි කීවෝය. (යොහන් 4:39, 42)**

## අද දවසෙහි දර්ශනය

දැසට පෙනෙන ස්වභාවික කුඹුරු යායක් මැද සිටගෙන ඉන්නා අතරතුර ගෝලයෝ එදින ආත්මික දර්ශනයක බිහිවීම අත්දුටුවෝය.

ඔබගේ ආත්මය තුළ ජනිත කරවීමට යේසුස්වහන්සේට අවශ්‍යව ඇත්තේ එම දර්ශනයම වේ. උන්වහන්සේ ඔබට ලොව මුළුල්ලේ පැසී නෙලීමට සූදානම්ව පවතින දේව රාජ්‍යයෙහි අස්වැන්න පිළිබඳව ආත්මික කුඹුරුයාය පිළිබඳ දර්ශනයක් දීමට බලා සිටින සේක. එම දර්ශනයෙහි සත්‍යතාවය ඔබ වටහාගත් කළ එය සම්පූර්ණ කිරීමෙහි ඔබ සතු වගකීම අවබෝධ කරගත් කල එවක් පටන් ඔබ ජීවිතය කවදාවත් පෙර සිටි ආකාරයට සමාන නොවනු ඇත.

යේසුස්වහන්සේ පැහැදිලිවම පැවසුවේ"

> **"කෙත නම් ලෝකය"ය... (මතෙව් 143:38)**

අප්‍රිකාව, ආසියාව, ඔස්ට්‍රේලියාව, උතුරු ඇමරිකාව, දකුණු ඇමරිකාව, යුරෝපය සහ සමුද්‍රයේ පිහිටි සියලු දිවයින්...හා ලෝකයෙහි කුඹුරුයායන් දේව රාජ්‍යයෙහි ශුභාරංචිය ඇසීමට ඇත්තාවූ මහත් සමූහයකින් පැසී ඇත'

දර්ශනය වෙනස් වී නොමැත. යේසුස්වහන්සේ තම ගෝලයන්ගේ ජීවිත තුළ එය ජනිත කළ දිනයෙහි මෙන්ම අදද එසේම පවතී. දෙවියන්වහන්සේගේ කාර්යය ඉටුවීම අවසන් වී නොමැති බැවින් දෙවියන්වහන්සේගේ කැමැත්ත ද එලෙසම පවතිනු ඇත.

පනිවිඩය නොඅසන ලද මිලියන ගණනක් තවමත් නොඅසා සිටිති. තවමත් දර්ශනය වනුයේ ලොවෙහි පැසුණු කෙතය.

**අස්වැන්න ඇයි?**

යේසුස්වහන්සේ තම ගෝලයන්ට ආත්මික දර්ශනය දීමට අස්වැන්නේ නිදර්ශනය භාවිත කළේ මන්ද? උන්වහන්සේට භාවිත කළ හැකිවූ තව බොහෝ නිදර්ශන තිබෙන්නට ඇති. ඇයි එතුමා අස්වැන්න නෙලීම භාවිත කළේ?

අස්වැන්න නෙලීම උන්වහන්සේගේ ගෝලයන්ට පහසුවෙන්ම වටහාගත හැකි දන්නා දෙයකි. දෙවියන්වහන්සේගේ ජනතාව වන ඉශ්‍රායෙල් සෙනග ඉතිහාසයේ පළමු මිනිසා වන ආදම් තෙක් දිව යයි. ඔහු පළමුකොට පොළොව කෙටූ තැනැත්තාය. කෘෂිකර්මය මෝසෙස්ගේ කාලය දක්වා සංවර්ධනය වී එය ආර්ථික පදනම බවට පත්විය.

යේසුස්වහන්සේගේ වකවානුව වන විට ඉශ්‍රායෙල්හි ආර්ථිකය කෘෂිකර්මය වටා ගෙති තිබුණි. මුළු වසර පුරා අස්වැන්න නෙලීම සිදුවිය. බාර්ලි සහ මෙනේරි නෙලීම අප්‍රේල් මැයි වල සිදුවිය. සති 6 කට පමණ පසු තිරිඟු කැපීම ජුනි-ජුලි වල සිදුවිය.

ජුනි මාසයෙහි ඇපල්, අත්තික්කා, ආමන්ඩ් සහ පළමු මිදිවල අස්වැන්න නෙලීම සිදුවේ. ඔලිව්, රට ඉඳි, ග්‍රීස්ම ඍතුවේ අත්තික්කා ආදිය අගොස්තු, සැප්තැම්බර් මාසවල නෙලා ගනී. දෙළුම් හා පිසාචියෝ මද නෙලා ගැනීම ඔක්තෝම්බර් මස සිදුවේ. උතුරු ගලීලයේ ග්‍රීස්ම ඍතුවේ ඔලිව හා අත්තික්කා නොවැම්බර් මස නෙලාගනු ලබයි.

ඉශ්‍රායෙල්හි ආර්ථිකය අස්වැන්න මත කේන්ද්‍රීය වුවා පමණක් නොව ආගමික පද්ධතිය ද ඒ වටා ගෙති තිබුණි. දෙවියන්වහන්සේ තම ජනතාව උදෙසා පිහිටුවාලූ ප්‍රධාන මංගල්‍යය තුන අස්වැන්න නෙලීම හා සම්බන්ධ විය. පාස්කු මංගල්‍යය බාර්ලි අස්වැන්න (නික්ම 23:16) නෙලන සමයේ පැවැත්විය. සති හතකට පසුව තිරිඟු අස්වැන්න නෙලන සමයෙහි පෙන්තකොස්ත මංගල්‍යය (නික්මයාම 34:22) විය. පලතුරු අස්වැන්න නෙලන හත්වෙනි මාසයෙහි කූඩාරම් මංගල්‍යය (නික්මයාම 34:22) පැවැත්විනි.

මුළු දින දර්ශනයත්, ආර්ථිකයත්, ආගමික පද්ධතියත් අස්වැන්න නෙලීම වටා පදනම් වී තිබූ බැවින් ගෝලයන් හට මෙම නිදර්ශනය ඉතා පහසුවෙන් ග්‍රහණය කර අවබෝධ කරගත හැකිවිය.

මීට අමතරව ස්වභාවික වැපිරීමේ හා නෙලා ගැනීමේදී අනුගමනය කළ යුතු වූ ඉතා වැදගත් උපදෙස් මාලාවක් පැවතීම වැදගත් කරුණකි. මෙම ස්වභාවික නීති ආත්මික අස්වැන්න සඳහා ද අදාළ වේ. යේසුස්වහන්සේගේ ගෝලයෝ මෙම ස්වභාවික නීති වලට හුරු පුරුදුව සිටි බැවින් ඉතා පහසුවෙන් ඒවා ආත්මික අස්වැන්නට අදාළ කරගැනීමට හැකිවිය. මෙම ස්වභාවික ප්‍රතිපත්ති ආත්මික ලෙස අදාළ කරගැනීමෙන් මහත් අස්වැන්නක් ආත්මිකව ගෙන දෙනු ඇත. පසුව මෙම අධ්‍යයනයෙහි දී එම ප්‍රතිපත්ති ඉගෙන ගන්නෙමු.

ස්වභාවික අස්වැන්න පිළිබඳ නිදර්ශනයෙහිදී ඉතාමත්ම වැදගත් කරුණක් ලෙස ගෝලයෝ දුටුවේ එහි පවතින හදිසිභාවයයි. යම්කිසි බෝගයක් මේරූ කල ඉතා ඉක්මනින්ම ඵල නෙලාගත යුතුය. නැත්නම් එම අස්වැන්න නරක් වේ. තීරණය කළ යුතුව ඇත්තේ ඵල නෙලාගන්නවා ද නැතහොත් කුණුවීමට ඉඩ හරිනවාද යන්න වේ.

අස්වැන්න සරුවට තිබී එය නෙලීමට සේවකයන්ගේ හිඟයක් වුවහොත් අස්වැන්න අහිමි වනු ඇත. මෙම ස්වභාවික ගැටලුවට ආත්මික සමාන්තරභාවය පිළිබඳව යේසුස්වහන්සේ මෙලෙස පැවසූසේක.

**"ගොයම නම් බොහෝය, නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය" (මතෙව් 9:37).**

## දර්ශනය ලැබීම

යේසුස්වහන්සේ තම ගෝලයන් හට අස්වැන්න පිළිබඳ දර්ශනය ගැන පැවසීමෙහිදී දර්ශනය ලැබීමට පියවර පහක් ඉදිරිපත් කළ සේක.

> **(1) නුඹලා කියනවා නොවේද? (2) තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේ යයි (3) මම නුඹලාට කියමි (4) නුඹලාගේ ඇස් ඔසවා (5) කුඹුරු දෙසට යොමා ගොයම දැනටම කැපීමට පැසී තිබෙන බව බලන්න. (යොහාන් 4:35)**

**පළමුවන පියවර: "නුඹලා කියනවා නොවේද? ..."**

බොහෝ ඇදහිලිවන්තයෝ තම මුළු ජීවිත කාලයම අස්වැන්න පිළිබඳව කතා කරමින් කාලය ගෙවති. ඔවුහු ගොවිපොලේ මඩුවකට වාඩි වී අස්වැන්න නෙලීමට උත්සාහ දරන්නාවූ කුලීකරුවන් කණ්ඩායමක් වැනිය. ඔවුහු සෑම ඉරුදිනකම ගොවිපොලේ මඩුවට (දේවස්ථානයට) රැස්වී කෘෂිකර්මයෙහි (ආත්මික අස්වැන්නෙහි) වඩා හොඳ වඩා විශාල ක්‍රම ඉගෙනගනිති. ඔවුහු තමුන්ගේ අස්වැන්න නෙලීමේ දැකැති මුවහත් කරගෙන ඔවුන්ගේ නිවෙස්වලට හැරී යති.

ඉන්පසුව නැවතත් රාත්‍රියෙහි පැමිණ වඩා හොඳ සාර්ථක කෘෂිකාර්මික ක්‍රම ඉගෙන ගෙන දැකැති මුවහත් කරගෙන තම නිවෙස් වලට යති. සති මැද නැවතත් වඩා හොඳ සාර්ථක කෘෂිකාර්මික ක්‍රම ඉගෙනීමට රැස්වීමට පැමිණෙති. ඉගෙන ගනිති. දැකැති හොඳින් මුවහත් කර ගනිති. තමුන්ගේ නිවෙසට හැරී යති. ඔවුහු මෙය සතියක් පාසා සතියක් නොකඩවා ඉටු කරති. මෙලෙස සති මාසවලට ද මාස අවුරුදු වලටද හැරී ගෙවී යන නමුත් කිසිවෙක් අස්වැන්න නෙලීමට කුඹුරට බැසීමට පිටත්ව නොයති.

"නුඹලා කියනවා නොවේද?" යි යේසුස්වහන්සේ පැවසූ කල එතුමා ඉන් අදහස් කළේ ආත්මික අස්වැන්න පිළිබඳව කතා කිරීම පමණක් නොසෑහෙන බවය. ඔබ ඇත්තෙන්ම අස්වැන්න නෙලීමේ ක්‍රියාවට සහභාගි විය යුතුය. එයින් ප්‍රකාශ වනුයේ සියලු දෙනාම තම රැකියාවලින් ඉවත් වී සභාවෙන් ආධාර මුදල් ලබාගෙන ශුභාරංචිය ප්‍රකාශකයන් ලෙස දේශ දේශාන්තර වලට යා යුතුය යන්න නොවේ. එනමුත් සෑම ඇදහිලිවන්තයෙකුම කිසියම් ආකාරයකින් අස්වැන්නට සම්බන්ධ වී සිටිය යුතුය. සමහර අයට තම නිවසට යා බද හෝ දේවස්ථානයට යාබද ප්‍රදේශය කුඹුර විය හැක. තවත් අයට කුඹුර වන්නේ තම පාසැල, රැකියා ස්ථානය, තම ප්‍රජාව හෝ ගමක් විය හැක. වැදගත් කරුණ නම් සෑම ඇදහිලිවන්තයෙකුට අස්වැන්න නෙලීමෙහි යෙදී සිටිය යුතු අතර ඒ ගැන කතා කිරීම පමණක් නොසෑහේ.

**දෙවන පියවර: "තව සාරමසක් ගිය කල .."**

අස්වැන්න නෙලීමේ කාලයෙහි සේවාවෙහි දර්ශනයෙහි ඔබ නිරත වෙනවා නම් එය කල් දැමීමට නොහැක. ඔබහට අනාගතයේ කිසියම් දිනක මම එයට එකතු වන්නෙමි යැයි බලා සිටිය නොහැක. මනුෂ්‍යයන්ගේ ප්‍රාණ, පාපය නිසා මේ මොහොතෙහිදීද මරණයට පත් වෙයි. ඉන් සමහර අය සඳහා හෙට දිනය ප්‍රමාද වැඩි වනු ඇත.

> **ගොයම් පැසුණු නිසා දෑ කැත්ත පොවාපල්ලා. මුද්‍රික යන්ත්‍රය පිරී තිබෙන බැවින් ඇවිත් බැහැපල්ලා. මිදි යන්ත්‍රය පිරී තිබේ. පැස් ඉතිරී යන්නේය. මක්නිසාද ඔවුන්ගේ දුෂ්ටකම මහත්ය. රාශි ගණන් සමූහයෝ තීන්දු කිරීමේ මිටියාවතේ සිටින්නෝය. මක්නිසාද තීන්දු කිරීමෙහි මිටියාවතෙහි ස්වාමින්වහන්සේගේ දවස ළංව තිබේ.**
> **(යෝවෙල් 3:13-14)**

**තුන්වන පියවර: "මම නුඹලාට කියමි"**

දෙවියන්වහන්සේගේ මාර්ගය මනුෂ්‍යයන්ගේ මාර්ග වලට වඩා බොහෝ සේ වෙනස්ය.

> **මක්නිසාද මාගේ යෝජනා නුඹලාගේ යෝජනා නොවේය. නුඹලාගේ මාර්ගද මාගේ මාර්ග නොවේයයි ස්වාමින්වහන්සේ කියන සේක. අහස පොළොවට වඩා උස්ව තිබෙන්නාක් මෙන්**

**මාගේ මාර්ග නුඹලාගේ මාර්ගවලටත් මාගේ යෝජනා නුඹලාගේ යෝජනාවලටත් වඩා උසස්ව තිබේ. (යෙසායා 55:8-9)**

මනුෂ්‍යයෝ ආත්මික අස්වැන්න පිළිබඳ කතා කරති, ඔවුන් කල් දමති. නුමුත් දෙවියන්වහන්සේ පවසන දෙය මනුෂ්‍යයා පවසන දෙයට වඩා වෙනස්ය. එතුමා පවසනුයේ:

**සතරවන පියවර: "නුඹලාගේ ඇස් ඔසවා..."**

ගෝලයන්ගේ දෑස් වෙනතකට යොමු වී තිබිනි. ඔවුහු ආත්මික අස්වැන්න සහිත කුඹුර දෙසට අවධානය යොමු කරගෙන නොසිටියහ.

මෙම ආත්මික දර්ශනය ලබාගැනීම සඳහා ඔබ පෞද්ගලිකව ක්‍රියා කළ යුතුය. ඔබ ස්වභාවික ජීවිතයෙහි ඔබගේ අවධානය වෙනතකට යොමු කරන්නාවූ කාරණාවලින් ඔබගේ ආත්මික ඇස් ඉවතට ගෙන ඇස් ඔසවාගත යුතුය. ඔබගේ ඇස් පෞද්ගලික ගැටලු වෙතින්, අධෛර්යයන් වෙතින්, ව්‍යාපාර වෙතින්, ලෝකයෙහි කාරණා වෙතින් එසවිය යුතුය.

ඔබ ජීවිතයෙහි ඔබ වටා ඇති තත්වයන් වලින් ඇස් එසවිය යුතුය.

**පස්වන පියවර: "කුඹුරු දෙසට යොමා... පැසී තිබෙන බව බලන්න".**

ඔබගේ දෙනෙත් ලෝකයෙහි කාරණාවලින් ඉවත් කොට කුඹුරු දෙසට යොමු කිරීම පමණක් නොසෑහේ. ඔබ සැබවින්ම අස්වැන්න දෙස බැලිය යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ ඇස් වලින් ලෝකය දෙස බැලිය යුතුය.

බොහෝ දෙනෙකු සැබවින්ම ලෝකය දෙස ඕනෑකමින් බලා නොමැති බැවින් ආත්මික දර්ශනයක් ඔවුනට නොමැත. ඔවුහු අස්වැන්න සහිත කුඹුරෙහි තමුන්ගේ පෞද්ගලික වගකීම හඳුනාගෙන නොමැත. අද දවසේ ලෝකය නමැති කුඹුරෙහි අස්වැන්නෙහි තත්වය සලකා බලා නොමැත.

**දර්ශනය ලැබීමට නම් . . .**

- ඔබ එය පිළිබඳව කතා කිරීම පමණක් නොසෑහේ.
- ඔබට එය කල් දැමිය නොහැක.
- ඔබ දෙවියන්වහන්සේ පවසන දෙයට සවන්දිය යුතුය. උන්වහන්සේ "මම කවරෙකු යවම්ද? අප උදෙසා යන්නේ කවුද? (යෙසායා 6:8) කියා අභියෝග කරන කල ඔබ සවන් දිය යුතුය.

- ඔබ ලෝකයෙහි ඔබගේ දෑස් වෙනතකට යොමු කරන කාරණා වලින් මිදී අස්වැන්න සහිත කුඹුර දෙසට යොමු කළ යුතුය.
- ඔබ ලෝකය නම් කුඹුර දෙවියන්වහන්සේගේ දෑස් තුළින් බැලිය යුතුය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

____________________

____________________

2. "ආත්මික සත්‍යයක ස්වභාවික සමාන්තරය" යන්නෙහි අර්ථය කුමක්ද?

____________________

____________________

3. යේසුස්වහන්සේ තම ගෝලයන්ට ආත්මික දර්ශනයක් දීම සඳහා භාවිතා කළාවූ ස්වභාවික නිදර්ශනය වූයෙ____________________ය.

4. අස්වැන්නෙහි නිදර්ශනයෙහි කුඹුර ____________________ සමානය.

5. යේසුස්වහන්සේ තම ගෝලයන්ට ආත්මික දර්ශනයක් දීම සඳහා ස්වභාවික අස්වැන්න නෙලීමේ උදාහරණය භාවිත කිරීමට හේතු වූ කරුණු තුනක් සඳහන් කරන්න.

____________________

____________________

____________________

6. ඔබහට ආත්මික දර්ශනයක් ලබාගැනීම සඳහා සහාය දෙන්නාවූ යොහන් 4:35 හි සඳහන් පියවර 5 නම් කරන්න.

____________________ ____________________

____________________ ____________________

____________________

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

මෙම පරිච්ඡේදයෙහි අවධාරණය කරනු ලැබුවේ අස්වැන්න නැමැති දර්ශනය සමග පෞද්ගලිකව සම්බන්ධවීම පිළිබඳවය.

ලූක් 10:25-35 ඇති "යහපත් සමාරිතයාගේ" උපමා කථාව කියවන්න. මෙහි මනුෂ්‍ය අවශ්‍යතා සමග සම්බන්ධවීමෙහි ආකල්ප විදහා දක්වයි. එය ආත්මික අස්වැන්නේ කුඹුර වූ ලෝකය කෙරෙහි පවතින දර්ශනයට විවිධ ඇදහිලිවතුන් දක්වන ආකල්පය පිළිබඳ උපමාවකි.

සොරාගේ, පූජකයාගේ, ලෙවීයාගේ හා තානායම්කරුගේ හා යහපත් සමාරිතයාගේ ආකල්ප සලකා බලන්න. එසේම යේසුස්වහන්සේට මෙම උපමාව කීමට මඟ පෑදූ ප්‍රශ්නය ඇසූ නීතිධරයාගේ ආකල්පය නිරීක්ෂණය කරන්න.

| **චරිතය** | **ආකල්පය** |
|---|---|
| නීතිධරයා | සාකච්ඡාවට ප්‍රශ්නයක් දුටුවේය. |
| සොරා | කොල්ලකෑමට පුද්ගලයෙක් දුටුවේය |
| පූජකයා සහ ලෙවීයා | අවශ්‍යතාවය මඟහැර, වැලකී සිටිය යුතු ගැටලුවක් ලෙස දුටුවෝය. |
| තානායම්කරු | මුදල් වලට සේවය ලබාදිය හැකි සේවාදායකයෙක් ලෙස දුටුවේය. "මට මෙයින් උපයා ගත හැකි කුමක්ද?" යන ආකල්පය දැරීය. |
| සමාරිතයා | මිය යන පුද්ගලයෙකු දුටුවේය, විනාශවන්නාවූ අස්වැන්න දුටුවේය, අවශ්‍යතාවයට පෞද්ගලිකව සම්බන්ධ වී ප්‍රතිචාර දැක්වීය. |

# තුන්වන පරිච්ඡේදය

## උන්වහන්සේගේ දෑස ජාතීන් වෙත යොමුවී තිබේ

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසානයෙහි ඔබට කළ හැකි වන දෑ:

- දෙවියන්වහන්සේගේ දෙනෙත් තුළින් ලෝකය දැකීම යන්නෙහි අරුත පැහැදිලි කිරීමට
- අද දින ලෝකයෙහි ආත්මික අස්වැන්න සහිත කුඹුරෙහි තත්වය වටහා ගැනීමට
- දෙවියන්වහන්සේ විසින් ලොව පුරා නැගිටුවන්නාවූ ජ්‍යාතන්තර අස්වැන්න නෙලන්නන්ගේ කණ්ඩායමට සම්බන්ධවීමට පෞද්ගලිකව කැපවීමක් කිරීමට

**ප්‍රධාන පදය:**

**"උන්වහන්සේගේ ඇස් ජාතීන් කෙරෙහි යොමා තිබේ" (ගීතාවලිය 66:7)**

### හැඳින්වීම

පසුගිය පරිච්ඡේදය ඔබගේ ආත්මික ඇස් ඔසවා ලෝකය නමැති අස්වැන්නේ කුඹුර දෙස බැලීම
ප
යේසුස්වහන්සේට තිබූ අයුරින්ම දර්ශනය ගෝලයන් තුළ නොතිබුණි. එනිසා යේසුස්වහන්සේ දැක්කාවූ ආකාරයටම අවශ්‍යතාවය දකින පිණිස උන්වහන්සේ ගෝලයන්ට ඇස් ඔසවා බලන්න යැයි උනන්දු කළ සේක.

ඔබ ලෝකය දැකිය යුත්තේ දෙවියන්වහන්සේ එය දකින අයුරිනි. ඔබහට නියමාකාර ආත්මික දර්ශනයක් වර්ධනය කර ගැනීමට නම් මෙය අත්‍යවශ්‍යය.

මෙම පරිච්ඡේදය ලෝකයෙහි අස්වැන්න සහිත කුඹුර දෙස අවධානය යොමු කරයි. බයිබලය දෙවියන්වහන්සේ පිළිබඳ පවසන්නේ "උන්වහන්සේගේ ඇස් ජාතීන් කෙරෙහි යොමුව තිබේ" යනුවෙනි. දෙවියන්වහන්සේ ලෝකයෙහි අස්වැන්න දෙස බලන කල දකින්නේ කුමක්ද?

### මළබැදුනු දෑකැති, හිස් කුඹුරු

දෙවියන්වහන්සේ ලෝකය දකින්නේ අස්වැන්න සහිත කුඹුරක් ලෙසටය.

> **"කෙත නම් ලෝකයය ..." (මතෙව් 13:38).**

ලෝකයෙහි ජනතාවගේ හැඬීම දෙවියන්වහන්සේට ඇසෙනවා ඇත.

> **ගොයම් කපන කාලය පසුවිය. ග්‍රීෂ්ම කාලය කෙළවරවිය, එහෙත් අපි නොගැළවුණෙමුව. (යෙරමියා 8:20)**

අනාගතවක්තෘ යෝවෙල් මොරගැසුවාවූ ස්වභාවික කුඹුරුවල තත්වය ලෝකයෙහි ආත්මික කෙතෙහි අස්වැන්නෙහි තත්වය නිරූපණය කරයි.

> **ගොවියෙනි, තිරිඟු සහ යව ගැන ලජ්ජාවෙයල්ලා, මිදිවතුකාරයෙනි, කෑමොරගසාපල්ලා. මක්නිසාද කෙතේ අස්වැන්න නාස්තිවිය (යෝවෙල් 1:11).**

දෙවියන්වහන්සේගේ ඇස් ලෝකයෙහි ජාතීන් වෙතට යොමු වූ කල සේවකයන්ගේ හිඟකම නිසා ආත්මික අස්වැන්න කුණු වී විනාශ වී යනු දකිනු ඇත. යේසුස්වහන්සේ කිසිවිටකත් ශුභාරංචිය

වපුරන්නන්ගේ හිඟයක් ඇතැයි නොපැවසූ සේක. උන්වහන්සේ පැවසුවේ අස්වැන්න නෙලීමට සේවකයන්ගේ හිඟයක් පවතිනු ඇත කියාය.

> **එවිට උන්වහන්සේ තමන් ගෝලයන්ට කථාකොට: ගොයම නම් බොහෝය, නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. (මතෙව් 9:37)**

දැනට ලෝකයේ සිටින දේව දාසයන්ගෙන් 94% ක් උතුරු ඇමරිකාවෙහි ජනතාවගෙන් 6% ක් උදෙසා සේවය කරමින් සිටිති. එයින් අදහස් කරන්නේ දේව සේවකයන්ගෙන් 6% ක් පමණක් ලොවෙහි ඉතිරි 94% ජනගහනය වෙතට මෙහෙකිරීමට උත්සාහ දරන බවය.

දළ වශයෙන් බිලියන තුනක පමණ ජනගහනයක් සංස්කෘතිකමය වශයෙන් විවිධ වූ ජන කොටස් 16,000 ක් නියෝජනය කරමින් තවමත් ශුභාරංචිය ළඟා නොවී පසුවෙති. ලෝකයෙහි තවමත් විවිධ භාෂාවන් 2,000 කින් පමණ දේව වචනය පරිවර්තනය වී නොමැත.

ඉන්දියාවෙහි ඇති සෑම ගම්මාන 10,000 කින් 9,950 කටම ක්‍රිස්තියානි සාක්ෂියක් ලැබී නොමැත. ජපානයෙහි මුළු ජනගහනයෙන් කිතුනුවන් සිටින්නේ සියයට එකක් පමණකි.

ලතින් ඇමරිකාවේ වන සහිත පහත් බිම් වල වෙසෙන මිලියන පහක පමණ ජනතාව වෙතට කිසිදා ශුභාරංචිය පිවිස නැත. මිලියන 750 පමණ මුස්ලිම්වරු මධ්‍යයෙහි සේවය කරන කිතුනු ධර්මදූත සේවකයන් ඇත්තේ 500 ක් පමණකි.

මීට අමතරව අප්‍රිකාවේ, ආසියාවේ, දකුණු ඇමරිකාවෙහි හා මැද පෙරදිග කලාපයෙහි පවතින අවශ්‍යතාවයන් ද ඉහත දැක්වූ අයුරින්ම පවතී.

දෙවියන්වහන්සේ ජාතීන් දෙස බලන කල උන්වහන්සේ දකින්නේ මෙයයි.

**හිඩැස**

බයිබලය ප්‍රකාශකරනුයේ,

> **"ඇත්තේ එක දෙවි කෙනෙක් සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර කෙනෙකුත්ය. උන්වහන්සේ ...මනුෂ්‍යයා වූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේය." (1 තිමෝති 2:5,6)**

මැදහත්කාරකම් කරන්නෙකුගේ අවශ්‍යතාවය මඟින් පෙන්නුම් වනුයේ එකිනෙකාව පිළිගැනීමට නොහැකි දෙපාර්ශවයක් සිටින බවය.

දෙවියන්වහන්සේ ලෝකය දෙස බලන කල ආත්මික හිඩැසක නැගී සිටින මහත් ජන සමූහයක් එතුමා දකින සේක. දෙවියන්වහන්සේත් මනුෂ්‍යයාත් අතර හිඩැසට හේතුව පාපය වේ.

පාපිෂ්ඨ මිනිසා සහ ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ අතර මැදිහත්කරු යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. මැදිහත්කරුවෙකුගෙන් තොරව දෙපාර්ශවයට එකිනෙකාව පිළිගත නොහැක. යේසුස්වහන්සේ මනුෂ්‍යයාව ඔහුගේ පාපයෙන් මුදාගැනීමටත් ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ විසින් පිළිගනු ලැබීමටත් හැකියාව සැපයූ සේක.

මහත් සමූහයක් ඔවුන් හා දෙවියන්වහන්සේ අතර මුණ ගැසීමට හැකියාව සපයා දෙන පාලම වන මැදිහත්කරුවාණෝ පිළිබඳ පණිවුඩය ඇසීමට බලා සිටිති. යේසුස්වහන්සේ තම ගෝලයන් හට දුන් මහා නියෝගය නම් එම හිඩැසට ඇතුළුවීමට දුන් අණකි. උන්වහන්සේ යෙරුසලමට, යුදයට, සමාරියට හා ලෝකාන්තය දක්වා යෑම පිළිබඳව පැවසූ සේක.

ඔවුනට උන්වහන්සේ පැවසුවේ ඔවුන් සිටි ස්ථානයෙන්, එනම් යෙරුසලමෙන් ධර්මදූත සේවය ඇරඹීමටය. යුදය හා සමාරියට යාම අන්තර්-සංස්කෘතික ධර්මදූත සේවයක් වනු ඇත. සමාරිය දේවධර්ම න්‍යායන් හා සංස්කෘතිකමය වශයෙන් යෙරුසලමට වෙනස් විය. ලෝකයේ ඈත එපිට කලාප මීටත් වඩා ගැඹුරු අභියෝග නියෝජනය කරයි. එනමුත් මේ සෑම කලාපයකම හිඩැස පවතී.

මුලින්ම ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයෝ යුදෙව්වන් හා අන්‍යජාතීන් අතර පැවති සංස්කෘතිකමය හා දේව ධර්මය පිළිබඳ වෙනස්කම් හේතුවෙන් දෙපාර්ශවය අතර හිඩැස පිරවීමට පාලමක්වීමට අදිමදි කළහ. පීඩාකිරීම ආරම්භවන තුරුම යෙරුසලමෙන් එපිට තිබූ කලාප වලට ශුභාරංචිය පතල කිරීමට වැඩියමක් ඔවුහු නොකළහ (ක්‍රියා 8:4) .

ඔබ මහා නියෝගය ඉටු කර, අස්වැන්න නෙලාගැනීමට නම් ඔබගේ සංස්කෘතික, දේවධර්ම හා නිකාය යන බන්ධනවලින් එළියට පැමිණිය යුතුය. ඔබට සමහරවිට ඔබගේ භූගෝලීය පරිසරයෙන් පවා ඉවත් වී යාමට සිදුවේවි. දෙවියන්වහන්සේ සහ මිනිසා අතර ඇති හිඩැස පිරවීමට හැකි ශුභාරංචිය බෙදාගනිමින් ඔබ එම හිඩැසට අවතිර්ණ විය යුතුවේ.

**තවත් හිඩැසක්**

දෙවියන්වහන්සේත් මිනිසාත් අතර පාපය හේතුකොට ගෙන පවතින හිඩැසට අමතරව තවත් එක් විශාල ආත්මික හිඩැසක් පවති. එම හිඩැස පවතිනුයේ යේසුස්වහන්සේගේ ශුභාරංචිය ගෙනගොස් ලෝකයා වෙත ඉදිරිපත් කිරීමට උන්වහන්සේ දී ඇති අභියෝගය හා එය ඉටුකිරීමට එතුමාගේ ජනතාව අසමත්වීම අතරය.

ඔබහට ආත්මික අස්වැන්න සහිත කුඹුර පිළිබඳව දර්ශනයක් ලැබෙන තුරු දේව රාජ්‍යයෙහි ඔබ සතු වගකීම සම්පූර්ණයෙන් වටහා නොගනු ඇත. ක්‍රිස්තියානි ජීවිතයට පරමාර්ථයක් හා දිශාවක් ලබා දෙන හේතුව මෙය වේ. ආත්මික අස්වැන්න පිළිබඳ දර්ශනය ඔබගේ ජීවිතයෙහි කේන්ද්‍රස්ථානය හිමි කරගත යුතුය. බොහෝ අය හට මෙය සුළු ලෙස සලකන කරුණකි.

අප ආදරය කරන දෑ පිළිබඳව කතා කිරීමට අප පෙලඹෙමු. අපි අපගේ ස්වාමි පුරුෂයන් භාර්යාවන්, යහළුවන්, ක්‍රීඩාවන්, විනෝදාංශයන් පිළිබඳව කතා කරමු. එවගේම අපට බලපාන කරුණු එනම් දේශපාලනය, ආර්ථිකය හෝ ව්‍යාපාර ගැන කතා කරමු. එහෙත් විනාශ වන ප්‍රාණ ගැන අපි කතාකරන්නේ කෙතරම් කලාතුරකින්ද? කුඹුරෙහි විනාශ වී කුණු වී යන, තවමත් හිඩැසේ රැඳී සිටින දහස් සංඛ්‍යාත ජනතාව පිළිබඳව අප දිනකට කොපමණ කාලයක් සැලකිලිමත් වනවාද?

දවසෙහි ඉතා සාමාන්‍ය චර්යාවන් වන කෑම, බීම පවා දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා කිරීම පිළිබඳව පාවුල් කතා කරයි (1 කොරින්ති 10:31). ඔබගේ ජීවිතයෙහි සෑම ක්‍රියාවක්ම ආත්මික අස්වැන්නෙහි දර්ශනය කේන්ද්‍රයේ තබා සිදු කළ හැකිය. මෙය සිදුවූ කල ඇදහිලිවන්තයෙකු හැටියට ඔබගේ ජීවිතයට නව අභියෝගයක්, පරමාර්ථයක් හා මඟපෙන්වීමක් ලැබෙනු ඇත. සෑම දිනයක්ම ඔබ හට එම දර්ශනය ඉටු කළ හැකි කෙසේදැයි සොයා බලන්නාවූ පිපාසිත උද්යෝගිමත් දිනයක් වනු ඇත.

හිඩැසේ සිටින්නාවූ මහත් ජන සමූහය උදෙසා ඔබගේ පෞද්ගලික වගකීම ඔබට හඳුනාගත හැකි වූ කල අස්වැන්නෙහි දර්ශනය ඔබගේ ආත්මයට කා වැදුනු කල ඔබ විශේෂ ජාලයක කොටසක් බවට පත් වේ. මෙම ජාලය නම්, දෙවියන්වහන්සේගේ දෑසින් ලොව දෙස බලා, ශුභාරංචිය පැතිරවීමේ එතුමාගේ සැලසුම ඉටු කිරීම සඳහා එකමුතු වූ ලෝකයෙහි බොහෝ ජාතීන්ගෙන් සමන්විත ඇදහිලිවතුන්ගේ කණ්ඩායමකි.

මෑත භාගයේදී එම කණ්ඩායම "ලෝක කිතුනුවන්" ලෙසට නම් කර ඇත. ඔවුහු නම්, සෑම දිනක අවසානයෙහි නිසැකකමින් යුතුව මෙසේ පැවසිය හැකි කිතුනු ඇදහිලිවතුන්ය. එනම්,

"අද දවසෙහි ක්‍රිස්තුස්වහන්සේගේ විශ්ව පතල කාර්යයෙහි මම ඉතා වැදගත් උපක්‍රමශීලි කොටසක් වූ බව මම දනිමි. විශේෂයෙන්ම තවමත් ශුභාරංචිය ළඟා වී නොමැති අය උදෙසා"

ආත්මික අස්වැන්නෙහි අභියෝගය මෙය වේ. මෙය නම් දෙවියන්වහන්සේගේ ඇස් වලින් ලෝකය දැකීමය.

**විවෘත වූ දොරටු**

මනුෂ්‍යයෝ සමහර දේශයන් ශුභාරංචියට විවර නොවූ දේශයන් ලෙසට දකිති. කිසියම් දේශයක් ශුභාරංචියට "විවර නොවූ" ලෙසට හඳුන්වන කල එයින් වැටහෙනුයේ සාමාන්‍යයෙන් එම රටෙහි

රජය ක්‍රිස්තියානි ධර්මදූත සේවකයන් (මිෂනාරිවරු) පිළිනොගන්නා බවත්, එම රටෙහි සීමා ඇතුලත ශුභාරංචිය ව්‍යාප්තවීම වළක්වාලන බවත්ය.

එනමුත් දෙවියන්වහන්සේ විසින් පිළිගෙන ඇති සීමාවන් කිසිවක් නොමැත. උන්වහන්සේ දකින "විවර නොවූ දොරටු" කිසිවක් නැත. සමහර රටවලින් මිෂනාරි සේවය සඳහා තම රට තුළ ශුභාරංචිය දේශනා කිරීමටත්, ව්‍යාප්ත කිරීමටත් රටට ඇතුළුවීමට වීසා බලපත්‍ර නිකුත් නොකරන බව සැබෑවකි.

එනමුත් කිසියම් දේශයක "ඉදිරිපස දොරටුව" වැසී ඇති අවස්ථාවලදී සැමවිටම "පසු පස දොරටුව" විවරව පවතී. ශුභාරංචියට වැසී ඇති රටවල් පාසැල්, ආරෝග්‍යශාලා කෘෂිකාර්මික ව්‍යපෘති ගොඩ නැඟීමට  කණ්ඩායම් රටට ඇතුළු වෙති. ඔවුහු රටෙහි ජීවත් වන අතරතුර ශුභාරංචිය බෙදා ගනිති.

තවත් ඇදහිලිවන්තයෝ ගුරුවරුන්, වෛද්‍ය වෘත්තිකයන්, භාෂා සාහිත්‍ය උපදේශකයන්, ලෙසට රටවලට ඇතුළු වෙති. නූතන සංනිවේදන මෙවලම්  උපාංග භාවිතයෙන් වැසුනු සීමා මායිම් පසු කරමින් ශුභාරංචිය විකාශනය වේ. ජාත්‍යන්තර යාච්ඤාවේ මැදිහත් කරුවෝ කණ්ඩායම් යාච්ඤාව තුළින් මුළු ලොවම ග්‍රහණය කර ගනිති.

"විවර නොවූ" දොරටු ඇති දේශයන් තුළ, ස්වදේශීය ඇදහිලිවන්තයෝ රහස් අප්‍රසිද්ධ ශුභාරංචි ජාල මඟින් තම දේශය පුරා ශුභාරංචිය පැතිරවීමේ වගකීම දරති. ඔබගේ වගකීම පැහැර හැරීමට ඔය කියන "විවර නොවූ" රටවල් නිසා ඉඩ හැරිය නොහැක. අස්වැන්න වලකාලීමට රජයට නොහැකිය. දේශපාලන නායකයින් ඔබගේ සතුරෝ නොවෙති.,

ඔබ වඩා සැලකිලිමත් විය යුත්තේ දෙවියන්වහන්සේගේ විශ්ව පතල පරමාර්ථයට එරෙහි වන මෙම කරුණ පිටුපස ඇති බලපරාක්‍රමයන් හා බලවේගයන් පිළිබඳවය.

> **මන්ද, අපගේ සටන, මිනිස් සතුරන්ට විරුද්ධව නොව, භූතාධිපතීන්ට ද, බලධාරීන්ට ද  මේ අඳුරු යුගයේ විශ්ව අධිකාරීන්ට ද ග්‍රහ තාරකා පාලනය කරන සකල දුෂ්ට බලවේගයන්ට ද විරුද්ධවය. (එපීස 6:12)**

සීමා රහිත ලොවක් ගැන ගැන දර්ශන අල්ලාගන්න. පැසී ඇති කුඹුරු දෙස බලන්න. යේසුස්වහන්සේ කළ අයුරින් නගර උදෙසා වැළපෙන්න. දෙවියන් වහන්සේගේ දෑසින් ලොව දකින්න. ලෝකයේ අත්තිවාරමෙහි පටන් උන්වහන්සේගේ දර්ශනය විශ්ව පතල විය, පරමාර්ථය සදාකාලිකය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

________________________________________________________

________________________________________________________

________________________________________________________

2. තවදුරටත් ශුභාරංචිය ගෙන යා යුතුයැයි ගණන් බලා ඇති ජන සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද?

________________________________________________________

3. දළ වශයෙන් තවමත් බයිබලිය පරිවර්තනය වී නැති භාෂා කණ්ඩායම් කියක් ඇතිද?

________________________________________________________

4. "දෙවියන් වහන්සේගේ දෑසින් ලොව දැකීම" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

________________________________________________________

5. දෙවියන්වහන්සේත් මිනිසාත් අතර මැදිහත් කරුවෙකු ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අවශ්‍ය වීමට හේතුව කුමක්ද? ____________________________________

6. පහත සඳහන් ප්‍රකාශන ඉදිරියේ සත්‍යය නම් සු යන්න ද අසත්‍ය නම් අ යන්න ද සලකුණු කරන්න.

   අ. වැසුනු රටවලට ශුභාරංචිය ගෙන ගිය නොහැක. ____________________

   ආ. ශුභාරංචිය පතල කිරීමට එරෙහිව අපට සටන් කිරීමට සිටින ප්‍රධාන සතුරන් නම් ජාතීන් පාලනය කරන රජයන්ය. ____________________

   ඇ. ලෝකය නම් කෙතෙහි අස්වැන්න නෙලීමට, නෙලන අයගේ හිඟයක් ඇතිවිය හැකි කියා යේසුස් වහන්සේ පැවසූ සේක. ____________________

7. "ලෝක කිතුණුවෙකු" යන්නෙහි අරුත කුමක්ද?

________________________________________________________

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

යෙසායා 6:1-9 සඳහන් යෙසායාගේ දර්ශනය කියවන්න.

**එය...**

- ඉහලට යොමු වූ දර්ශනයකි (උස) : ඔහු ස්වාමින්වහන්සේ දුටුවේය.
- අභ්‍යන්තරයට යොමු වූ දර්ශනයකි (ගැඹුර) : ඔහු තමාගේ ආත්මික තත්වයත් තමා සිටින අයුරින්ම දුටුවේය.
- බාහිරයට යොමුවූ දර්ශනයකි (පළල) : ඔහු ලෝකය දුටුවේය.

**එම දර්ශනය තව දුරටත්...**

- ශුද්ධවූ එකකි : ස්වාමින් වහන්සේගේ ශුද්ධභාවය
- විනාශයේ එකකි : "මට විනාශය විය" (අපවිත්‍රය)
- බලාපොරොත්තු සුන්වූ :"අප උදෙසා යන්නේ කවුද?"

**මෙම ප්‍රධාන වචන සලකා බලන්න...**

දුක්වේ : පාපොච්චාරණයේ වචනයක් (5 පදය).
බලව : පවිත්‍ර කිරීමේ වචනයක් (7 පදය).
ගොස් : අණ දීමේ වචනයක් (9 පදය).
පිළිබඳව අවධාරණය විය.

**දෙවන කොටස : සංකල්පමය බිහිවීම.**

**දර්ශනය පසුපස පවතින පරමාර්ථයේ සංකල්පය අවබෝධ කරගැනීම**

# හතරවන පරිච්ඡේදය

## වචනයෙහි සඳහන් ලෝකය

**අරමුණු**

මෙම පරිච්ඡේදය අවසානයෙහි ඔබට කළ හැකි දේ:

- කාලයෙහි මුලාරම්භයේ පටන් අරමුණු කරගෙන තිබූ පරිදි ලොවෙහි ජාතීන් උදෙසා දෙවියන්වහන්සේගේ සැලසුම පැහැදිලි කිරීමට
- බයිබලයෙහි උත්පත්ති පොතේ සිට එළිදරව් පොත දක්වා එළිදරව් වී ඇති මෙම දර්ශනය ක්‍රමානුකුලව පෙන්වා දීමට

**ප්‍රධාන පදය**

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

**හැඳින්වීම**

මෙම පාඨමාලාවෙහි පළමු කොටසෙහිදි "ආත්මික අස්වැන්න සඳහා උපක්‍රම" වල පළමු පියවර ඉදිරිපත් කළෙමු. එහිදි දර්ශනය හඳුනාගැනීම උදෙසා "සිතින් මවාගැනීම" සම්බන්ධව ක්‍රියා කළෙමු. එම පරිච්ඡේදවලදි දර්ශනයක බිහිවීම, දර්ශනයක හඳුනාගැනීම හා දෙවියන්වහන්සේගේ දෑසින් ලෝකය දැකීම යන කරුණු අධ්‍යයනය කළෙමු.

මෙම පරිච්ඡේදයේදි "සංකල්පමය බිහිවීම" එනම් "ආත්මික අස්වැන්න සඳහා උපක්‍රම" දෙවන පියවර පිළිබඳව සාකච්ඡා කරමු. අස්වැන්න පිළිබඳ දර්ශනයෙහි පරමාර්ථය සඳහා සංකල්පය ඉදිරිපත් කරයි. දෙවියන්වහන්සේගේ වචනයේ ලෝකය ඒකාබද්ධ කරන තේමාව තුළින් උන්වහන්සේගේ සමස්ත පරමාර්ථය හෙළිදරව් කෙරේ.

**දෙවියන්වහන්සේගේ පරමාර්ථය**

ලොව ආරම්භයේ පටන් දෙවියන්වහන්සේ සතුව දිව්‍යමය පරමාර්ථයක් මිනිසා උදෙසා පැවතුනි. උන්වහන්සේ මිනිස් වර්ගයා සමග සම්බන්ධතාවය, පොරොන්දු හා අනාගතකිම් සියල්ල එම පරමාර්ථය මත පදනම් කරගත් සේක.

දෙවියන්වහන්සේ තම පරමාර්ථය ඇදහිලිවතුන් හට එළිදරව් කර දී තිබේ.

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

කාලයේ ආරම්භයේ සිට දෙවියන්වහන්සේගේ පරමාර්ථයව පැවතියේ මුළු සගයත් මුළු පොළොවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඒකාබද්ධ කිරීමය. එතුමාගේ දර්ශනය ස්වභාවයෙන් සමස්ත වන අතර.......

> **ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවනසේක. නුමුත් සියල්ලන්ම පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමැතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක.** (2 පේතෘස් 3:9)

දෙවියන්වහන්සේගේ පරමාර්ථය නම් ලෝකයට ගැළවීම ලබා දීමය. එය දෙවියන් වහන්සේගේ පරමාර්ථය බැවින් අපගේද පරමාර්ථය විය යුතුය. අපි එතුමාගේ සමස්ත කාරණාව අපගේ ප්‍රමුඛතාවයක් කරගත යුතුය.

ලෝකයෙහි බොහෝ අවශ්‍යතාවයන් පවති. ඉන් සමහරක් වනුයේ කුසගින්න, දිළිඳුභාවය, රෝගිබව, සමාජ අසාධාරණය යනාදියයි. සම්ප්‍රදායික ධර්මදූත සේවා මේ සියලු අංශයන් සමග ක්‍රියා කළහ. එය කළ යුතු වුවකි. මන්ද දේව වචනය එවැනි දෑ පිළිබඳව සැලකිමට උගන්වයි.

එනමුත් අස්වැන්න නෙලීමේ දර්ශනය, එනම් දේව රාජ්‍යයට ස්ත්‍රී, පුරුෂයන් දිනා ගැනීම එහි ප්‍රමුඛතාවය බවට පත්විය යුතුය. වගකීමෙන් යුත් ඇදහිලිවතුන්ගෙන් සමන්විත වූ ප්‍රජාවන් පිහිට වූ කල, අන් සියලු අවශ්‍යතා සපිරෙනු ඇත.

ධර්මදූත සේවාවන් වලට නොයෙක් මාදිලියේ මිනිස් අවශ්‍යතා සැපිරීම පැවරී තිබේ. එහෙත් මේ සියල්ලට ඉහලින් අස්වැන්නේ දර්ශනය, එනම් විනාශ වී සිටින ගැහැණු පිරිමි ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනාගැනීම දෙවියන් වහන්සේට මෙන්ම අපට ද ප්‍රමුඛතම පරමාර්ථය බවට පත්විය යුතුය.

## පරණ ගිවිසුම

දෙවියන්වහන්සේගේ පරමාර්ථය උත්පත්ති පොතේ සිට එළිදරව් පොත දක්වා මං සලකුණු සහිතව දිගහැරුණු පාර සොයා ගත හැක. උන්වහන්සේගේ වචනය, මෙම පරමාර්ථය ඉටු කිරීම සඳහා දේශයන් සමගත් පුද්ගලයන් සමගත් ක්‍රියා කළ ආකාරය පිළිබඳ ඉතිහාසය වේ.

දෙවියන්වහන්සේ මුලින්ම ආදම් සහ ඒවට කතා කොට...

> **නුඹලා බෝවී, වැඩෙමින් පොළොව පූර්ණකොට ඒක යටත් කරගනිව්...** (උත්පත්ති 1:28)

යයි පැවසූ කල මහා නියෝගය ප්‍රථම වතාවට ප්‍රකාශ විය.

ආදම් සහ ඒව ඔවුන් වාගේම පරම්පරාවක් බිහිකොට පොළොව ජනාවාස කිරීමට නියමව සිටියහ. දෙවියන්වහන්සේගේම ස්වරූපයෙන් මවන ලද, ජීවමාන දෙවියන්වහන්සේ සමග සහභාගිකම දැරූ ජීවමාන ප්‍රාණ වේ. ශාරීරිකව ඔව්හු දරුවන් බිහි කළ යුතු විය. ආත්මිකව ඔව්හු ඇදහිලිවතුන් බිහි කළ යුතුව තිබුණි..

පසු කලෙක දෙවියන්වහන්සේ ආබ්‍රහම් සමග සදාකාලික ගිවිසුමකට පිවිසි සේක. මෙම ගිවිසුම සමස්ත ස්වභාවයක් දැරීය. මන්ද දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට කතාකොට ඃ

> **මාගේ ශබ්දයට නුඹ කීකරුවූ නිසා නුඹේ වංශය කරණකොටගෙන පොළොවේ සියලු ජාතිහු ආශිර්වාද ලබන්නෝය කියා මා ගැනම දිවුළෙමියි ස්වාමින්වහන්සේ කියනසේකැයි කීයේය.** (උත් 22:18)
>
> **නුඹේ වංශය පොළොවේ ධූලි මෙන් වැඩිවන්නේය. නුඹ බස්නාහිර දෙසට ද නැගෙනහිර දෙසට ද උතුරු දෙසට ද දකුණු දෙසට ද පැතිර යන්නෙහිය. පොළොවේ සියලු ගෝත්‍රයෝ නුඹ සහ නුඹේ වංශය කරණකොටගෙන ආශිර්වාද ලබන්නෝය.** (උත් 28:14)

ආබ්‍රහම්ගෙන් ඉශ්‍රායෙල් ජාතිය ඇතිවිය. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය අවට වෙසෙන ජාතීන්ට සාක්ෂියක් ලෙස භාවිත කළසේක. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය තුළින් තමන්වහන්සේ එළිදරව් කළ බැවින් ඔවුන් කරණකොටගෙන පොළොවේ ජාතිහු ආශිර්වාද ලැබුවෝය.

මිසරයෙහි වසංගත කාලයෙහිදී දෙවියන්වහන්සේ පාරාවෝට පැවසුවේ දෙවියන් වහන්සේ සියල්ලන්ට ඉහලින් සිටින බව පෙන්වීමට විනිශ්චය එවූ බවය,

**මක්නිසාද මුළු පොළොවෙහි මා සමාන කෙනෙක් නැති බව නුඹ දැනගන්නා පිණිස මේ වතාවේ නුඹේ සිතටත් නුඹේ සේවකයන් පිටටත් නුඹේ සෙනඟ පිටටත් මාගේ සියලු පීඩාවන් පමුණුවන්නෙමි. (නික්මයාම 9:14)**

ඉශ්‍රායෙල් ජනතාව යෝර්දාන් නදිය දෙගොඩගලා තිබීම අභියෝගයක් වූ කල, පොළොවේ සියලු වැසියන් උන්වහන්සේගේ හස්තය දකින පිණිස උන්වහන්සේ නදියේ ජලය වියලවා දැමූ සේක.

**නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ අප රතු මුහුදෙන් මෙතර වෙන තුරු එහි ජලය අප ඉදිරියෙන් හින්දවා දැමුවාක් මෙන් නුඹලා මෙතෙර වන තුරු නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ යෝර්දානේ ජලය නුඹලා ඉදිරියෙනුත් හින්දවා දැමූසේක කියා දන්වාපල්ලායයි කීවේය. (යෝෂුවා 4:24)**

දාවිත් ගොලියත්ව යුද්ධ බිමෙහි හමුවූ කල, පොළොවේ සියල්ලන්ම දෙවි කෙනෙකු සිටින බව දැනගන්නා පිණිස උන්වහන්සේ මට ජය දෙන බව දනිමියි දාවිත් පැවසිය.

**අද දවසේ ස්වාමින්වහන්සේ තා මා අතට පාවාදෙනසේක. මම තට ගසා, තාගේ හිස කපාදමා, පිලිස්තිවරුන්ගේ සේනාවේ මළකඳන් අද දවසේ ආකාශයේ පක්ෂීන්ට ද පොළොවේ වන මෘගයන්ට ද දෙන්නෙමි. මෙසේ ඉශ්‍රායෙල් කෙරෙහි දෙවිකෙනෙක් ඉන්න බව පොළොවේ සියල්ලන්ම දැනගන්නවා ඇත. (1 සාමුවෙල් 17:46)**

ඉශ්‍රායෙල් ජාතිය පිහිටුවීමෙන් අනතුරුව සාලමොන් , දෙවියන්වහන්සේගේ සමස්ත පරමාර්ථයේ දර්ශනය වටහාගෙන මෙසේ පැවසීය.

**ඔබගේ සෙනඟවූ ඉශ්‍රායෙල් මෙන් පොළොවේ සියලු සෙනඟ විසිනුත් ඔබගේ නාමය ඇඳිනගන ඔබ කෙරෙහි භයවන පිණිසද, මා විසින් ගොඩනැගුවාවූ මේ ගෘහයට ඔබගේ නම තබා තිබෙන බව දැනගන්න පිණිසද, ඔබගේ වාසස්ථානය වන ස්වර්ගයෙහි සිට අසා, විදේශියා ඔබට කරන මුළු කන්නලව්ව ලෙස ඔහුට කළ මැනව.**
(1 රාජාවලිය 8:43)

දාවිත් ලෝකයෙහි වෙසෙන ජාතින්ගෙන් සමන්විත ලෝක අස්වැන්න වෙත කැඳවීමක් නිකුත් කරමින් මෙලෙස පැවසිය:

**උන්වහන්සේගේ මහිමය ජාතීන් අතරේද උන්වහන්සේගේ ආශ්චර්ය ක්‍රියා සියලු මනුෂ්‍ය වර්ගයන් අතරේද ප්‍රකාශ කරව්.**

**ස්වාමින්වහන්සේ රජකම්කරනසේක කියාත්, නොසෙලවෙන ලෙස ලෝකය පිහිටා තිබේය කියාත්, උන්වහන්සේ මනුෂ්‍ය වර්ගයන් සාධාරණකමින් විනිශ්චයකරනසේක කියාත් ජාතීන් අතරේ කියව්. (ගීතා 96:3, 10)**

පැරණි ගිවිසුමෙහි අනාගතවක්තෘවරු දෙදෙනෙක් වන දානියෙල් හා යෝනා සංස්කෘතිකමය කලාප දෙකක සේවයෙහි නිරත විය. එහි අරුත නම් තමුන්ගේම ජාතියෙන් බැහැර වූ වෙනත් ජාතීන් වෙත ඔව්හු ශුභාරංචිය රැගෙන ගිය බවය.

දානියෙල් බබිලෝනියෙහි රාජකාරි කරන අතරතුර දෙවියන්වහන්සේ උදෙසා සාක්ෂිකරුවෙකු විය. යෝනා, නිනිවය උදෙසා ධර්මදූතවරයෙක් විය.

ඉශ්‍රායෙල් වනාහී ජාතීන් මධ්‍යයෙහි දෙවියන්වහන්සේගේ සාක්ෂිය බව යෙසායා ප්‍රකාශ කළේය.

**සියලු ජාතිහු එකට රැස්වෙත්වා, ජනයෝද එකතුවෙත්වා. ඔවුන්ගෙන් කවුරු මෙය දන්වා පළමු දේවල් අපට ප්‍රකාශකරනවා ඇද්ද? ඔව්හු තමුන්ගේ සාක්ෂිකාරයන් ගෙනැවිත් තමුන් ධර්මිෂ්ඨ බව පෙන්වත්වා, නැත්නම් ඔව්හු අසා: ඒක සැබෑයයි කියත්වා. මම ඒ තැනන්වහන්සේ බව නුඹලා දැනගන මා විශ්වාසකර තේරුම්ගන්න පිණිස, නුඹලා මාගේ සාක්ෂිකාරයෝව, මා විසින් තෝරාගත් මාගේ මෙහෙකරුවාව සිටින්නහුයයි ස්වාමින්වහන්සේ**

**කියනසේක. මා සිටින්ට පළමුවෙන් කිසි දෙවිකෙනෙක් සාදනු ලැබුවේ නැත, මට පසුව සිටින්නෙත් නැත. මම, මමම, ස්වාමින්වහන්සේය: මා හැර වෙන ගැළවුම්කාරයෙක් නැත. මමම දැන්වීම්, මමම ගැළවීම්, මමම ප්‍රකාශකෙළෙම්, අන් දෙවිකෙනෙක් නුඹලා අතරේ සිටියේ නැත. එබැවින් නුඹලා මාගේ සාක්ෂිකාරයෝය, මම දෙවියන්වහන්සේයයි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙසායා 43:9-12)**

මුළු පැරණි ගිවිසුමම, ලෝකයෙහි අනෙකුත් ජාතීන් වෙතට සාක්ෂියක් ලෙස ඉශ්‍රායෙල් ජාතිය දෙවියන්වහන්සේ පාවිච්චි කළ ආකාරය පිළිබඳ ඉතිහාසය වේ.

පරණ ගිවිසුම දෙවියන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය එනම් පුද්ගලයන් හා ජාතීන් සත්‍ය වූ ජීවමාන වූ දෙවියන්වහන්සේව දැනගැනීමකට ගෙන ඒමට ක්‍රියා කළ ආකාරය පිළිබිඹු කරදෙයි.

**අලුත් ගිවිසුම**

පරණ ගිවිසුම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීමෙන් සම්පූර්ණ වූ දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටු කිරීම සඳහා මග සූදානම් කළේය. අලුත් ගිවිසුම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත හා පරමාර්ථය ඉෂ්ට කරමින් කළාවූ මෙහෙය වාර්තා කරයි. යේසුස්වහන්සේ තම ගෝලයන් හට අස්වැන්න පිළිබඳ දර්ශනය මඟින් අභියෝග කළ අවස්ථාවෙහි මෙලෙස පැවසූ සේක.

**යේසුස්වහන්සේද: මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්තකොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. (යොහන් 4:34)**

යේසුස්වහන්සේගේ මුළු ජීවිතයම දෙවියන්වහන්සේ වෙතට මනුෂ්‍යයන් දිනාගැනීම උදෙසා කැප කළ සේක, ලෝකය නමැති කෙත වෙත පිවිසීම එතුමාගේ ජීවිතයෙහි පරමාර්ථය විය,

**නුමුත් උන්වහන්සේ: මා විසින් අනික් නුවරවලත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ යහපත් ආරංචිය දේශනාකරන්ට ඕනෑය. මක්නිසාද ඒ පිණිස එවනලද්දෙමියි ඔවුන්ට කීසේක.(ලූක් 4:43)**

යේසුස්වහන්සේ නැවත ස්වර්ගයට ගිය කල, අපහට මහා නියෝගයක් භාරදී ගිය සේක. ආත්මික අස්වැන්න පිළිබඳ දර්ශනයෙහි කාර්යභාරය එය වේ. අලුත් ගිවිසුමෙහි ස්ථාන පහක මෙය වාර්තා වී තිබේ.

**යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක. (මතෙව් 28:18-20)**

**උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. අදහන්නාවූ බව්තිස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය. නුමුත් අදහා නොගන්නා තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය. අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය. අන් භාෂාවලින් කථාකරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය. යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය. ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක් 16:15-18)**

**එවිට උන්වහන්සේ ඔවුන්ට ලියවිලි වැටහෙන පිණිස ඔවුන්ගේ සිත් පහදවා, ඔවුන්ට කියනසේක්: මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. නුඹලා මේ දේවලට සාක්ෂිකාරයෝය. බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක. (ලූක් 24:45-49)**

**යේසුස්වහන්සේ: නුඹලාට සමාදානය වේවයි නැවතත් ඔවුන්ට කියා-පියාණන්වහන්සේ මා එවූවාක්මෙන්ම මමත් නුඹලා යවමියි කීසේක. (යොහන් 20:21)**

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

ඇදහිලිවතුන් ලෙස දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටු කිරීම දැන් අපගේ වගකීම වේ. දැන් අපි ලෝකයා වෙතට උන්වහන්සේගේ සාක්‍ෂිකාරයෝ වෙමු.

ක්‍රියා පොතෙහි සභාවෙහි මුලාරම්භය හා මුල්කාලීන සභා ජීවිතය පිළිබඳව වාර්තා කරයි. එහි මධ්‍ය කේන්ද්‍රීය තේමාව වූයේ "ඔබ මාගේ සාක්‍ෂිකරුවෝ වන්නාහුය" (ක්‍රියා 1:8) යන වාක්‍යාංශයයි. මුළු ක්‍රියා පොත පුරාවට සාක්‍ෂිදැරීමේ ව්‍යාප්ත වීමේ රටාව දැකිය හැකිය.

යුදෙව්වන්ට සාක්ෂි දැරීම : ක්‍රියා 1:1-8:3
යුදෙව්වන්ට හා අන්‍යජාතීන්ට සාක්ෂි දැරීම : ක්‍රියා 8:4-12:25
අන්‍යජාතීන්ට සාක්ෂිදැරීම : ක්‍රියා 13:1-28:31

මුල් සභාව බිහි වූයේ මහත් වූ බලයක් විදහා දක්වමිනි. එය ක්‍රියා 2හි වාර්තා වේ. දෙවියන්වහන්සේ නව ශරීරයක් එනම් සභාවක් ලෙසට එකමුතු වූ ජන කොටසක් ගොඩ නගා එමගින් මුළු ලොව පුරා ජාතීන්ට උන්වහන්සේගේ සාක්ෂිය පැතිරවීමේ ක්‍රියා දාමය ඇරඹූ සේක.

**සියල්ල මැවූවාවූ දෙවියන්වහන්සේ තුළ සියලු කාලවල පටන් සැඟවී තිබුණාවූ රහසේ නියමය කිමෙක්ද කියා සියල්ලන්ට පෙන්වන පිණිසත්ය.**
**එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රායකරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයටය. (එපීස 3:9-10)**

දෙවියන්වහන්සේගේ පරමාර්ථය වනුයේ සභාව තුළින් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙන සැපයූ මිදීමේ සැලැස්ම මුළු ලොව පුරා දැන ගන්නට සැලැස්වීමය.

අලුත් ගිවිසුමේ යැවුම් පත්‍රවල සභා සාමාජිකයන්ගේ තත්වය, නිලය, වරප්‍රසාද හා වගකීම් පැහැදිලි කර දෙයි. ඉතා ක්‍රමානුකූල වූ සභාවක් තම ඉගැන්වීම් පැහැදිලිව ප්‍රකාශ කිරීමට (ඉගැන්වීමට) පමණක් නොව දෙවියන් වහන්සේගේ බලය විදහා දැක්වීමට ද (පෙන්වීමට) සමත් ලෝකයෙහි අස්වැන්න නෙලා ගැනීමට සමත් කම්කරු පිරිසක් සපයනු ඇත.

එළිදරව් 1-3 දක්වා යොහන් වාර්තා කරනුයේ පළමුවන සියවස අවසානයෙහි ප්‍රාදේශීය සභා සතක පැවති තත්වයයි. මෙම වාර්තාවට අනුව අප හට පෙන්තකොස්ත දවසට පසු පරම්පරා දෙකකට පසුව සභාවේ තත්වය දැක බලා ගත හැකිය.

සමහර සභාවලට ඔවුන්ගේ පරමාර්ථය අමතක වී ගොස්ය. සමහරු ආත්මිකව ශීතලවී බෙලහීනවී සිටියහ. මෙම සභාවලින් පිළිබිඹු වූ තත්වය කුමක් වුවද දෙවියන් වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය වෙනස් නොවී පවතී.

**මෙන්න, මම දොර ළඟ සිට තට්ටුකරමි, යමෙක් මාගේ හඬ අසා දොර ඇරියොත්, ඔහු වෙතට ඇතුල්ව, ඔහු සමඟ කෑම කන්නෙමි, ඔහුද මා සමඟ කන්නේය. (එළිදරව් 3:20)**

ඕනෑම මනුෂ්‍යයෙක් ... ඕනෑම දේශයකින්, ඕනෑම භාෂාවක් කතා කරන, ඕනෑම ගෝත්‍රයකින් පැමිණියහොත් ඔහුට දෙවියන්වහන්සේ එළිදරව් වන සේක. ලෝකයේ ආරම්භයේ සිට එතුමාගේ පරමාර්ථය වෙනස් නොවී පවතී.[1]

[1] හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනය "බයිබලීය ලෝක දැක්මක් ගොඩනැගීම" නම් පාඩම් මාලාවක් ඉදිරිපත් කර තිබේ. එමගින් ලෝකයේ ජාතීන් උදෙසා දෙවියන්වහන්සේගේ පරමාර්ථය දේව වචනයෙහි පෙන්නුම් කර දී ඇති පරිදි විස්තර කෙරෙයි.

## ස්වයං පරීක්‍ෂණය

1. මතකයෙන් ප්‍රධාන පදය ලියන්න.

________________________________________________

________________________________________________

________________________________________________

________________________________________________

2. පහත සඳහන් ප්‍රකාශන සත්‍යය නම් සු යන්න ද අසත්‍ය නම් අ යන්න ද ඉදිරියෙන් ලියන්න.

   අ. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය මිනිසාට එළිදරව් කර නැත. ____________________

   ආ. දෙවියන්වහන්සේගේ පරමාර්ථය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ල ඒකාබද්ධව කරවීමය. ____________________

   ඇ. පරණ ගිවිසුම් වාර්තා වලට අනුව දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය ලෝකයෙහි අනෙකුත් ජාතින්ට සාක්‍ෂියක් ලෙස භාවිත කළ සේක. ____________________

   ඈ. අලුත් ගිවිසුමෙහි සභාව නම්, දෙවියන්වහන්සේ තම ශුභාරංචිය ලොවට ව්‍යාප්ත කිරීමට යොදාගැනීමට ආශාවන ජන කණ්ඩායමය. ____________________

3. දෙවියන් වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය කුමක්ද? ඔබගේ පිළිතුර තහවුරු කිරීමට එක් බයිබල් පදයක්වත් සඳහන් කරන්න.

________________________________________________

________________________________________________

________________________________________________

__________________________ බයිබල් පදය :____________________

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ආසියාවෙහි ඇති සභා සතට දෙවියන්වහන්සේගේ පණිවුඩය ඇතුළත් වන එළිදරව් 1-3 පරිච්ඡේද අධ්‍යයනය කරන්න.

   මෙම සභාවල පැවති දෙවියන්වහන්සේ පැසසුමට ලක් කළ චරිත ගුණාංග පිළිබඳ ලේඛණයක් සාදන්න. මෙම ගුණාංග සභාවලට ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට උපකාරී වූයේ කෙලෙසද?

   එම සභාවල පැවති ලෙසට දෙවියන්වහන්සේ හඳුනාගත් ගැටලුවල ලැයිස්තුවක් සාදන්න. මෙම ගුණාංග ලෝකයේ ජාතීන් උදෙසා එම සභාවන් තම පරමාර්ථය වන සාක්ෂියක්වීම වළකාලීමට හේතු වූයේ කෙලෙසද?

2. දේව වචනයෙහි සඳහන් ලෝකය පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීම දිගටම කරන්න. ඊළඟ වසර පුරා දෙවියන්වහන්සේගේ සමස්ත පරමාර්ථය සිතෙහි දරාගෙන මුළු බයිබලයම කියවන්න.

   දෙවියන්වහන්සේ ලෝකයෙහි ජාතීන් සමඟ ක්‍රියාකළ ආකාරය දක්වන බයිබල් පද හඳුනාගන්න. ඔබගේ බයිබලයෙහි මෙම පද සලකුණු කිරීමට විශේෂ පාට පෑනක් හෝ පැන්සලක් භාවිත කරන්න.

   ඔබට එම පද හඳුනාගැනිමට පහසු වන්නාවූ බැලිය යුතු වචන කිහිපයක් නම්,

   - පොළොව
   - ලෝකය
   - ජාතිය හෝ ජාතීන්
   - අන්‍යජාතීන් (ඉශ්‍රායෙල් හැර ලොවේ අන් සියලු ජාතීන්)
   - මිථ්‍යාදෘෂ්ටිකයින්

**තුන්වන කොටස: අරමුණු නංවාලීම**

**දර්ශනය සම්පූර්ණ කිරීම සඳහා අරමුණු**

# පස්වන පරිච්ඡේදය

## මළ බැඳුනු දැකැති, හිස් කුඹුරු

**අරමුණු:**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කළ පසු ඔබහට කළ හැකි දේ:

- ස්වභාවික ලෝකයෙහි අස්වැන්නට බාධාකරන කරුණු හඳුනාගැනීමට
- මෙම ස්වභාවික ප්‍රතිපත්ති ආත්මික අස්වැන්නට අදාළ කරගැනීම.

**ප්‍රධාන පදය:**

> **නොරැවටෙල්ලා, දෙවියන්වහන්සේට සරදම්කරන්ට කාටවත් බැරිය. මක්නිසාද, මනුෂ්‍යයෙක් තමා වපුරන දේම කපාගන්නේය. ඒ හැටියට තමාගේ මාංසය සඳහා වපුරන්නා මාංසයෙන් කුණුවීම කපාගන්නේය. ආත්මයාණන්වහන්සේ සඳහා වපුරන්නා ආත්මයාණන්වහන්සේගෙන් සදාකාල ජීවනය කපාගන්නේය. (ගලාති 6:7-8)**

### හැඳින්වීම

මෙම අධ්‍යයනයෙහි පළමුවන කොටස අස්වැන්නේ දර්ශනය හඳුන්වා දුනි. දෙවන කොටස දර්ශනය පිටුපස ඇති පරමාර්ථය හඳුන්වා දුනි. තුන්වන කොටසින් "අරමුණු ඉටුකරගැනීම" හඳුන්වා දෙයි. මෙම කොටසෙහි දී "බලාපොරොත්තු" ඉටුකරගැනීමට දර්ශනය සම්පූර්ණ කිරීමට අවශ්‍ය සැලසුම ඉදිරිපත් කරයි.

දුර්වල ආත්මික අස්වැන්නට හේතු මෙම පරිච්ඡේදයෙහි දී විමසා බලයි. යම් කිසි කාර්යයක් නිසියාකාරව කිරීමට දැන සිටීම තරමටම එය නොකළ යුතු ආකාරය දැන සිටීම ද වැදගත්ය.

ඇමරිකා එක්සත් ජනපදයෙහි විසූ සුප්‍රසිද්ධ ගවේෂකයෙකු වූ තෝමස් එඩිසන් විදුලිය ගවේෂණය කිරීම සාර්ථක කරගැනීමට පෙර ඒ පිළිබඳව අසමත් වූ පරීක්ෂණ 1500 ක් පැවැත්විය. මෙම පරීක්ෂණ 1500 පිළිබඳව ඔහුගෙන් විමසූ කල ඔහු පැවසුවේ "ඒවා ඉතා වැදගත්, එයට හේතුව නම් විදුලිය ජනනය නොවන ක්‍රම 1500 ක් මම ඉගෙන ගතිමි" කියාය. මීට පසුව නිෂ්ප්‍රයෝජන ක්‍රම උත්සාහ කරමින් ඔහුට කාලය අපතේ යැවීමට සිදු නොවීය.

ආත්මික අස්වැන්න නෙලීම සඳහා අත්හදා බැලීම ඔබ කළ යුතු නොවේ. දුර්වල අස්වැන්නක් ලැබීමට හේතු මොනවාදැයි දෙවියන්වහන්සේ තම වචනයෙහි හඳුන්වා දී තිබේ. ඔබ මෙම කරුණු අවබෝධ කරගැනීම වැදගත් වන්නේ තවදුරටත් ඔබගේ ආත්මික ප්‍රයත්නයන් අපතේ යැවීමට අවශ්‍ය නොවන බැවිනි. මෙම පාඩමෙහි විෂය මෙය වේ.

ඊළඟ පරිච්ඡේද දෙකෙහි "අස්වැන්න සඳහා උපක්‍රම" පිළිබඳව සලකා බලයි. එහිදී කාර්යක්ෂම ආත්මික අස්වැන්නක් සඳහා ප්‍රතිපත්ති ඉදිරිපත් කරයි. අටවැනි පරිච්ඡේදය "ප්‍රතිඵල නෙලා ගැනීම" වේ. මෙහිදී ආත්මික අස්වැන්න සඳහා ක්‍රම හා ආම්පන්න පිළිබඳව කියැවේ.

### "නම්-නමුත්" ප්‍රතිපත්තිය

දේව වචනයෙහි "නම්-නමුත්" යනුවෙන් හැඳින්වෙන වැදගත් ප්‍රතිපත්තියක් සඳහන් වේ. දෙවියන්වහන්සේ තම ජනතාවට බොහෝ පොරොන්දු දී ඇති අතර ඉන් වැඩි ප්‍රමාණයක් මෙම "නම්-නමුත්" ප්‍රතිපත්තිය මත පදනම් වේ. ද්විතීය කථාව 28 පරිච්ඡේදය මෙම ප්‍රතිපත්තියට කදිම උදාහරණයකි. දෙවියන්වහන්සේ පොරොන්දු දෙමින්:

> **තවද මා විසින් අද නුඹට අණකරන නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ සියලු ආඥා රක්ෂාකරන්ට බලාගන්න ලෙස උන්වහන්සේගේ හඬට ඕනෑකමින් කන්දෙන්නෙහි නම් නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේ පොළොවේ සියලු ජාතීන්ට වඩා නුඹ උසස් කොට තබන සේක. (ද්විතීය කථාව 28:1)**

දෙවියන්වහන්සේගේ ජනතාව එතුමාට සේවය කරන්නේ **නම්** ඔවුන් අත්විඳීමට යන්නාවූ ආශිර්වාද වල ලැයිස්තුවක් මෙම ජේදයෙහි සඳහන් වේ.

> **... නුඹ කෙතෙහි ආශිර්වාද ලද්දෙකි...**
> **... නුඹේ භූමියේ ඵලය ආශිර්වාද ලබනු ඇත...(ද්විතීය කථාව 28:3-4)**

නමුත් 15 පදය අනතුරු අඟවයි.

> **නුමුත් මා විසින් අද නුඹට අණකරන නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ සියලු අඥාද පනත්ද පවත්වන්ට බලාගන්න හැටියට නුඹ උන්වහන්සේගේ හඬට කන්නොදෙන්නෙහි නම්, මේ සියලු ශාප නුඹ පිටට පැමිණ නුඹ අසුකරගන්නේය. (ද්විතීය කථාව 28:15)**

දෙවියන්වහන්සේගේ මාර්ගවලින් හැරී යාමේ ශාප අතර ස්වභාවික ලෝකයෙහි ඉතා අඩු අස්වැන්නක් හිමිවීම නම්කර තිබේ.

> **නුඹ නුවරෙහි ශාපලද්දෙක්ද කෙතෙහි ශාපලද්දෙක්ද වන්නෙහිය.**
> **නුඹේ ගර්භයේ ඵලයටද නුඹේ භූමියේ ඵලයටද නුමේ ගවයන්ගේ බෝවීමටද නුඹේ එළු බැටළු පැටවුන්ට ද ශාප පැමිණෙන්නේය.**
> **නුඹ බොහෝ බිජ කෙතට ගෙනයන නුමුත් ස්වල්පයක්ම රැස්කරගන්නෙහිය. මක්නිසාද පළඟැටියෝ ඒවා කාදමන්නෝය. නුඹ මිදිවතු වවා ඒවා සග්‍රිකකරන නුමුත් පණුවන් ඒවා කාදමන බැවින් නුඹ මුදිකපානය නොබොන්නෙහිය, ඵල නෙළා නොගන්නෙහිය. නුඹේ සියලු සීමාවල ඔලිව ගස් නුඹට තිබෙන නමුත් ඔලිව තෙල් ගාගන්ට නුඹට නොලැබේ. මක්නිසාද නුඹේ ඔලිව ඵල වැටියන්නේය. නුඹ පුත්‍රයන්ද දූවරුන්ද ජාතකකරන නුමුත් ඔව්හු නුඹට නොවන්නෝය. මක්නිසාද ඔව්හු වහල්කමට යන්නෝය. නුඹේ සියලු ගස්ද නුඹේ භූමියේ ඵලද පළඟැටියෝ භුක්තිවිඳින්නෝය.**
> **(ද්විතීය කථාව 28:16, 18, 38-42)**

ද්විතීය කථාවෙහි මෙම පරිච්ඡේදය "නම්-නමුත්" ප්‍රතිපත්තිය මනාව විදහා දක්වයි. දෙවියන්වහන්සේගේ පොරොන්දු අපගේ ප්‍රතිචාර මත කොන්දේසි සහිතව සීමා වේ.

**ස්වභාවික හා ආත්මික සමාන්තරබව**

ස්වභාවික ලෝකයෙහි සරු අස්වැන්නක් ලබාගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති බයිබලයෙහි හෙළිකර දී තිබේ. එම ප්‍රතිපත්ති නිසියාකාරව පිළිනොපැදීම නිසා ඵල කුණුවී යාම හා හිඟවී යාම පිළිබඳව අනතුරු අඟවයි.

මෙම ප්‍රතිපත්ති සැබෑ ලෝකයෙහි ස්වභාවික වැපිරීම හා නෙලීම කෙරෙහි බලපාන ප්‍රතිපත්ති වේ. නමුත් ආත්මිකව ද මෙහි වටිනා සමාන සත්‍යතාවයක් පවතී.

මෙම ප්‍රතිපත්ති අවබෝධ කරගැනීම ලෝකයා වෙතට ශුභාරංචිය රැගෙන පිවිසීම සහ එහි ඵල නෙලාගැනීම කෙරෙහි බලපානු ඇත. එසේම එම ප්‍රතිපත්ති අපගේ එදිනෙදා ජීවිතයෙහි අදාළ කරගැනීමෙහි ප්‍රතිඵලය වනුයේ දෙවියන්වහන්සේගේ ආශිර්වාද එනම්- ආර්ථික, භෞතික, භාණ්ඩමය, චිත්තමය ආශිර්වාද අප සතුවීමය.

## අස්වැන්න කෙරෙහි සාතන්ගේ (ඇල්ම) උනන්දුව

ආත්මික අස්වැන්න පිළිබඳව සාතන්ද උනන්දුවක් දක්වයි. යේසුස්වහන්සේ පේතෘස්ට කථාකොට පැවසුයේ.

**සීමොන්, සීමොන්, බලව නුඹලා ගෝධුම මෙන් පොළන්ට සාතන් ඉල්ලුවේය. (ලූක් 22:31)**

සාතන්ට ඔබගේ ජීවිතයෙහි ඇති සියලු යහපත් දේ පොලා දැමීමට අවශ්‍යව ඇත. එවිට ඉතිරි වන්නේ බොල් පමණකි. ඔබට හොඳ ආත්මික අස්වැන්නක් නෙලීමට සාතන්ට අවශ්‍ය නැත.

ඔබගේ ජීවිතයෙහි අස්වැන්න පොලා දැමීම සඳහා සාතන් භාවිතකරන උපක්‍රම හඳුනාගැනීමට උපකාරවීම සඳහා දෙවියන්වහන්සේ ඔබව ආත්මික අස්වැන්නෙන් වලක්වාලන කාරණ පිළිබඳ අනතුරු ඇඟවූ සේක.

සාර්ථක අස්වැන්න නෙලාගැනීමට උපක්‍රම අදාළ කරගැනීමට නම්, පළමුකොට ඔබගේ ජීවිතයෙන් අස්වැන්න වළක්වා තබන්නාවූ සාධක ඉවත් කළ යුතුය.

මෙම අසුබවාදී සාධක සමඟ ගණුදෙනු කළ යුතුය. එය ස්වභාවික ලෝකයෙහි පැල සිටුවීමට පෙර බිම සකස් කිරීම වැනිය. හොඳ බීජ වැපිරීමට පෙර බිම කොටා පස් පෙරළා කටු, ගල් යනාදිය ඉවත් කළ යුතුය.

## නිසරු අස්වැන්නකට හේතු

නිසරු ආත්මික අස්වැන්නකට හේතු පහත සඳහන් වේ.

**දේව වචනයට අකීකරුවීම:**

දුර්වල ආත්මික අස්වැන්නකට හේතුව ලෙස ද්විතිය කථාවේ 28 පරිච්ඡේදයෙහි සඳහන් වන එක් හේතුවක් නම්, දේව වචනයට අකීකරුවීමය.

දෙවියන්වහන්සේගේ ජනතාව එතුමාගේ අණ පනත් පැවැත්වුවහොත් උන්වහන්සේ ඔවුනට මහත් සරු අස්වැන්නක් පොරොන්දු වූ සේක. නමුත් එසේ නොකළහොත් අස්වැන්න කුණු වී යනු ඇත.

යෙසායා 5 වන පරිච්ඡේදයෙහි දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් මිදිවත්තකට සමාන කරමින් කතා කරන සේක. එතුමාගේ වචනයට අකීකරුවීම තුළින් (13 සහ 20 පද) ඔව්හු ඵල රහිත වූහ. ඔබ දේව වචනයට අකීකරු වූ කල එහි ප්‍රතිඵලය වනුයේ ආත්මික සාගතයයි.

> **බලව, හානියක් එනම් කෑම හානියක්වත් වතුර පිපාසයක්වත් නොව ස්වාමින්වහන්සේගේ වචන ඇසීමේ හානියක්, මා විසින් දේශයට එවන දවස් පැමිණෙන්නේය. එවිට මනුෂ්‍යයෝ ස්වාමින්වහන්සේගේ වචනය සොයන පිණිස මුහුදෙන් මුහුදට ගමන්කරන්නෝය, උතුරේ සිට නැගෙනහිරටද ඔබ මොබ දුවනවා ඇත. නුමුත් ඔවුන්ට සම්බවන්නේ නැත. (ආමොස් 8:11-12)**

**දෙවියන්වහන්සේගේ වචනය අමතක කිරීම:**

දුර්වල අස්වැන්නක් ලැබීමට තවත් හේතුවක් නම් දෙවියන්වහන්සේට ඔබගේ ජීවිතයෙහි නිසි ස්ථානය හිමිකර නොදී එතුමාව අමතක කිරීමය.

> **මක්නිසාද නුඹ නුඹේ ආරක්ෂා පර්වතය සිහිනොකර, නුඹේ ගැළවීමේ දෙවියන්වහන්සේ මතක නැතිකළෙහිය. එබැවින් නුඹ ප්‍රියකරු ගස් පංක්ති හිටවන්නෙහිය. අන්‍ය පැළැටිද එහිම වවන්නෙහිය. නුඹ හිටවන දවසේදී වැට බඳින්නෙහිය, උදය නුඹේ පැළැටි ලියලවන්නෙහිය. එහෙත් ශෝකය සහ තද දුකේ දවසක් පැමිණ අස්වැන්න පහව්යන්නේය. (යෙසායා 17:10-11)**

දෙවියන්වහන්සේ පිළිබඳව දැන සිටීම පමණක් නොසෑහේ. ඔබ එතුමාව දැනගත යුතුය. ඔබ එතුමාගේ ගැළවීමේ සැලසුම පිළිගත යුතුය. ඔබ එතුමාව ඔබගේ ජීවිතයෙහි ස්වාමීන් ලෙසට පිළිගැනීම අවශ්‍ය වේ.

ඔබ දෙවියන්වහන්සේව නිසි ප්‍රකාර පිළිනොගන්නේ නම් උදේ සිට රෑ වන තුරුම දිනපතාම වෙහෙස වුවත් ආත්මික අස්වැන්නක් හිමි නොවනු ඇත. දෙවියන්වහන්සේ අමතක කළාවූ ජනතාවක් හැටියට ඉශ්‍රායෙල් ජාතිය එක් උදාහරණයකි.

> **ඔව්හු උන්වහන්සේගේ ක්‍රියා වහාම සිහිනැතිකරමින්, උන්වහන්සේගේ මන්ත්‍රණය බලානොසිටියෝය. ඔව්හු මිසරයේදී මහත් දේද හාම්ගේ දේශයේදී ආශ්චර්ය ක්‍රියාද කළාවූ ... දෙවියන්වහන්සේ මතකනැති කළෝය. (ගීතාවලිය 106:13, 21)**

මේනිසා ඉශ්‍රායෙල් ස්වභාවිකව මෙන්ම ආත්මිකව ද අස්වැන්නෙහි දුක් වින්දෝය.

දෙවියන්වහන්සේ අමතක කළාවූ බොහෝ දෙනෙකු මෙන් ඉශ්‍රායෙල් තමුන්ට දුර්වල අස්වැන්නක් ලැබීමට හේතුව හඳුනා නොගත්තෝය.

> **ඔවුන් නුඹේ පුත්‍රයන්ද දූවරුන්ද විසින් කන්ට යුතුවූ නුඹේ අස්වැන්නද නුඹේ ආහාරද කා දමනවා ඇත. ඔවුන් නුඹේ බැටළුවන්ද නුඹේ ගවයන්ද කා දමනවා ඇත. නුඹේ මිදිවැල්ද නුඹේ අත්තික්කා ගස්ද කා දමනවා ඇත. නුඹ විශ්වාසකරන නුඹේ බලකොටු නුවරවල් ඔවුන් කඩුවෙන් නටබුන්කරනවා ඇත. එසේවී නුමුත් ඒ දවස්වලදීත් තින්දුවටම නුඹලා නැති නොකරන්නෙමියි ස්වාමින්වහන්සේ කියනසේක. තවද: අපේ දෙවිවූ ස්වාමින්වහන්සේ මේ සියල්ල අපට කළේ මක්නිසාදැයි නුඹලා අසන කල නුඹලා මා අත්හැර නුඹලාගේම දේශයේදී අන්‍ය දෙවිවරුන්ට සේවයකළාක්මෙන්ම නුඹලාට අයිති නැති දේශයකදී නුඹලා අන්‍යයන්ට සේවයකරන්නහුයයි ඔවුන්ට කියාපන්න.**
> **(යෙරමියා 5:17-19)**

ආමොස් තම ලේඛණයෙහි දුර්වල අස්වැන්නක් ලැබීමට හේතුව 4 හා 5 පරිච්ඡේදවල දක්වයි.

> **තවද කපන කාලයට තුන් මසක් තිබෙද්දී මම වැස්ස නුඹලාගෙන් වලක්වාගතිමි. එක නුවරකට වහින්ට සලස්වද්දී තවත් නුවරකට වැස්ස නොදී ඇරියෙමි. එක බිම් කොටසකට වැස්සේය. වැස්ස නොලැබූ කොටස වියළී ගියේය. මම ගොයම් වියළවීමෙන්ද ගොයම් රෝගයෙන්ද නුඹලාට පහරදුනිමි. නුඹලාගේ බොහෝවූ වතුද මිදිවතුද නුඹලාගේ අත්තික්කා ගස්ද ඔලිව ගස්ද පැළෑටි පණුවෝ කෑවෝය. එහෙත් නුඹලා මා වෙතට හැරී නාවහුයයි ස්වාමින්වහන්සේ කියනසේක. (ආමොස් 4:7, 9)**

ආමොස් ගැටලුවට හේතු හඳුනාගන්නවා පමණක් නොව ඊට පිළියම ද ප්‍රකාශ කරයි.

> **එසේය, ස්වාමින්වහන්සේ ඉශ්‍රායෙල් වංශයට මෙසේ කියනසේක. මා සොයාපල්ලා එවිට නුඹලා ජීවත්වන්නහුය. (ආමොස් 5:4)**

**නොගැළපෙන වැපිරීම: (නුසුදුසු):**

දෙවියන්වහන්සේ තම ජනතාවට අනතුරු ඇඟවූයේ:

> **නුඹේ මිදි වත්තේ දෙවර්ගයක බීජ නොවපුරන්න. වැපුරුවොත් එහි පලදාව වන නුඹ වපුරන බීජ සහ මිදි වත්තේ අස්වැන්නද ශුද්ධස්ථානයට අයිතිවන්නේය**
> **(ද්විතීය කථාව 22:9)**

> **මක්නිසාද නුඹ නුඹේ ආරක්ෂා පර්වතය සිහිනොකර, නුඹේ ගැළවීමේ දෙවියන්වහන්සේ මතක නැතිකළෙහිය. එබැවින් නුඹ ප්‍රියකරු ගස් පංක්ති හිටවන්නෙහිය, අන්‍ය පැළෑටිද එහිම වවන්නෙහිය. නුඹ හිටවන දවසේදී වැට බඳින්නෙහිය, උදය නුඹේ පැළෑටි ලියලවන්නෙහිය. එහෙත් ශෝකය සහ තද දුකේ දවසක් පැමිණ අස්වැන්න පහවීයන්නේය. (යෙසායා 17:10-11)**

මෙම පදවල දෙවියන්වහන්සේ "මිශ්‍ර වූ බීජ" සහ "අන්‍ය පැලැටි" (කුඩා පැල වර්ග) පිළිබඳව සඳහන් කරන සේක. බැලූ බැල්මට එම පැලැටි වැඩන සේ පෙන්නුම් වුවද අස්වැන්න නෙලන කල ශාපලත් බව වැටහේ.

අලුත් ගිවිසුමෙහි දේව වචනය "බීජ" ලෙස නම් කෙරේ. ඔබ ඔබගේ ජිවිතයෙහි වපුරන දෙය ආත්මික අස්වැන්නට බලපායි. ඔබ එතුමාගේ වචනය වැපුරුවහොත් මහත් සරු අස්වැන්නක් ඔබට හිමි වනු ඇත.

එනමුත් ඔබ මනුෂ්‍යයාගේ පාරම්පරික ගතානුගතික දෑ, සංවිධානය හෝ නිකායන්, දේව වචනයට වඩා වැදගත් හෝ දේව වචනය හා සම තත්වයෙහි ලා සලකනවා නම් එවිට ඔබ බීජ වර්ග මුසු කරනු ඇත. බොහෝ නිකායන් බැලූ බැල්මට නිරෝගී ආත්මික පැලැටි මෙන් පෙනේ. ඔවුන් සතුව රැස්වීම් පැවැත්වීමට විශාල ගොඩනැගිලි හා මහත් වූ සමාජික සංඛ්‍යාවක් ඇත. එනමුත් ඔවුහු දේව වචනය ඔවුන්ගේ චාරිත්‍ර සමඟ නැත්නම් ඔවුන්ගේම හෙළිදරව් සමඟ මුසු කොට තිබේ. ඔවුන්ගේ ආත්මික අස්වැන්න ශාප ලබා ඇත. මිථ්‍යා මතධාරී බොරු ආගම් බිහිවන්නේ මෙලෙසය. ඔව්හු දේව වචනය නම් බීජ සමඟ ඔවුන්ගේම අදහස් සමග මුසු කරති. අවසානයෙහි අස්වැන්න දුකකි.

මනුෂ්‍යයන්ගේ ජිවිත වල අලුත් ආරම්භයක් ඇති කරන්නාවූ ආත්මික අස්වැන්න ගෙන දිය හැකි දිරාපත් නොවන්නාවූ බීජය නම් දේව වචනයයි.

> **මක්නිසාද නුඹලා කුණුවෙන්නාවූ බීජවලින් නොව දෙවියන්වහන්සේගේ ජිවමානවූ පවතින්නාවූ වචනය කරණකොටගෙන, කුණු නොවෙන්නාවූ බීජවලින් නැවත උත්පාදකරනු ලැබුවහුය. (1 පේතෘස් 1:23)**

**නොසැලකිලිමත්:**

අස්වැන්න නෙලන කාලයෙහි සැතපෙන පුත්‍රයෙකු පිළිබඳව හිතෝපදේශ පොත කතාකරයි.

> **ග්‍රීෂ්ම කාලයෙහි රැස්කරගන්නා ඥාණවන්ත පුත්‍රයෙක්ය. ගොයම් කපන කාලයෙහි නිදන්නා ලජ්ජා ඇතිකරවන පුත්‍රයෙක්ය. (හිතෝපදේශ 10:5)**

අස්වැන්න නෙලන කාලය ඉතා කලබලකාරී කාලයකි. කඩිනමින් අස්වැන්න නෙලා එකතුකර නොගතහොත් එය කුඹුරුවලම කුණු වී යනු ඇත.

ස්වභාවික ලෝකයෙහි බයිබලිය සමයෙහි අස්වැන්න නෙලන කල පවුලේ සියලුම සාමාජිකයෝ එයට උපකාර කළහ. මෙවන් කලක නිදන පුත්‍රයෙකු ඔහුගේ පවුලට වස ලැජ්ජාවක් විය.

අපි යේසුස් ක්‍රිස්තුස් සමිඳුන්ගේ නැවත-පැමිනීමට ඉතා ආසන්න ආත්මික අස්වැන්නේ තීරණාත්මක යුගයක ජිවත් වෙමු. එනමුත් දෙවියන්වහන්සේගේ බොහෝ දරුවෝ තවමත් නින්දේ පසුවෙති. ඔව්හු අස්වැන්න නෙලන කාලයේ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට එකතු වී නොමැත. ඔවුන්ගේ දෑකැති මළකඩ කා කුඹුරු පුරන් වී ගොස් ඇත.

එවැනි නොසැලකිලිමත්කම පිළිබඳව හිතෝපදේශ පොත මෙසේ පවසයි.

> **අලසයාගේ කෙත ළඟින්ද තේරුම් නැත්තාගේ මිදිවත්ත ළඟින්ද ගියෙමි. එහි සෑම තැනම කටුගස් වැවී, මුළුල්ලම කහඹිලියාවලින් වැසී තිබුණේය. ඒකේ ගල් තාප්පයත් කඩා වැටී තිබුණේය. එවිට මම බලා හොඳින් සිතට ගත්තෙමි, මම ඒ දැක ගුරුකම් ලැබීමි. තව ටිකක් නිදාගැනීමක්ය, ටිකක් සැතපීමක්ය. නින්දට ස්වල්ප අත්පොරවාගැන්මක්යයි කියන නුඹට දිළිඳුකම සොරෙකුමෙන්ද, හිඟකම අවිගත් කෙනෙකු මෙන්ද එනවා ඇත. (හිතෝපදේශ 24:30-34)**

නොසැලකිල්ල ආත්මිකව ඵල රහිත බව ගෙන දෙයි.

තමුන්ගේ නොසැලකිලිමත් බව නිසා අස්වැන්න විනාශ කරන්නාවූ නායකයන් පිළිබඳව යෙරමියා ප්‍රකාශ කරයි.

**බොහෝ එඬේරු මාගේ මිදිවත්ත නාස්තිකළෝය. ඔව්හු මාගේ කොටස පාගාදැමුවෝය, මාගේ ප්‍රිය කොටස පාළු කාන්තාරයක් කළෝය. ඔව්හු එය පාළුවක් කළෝය. එය පාළුවක්ව්, මා ඉදිරියෙහි වැලපෙන්නේය, කවුරුවත් සිතට නොගන්න නිසා මුළු දේශය පාළුකරන ලද්දේය. (යෙරමියා 12:10-11)**

නොසැලකිලිමත් නායකයෝ බිහිකරනුයේ ද නොසැලකිලිමත් අනුගාමිකයන් වේ. අස්වැන්න පිළිබඳ දර්ශනය අපගේ නායකයෝ සන්නිවේදනය නොකළහොත් කිසි මනුෂ්‍යයෙකු "සිතට නොගැනීම" නිසා කුඹුරු පාළු වී යනු ඇත.

**ස්වයං-ප්‍රයත්නය:**

ඔබට ඔබගේම උත්සාහයෙන් ආත්මික අස්වැන්න නිපදවිය නොහැක.

**නුඹ හිටවන දවසේදී වැට බඳින්නෙහිය, උදය නුඹේ පැළෑටි ලියලවන්නෙහිය. එහෙත් ශෝකය සහ තද දුකේ දවසක් පැමිණ අස්වැන්න පහවීයන්නේය. (යෙසායා 17:11)**

පළමුවන පරිච්ඡේදයෙහි දී, දෙවියන්වහන්සේ දීමට අගාවන දර්ශනය ස්වයං-උත්සාහයෙන් ඇති කළ නොහැකි බව ඉගෙන ගතිමු. එය පැමිණෙන එකම මාර්ගය නම් ආත්මික අස්වැන්න වලකාලන කාරණා ඉවත් කොට, අස්වැන්න උදෙසා දෙවියන්වහන්සේ සපයා දී ඇති උපක්‍රම භාවිත කිරීම පමණකි.

ස්වයං-ප්‍රයත්නයෙන් යුතුව දුර්වල අස්වැන්නක් නෙලාගැනීම පිළිබඳව හොෂෙයා සඳහන් කරයි. ඉශ්‍රායෙල්වරු තමුන්ගේම මාර්ග සහ ඔවුන්ගේ බලවත් මිනිසුන් කෙරෙහි විශ්වාසය තැබූහ (හොෂෙයා 10:13). ඔබ ඔබගේ මාර්ග, ක්‍රම සහ ඔබගේම "ප්‍රබල මනුෂ්‍යයන්" කෙරෙහි රැඳී සිටිනතුරු ආත්මික අස්වැන්නක් ලබන්ට අසමත් වනු ඇත. ඔබ දෙවියන්වහන්සේගේ කාර්යය දෙවියන්වහන්සේගේ ක්‍රමයට ඉටු කළ යුතුය.

**ශාපලත් ප්‍රජනන ක්‍රියාදාමය**

මනුෂ්‍යයා පාපයට වැටීමෙහි එක් ප්‍රතිඵලයක් නම් ස්වභාවික ලෝකයෙහි ප්‍රජනන ක්‍රියාදාමයට දෙවියන්වහන්සේගේ ශාපය හිමිවීමය. ශෝකයෙන් යුතුව කාන්තාවෝ දරුවන් බිහිකරති. භූමියෙන් කටු, ගොකටු උපදින බැවින් එහි වගා කිරීමට ඵල ඉපැයීමය වැඩි වෙහෙස් දැරිය යුතු වේ (උත්පත්ති 3:16-19). ප්‍රජනන පද්ධතියට මෙම සියලු ශාප හිමිවූයේ පාපයෙහි ප්‍රතිඵලයක් ලෙසටය.

ආත්මික ලෝකයෙහි ඔබ පාපයෙහි ජීවත්වන කල ඔබගේ ආත්මික ප්‍රජනන ක්‍රියාදාමය කෙරෙහි ශාපය පවතී. එම ශාපය ඉවත් කළ හැක්කේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය හේතුකොටගෙන පාපයෙන් නිදහස, එනම් ගැළවීම ලැබීමෙන් පමණකි. ඔබ පාපයෙහි ශාපය යටතේ ජීවත් වනතුරු ආත්මික අස්වැන්නෙහි ආශිර්වාදය හිමි කර ගත නොහැක.

**වටපිටාවෙහි සිදුවන කරුණු සම්බන්ධව:**

ජීවිතයෙහි අවස්ථානුකූලව සිදුවන කාරණා නිසා ආත්මික අස්වැන්න වලක්වාලිය හැක.

**අලසයා ශීත කාලය නිසා හාන්නේ නැත. එහෙයින් ඔහු ගොයම් කපන කාලයේ හිඟාමින් කිසිත් නැතුව සිටියි. (හිතෝපදේශ 20:4)**

**සුළඟ බලාසිටින්නා නොවපුරන්නේය. වලාකුල් බලන්නා කපා නොගන්නේය. (දේශනාකාරයා 11:4)**

ස්වභාවික ලෝකයෙහි ගොවියෙකු සර්වසම්පූර්ණ තත්වයන් එනතෙක් බලාසිටියහොත් කිසිදිනක වපුරන්නේවත් නෙලාගන්නේවත් නැත. අව්ව, වැස්ස, ශීතල, සුළඟ මොනයම් තත්වයකදී වුව ගොවියා තම වගාබිමෙහි වැඩෙහි යෙදෙයි.

ආත්මික ලොවෙහි ඔබ ඉතාමත්ම හොඳ කාලය පැමිණෙනතෙක් බලාසිටියහොත් කිසිදිනක ආත්මික අස්වැන්නේ කෙතට නොපිවිසෙනු ඇත. ඔබගේ ජීවිතයෙහි වටාපිටාව... ඔබගේ ප්‍රශ්න, ඔබගේ ආර්ථික තත්වය, ඔබගේ අධ්‍යාපනය මදිබව ... යනාදී කාරණා පසෙකට දැමිය යුතුය.

**දිගාවකට යොමු නොවූ උත්සාහයන්:**

ඔබගේ මුළු ජීවිත කාලය පුරාම හොඳ වැඩ කරමින් කාර්ය බහුල දිවියක් ගෙවිය හැකි නමුත් දෙවියන්වහන්සේගේ කාර්යය නොකර සිටිය හැක. මෙය වනාහි දිගාවකට යොමු නොවූ ප්‍රයත්නයන් වේ.

> **ඔව්හු සුළඟ වපුරා, සුළි හුළඟ කපාගන්නෝය. ඔවුන්ට ගොයම් නැත. කොළවල කරල් නැත. තිබුණත්, අන්‍ය දේශීන් ඒවා ගිලගන්නවා ඇත. (හොෂෙයා 8:7)**

ජීවිතයෙහි යහපත් වැඩ හා වටිනා වැඩ ඕනෑතරම් තිබේ. ඔබගේ තලෙන්ත හා හැකියාවන් භාවිත කිරීමට ඔබ මනුෂ්‍යයන්ට ඉඩ හැරීයොත් ඔව්හු ඔබව ඔවුන්ගේ වැඩ කරගැනීමට භාවිත කරනු ඇත.

එනමුත් ආත්මික අස්වැන්නක් නෙලාගැනීමට යහපත් ක්‍රියා පමණක් නොසෑහේ. යේසුස්වහන්සේ පැවසුවේ.

> **යේසුස්වහන්සේද: මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්තකොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. (යොහන් 4:34)**

ආත්මික අස්වැන්නකට රහස නම් කඩිමුඩියේ හොඳ වැඩ රාශියක නියැලීමට නොව දෙවියන්වහන්සේගේ වැඩය කිරීමය. ඔබගේ ආත්මික උත්සාහය දෙවියන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය කෙරෙහි යොමු විය යුතුය. එසේ නොවුවහොත් එම උත්සාහයන් සුළඟට ගසාගෙන ගොස් බීජ අපතේ යන්නාවූ ඵල නොදෙන්නාවූ වැපිරීමක් මෙන් වනු ඇත.

**කෘමි උවදුරු සහ රෝග:**

ස්වභාවික ලෝකයෙහි පැලවලට හානිකරන අස්වැන්න විනාශකර දමන කෘමි උවදුරු හා රෝග ඇති වේ. කෘමි හා වල් උවදුරු යනු පැලෑටිවලට බාහිරයෙන් හානි කරන කෘමීන්, පළගැටියන්, වල් පැල යනාදියයි. රෝග, පැලවල අභ්‍යන්තරයට බලපාන මුල් වලට හානිකරන වර්ධන පද්ධතියට හානිකරන දේවල්ය.

ආත්මික ලොවෙහි ඇදහිලිවතුන්ට ද කෘමි උවදුරු හා රෝගවලට මුහුණ දීමට සිදුවේ. සාතන් බාහිරයෙන් ඔබගේ ජීවිතයේ සිදුවීම් ආශ්‍රයෙන් පහර දෙයි. අභ්‍යන්තරයෙන් ඔබගේ මනස තුළින් ඔබගේ කැමැත්ත හා චිත්තයට පහර දෙයි.

මිදි වැල් අතු කපා කප්පාදු කිරීමට ගොවියාට සිදුවේ. මිදි වැල තුළින් පෝෂණය උදුරාගන්නාවූ වැලෙන්ම ඇති වූ අතු මෙහිදී කපා දමනු ලැබේ. මිදි වැල වඩා ඵල දරන පිණිස මෙය සිදු කරයි.

ඇදහිලිවන්තයාගේ ජීවිතයෙහි ද මෙය සිදුකිරීම අවශ්‍ය වේ. සමහර අවස්ථාවලදී අප තුළින් ඇතිවන කිසියම් කාරණා අපගේ ඵලදැරීමට බාධා පමුණුවයි (මාර්ක් 7:15). එවන් අවස්ථාවලදී අප වඩා ඵල දරන පිණිස දෙවියන්වහන්සේ අපව කප්පාදුකරන සේක. යොහන් 15 පරිච්ජේදය මෙම ක්‍රියාවලිය විස්තර කරයි.

ආත්මික කෘමි උවදුරු සහ රෝගවල ගැටලුව ඇත්තේ ජීවිතයෙහි සිදුවීම් තුළ හෝ මනසෙහි සිතුවිලි රටාව තුළ නොවෙයි. ගැටලුව පවතින්නේ මේ පිටුපස ඇති ආත්මික බලවේගයන් වලය.

> **මක්නිසාද අපේ පොරබැඳීම වනාහි මාංසයට සහ රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත් පරාක්‍රමධාරීන්ටත් මේ අන්ධකාරයේ ලෝක මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්ම සේනාවන්ටත් විරුද්ධවය. (එපීස 6:12)**

ස්වභාවික ලෝකයෙහි කෘමි විනාශ කිරීමට සහ රෝග සුවකිරීමට රසායනික ප්‍රතිකාර යොදනු ලැබේ. ආත්මික ලෝකයෙහි ඔබගේ ජීවිතයෙහි ආත්මික අස්වැන්න ආරක්ෂා කරනුයේ දෙවියන්වහන්සේගේ යුද්ධ ආයුධ වේ.

> **එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්ටත් සියල්ල සම්පූර්ණකරගන ස්ථිරව සිටින්ටත් පුළුවන්වෙන පිණිස, දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා. එබැවින් නුඹලාගේ**

> **ඉඟටි සැබෑකම නමැති පටියෙන් බැඳගෙන, ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම පැළඳගෙන, සමාදානයේ ශුභාරංචියේ සූදානම නමැති වහන් පය ලා සිටපල්ලා. ඒ සියල්ල ඇර ඇදහිල්ල නමැති පලිහ අරගනිල්ලා, එයින් නපුරාගේ සියලු ගිනිහෙල්ල නිවන්ට නුඹලාට පුළුවන්වන්නේය. ගැළවීම නමැති ආරක්ෂා තොප්පියද දෙවියන්වහන්සේගේ වචනය නැමති ආත්මයාණන්වහන්සේගේ කඩුවද ගනිල්ලා. (එපීස 6:13-17)**

**නුසුදුසු අස්වැන්න නෙලීම:**

නුසුදුසු අස්වැන්න බෝග විනාශ කරයි.

> **හාන්නා වපුරන පිණිස සැමදාම හාන්නේද? නොර නැතුව තමාගේ බිම හාරා පස්කැටි කඩන්නේද? ඔහු බිම සමතලාකොට, කොල්ලු ඉස, දුරු වපුරා, තිරිඟු පේළි වශයෙන්ද යව ඊට නියම ඉඩමේද තණහාල් එහි මායිමේද හිටවනවා නොවේද? මෙසේ ඔහුගේ දෙවියන්වහන්සේ හරි විධිය ඔහුට පෙන්වා ඔහුට උගන්වන සේක. තවද කොල්ලු තියුණු යන්ත්‍රයකින් මඩින්නේවත් දුරු පිට රථ රෝදයක් කරකවන්නේවත් නැත. කොල්ලු ලියකින්ද දුරු කෝටුවකින්ද මඩින්නේය. රොටි-ධාන්‍ය අඹරනු ලබන්නේය, මක්නිසාද ඔහු ඒවා නිතරම තළා තළා නොසිටින්නේය. තමාගේ රථ රෝද සහ තමාගේ අශ්වයන් ඒවා පිට ගෙනගොස් ඒවා විසුරුවන නුමුත් ඒවා පොඩිකරවන්නේ නැත. (යෙසායා 28:24-28)**

ස්වභාවික ලෝකයෙහි භූමිය සකස් කිරීමටත් බීජ වැපිරීමටත් නිසියාකාර ක්‍රම ඇත. එක් එක් ඵල වලට අනුකූලව අස්වැන්න නෙලීමට විවිධ ක්‍රම පවතී. අබ ඇට, උළුහාල් වැනි දෑ වල ඇට ඉක්මනින් පහසුවෙන් පොත්තෙන් මිදෙන බැවින් කෙවිටක් හා මුගුරක් පමණක් භාවිත කරනු ලැබේ. එනමුත් බඩ ඉරිඟු වල ඇට පහසුවෙන් ඉවත් නොවන බැවින් මඩින යන්ත්‍රයක් භාවිත කළ යුතු වේ.

ඔබ දේව රාජ්‍යය උදෙසා ස්ත්‍රී පුරුෂ ජීවිත නෙලා ගැනීමෙහිදී සමහරු ඉතා පහසුවෙන් ස්වාමින්වහන්සේගේ දැනගැන්මට පැමිණෙනු ඇත. සමහරු නෙලාගැනීම සඳහා වැඩිපුර ශ්‍රමයක් යෙදිය යුතුවේවි.

නුසුදුසු නෙලීමේ ක්‍රම ඵලදාවට හානිකරය. වැඩිපුර බලය යෙදීමෙන් මෘදු පැලෑටි හැලී පොඩිවී යාවි. ඕනෑ ප්‍රමාණයට අඩුවෙන් උත්සාහ නොගතහොත් ඵල නොදරනු ඇත. ස්වභාවික අස්වැන්න නෙලාගැනීමට ප්‍රඥාව සපයන්නාවූ දෙවියන්වහන්සේම ආත්මික අස්වැන්න නෙලීමට ද ප්‍රඥාව සපයන සේක්වා.

**නොවපුරන ලද බිම්:**

භූමිය මනාසේ සකසා නොතිබීමෙන් දුර්වල අස්වැන්නක් ගෙන දෙයි. මාර්ක් 4:12-20, මතෙව් 13:1-23, ලූක් 8:4-15 දක්වා සඳහන් වපුරන්නාගේ උපමාව කියවන්න. මෙම උපමාවෙහි දේව වචනය ස්වභාවික ලොවෙහි බීජ වලට සමාන කර තිබේ. දේව වචනය ගැහැණු හා පිරිමි හදවත් වල ඉසිනු ලැබේ.

වපුරන්නාගේ උපමාවෙහිදී වෙනස් වනුයේ වපුරන්නාවත් බීජවත් වපුරන ක්‍රමයවත් නොවේ. මෙහිදී අස්වැන්නට බලපෑ සාධකය නම් පසෙහි තත්වය වේ. සමහර බිම් වගා කර නොමැත. ඒවා ආත්මික ගල් හා වල් පැලෑටි වන ලෝකයෙහි කාරණා, වස්තුව හා ලෞකික තෘෂ්ණාවලින් පිරී තිබේ. මෙලෙස සකස් නොකරන ලද ආත්මික බිම් වලින් ලැබෙන අස්වැන්න දුර්වලය.

තවත් සමහර බීජ සරු බිම්වල වපුරන ලදි. ඒවා නම් ආත්මිකව බීජ ලබාගැනීමට සූදානම් කරන ලද හදවත් වේ. ප්‍රතිඵලය නම් සරු අස්වැන්නකි.

> **සරුබිමේ වපුරනලද්දෝ නම්, වචනය අසා, පිළිගෙන, තිස් ගුණයක්ද සැට ගුණයක්ද සියක් ගුණයක්ද බැගින් ඵල දරන්නෝයයි කීසේක. (මාර්ක් 4:20)**

ඉතා සරු බිමේ වපුරන ලද දේව වචනය නමැති බීජ වලින් මහත් අස්වැන්නක් නෙලාගත හැකිය.

සමහර පුද්ගලයෝ ශුභාරංචිය ලබාගැනීමට එකඟතාවය දක්වන අතර තව සමහරු එයට ප්‍රතිරෝධය දක්වති. ඔබ අස්වැන්නක් නොලබයි නම්, එයට හේතුව පස සකසා නොතිබීම විය හැක. එනිසා පස් හොඳින් සැකසිය යුතු වේ.
අනාගතවක්තෘ හොෂෙයා අණ කරනුයේ:

> **ධර්මිෂ්ඨකම පිණිස වපුරාගන, කරුණාවේ හැටියට කපාගනිල්ලා, පුරන් බිම කොටාගනිල්ලා, ස්වාමින්වහන්සේ ඇවිත් නුඹලාට ධර්මිෂ්ඨකම වස්වන තුරු දැන් උන්වහන්සේ සොයන්ට කාලයය. නුඹලා දුෂ්ටකම කැවහුය, අයුතුකම කපාගත්තහුය, බොරුවල ප්‍රතිඵල කැවහුය. මක්නිසාද නුඹ නුඹේ මාර්ගයත් නුඹේ බලවතුන් රාශියත් කෙරෙහි විශ්වාස කෙළෙහිය. (හොෂෙයා 10:12-13)**

නිසිලෙස සකසා නොමැති භූමිය ආත්මික ලෝකයෙහි නියෝජනය කරනුයේ අධර්මිෂ්ඨ භූමිය වේ. හොෂෙයා දෙවියන්වහන්සේගේ ජනතාවට පවසනුයේ ඔව්හු තමුන්ගේ ජීවිත නමැති භූමියෙහි දුෂ්ඨකම පසට හැමෙන් අධර්මිෂ්ඨකම නෙලාගෙන ඇති බවය. දුෂ්ඨකම හැමෙන් නෙලාගන්නාවූ අයුතුකමට ඇතුලත් වනුයේ:

**භේදය:**

> **ප්‍රයෝග මුඛයක් ඇතුව ඇවිදින්නාවූ, තමාගේ ඇස්වලින් ඉඟිකරන්නාවූ, තමාගේ පාදවලින් හැඟුම් දෙන්නාවූ ඔහුගේ හිතේ ප්‍රයෝගය ඇත්තේය. ඔහු නිතරම නපුර යොදා භේද පතුරුවයි. (හිතෝපදේශ 6:12, 14)**

**අයුක්තිය:**

> **අයුක්තිය වපුරන්නා විපත්තිය කපාගන්නේය. ඔහුගේ උදහස නමැති ඉපල නැතිවන්නේය. (හිතෝපදේශ 22:8)**
> **මා දැක තිබෙන හැටියට අධර්මිෂ්ඨකම හාලා අයුක්තිය වපුරන්නෝ ඒවාම කපාගනිති. (යෝබ් 4:8)**

**බේදය:**

> **ප්‍රයෝගකාර මනුෂ්‍යයා තරඟ පතුරුවන්නේය. කේලාම්කියන්නාද හිතමිත්‍රයන් වෙන්කරන්නේය. (හිතෝපදේශ 16:28)**

**මාංශය:**

> **නොරැවටෙල්ලා, දෙවියන්වහන්සේට සරදම්කරන්ට කාටවත් බැරිය. මක්නිසාද මනුෂ්‍යයෙක් තමා වපුරන දේම කපාගන්නේය. ඒ හැටියට තමාගේ මාංසය සඳහා වපුරන්නා මාංසයෙන් කුණුවීම කපාගන්නේය. ආත්මයාණන්වහන්සේ සඳහා වපුරන්නා ආත්මයාණන්වහන්සේගෙන් සදාකාල ජීවනය කපාගන්නේය. (ගලාති 6:7-8]**
>
> **ඉඳින් මාංසයේ ක්‍රියා ප්‍රකාශව තිබේ. එනම්, වේශ්‍යාකම, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදිකම්, භේද, ලබ්ධි භේද, වෛර, බීමත්කම, මංගල්‍ය ඝෝෂා සහ තවත් එවැනි දේවල්ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට ප්‍රථම කී ලෙසම, දැනුත් කලින් නුඹලාට කියමි. (ගලාති 5:19-21)**

ඔබගේ ජීවිතයෙහි සරු ආත්මික අස්වැන්නක් සහතික ලෙස ලැබීමට නම් ඔබගේ ආත්මික බිම කොටා පස් සකසා මෙම බාධක ඉවත් කරගත යුතුය. හොෂෙයා අණ කළ පරිදි "ස්වාමින්වහන්සේ පැමිණ ධර්මිෂ්ඨකම වස්සවන තුරු එතුමා සෙවිය යුතුය".

**අධර්මිෂ්ඨ වූ අත්තිවාරම්**

ස්වභාවික ලොවෙහි දුර්වල අස්වැන්නක් ඇති වූ කල අනාගතවක්තෘ හග්ගයි දෙවියන්වහන්සේගේ ජනතාවට තමුන්ගේ මාර්ග සෝදිසි කර බැලීමට කර බැලීමට පැවසිය.

**නුඹලා බොහෝම වැපුරූ නුමුත් එකතුකරගත්තේ ස්වල්පයක්ය. නුඹලා කන නුමුත් තෘප්තියට නොපැමිණෙන්නහුය. බොන නුමුත් සෑහීමට නොපැමිණෙන්නහුය. අඳින නුමුත් උණුසුම් නොවන්නහුය. කුලී ලබාගන්නාද එය ලබාගන්නේ හිල් ඇති පසුම්බියකට දමන්ටය. සේනාවල ස්වාමීන්වහන්සේ මෙසේ කියනසේක. නුඹලාගේ මාර්ග සිතට ගනිල්ලා. නුඹලා බොහොමයක් ගැන බලාසිටියහුය, නුමුත් ඒවා ස්වල්ප විය. නුඹලා ඒවා ගෙදර ගෙනා කල මම ඒවා පිඹදමුවෙමි, ඒ මක්නිසාදැයි සේනාවල ස්වාමීන්වහන්සේ අසන සේක. මාගේ ගෘහය පාළුව තිබෙද්දී නුඹලා එකිනෙකා තම තමාගේම ගෙදරට දුවන නිසාය. (හග්ගයි 1: 6, 7, 9)**

දෙවියන්වහන්සේගේ ජනතාව බීජ රාශියක් වැපිරූ නමුත් අස්වැන්න ඉතා ස්වල්ප විය. එවිට හග්ගයි පැවසුවේ සරු අස්වැන්නක් ලැබීම පිණිස ඔවුන් ස්වභාවික මෙන්ම ආත්මික කාරණාවල් ද නැවත-ගොඩනැගිය යුතු බවය.

නැවත-ගොඩනැගීම අවශ්‍ය වූයේ ඇයි?

ස්වභාවික ලෝකයෙහි ඉශ්‍රායෙල් ජනතාව දෙවියන්වහන්සේගේ ගෘහය ගොඩ නැගීම කල් දමා තමුන්ගේම ගෙවල් සෑදීමට යොමු වූහ. ඔව්හු දෙවියන්වහන්සේගේ ආඥාවට ඉහළින් තමුන්ගේ අවශ්‍යතාවයනට මුල් තැන දී තිබුණි.

ආත්මික ලොවෙහි ඔවුන්ගේ ජීවිතවල අත්තිවාරම වැරදි විය. ඔව්හු අශුද්ධ දත් සහිතව ආත්මික ලොවෙහි වැපිරීමත් නෙලා ගැනීමත් කළහ.

**එවිට හග්ගයි උත්තරදෙමින් මෙසේ කීවේය. මා ඉදිරියේ මේ සෙනඟ එසේමය. මේ ජාතියද එසේමයයි ස්වාමීන්වහන්සේ කියන සේක. ඔවුන්ගේ අත්වල සියලු වැඩත් එසේමය. ඔවුන් එහි ඔප්පුකරන දේත් අපවිත්‍රය. (හග්ගයි 2:14)**

අශුද්ධ දෑතින් පිදූ හරි පූජාවක් හෝ හරි ක්‍රියාවක් හෝ පිළිගනු නොලැබේ. එහි අත්තිවාරම වැරදිය. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට පැවසුවේ.

**එහෙත් මා විසින් නුඹ හොඳ මිදිවැලක්ද මුළුමනින්ම හරිවූ බීජයක් ද කොට හිටවා තිබුණේය. එසේවී නම්, නුඹ වෙනස් වීමට වල් මිදිවැලක නරක් වූ පැළයක් වුනේ කොහොමද? (යෙරමියා 2:21)**

මෙලෙස නුසුදුසු ආත්මික පදනම නිසා දෙවියන්වහන්සේ අස්වැන්නට ශාප කළ සේක.

**ගොයම් වියළී යාමෙන්ද ගොයම් රෝගයෙන් ද ගල් වර්ෂාවෙන්ද නුඹලාගේ අත්වල සියලු වැඩවලදී නුඹලාට පහර දුනිමි. එහෙත් නුඹලා මා වෙතට හැරුණේ නැතැයි ස්වාමීන්වහන්සේ කියන සේක. (හග්ගයි 2:17)**

නව ජීවමාන බයිබලය නම් අනුවර්තනයෙහි එම පදය "ඔබ කළාවූ සියලු කාරණා වැරදුනේය" යයි සඳහන් වේ.

හග්ගයි දෙවියන්වහන්සේගේ ජනතාවට පැවසුයේ ස්වාමීන්ගේ ගෘහයෙහි අත්තිවරම් අලුතින් දැමිය යුතු බවය. ඔව්හු නැවත වරක් ආත්මිකව ද ස්වභාවිකව ද අලුතින් ගොඩනැඟුවහොත් දෙවියන්වහන්සේ ඔවුනට ආශිර්වාද කරනු ඇතැයි පැවසූ සේක.

**අද දවස වන නවවෙනි මාසයේ විසිහතර වනදා පටන් මත්තට සිතට ගනිල්ලා. එසේය, ස්වාමීන්වහන්සේගේ මාලිගාවේ අත්තිවාරම තැබූ දවසේ පටන් සිතට ගනිල්ලා. බීජ තවම අටුවෙහිද? එසේම මිදිවැලත් අත්තික්කා ගසත් දෙළුම් ගසත් ඔලිව ගසත් තවම ඵල දුන්නේ නැත. අද පටන් මම නුඹලාට ආශිර්වාද කරන්නෙමියි කීසේක. (හග්ගයි 2:18-19)**

ඉශ්‍රායෙල් ස්වභාවික ලොවෙහි දේව ගෘහය නැවත ගොඩනැඟීමට හා ආත්මික ලොවෙහි ධර්මිෂ්ඨකමේ අත්තිවාරම දැමීමට ඇරඹූ මුල් දිනයේ සිට දෙවියන්වහන්සේ ඔවුනට ආශිර්වාද කිරීමට ආරම්භ කළ සේක. එහි ප්‍රතිඵලය වූයේ ලෝක දෙකෙහිම මහත් සරු අස්වැන්න ලැබීමය.

ඔබගේ ජීවිතයෙහි ධර්මිෂ්ඨ අත්තිවාරම නැවත ගොඩනැඟීමට ආරම්භ කළහොත් අද දින සිට දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කිරීමට අරඹනු ඇත. ඔබගේ ජීවිතයෙහි සියලුම ක්ෂේත්‍ර වලින් ඔබ මහත් ලෙස නෙලාගනු ඇත.

හාවස්ටයිම් ජත්‍යන්තර ආයතනය "ඇදහිල්ලෙහි පදනම්" නම් පාඨමාලාවක් නිකුත් කර ඇත. කිතුනු ජීවිතයෙහි නියමාකාර අත්තිවාරම් වල ඇති වැදගත්කම මෙයින් ඉගැන් වේ.

මෙම විෂය පථය ඉතා පුළුල් වුවක් බැවින් මෙම ජේදයෙහිදී ඒ සියල්ල සාකච්ඡා කළ නොහැකි වුවද මූලික ප්‍රතිපත්ති කිහිපයක් දැනගැනීම වැදගත් වනුයේ ඔබගේ ආත්මික අස්වැන්න නෙලීමට එය බලපාන බැවිනි.

මහත් සරු අස්වැන්නක් ගෙනදීම සඳහා නියමිත අත්තිවාරම නම්:

**නොසැලෙන පර්වතයක් මත ගොඩනැඟුනකි**

> **ඔහු ගැඹුරට හාරා, පර්වතයක් පිට අත්තිවාරම ලා, ගෙයක් සාදාගත් මනුෂ්‍යයෙකුට සමානය. ජලගැල්මක් පැමිණ සැඩ පහර ඒ ගෙට ගැසූ නමුත්, ඒක හොඳින් ගොඩනඟා තිබූ බැවින් සොලවන්ට බැරි විය. (ලූක් 6:48)**

**එම පර්වතය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය**

> **තැතිගන්ටවත් භයවෙන්ටවත් එපා: මම පුරාණයේ පටන් නුඹට ප්‍රකාශ කර නොදැන්නුවෙම්ද? නුඹලා මාගේ සාක්ෂිකාරයෝය. මා ඇර වෙන දෙවිකෙනෙක් ඇද්ද? නැත, වෙන පර්වතයක් නැත: අන් කිසිවෙකු ඇති බවක් නොදනිමි. (යෙසායා 44:8)**

**ධර්මිෂ්ඨකම මත පදනම් වූ අත්තිවාරමකි**

> **සුළි සුළඟ ගසන කල්හි දුෂ්ටයන් නැති වන්නේය. එහෙත් ධර්මිෂ්ඨයා සදහටම අත්තිවාරමක්ය. (හිතෝපදේශ 10:25)**

**එය යහපත් අත්තිවාරමකි**

> **සැබවින් ජීවනයවූ ඒ ජීවනය අල්ලාගන්නා පිණිස මතු කාලයට යහපත් අත්තිවාරමක් තබාගන්ටත් අණදා කරපන්න. (1 තිමෝති 6:19)**

**එය සදාකාලිකය**

> **සැබවින් ජීවනයවූ ඒ ජීවනය අල්ලාගන්නා පිණිස මතු කාලයට යහපත් අත්තිවාරමක් තබාගන්ටත් අණදා කරපන්න. (1 තිමෝති 6:19)**

**එය දේව වචනය මත පදනම් වුවකි**

> **එසේද වුවත් ස්වාමින්වහන්සේ තමන්ගේ අය දන්නාසේකැයි ද ස්වාමින්වහන්සේගේ නාමය සඳහන් කරන සියල්ලෝ අධර්මිෂ්ඨකමින් පහවෙත්වා යයිද යන මුද්‍රාව ඇතිව දෙවියන්වහන්සේගේ ස්ථිර අත්තිවරම පවත්නේය. (2 තිමෝති 2:19)**

**එම අත්තිවාරම ප්‍රතිපත්ති දෙකක් මත නැගී සිටී.**

> **එසේද වුවත් ස්වාමින්වහන්සේ තමන්ගේ අය දන්නාසේකැයි ද ස්වාමින්වහන්සේගේ නාමය සඳහන් කරන සියල්ලෝ අධර්මිෂ්ඨකමින් පහවෙත්වා යයිද යන මුද්‍රාව ඇතිව දෙවියන්වහන්සේගේ ස්ථිර අත්තිවරම පවත්නේය. (2 තිමෝති 2:19)**

අත්තිවාරම රැඳී තිබෙන්නාවූ ප්‍රතිපත්ති දෙක නම්:

1. මුදන ලැබූ මනුෂ්‍යයන් – ස්වාමින්වහන්සේ තමාගේ ජනතාව දන්නා සේක.

2. මුදනු ලැබුවන්සේ ජීවත්වන්නන් – ස්වාමින්වහන්සේගේ නාමයෙන් තමුන්ව හඳුන්වා දෙන්නාවූ
සෑම කෙනෙකුම සියලු අයුතුකම් පහකොට එයින්
තොරව ජීවත් වේවා.

ආත්මික අස්වැන්න සඳහා සුදුසු අත්තිවාරම එය වේ.

**සේවකයන් ස්වල්ප දෙනෙකි.**

අස්වැන්න නෙලන කෙතෙහි ඇත්තේ කම්කරුවන් ස්වල්ප දෙනෙකු පමණක් නම් අස්වැන්න දුර්වල වනු ඇත. අස්වැන්න නෙලා ගැනීමට පෙර එය කුණු වී යනු ඇත.

යේසුස්වහන්සේ පැවසුවේ:

> **උන්වහන්සේ ඔවුන්ට කථාකොට: ගොයම බොහෝය, මෙහෙකරුවෝ ස්වල්ප දෙනෙක්ය. ඒ නිසා තමන්ගේ ගොයම් කැපීමට මෙහෙකරුවන් එවන ලෙස ගොයමේ ස්වාමින්වහන්සේට යාච්ඤා කරපල්ලා. (ලූක් 10:2)**

**ප්‍රතිඵල**

අස්වැන්න වලකාලන කාරණා සඳහා ආත්මික ලෝකයෙහි දුක්ඛිත ප්‍රතිඵල හිමි වේ.

> **කෙත් නාස්තිවී තිබේ, දේශය වැලපෙයි. මක්නිසාද ගොයම් නාස්තිවී, මිදි යුස සිඳී, තෙල් හිනවී තිබේ. ගොවියෙනි, තිරිඟු සහ යව ගැන ලජ්ජාවෙයල්ලා, මිදිවතුකාරයෙනි, කෑමොරගසාපල්ලා, මක්නිසාද කෙතේ අස්වැන්න නාස්තිවිය. මිදිවැල වියළී, අත්තික්කා ගස මැලවී, දෙළුම් ගසද තල් ගසද ජම්බු ගසද යනාදිවූ කෙතේ සියලුම ගස් වියළී තිබේ. මක්නිසාද මනුෂ්‍ය පුත්‍රයන්ගෙන් ප්‍රීතිය පහව ගියේය. (යෝවෙල් 1:10-12)**

ස්වභාවික ලොවෙහි අඩු අස්වැන්නක් ශෝකය හිමිකර දෙයි.

> **සාරවත් කෙතෙන් සතුටද ප්‍රීතියද පහකරනලද්දේය. මිදිවතුවල කවිකීමවත් ප්‍රීති ඝෝෂාවවත් නොවන්නේය. කිසි මඩින්නෙක් මිදිපැස්වල මුදිකඵල මැඩ නොගන්නේය. මම මිදිඵල නෙළීමේ ප්‍රීති ඝෝෂාව නැවැත්වීමි. (යෙසායා 16:10)**

ආත්මික ලොවෙහිද අඩු අස්වැන්න ප්‍රීතිය හා සතුට අහිමිකර දෙයි.

> **අපේ ඇස් ඉදිරියෙහිම කෑමත් අපේ දෙවියන්වහන්සේගේ ගෘහයෙන් ප්‍රීති සන්තෝෂයත් පහවගියා නොවේද? (යෝවෙල් 1:16)**

අපගේ ජීවිතවල ප්‍රීතිය නොමැති මන්දැයි කල්පනා කරමුද? අපගේ දේවස්ථානවලින් ගී ගැයුම හා ජයග්‍රහණයේ ඝෝෂාව වියලී ඇත්තේ මන්දැයි ප්‍රශ්න කරමුද? එය අඩු, දුර්වල අස්වැන්නෙහි ප්‍රතිඵලය වේ.

**අපට කළ හැකි කුමක්ද?**

ආත්මික අස්වැන්න වලකාලන සාධක අපි හඳුනාගනිමු. ආත්මික ප්‍රීතිය හා ජයග්‍රහණය හීනවීමට හේතු සොයා ගනිමු.

ඔබගේ ජීවිතයෙහි මද අස්වැන්න ලැබීමේ චක්‍රය නොපිට පෙරලා මහත් අස්වැන්නක් ලැබීමට ඔබට කළ හැකි කුමක්ද?

ඉශ්‍රායෙල්හි ස්වභාවික අස්වැන්න හීන වූ කල යෝවෙල් දෙවියන්වහන්සේගේ ජනතාවට කීවේ.

> **එහෙත් දැන්වත් නුඹලාගේ මුළු සිතින්ද නිරාහාරව සිටීමෙන්ද ඇඬීමෙන්ද වැලපීමෙන්ද මා වෙතට හැරී වරෙල්ලායයි ස්වාමින්වහන්සේ කියනසේක. එසේය, නුඹලාගේ වස්ත්‍ර නොව**

**නුඹලාගේ සිත් ඉරාගෙන, නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ වෙතට හැරියල්ලා. මක්නිසාද උන්වහන්සේ දයාවන්තවූ, අනුකම්පාවෙන් පූර්ණවූ, ඉවසිලිවන්තවූ, ඉතා කරුණාවන්තවූ කෙනෙක්ය. උන්වහන්සේ විපත්තිය ගැන තැවෙනසේක. (යෝවෙල් 2:12-13)**

ඔබ දෙවියන්වහන්සේගේ වචනයට අකිකරුවීම පිළිබඳවත් ආත්මික අස්වැන්න කෙරෙහි නොසැලකිලිමත් වීම ගැනත් පසුතැවෙමින් දෙවියන්වහන්සේ වෙතට හැරිය යුතුය. ඔබගේ ඵලදායි බව වලකාලන ආත්මික කෘමි හා රෝග උවදුර ඉවත් කර දමන මෙන් එතුමාගෙන් ඉල්ලා සිටින්න. ඔබගේ ස්වයං-උත්සාහය පිළිබඳව පසුතැවිලිවන්න. ඔබගේ උත්සාහයන් ලෝකයේ ජාතීන් උදෙසා එතුමා සතු පරමාර්ථය ඉටු කිරීමට මඟ පෙන්වන මෙන් ඉල්ලා සිටින්න.

ඔබගේ වගා නොකළ බිම කොටා, ජීවිතයෙහි අත්තිවාරම් ධර්මිෂ්ඨකම මත නැවත ගොඩනඟන්න.

යෝවෙල් ආත්මික නායකයන්ට පසුතැවිලි වී නිරාහාරයක් කැඳවන ලෙස අවවාද කළේය.

**පූජකයෙනි, ගෝණිරෙදි ඔතාගෙන විලාප කියාපල්ලා, පූජාසනයේ සේවකයෙනි, කෑමොරගසාපල්ලා, මාගේ දෙවියන්වහන්සේගේ සේවකයෙනි, ඇවිත් ගෝණිරෙදි පොරවාගන මුළු රාත්‍රියෙහි වැතිර ඉඳිල්ලා. මක්නිසාද ආහාර පූජාවද පාන පූජාවද නුඹලාගේ දෙවියන්වහන්සේගේ ගෘහයට නොපැමිණෙන්නේය. ශුද්ධවූ උපවාසයක්ද රැස්වීමක්ද ප්‍රසිද්ධකර, නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ ගෘහයට වැඩිමහල්ලන්ද දේශයේ සියලුම වැසියන්ද රැස්කර, ස්වාමින්වහන්සේට මොරගසාපල්ලා (යෝවෙල් 1:13-14)**

ඔබ ක්‍රිස්තියානි නායකයෙකු නම් ඔබගේ සභාව ආත්මික අස්වැන්න නෙලා ගෙන නැත්නම් පහත සඳහන් පියවර අනුගමනය කරන්න.

- ඔබගේ වැඩිමහල්ලන් හා සාමාජිකයන් රැස්වීමකට කැඳවන්න.
- දෙවියන්වහන්සේ ඉදිරියට නිරාහාරයෙන් හා පසුතැවිල්ලෙන් පැමිණෙන්න.
- මහත් ආත්මික අස්වැන්නක් පිළිබඳ දර්ශනයක් ඔබට සපයන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.
- එම දර්ශනය සපුරාලීමේ පරමාර්ථය සඳහා එකමුතු වන්න.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පද මතකයෙන් ලියන්න.

______________________________________________________________________

______________________________________________________________________

______________________________________________________________________

2. පහත සඳහන් ප්‍රකාශන සත්‍යය නම් ස යන්නද අසත්‍ය නම් අ යන්නද හිස්තැනෙහි සඳහන් කරන්න.

   අ. ද්විතිය කථාව 28 දෙවියන්වහන්සේගේ "නම්-නමුත්" නම් පොරොන්දු පිළිබඳ ප්‍රතිපත්තියට උදාහරණයකි.__________________

   ආ. සාතන් ආත්මික අස්වැන්න පිළිබඳව කිසිම උනන්දුවක් නොදක්වයි.__________________

   ඇ. ආත්මික අස්වැන්න නෙලීම සඳහා ස්වයං-ප්‍රයත්නය වැදගත්ය.__________________

   ඈ. ඔබ ආත්මිකව බීජ වැපිරීමට පෙර වටපිටාව ඉතා හොඳින් නිරීක්ෂණය කළ යුතුය.__________________

   ඉ. ආත්මික අස්වැන්නක් ලැබීමට යහපත් ක්‍රියා කිරීම පමණක් නොසෑහේ.__________________

   ඊ. ඔබට ඇති ගැටලුව අයහපත් වාතාවරණය නොව එම වාතාවරණය පසුපස ඇති ආත්මික බලවේගය.__________________

   උ. නිවැරදි ක්‍රියාවක් අශුද්ධ දෑතින් ඉදිරිපත් කළ විට පිළි නොගැනේ. __________________

3. අපට අයුතුකමේ ආත්මික අස්වැන්නක් හිමිකර දෙන්නාවූ අප වපුරන දුෂ්ඨ දේවල් කිහිපයක් මොනවාද?

   ____________________________ ____________________________

   ____________________________ ____________________________

   ____________________________ ____________________________

4. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මත පදනම් වූ අත්තිවාරමෙහි ප්‍රතිපත්ති දෙක මොනවාද?

   _________________________________ජීවත්වීම_________________________________

5. දුර්වල ආත්මික අස්වැන්නක ප්‍රතිඵල පෙන්වා දෙන එක් ශුද්ධ ලියවිලි පාඨයක් සඳහන් කරන්න.

______________________________________________________________________

6. දුර්වල ආත්මික අස්වැන්න රටාව වෙනස් කිරීමට ඔබට කළ හැකි දෑ පෙන්වා දෙන එක් ශුද්ධ ලියවිලි පාඨයක් සඳහන් කරන්න.

7. මෙම පරිච්ඡේදයෙහි සාකච්ඡා කළ පරිදි අස්වැන්න වලක්වාලන කාරණාවල ලේඛණයක් සාදන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

දුර්වල ආත්මික අස්වැන්නක් සඳහා අනෙක් හේතු සාධක සොයාගැනීමට පහත සඳහන් බයිබල් පද අධ්‍යයනය කරන්න.

### පැරණි ගිවිසුම

ලෙවී කථාව 19:19
ද්විතිය කථාව 22:9, 28
යෝබ් 4:8
ගීතාවලිය 105
හිතෝපදේශ 6:12, 14, 19; 10:5; 16:28; 20:4; 22:8; 24:30
දේශනාකාරයා 11:4
සලමොන්ගේ ගීතිකා 2:15
යෙසායා 16:10; 17:10-11; 28:24-28; 32:9-20
යෙරමියා 2; 5:17-19; 8:13-14; 12:10-11
හොෂෙයා 8:7; 10:12-13
යෝවෙල් 1
ආමොස් 4, 5
මීකා 6
හග්ගයි 1

### අලුත් ගිවිසුම

මතෙව් 13:1-23
මාර්ක් 4:2-20
ලූක් 8:4-15; 10:2; 22:31
2 කොරින්ති 9:6
ගලාති 6:7-8
යාකොබ් 5:4

# හයවන පරිච්ඡේදය

## ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම

## I කොටස

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබහට:

- මහත් ආත්මික අස්වැන්නක් ලබාදෙන බයිබලිය උපක්‍රම භාවිත කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **කඳුළු සහිතව වපුරන්නෝ ප්‍රීතියෙන් කපන්නෝය. ඔහු බීජ මල්ල රැගෙන හඬමින් පිටත්ව යන්නේ නුමුත්, තමාගේ ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් එන්නේය. (ගීතාවලිය 126:5-6)**

### හැඳින්වීම

පසුගිය පරිච්ඡේදයෙහි අපි ආත්මික අස්වැන්න වලකාලන සාධක හඳුනාගතිමු. මෙම පරිච්ඡේදයෙහිදී හා මීළඟ පරිච්ඡේදයෙහි දී අපි මහත් සරු ආත්මික අස්වැන්නක් නියත ලෙස ලබාගත හැකි උපක්‍රම විස්තර කරමු.

උපක්‍රම යනුවෙන් හඳුන්වනුයේ කිසියම් නියත ඉලක්කයකට පිවිසීම සඳහා අනුගමනය කරන්නාවූ ප්‍රතිපත්ති, ක්‍රම හා සැලසුම්ය. ඒවා දේව වචනයෙහි ස්වභාවික ප්‍රතිපත්ති ලෙස හෙළිදරව් කර දී තිබේ. එම ප්‍රතිපත්ති ආත්මික සත්‍යවල සමාන්තරය වේ.

### අස්වැන්නෙහි උපක්‍රම

අස්වැන්නෙහි උපක්‍රම මෙසේය:

**සෑම පැළෑටියකටම නැවත ඵල දැරීමේ හැකියාව තිබේ.**

දෙවියන්වහන්සේ ස්වභාවික ලෝකයෙහි පොළොව මැවූ කල එහි ඇති සෑම පැළෑටියකටම නැවත-ඵල දැරීමේ හැකියාව සහිතව මැවූ සේක.

> **දෙවියන්වහන්සේ: පොළොව වනාහි තෘණද බීජ උපදවන පලාද ඒ ඒ වර්ග ලෙස ඵල දරන බීජ සහිත ඵල වෘක්ෂද පොළොව පිට හටගන්වාවයි කීසේක. ඒ එසේ විය. (උත්පත්ති 1:11)**

ස්වභාවිකව සෑම පැළෑටියකටම නැවත-ඵල දැරිය හැකිවාක් මෙන්ම ආත්මිකව සෑම කිතු බැතියෙකුටම නැවත-ඵලදැරීමේ හැකියාව පවතී. **ඔබ** තුළ ආත්මිකව නැවත-ඵලදැරීමේ හැකියාව ගැබ්ව තිබේ. ආත්මික අස්වැන්නේ කොටස්කරුවෙකු වීමට ආත්මික කාරණා පිළිබඳ මහා දැනුමක් අවශ්‍ය නොවේ. මෙම සත්‍යය පහදා දෙමින් යේසුස්වහන්සේ උපමා කතාවක් කීසේක.

> **තවද උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය වනාහි මනුෂ්‍යයෙකු විසින් පොළොවෙහි බීජ වැපිරීමට සමානය. ඔහු රාත්‍රියේ නිදන්නේය. දහවල් නැගිට සිටින්නේය. ඔහු නොදන්නා ප්‍රකාරයකින් ඒ බීජ පැළවී වැඩෙන්නේය. ගොයම් පැසුණු කල, කපන කාලය පැමුණුන බැවින් ඔහු වහාම දෑකැත්ත යොදන්නේයයි කීසේක. (මාර්ක් 4:26, 27, 29)**

මනුෂ්‍යයෙකුගේ හදවත තුළ දේව වචනය නමැති බීජය පැලවී වැඩෙන ආකාරය පිළිබඳ දේව ධර්මය ඔබ දැන සිටීම අවශ්‍ය නොවේ. ගැඹුරු දේව ධර්ම පිළිබඳ මහත් දැනුමක් ඔබට තිබීම අවශ්‍ය නොවේ.

අවශ්‍යවනුයේ ඔබ ආත්මික අස්වැන්න නෙලීමේ චක්‍රයෙහි කොතැනක හෝ කොටස්කරුවෙකු වීමය.

**අස්වැන්න නෙලා ගැනීමට නම් වැපිරීමක් අවශ්‍ය වේ.**

ස්වභාවික ලෝකයෙහි බෝගයක ඵල නෙලා ගැනීමට ඕනෑ නම් පළමුව ඔබ බීජ වැපිරිය යුතුවේ. එසේම ආත්මික ලොවෙහිද අස්වැන්න කපා ගැනීමට නම් බීජ වැපිරිය යුතු වේ. ආත්මිකව වැපිරීම උදෙසා අවශ්‍ය ප්‍රතිපාදන දෙවියන්වහන්සේ සපයා දෙන සේක.

> **ඉතින් වපුරන්නාට බීජද කෑමට රොටිද සපයාදෙන්නාවූ තැනන්වහන්සේ නුඹලාට වැපිරීම පිණිස බීජ සපයාදී, වැඩිකොට, නුඹලාගේ ධර්මිෂ්ඨකමේ ඵල වර්ධනය කරන සේක. (2 කොරින්ති 9:10)**

දෙවියන්වහන්සේ ඔබට ඵල දරන පිණිස ඔබගේ ආත්මික දීමනා හා හැකියාවන් වර්ධනය කර දෙන සේක.

දෙවියන්වහන්සේ ඔබගේ ආර්ථිකය වර්ධනය කර එමගින් එතුමාගේ සේවයෙහි අයෝජනය කිරීමට හැකියාව ලබාදෙන සේක. දෙවියන්වහන්සේ ඔබගේ ආර්ථිකයට ආශිර්වාද කොට වැඩිකර දෙන්නේ ඔබ මහත් වස්තු සම්භාරයක් රැස්කරගෙන තබාගැනීම පිණිස නොවේ. එහි අරමුණ වනුයේ එම ආශිර්වාද නැවත වරක් දේව රාජ්‍යයෙහි ආයෝජනය කිරීමය.

**ඔබ වපුරන කාලයෙහිම අස්වැන්න නෙලාගන්නේ නැත.:**

ආරම්භයෙහිදී දෙවියන්වහන්සේ සෘතු පිළිබඳ නියමයක් ස්වභාවික ලෝකයෙහි පිහිටවූ සේක.

> **පොළොව පවතිනතුරු වපුරන කාලය සහ කපන කාලයද ශීතය සහ උෂ්ණයද ග්‍රීෂ්ම කාලය සහ ශීත කාලයද, දවාල සහ රාත්‍රියද නොනවතින්නේයයි කීසේක. (උත්පත්ති 8:22)**

අස්වැන්නක් ලැබීමට නම්, වැපිරීමක් අවශ්‍ය වේ. එහෙත් වැපිරූ කන්නයෙහිම අස්වැන්න නෙලා ගත නොහැකි වේ. ආත්මික අස්වැන්නෙහි දර්ශනය ලද සමහරු මෙම ප්‍රතිපත්තිය අවබෝධ කර නොගැනීම නිසා අධෛර්යට පත් වෙති.

වැපිරීමට කාලයක් තිබේ. ඉන්පසුව දේව වචනය නමැති බීජය මනුෂ්‍යයන්ගේ හදවත් තුළ රෝපණය වීමට ඉඩදී සිටිය යුතුය. ඉතා ඉවසීමෙන් ගොවිතැන් කළ යුතු කාලයක් තිබේ. ඔබ වැපිරූ කන්නයෙහිම අස්වැන්න නෙලන්නේ නැත.

ගීතාවලිය 1 පරිච්ඡේදය ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයෙහි මෙම ක්‍රියාදාමය පිළිබඳව පවසයි.

> **ඔහු දිය ඇළවල් ළඟ හිඳවූ, නියම කලට ඵල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේය. ඔහු කරන සියල්ල සඵල වෙයි. (ගීතාවලිය 1:3)**

"සඵලවත්" අස්වනු ලැබෙන කන්නයක් තිබුණා යැයි පැවසීමෙන් අදහස් කරනුයේ එතරම් ඵලදායී නොවූ කන්නද තිබූ බවය. එවැනි ඵලදායි නොවූ කන්න වලදී ඔබ පස් කොටා, සූදානම්කොට, බීජ වපුරා, ගොවිතැන් කළ යුතුය. එහෙත් අස්වැන්න ලැබීම සඳහා එවැනි "එතරම් සඵලවත් නොවූ" කන්නද අවශ්‍ය වේ.

මෙය නිසි කාල නම් ප්‍රතිපත්තියෙහි වැදගත්කම පෙන්වා දෙයි. ඔබ බීජ වපුරා ඒවා මුල් ඇද පැළවී වර්ධනය වනතුරු ඉවසීමෙන් යුක්තව රැඳී සිටිය යුතුය. එසේම ඵල දැරූ පසු ඵල විනාශ වීමට පෙර වගාවේ අස්වැන්න නියමිත වකවානුවේ දී කපා ගැනීමට ඔබ හඳුනාගත යුතුය. නියමිත කාලයෙහිදී අස්වැන්න නෙලිය යුතුය.

> **ගොයම් පැසුණු කල, කපන කාලය පැමුණුන බැවින් ඔහු වහාම දෑකැත්ත යොදන්නේයයි කීසේක. (මාර්ක් 4:29)**

සැකෙවින් පවසනවා නම්...

> **උපදින්ට කාලයක් හා නසින්ට කාලයක්ය. සිටුවන්ට කාලයක් සහ සිටෙවූ ඒවා උදුරාදමන්ට කාලයක්ය. (දේශනාකාරයා 3:2)**

**ඔබ වපුරන දෙයම කපාගනු ඇත:**

ස්වභාවික ලෝකයෙහි වැපිරූ බීජවර්ගයේම පැළ බිහි වේ. ඔබ පැළ කළේ ඇපල් ඇට නම් ඔබට හිමිවනුයේ ඇපල් අස්වැන්නකි. ආත්මික ලෝකයෙහිද මෙය සත්‍යතාවයකි.

> **නොරැවටෙල්ලා: දෙවියන්වහන්සේට සරදම්කරන්ට කාටවත් බැරිය. මක්නිසාද මනුෂ්‍යයෙක් තමා වපුරන දේම කපාගන්නේය. (ගලාති 6:7)**

මාංශයට වැපිරීම දිරාපත්වී යන අස්වැන්නක් ගෙන දෙන අතර ධර්මිෂ්ඨකමින් වැපිරීමෙන් යහපත් අස්වැන්නක් ගෙන දේ.

**වාතාවරණය කුමක්වුවත් ඔබ වැපිරිය යුතුය**

වාතාවරණය සලකමින් සිටින අය කිසිදිනක අස්වැන්නේ දර්ශනයෙහි කොටස්කරුවන් නොවනු ඇත. අව්ව, වැස්ස, ශීත, සුළඟ යනාදී කාරණ ඉදිරිපත් කරමින් තම කෙතෙහි වැඩ කිරීම අතපසුකර දමන ගොවියෙකු මෙන් ඔවුන්ගේ වාතාවරණය ද ඔවුන්ව පරාජය කර දමනු ඇත.

> **හුළඟ බලාසිටින්නා නොවපුරන්නේය. වලාකුල් බලන්නා කපා නොගන්නේය. (දේශනාකාරයා 11:4)**

ආත්මික අස්වැන්නෙහි ඉතා වැදගත් උපක්‍රමයක් නම්, ජීවිතයෙහි ඔබගේ වටාපිටාව වාතාවරණය කුමක්වුවත් ඔබ බීජ වැපිරීමෙහි නිරත වී සිටීමය.

> **නුවරද සහමුලින්ම පහත්කමට පැමිණෙනවා ඇත. සෑම දියපාරවල් ළඟ වපුරන්නාවූ, ගොනාගෙත් කොටළුවාගෙත් පාද මුදන්නාවූ නුඹලා වාසනාවන්තයෝය. (යෙසායා 32:20)**

සියලුම ජලයන් මධ්‍යයේ පවා ඔබ වැපිරිය යුතුය. එනම් ජීවිතයෙහි මොනයම් ආකාර තත්වවලට පත්වුවද වැපිරිය යුතුය. ඔබගේ ජීවිතයේ අමාරුකම් දෝර ගලා දොගොඩතලා යන විටදී පවා ඔබ දිගටම වැපිරීම කරගෙන යා යුතුවේ. දෙවියන්වහන්සේ මහත් සරු අස්වැන්නක් ඔබට පොරොන්දුවී තිබේ.

**ඔබ වැපිරූ ප්‍රමාණයට අනුකූලව නෙලා ගනු ඇත**

> **නුමුත් මේක කියමි: මසුරුලෙස වපුරන්නා මසුරුලෙස කපාගන්නේය. නොමසුරුව වපුරන්නා නොමසුරුව කපාගන්නේය. (2 කොරින්ති 9:6)**

මෙම ප්‍රතිපත්තිය ඔබගේ ආත්මික ජීවිතයෙහි සියලුම අංශවලට අදාළ වේ. ඔබ දෙවියන්වහන්සේගේ කාර්යය උදෙසා කොඳුරමින් අදිමදි කරමින් ඔබගේ කාලය, දීමනා, සහ මුදල් දෙනවා නම් ඔබ ලබන අස්වැන්න ස්වල්ප වනු ඇත. ඔබ නොමසුරුව වපුරනවා නම් නොමසුරුව කපාගනු ඇත. යොහන් 15 වෙනි පරිච්ඡේදයෙහි ආත්මික ඵල දැරීමේ විවිධ මට්ටම් පිළිබඳව විස්තර කර දෙයි. ඔබට ඵල දැරීම මෙසේ කළ හැකිය. එනම්,

- ඵල — යොහන් 15:2
- වඩා ඵල — යොහන් 15:2
- බොහෝ ඵල — යොහන් 15:4
- සදාකාලික ඵල — යොහන් 15:16

දෙවියන්වහන්සේගේ ආශාව නම් ඔබ බොහෝ ඵලදැරීමත් එය සදාකාලිකව පැවතීමත්ය.

ඔබ සඵලවත්වන පිණිස ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංග කිහිපයක් පේතෘස් හඳුන්වා දෙයි.

**එසේය, මේ කාරණය නිසාම මුළු උත්සාහයෙන් නුඹලාගේ ඇදහිල්ල සමඟ ගුණයද, ගුණය සමඟ දැනගැන්මද, දැනගැන්ම සමඟ පමණ දැන ක්‍රියාකිරීමද, පමණදැන ක්‍රියාකිරීම සමඟ ඉවසිල්ලද, ඉවසිල්ල සමඟ දේවභක්තියද, දේවභක්තිය සමඟ සහෝදර ස්නේහයද, සහෝදර ස්නේහය සමඟ ප්‍රේමයද සපයාගනිල්ලා. මක්නිසාද මේවා නුඹලාට තිබේ නම්, වැඩිවේ නම්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැනගැනීමෙහි කම්මැළි බවටවත් අඵල බවටවත් පැමිණෙන්ට ඒවා නුඹලාට ඉඩ නොදෙයි.** (2 පේතෘස් 1:5-8)

ඔබ මෙම ගුණාංග වර්ධනය කර නොගතහොත් දර්ශනය හිනවී යනු ඇතැයි පේතෘස් අනතුරු අඟවයි.

**නුමුත් මේවා නැති තැනැත්තේ තමාගේ පරණ පව්වලින් පවිත්‍ර කරනු ලැබූ බව මතකනැතිකොට, ළඟ තිබෙන දේ පමණක් බලමින්, අන්ධව සිටියි.** (2 පේතෘස් 1:9)

**ඔබ වැපිරූ තැනින් නෙලා නොගැනීමද වැපිරූ නැති තැනකින් නෙලා ගැනීමද සිදුවිය හැකිය.**

ඉශ්‍රායෙල් ජනතාව පොරොන්දු දේශයට ඇතුළුවූ කල ඔව්හු තමුන් නොවැවූ මිදි වතුවල ඵල භුක්ති විඳිනු ඇතැයි දෙවියන්වහන්සේ පැවසූ සේක. ඔව්හු නොවැපුරූ අස්වැන්නක් නෙලා ගනු ඇත.

ආත්මික ලොවෙහිද මෙය සත්‍යයකි. අනෙකෙකු වැපිරූ බෝගයක අස්වැන්න නෙලීම ඔබ ඉටු කළ හැකිය.

**මක්නිසාද: එක්කෙනෙක් වපුරන්නේය, වෙන කෙනෙක් කපන්නේය යන කීම මෙයින් සැබෑවේ. නුඹලා විසින් වැඩ නොකළ ගොයම් කපන්ට මම නුඹලා යැවීමි. අන්‍යයෝ වැඩකළෝය, නුඹලා ඔවුන්ගේ වැඩට පැමින්නෝයයි කීසේක.** (යොහන් 4:37-38)

සියවස් ගණනක් පුරා ඇදහිලිවතුන් ලෝකය නමැති කෙතෙහි තම ජීවිත වපුරා ඇත. අප ස්වාමින්වහන්සේ නැවත-ඒමට සමීපව සිටින මේ වකවානුවෙහි ඔවුන්ගේ එම වැපිරීම් ජාතීන් තුළ මහත් අස්වැන්නක් ගෙන දෙයි. ඔබ වපුරා නොමැති තැනක අස්වැන්න නෙලීමෙහිදී ඔබත් ඔවුන්ගේ වෙහෙසට ඇතුළු වේ.

එසේම ඔබද කිසිදාක ඔබ වැපිරූ දෙයෙහි අස්වැන්න නොදුටු එහෙත් වැපිරීමෙහි යෙදී සිටින්නෙකු විය හැකිය.

පාවුල් මේ පිළිබඳව පවසමින්:

**මම හිටෙවුවෙමි, අපොල්ලොස් වතුර වත්කෙළේය: නුමුත් වර්ධනය දුන්නේ දෙවියන්වහන්සේය. එබැවින් වර්ධනය දෙන දෙවියන්වහන්සේ මිස හිටවන තැනැත්තේද කිසිත් නැත. හිටවන තැනැත්තෙත් වතුර වත්කරන තැනැත්තෙත් එකය. එක් එක්කෙනා තම තමාගේ වැඩේ හැටියට තම තමාගේ විපාකය ලබන්නේය. මක්නිසාද අපි දෙවියන්වහන්සේගේ හවුල් වැඩකරන්නෝය. නුඹලා දෙවියන්වහන්සේගේ කෙතය, දෙවියන්වහන්සේගේ ගොඩනැගිල්ලය .** (1 කොරින්ති 3:6-9)

**ඔබ විශ්වාසවන්තව සිටියහොත් අස්වැන්න නෙලාගනු ඇත.**

**තවද යහපත්කම්කිරීමට මැළිනොවෙමු: මක්නිසාද අපි ක්ලාන්ත නොවෙමු නම්, නියම කාලයේදී කපාගන්නෙමුව.** (ගලාති 6:9)

**එබැවින්, සහෝදරයෙනි, ස්වාමින්වහන්සේගේ ඊම දක්වා ඉවසාපල්ලා, බලව, ප්‍රථම සහ අන්තිම වර්ෂාව පැමිණෙන තුරු ඉවසීමෙන් ගොවියා පොළොවේ අනර්ඝ ඵල ගැන බලාසිටී.** (යාකොබ් 5:7)

ඔබ විශ්වාසවන්ත නම් ඔබ අස්වැන්න නෙලන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වී තිබේ. දෙවියන්වහන්සේ ඔබහට ඉටු කිරීමට පවරා ඇති කාර්යයෙහි යෙදීමෙන් ක්ලාන්ත නොවන්න.

**බීජකින් නැවත-නිපදවීමක් සඳහා එම බීජය මිය යා යුතුය**

බීජයක් මිය ගිය දෙයක් මෙන් පෙනේ. එහි කොළ පාට කොළ නැත, ලා දළු හෝ රිකිලි නැත. එය පැලවෙන පිණිස බීජය පස් යට වැලලිය යුතුය.

මෙය විශිෂ්ට ආත්මික සත්‍යයක ස්වභාවික සමාන්තරය වේ. ආත්මික ජීවිතය රඳා පවත්නිනේ පූජාවීමේ මරණය තුළය.

> **අඥානය, නුඹම වපුරන දේ මළොත් මිස නැත්නම් පැළවෙන්නේ නැත.** (1 කොරින්ති 15:36)

ජීවනය ගෙන දෙන පිණිස යේසුස්වහන්සේට කුරුසිය මත මිය යාමට සිදුවිය. එතුමාගේ සේවය මරණයෙන් අවසන්වීම නිරපරාදේ සිදුවුවක් ලෙස බැලූ බැල්මට පෙනේ.

නමුත් එය එතුමාගේ වැපිරීමේ කාලය විය. එතුමාගේ ජීවිතය එක් තිරිඟු බීජයක් පොළොවට වැටී මහත් අස්වැන්නක දෙන්නාක් මෙන් මහත් ජීවනයක් මිලියන් ගණනක් ජනතාවට හිමිකර දී ඇත.

ආත්මික ජීවිතය පූජාවීමේ මියයාමක් අපේක්ෂා කරයි. එය පාපයට මිය යාමක් අපේක්ෂා කරයි. එය ලෞකික ආශාවන්ට විනෝදවීම් වලට මිය යාමක් අපේක්ෂා කරයි.

ඉක්වදෝර්හි විසූ ඇකුවා ඉන්දියන්වරුනට ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය ගෙනයාමේ ප්‍රයන්තයෙහිදී වේදසාක්ෂිකරුවෙකු ලෙස මියගිය ජිම් එලියට් තම දිනපොතෙහි මෙසේ ලියා තිබුණි. "තමාට රැකගැනීමට නොහැකි දෙය තමාට අහිමි කරගත නොහැකි කාරණාව උදෙසා පුද දෙන්නාවූ තැනැත්තා කිසිවිටක මෝඩයෙක් නම් නොවේ"

ස්වභාවික ලෝකයෙහි අවසාන පරස්පරය වන්නේ මරණයයි. මන්ද ස්වභාවික මරණය ඇදහිලිවන්තයා හට සදාකාලික ජීවනයට මං පාදන බැවිනි. සැබවින්ම මිය යාම වන්නේ මිය යාමට තරම් වටිනා දෙයක් ඔබ සතු නොවූ විටය. එනිසා ඔබ යමක් උදෙසා ජීවත්වේද එය උදෙසා මිය යාමට තරම් එම කරුණ වටිනා දෙයක් වීමට වගබලාගන්න.

සමහර අවස්ථාවලදී අස්වැන්නෙහි ජායාවක් ඔබට නොපෙනෙනු ඇත. මියයන දර්ශනයක් උදෙසා ඔබ ඔබගේ ජීවිතය වැය කරනවායැයි ඔබට හැඟියාමට පුළුවන.

එනමුත් ඔබ මතක තබා ගත යුතු වන්නේ:

> **සැබවක් සැබවක් නුඹලාට කියමි-ගෝධුම බීජය පොළොවෙහි වැටී නොමළොත් තනිව තිබෙයි: නුමුත් මළොත් බොහෝ ඵල දෙයි.** (යොහන් 12:24)

යේසුස්වහන්සේ නිරපරාදේ මියගියේ නැත. එතුමාගේ මරණය තුළින් ජීවනය ලැබුණි. උන්වහන්සේගේ මරණය තුළින් අනෙක් අය එතුමා උදෙසා ශුභාරංචිය ව්‍යාප්තකිරීමට පියවර ගත් බැවින් ඇකුවා ඉන්දියන්වරුනට ගැළවීම හිමි විය.

බීජය මියගිය දෙයක් නොවේ. එය තුළ දෙවියන්වහන්සේගේ ජීවන බලය ගැබ්වී තිබේ. නුමුත් එම ජීවනය පුබුදුවාලීමට නම් බීජය මිය යා යුතුය. මෙවන් අයුරින් ඔබගේ ජීවිතය ආයෝජනය කිරීමෙහි ප්‍රතිඵල හොෂෙයා පවසයි.

> **මම ඈ දේශයෙහි මට වපුරාගන, කරුණාව නොලත් ඇත්තිට අනුකම්පා කරන්නෙමි. මාගේ සෙනඟ නොවූවන්ට: නුඹ මාගේ සෙනඟයයි කියන්නෙමි. ඒ අයද: ඔබ මාගේ දෙවියන්වහන්සේයයි කියනවා ඇත.** (හොෂෙයා 2:23)

ආත්මික අස්වැන්න සඳහා උපක්‍රම භාවිත කිරීමෙහි පරමාර්ථය මෙම පදයෙහි සාරාංශගත කොට තිබේ. ඔබගේ ව්‍යායාමය තුළින් දෙවියන්වහන්සේට මෙතෙක් උන්වහන්සේගේ ජනතාවක්ව නොසිටි අය දෙස බලා "ඔබ මාගේ සෙනඟය" කීමටත් ඔව්හු කතාකොට "ඔබවහන්සේ මාගේ දෙවිඳානෝය" කීමටත් හැකියාව ලබාදෙනු ඇත.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න

2. "උපක්‍රම" යන්න අර්ථ දක්වන්න.

3. මෙම පරිච්ඡේදයෙහිදී සාකච්ඡා කළාවූ ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම නවය සඳහන් කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

### මිදිවත්තේ උපමාව

බයිබලයෙහි මිදිවත්ත පිළිබඳ මොනයම් උපමා සහ ආත්මික අස්වැන්න පිළිබඳ වැඩි විස්තර සඳහන් වේ. වපුරන්නාගේ උපමාව (මතෙව් 13, මාර්ක් 4, ලූක් 8) මෙම පාඨමාලාවේ වෙන ස්ථානයකදී සවිස්තර කෙරේ. වැඩිපුර අධ්‍යයනය සඳහා අනෙකුත් උපමා පහතින් දී තිබේ.

**ඉදුනු ඵල පෙට්ටිය: ආමොස් 8:1-2**

දෙවියන්වහන්සේ ආමොස්ට පෙන්වූ ස්වභාවික උදාහරණය කුමක්ද? ____________________

මෙම උදාහරණයෙහි තේරුම කුමක්ද? ____________________

දෙවියන්වහන්සේගේ වචනයට අකීකරුවීමෙහි විනිශ්චය ලෙස ඉශ්‍රායෙල් පිටට එතුමා එවූ මහත් සාගතය කුමක්ද? (11-12 පද) ____________________

**දෙවියන්වහන්සේගේ මිදිවත්ත: යෙසායා 5:1-7**

මෙම උපමා කථාව ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳවය. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් ජාතිය ආත්මික ලොවෙහි පැල කොට තිබෙන්නේ ඔවුන් ඵලදරා ලෝකයෙහි සියලු ජාතීන්ට ආශිර්වාද කරන පිණිසය. නමුත් ඉශ්‍රායෙල් සඵලවත් වී නොමැත. එවිට ඉශ්‍රායෙල්හි ආත්මික අස්වැන්නට කුමක්වීද? (4 පදය) ____________________

මිදිවත්ත කෙරෙහි විනිශ්චය කුමක්වීද? (5,6 පද) ____________________

7 වෙනි පදයෙහි ඇති පරස්පර දෙය කුමක්ද?

දෙවියන්වහන්සේ ____________________සෙවූ නමුත් ____________________ සම්බවිය.
උන්වහන්සේ____________________ සෙවූ නමුත්____________________ (අයුක්තිය)
____________________ සම්බවිය.

ඉශ්‍රායෙල් මෙම ආත්මික තත්වයෙහි සිටීමට හේතුව කුමක්වීද? (13, 20 පද)

____________________

**<u>දෙවියන්වහන්සේගේ මිදිවත්ත</u> : මතෙව් 21:28-41; මාර්ක් 12:1-9, ලූක් 20:9-16.**

අලුත් ගිවිසුමෙහි සඳහන් මෙම උපමාවද දෙවියන්වහන්සේගේ මිදිවත්ත සම්බන්ධවය. එය දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරු උන්වහන්සේ ඉශ්‍රායෙල් වෙතට එවූ ආකාරයත් ඔව්හු ඔවුන්ව ප්‍රතික්ෂේප කළ ආකාරයත් විස්තර කරයි. අවසානයෙහි දෙවියන්වහන්සේ තමන්ගේම පුත්‍රයා එවූ කල ඔව්හු උන්වහන්සේවද ප්‍රතික්ෂේප කළහ.

දෙවියන්වහන්සේ එවූ සේවකයන් කෙරෙහි කෙතෙහි ගොවියාගේ (ඉශ්‍රායෙල්හි) ප්‍රතිචාරය කුමක්වීද?

____________________

එතුමාගේ පුත්‍රයා කෙරෙහි ඔවුන්ගේ ප්‍රතිචාරය කුමක්වීද? ____________________

දෙවියන්වහන්සේ එවූ විනිශ්චය කුමක්ද? ____________________

(එය උන්වහන්සේ දෙන්නාවූ අනෙක් කොටස නම් අන්‍යජාතීන්ය)

**අත්තික්කා ගස : ලූක් 13:6-9**

අත්තික්කා ගසෙහි අයිතිකරු එල රැස්කිරීමට පැමිණි කල ඔහු දුටුවේ කුමක්ද? ____________________

ඔහුට කුමක් කිරීමට අවශ්‍ය විද? ____________________

මිදිවත්තේ මුරකරුගේ ප්‍රතිචාරය කුමක්විද? ____________________

අත්තික්කා ගස නියෝජනය කළේ ඉශ්‍රායෙල්වරුන්ය. මෙම උපමාවෙහි අර්ථය කුමක්යැයි ඔබ සිතනවාද? ____________________

**මිදිවත්තේ සේවකයෝ: මතෙව් 20:1-16**

උදෑසනින්ම වැඩට කැඳවාගත් අයගේ වේතනය කුමක්විද? ____________________

සවස් යාමයෙහි වැඩට කැඳවාගත් අයගේ වේතනය කුමක්විද? ____________________

සේවකයෝ අතර පැන නැගුන ගැටලුව කුමක්ද? ____________________

යේසුස්වහන්සේ මෙම උපමාවෙන් පෙන්නුම් කර දුන් ප්‍රතිපත්තිය කුමක්ද? (16 පදය)

____________________

**පුත්තු දෙදෙනා : මතෙව් 21: 28-31**

පියා පුතුන් හට මිදිවත්තේ වැඩ කරන ලෙස ඉල්ලා සිටි කල :

පලමුවැනි පුතා ඔහුට පිළිතුරු දුන්නේ කෙසේද? ____________________

පලමු පුතා කුමක් කලේද ? ____________________

දෙවෙනි පුතා ඔහුට පිළිතුරු දුන්නේ කෙසේද ? ____________________

දෙවෙනි පුතා ඇත්තෙන්ම කුමක් කලේද ? ____________________

මෙම උපමාව තුලින් යේසුස් වහන්සේ ඉගැන්වූ මුලධර්මය කුමකද ? ____________________

**අස්වැන්න: මතෙව් 9:37-38, ලූක් 10:2, යොහාන් 4:34-38, 12:24**

යේසුස් වහන්සේ ආත්මික අස්වැන්න පිළිබඳ ආත්මික සත්‍යයන් විදහා දැක්වීමට කිහිප විටක්ම අස්වැන්නේ උපමාව යොදා ගත් සේක. කෙතෙහි පවතින විශාලතම අවශ්‍යතාවය කුමක්ද?

____________________

මෙම අවශ්‍යතාවය සඳහා ඔබට කළ හැකි එක් දෙයක් කුමක්ද (මතෙව් 9:38) ?

____________________

යේසුස් වහන්සේ යොහාන් 12:24 හි ඉදිරිපත් කර ඇති අස්වැන්න පිළිබඳ ප්‍රතිපත්තිය කුමක්ද?

____________________

යොහාන් 4:36-38 න් වපුරන්නෝ හා නෙලාගන්නේ පිළිබඳව ඔබට ඉගෙන ගත හැකි සත්‍ය මොනවාද?

____________________

**කිරිඳි : මතෙව් 13:24-30**

කුඹුරෙහි වපුරන ලද්දේ කුමනාකාර බීජද ? ____________________

සේවකයන් නිදාගෙන සිටියදී කුමක් සිදුවීද ? ____________________

වපුරන ලද කිරිඳි නිසා ඇතිවූ ගැටළුව සඳහා පිලියම කුමක් වීද? (30 පදය) ? ____________________

____________________

අයිතිකරු එම විසඳුම ගැනිමට තිරණය කළේ මන්ද? (29 පදය) ? ____________________

කිරිඳි සහ තිරිඟු වෙන්කිරීමේ වගකීම පැවරී ඇත්තේ අපටද ? ____________________

**අබ ඇටය : මතෙව් 13:31-32, මාර්ක් 4:31-32, ලූක් 13:18-19**

සියළුම ඇට වලින් ඇටය අබ ඇටය වේ.

එය වැඩුනු කල කුමන ආකාරයේ පැලයක් වේද? ____________________

යේසුස්වහන්සේ මෙම අබ ඇටයේ උපමාවෙන් නිරූපනය කර දැක්වුයේ කුමන ආත්මික සත්‍යතාවයක්ද ? ____________________

මතෙව් 17:20 දී යේසුස්වහන්සේ අබ ඇටය ඇදහිල්ලේ උදාහරණයක් ලෙස යොදාගත් සේක. සුළු ප්‍රමාණයක ඇදහිල්ලේ බලපෑම කුමක්ද ? ____________________

# හත්වන පරිච්ඡේදය

## ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම

### ෂෂ කොටස

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට :

- පැල වර්ධනය වීමේ ස්වභාවික මූලධර්මයෙහි ආත්මික සමාන්තරන් පැහැදිළි කිරිමට හැකිවෙනු ඇත.
- මෙම සමාන්තර ආත්මික අස්වැන්නේ උපක්‍රම අදාල කරගැනිමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මක්නිසාද පොළොව ස්වකිය දළු උපදවන්නාක් මෙන්ද උයන එහි වපුළ දේ ලියලවන්නාක් මෙන්ද මහොත්තම ස්වාමිවූ දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨකම හා ප්‍රශංසාව සියලූ ජාතින් ඉදිරියෙහි හටගනවන්වනවා ඇත. (යෙසායා 61:11)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදයෙහිදී අපි තව දුරටත් ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම ඉගෙනගනිමු. මෙහිදී අස්වැන්න පිළිබඳ අවසාන මූලධර්මයක් අපි හඳුනාගනිමු, එනම් : සමහර බාහිර සාධක වලට ප්‍රතිචාරයක් ලෙස බීජ වර්ධනය වේ.

ස්වභාවික ලෝකයෙහි බීජ පැලවීමට හා වර්ධනය වීමට කිසියම් නියමිත තත්වයන් පැවතිම අවශ්‍ය වේ. ආත්මික ලෝකයෙහි දේව වචනය නමැති බීජ පැලවීමට හා ආත්මික අස්වැන්නක් ගෙන ඒමට මෙම ස්වභාවික තත්වයන් වලට සමාන්තර ආත්මික සාධක පැවතිය යුතුය.

### වර්ධනය සඳහා සුදුසු තත්වයන්

**ජීවනය:**

ජීවයෙන් තොරව වර්ධනයක් කිසිසේත් සිදුවිය නොහැක. බීජය තුල ජීවය තිබිය යුතුය. නැත්නම් එය පැල නොවේ. යේසුස්වහන්සේ දේව වචනයෙහි දෘෂ්‍යමාන එළිදරව්වය. උන්වහන්සේ බීජය විය, උන්වහන්සේ තුල ජීවනය විය.

> **උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය, ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වූයේය. (යොහාන් 1:4)**

> **මක්නිසාද පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක් මෙන් පුත්‍රයාටත් තමන් ජීවනය ඇතුව සිටින්ට උන්වහන්සේ වරය දුන් සේක. (යොහාන් 5:26)**

යේසුස්වහන්සේ පැමිණියේ මෙම ජීවනයේ බීජය ඔබ තුල පැල කොට ඔබ නැවත - එලදැරීමට සැලැස්වීමටය.

**සොරා එන්නේ සොරකම්කරන්නටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහාන් 10:10)**

උන්වහන්සේගේ ජීවනය ඔබ තුල පවතී. ඔබ එතුමාගේ වචනය වන බීජ පැල කළ විට මෙලෙස සිදුවන බව දනී. එනම්.

**එලෙස වැස්ස හා හිම අහසෙන් බැස පොළොව පොගවා, සශ්‍රිකකර ඵල හටගන්වා, වපුරන්නාට බිජ ද, කන්නාට කෑමද දෙන තුරු එහි හැරී නොයන්නාක් මෙන් මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවිත්, මා කැමති දෙය සිදුකොට, මා නියම කල කාරණය සඵල කරනවා ඇත. (යෙසායා 55:10-11)**

**නියම පස් :**

කලින් සුදානම් නොකළ බිම මහත් අස්වැන්නක් සැපයිම වලක්වන බවත් හොඳ අස්වැන්නක් සඳහා නියමිත පස් අවශ්‍ය බවත් ඔබ මෙම පාඩමෙහිදී ඉගෙන ගත්තෙහිය.

**සරුබිමේ වපුරන ලද්දෝ නම්, වචනය අසා, පිළිගෙන. තිස් ගුණයක්ද සැට ගුණයක්ද සියක් ගුණයක්ද බැගින් ඵල දරන්නෝ යැයි කී සේක. (මාර්ක් 4:20)**

ඔබ ආත්මික ලොවෙහි ගොවිතැන් කරන කල ඔබගේ ප්‍රයත්නයන් කැටිකොට යෙදවිය යුත්තේ සරු බිම්වලටය. ඔබ මනා කොට බිම සකසා දේව වචනය නමැති බීජ නිසියාකාරයෙන් වැපිරිය යුතුය. අස්වැන්නක් නෙලා ගැනිමට නම් මෙම කාරණා දෙකම අවශ්‍ය වේ.
(හොෂෙයා 10:12, යෙරමියා 4:3).

වපුරන්නාගේ උපමාවට අනුව (මාර්ක් 4:3-20), අස්වැන්නක් හිමි නොවේ නම්, එයට හේතු විය හැකි වෙනසකට ඇත්තේ භූමිය වේ. මෙය අස්වැන්න සඳහා වැදගත් මූලධර්මයකි. ප්‍රතිචාර නොදක්වන භූමිය අත්හැර දැමිය යුතු නොවේ. යම් කිසිවෙක් එහි භූමිය පෙරලා සකසා වපුරා අස්වැන්න නෙලීම සඳහා සුදුසු කාලය හඳුනාගත යුතුය (ලූක් 13:6-9). නුමුත් ඔබගේ ආත්මික බලවේගයන් යොමු කළ යුතු ස්ථානය මෙය නොවේ. යේසුස් වහන්සේ වපුරන්නන්ගේ හිඟයක් පවතිවී යයි කිසිවිටක නොපැවසූ සේක. නමුත් අස්වැන්න නෙලන්නන්ගේ හිඟයක් ඇති බව පැවසූ සේක. ආත්මික කම්කරු බලවේගය වැඩිපුර යොමු කළ යුත්තේ ප්‍රතිචාර දක්වන්නාවූ ඵල ගෙනදෙන්නවූ අස්වැන්න ලැබිය හැකි භූමි වෙතටය.

අස්වැන්න නෙලීම සඳහා නියමිත කාලය ඉතා වැදගත් වේ. බීජ වැපිරූ ගමන්ම නැතහොත් පැළැටි වල ගෙඩි තවමත් කොළපාටට ඇති කාලයෙහිදී අස්වැන්න නෙලන්නන්ගේ අවශ්‍යතාවයක් පැන නොගනී. එහෙත් සරු බිමෙහි අස්වැන්න මෝරා කපාගත යුතු ඉතා වැදගත් කෙටි කාලීන සුක්ෂම මොහොතක් එළැඹේ. අන්න එවිට බොහෝ නෙලන්නන්ගේ අවශ්‍යතාවයක් හටගනී. මෙවැනි තීරණාත්මක මොහොතකදී සියළුම කම්කරුවෝ ආත්මිකව ප්‍රතිචාර නොදක්වන්නාවූ නිසරු ගොවි බිම් වල වැඩ බහුලව නියැලී සිටිත් නම් නෙලීමට කම්කරුවෝ හිඟ වේ නම්, අස්වැන්න රැස්කරුගැනීමට තිබූ මහඟු අවස්ථාවක් සදාකාලයටම ගිලිහි යනු ඇත.

**ජලය :**

ස්වභාවික ලෝකයෙහි බීජයක් මුල් ඇද පැළවීමට නම් ජලය අවශ්‍ය වේ. දෙවියන් වහන්සේ පොරොන්දු වුයේ :

**මක්නිසාද පිපාස ඇත්තා කෙරෙහි වතුරද වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරුවන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරුවන්නෙමි. (යෙසායා 44:3)**

මෙලෙස ජලය වැගිරීම සංකේතවත් කරනුයේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලේපය වැගිරවීමකි.

**මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරුවන්නෙමි. (යෙසායා 44:3)**

**මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජිවනදයක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක. (යොහාන් 7:38)**

පාපයෙහි මැරී සිටින පුද්ගලයන්ගේ හදවත් තුල දේව වචනය නම් බීජය මුල් ඇද පැලවීමට සලස්වනුයේ ශුද්ධාත්මයාණන් නම් ජලය වේ.

> **මක්නිසාද ගහක් කපාදැමුවහොත් ඒක දෙවනු ලියලා ඒකේ රිකිලි හටගන්නේය යන බලාපොරොත්තුව ඇත්තේය. ඒකේ මුල බොහෝ කල් පොළොවෙහි පරණවී ඒකේ කඳ බිමෙහි මැරුණත්, වතුරට පෙගීමෙන් ඒක දළුලා පැළෑටියක් මෙන් අතු ලියලනවා ඇත. (යෝබ් 14:7-9)**

**ආලෝකය :**

ස්වාභාවික ලෝකයෙහි ශාඛා පැලවීම හා වැඩීම උත්තේජනය වනුයේ ආලෝකයට ප්‍රතිචාරයක් ලෙසටය, ආත්මික අස්වැන්න ලබාදීමට වර්ධනය ඇති කරවනුයේ දෙවියන් වහන්සේගේ ආලෝකයෙහි ප්‍රතිඵලයක් ලෙසටය.

> **උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය, ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වූයේය. (යොහාන් 1:4)**
>
> **එබැවින් යේසුස් වහන්සේ නැවත ඔවුන්ට කථාකරමින්, මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කී සේක. (යොහාන් 8:12)**

දෙවියන්වහන්සේගේ ආලෝකය ආත්මික ජීවනය ගෙන දෙයි.

**වාතය :**

ස්වභාවික පැලෑටි අවට ඇති වාතයෙන් කාබන් ඩයොක්සයිඩ් නම් වැදගත් ද්‍රව්‍යයක් උරාගනී. පැලෑටියක වර්ධනයට වාතය අවශ්‍යයයි. බයිබලයෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ වාතයට හෝ සුළඟට සමාන කොට දක්වා ඇත.

> **හුළඟ කැමති කැමති තැනට ගසයි, එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේද කියාවත් කොතැනටයන්නේද කියාවක් නුඹ දන්නේ නැත. ආත්මයාණන්ගෙන් ඉපිද සිටින සියල්ලෝම එසේම යයි කී සේක. (යොහාන් 3:8)**

ශුද්ධාත්මයාණෝ දේව වචනය නමැති බීජයට හුස්ම හෙළයි. එමගින් ආත්මික වර්ධනය සිදුවේ.

**ඉඩකඩ :**

වපුරන්නාගේ උපමාවෙහි පැලවලට ඉඩ සඳහා තිබූ තරඟකාරීත්වය කරණකොටගෙන සමහර පැල මරනයට පත්විය.

> **කටු අතරෙහි වපුරන ලද්දේ නම්, වචනය අසා, ලෝකය ගැන වෙහෙසීමෙන්ද වස්තුවේ රැවටිලිකාරකමෙන්ද වචනය යටවීමෙන් ඵල නොදරන තැනැත්තාය. (මතෙව් 13:22)**

**මූල පද්ධතිය :**

පැලයට පෝෂ්‍ය පදාර්ථ සැපයීමට හා පසෙහි රැඳී සිටීමට මූල පද්ධතියක් අවශ්‍යය. ඔබගේ ආත්මික ජිවිතයෙහි මූල පද්ධතිය සංවර්ධනය කළ හැකි ක්‍රමය ගීතාවලිය 1 හි සඳහන් වේ.

> **දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දවල් මෙනෙහි කරන්නාවූ, මනුෂ්‍යයා ආශිර්වාදලද්දේය. ඔහු දිය ඇලවල් ළග හිඳුවූ , නියම කලට ඵල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේයඃ ඔහු කරන සියල්ල සඵල වෙයි. (ගීතාවලිය 1:1-3)**

**විවේකය :**

"නිද්‍රාගත කාලය" නම් කාල චක්‍රානුවකදී පැලෑටි විවේක ලබාගනී, ඉතා සිඝ්‍ර වර්ධනයකට සමීප කාලයකදී පැලෑටි "නිද්‍රාගත" වේ. පැලෑටිය මියගොස් මෙන් පෙනී යා හැක. එනමුත් එය මිය ගොස් නොමැත. එය තුල බීජ ජීවය තවමත් රැඳී පවතී.

ඔබ මනුෂ්‍යයන්ගේ ජීවත වල දේව වචනය තැන්පත් කළ පසුව ඔවුන්ගේ කිසිම වර්ධනයක් නොපෙනෙන කාල පරිච්ඡේදයක් ගත කරනු ඔබට දැකිය හැක. ඔබගේ කාර්යයෙහි ඔබ අසමත් වී ඇතැයි ඔබට සිතෙන්නට පුළුවන. එනමුත් බීජය මියගොස් නොමැත.

ස්වභාවික ලෝකයෙහි මෙන්ම ආත්මික ලොවෙහිද ඉතා සිඝ්‍ර වර්ධනයකට හා අස්වැන්නකට පෙර ආත්මික නිද්‍රාකාලයක් පවතී. එවැනි අවදියෙහිද ඉවසිලිවන්තව අස්වැන්න බලාපොරොත්තුව සිටින්න.

> **එබැවින්, සහෝදරයෙනි, ස්වාමීන්වහන්සේගේ ඊම දක්වා ඉවසාපල්ලා. බලව, ප්‍රථම සහ අන්තිම වර්ෂාව පැමිණෙන තුරු ඉවසමින් ගොවියා පොළොවේ අනර්ඝ එල ගැන බලා සිටී. (යාකොබ් 5:7)**

**මිදිවැලට සම්බන්ධව පැවතිම :**

ස්වභාවික ලොවෙහි යම් පැළෑටියක අත්තක් එල දැරීමට නම් එම අත්ත ප්‍රධාන පැළෑටියකට යාවී පැවතිය යුතුය. අත්තට ජීවය සපයා ප්‍රධාන කඳෙන් හෝ වැලෙන් අත්ත කඩා දැමුවහොත් එහි එල හට ගත නොහැක.

යේසුස් වහන්සේ ප්‍රධාන මිදි වැලය, අපි එහි අතු වෙමු. ඔබ ආත්මිකව එල දැරීමට නම් ඔබ උන්වහන්සේ තුල සම්බන්ධතාවයේ පැවති සිටිය යුතුය.

> **මම සැබෑවූ මිදිවැලය, මාගේ පියාණන් වහන්සේ ගොවියාය. මා තුළෙහි තිබී එල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරනසේක. එල දරන සියලු අතු වඩා එල දරන පිණිස උන්වහන්සේ පවිත්‍ර කරන සේක. මා විසින් නුඹලාට කී වචනය කරණකොටගෙන නුඹලා දැන් පවිත්‍රය, මා තුළ පැවැතියල්ලා, මමත් නුඹලා තුළ පවතින්නෙමි. අත්ත මිදිවැලෙහි නොපවතිනම් තනියම එල දරන්ට බැරුවාක් මෙන්, නුඹලා මා තුළෙහි නොපවතිවූ නම්, එල දරන්ට නුඹලාට බැරිය. (යොහාන් 15:1-4)**

**කප්පාදුව :**

ස්වභාවික ලොවෙහි ගසක් එල දැරීමට හා නැවත නැවතත් එල නිපදවීමට නම් කප්පාදු කිරීම අවශ්‍ය වේ. ගොවියෙක් ගසක් කප්පාදු කරන විට එල නොදරන අතු කපා ඉවත් කොට අනෙක් අතුවලට වඩා එල දැරීමට අවස්ථාව සලසා දෙයි. ගසෙහි වර්ධනයට බාධා කරන සියළු දෑ ඔහු ඉවත් කර දමයි.

ආත්මික ලෝකයෙහිද කප්පාදු කිරීම අවශ්‍ය වේ. ආත්මික කප්පාදුව නම් දෙවියන් වහන්සේ විසින් අපව නිවැරදි කරවීමය. බයිබලය මෙයට හික්මීම කියාද නම් කරනු ඇත. දෙවියන් වහන්සේ කප්පාදු කරන කල ඔබගේ ආත්මික ජීවිතයට බාධාවක් වන සියළු දේ ඉවත් කර දමන සේක. ඔබට ආත්මික පළ දැරීමට අවශ්‍ය නම් මෙම ක්‍රියාවලිය අවශ්‍ය වේ.

> **මා තුළෙහි තිබී එල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරන සේක. එල දරන සියලු අතු වඩා එල දරන පිණිස උන්වහන්සේ පවිත්‍ර කරන සේක. (යොහාන් 15:2)**

සමහර අවස්ථාවලදී දෙවියන් වහන්සේ ඔබව නිවැරදි කරන පිණිස ජීවිතයෙහි විවිධ සිදුවීම් ඇති කරන නමුත් ඔබ එහිදී සාතන්ට චෝදනා කිරීමෙහි යෙදීම නිසා හික්මවීමේ කප්පාදුවෙහි එල අත් නොදකිනු ඇත. හොෂෙයා 6:1 හි දෙවියන් වහන්සේ විසින් අපව නිවැරදි කරවීමේ පරමාර්ථය පෙන්වා දේ.

**වරෙල්ලා , අපි ස්වාමින්වහන්සේ වෙතට හැරීයමු, මක්නිසාද ඉරාදැමුවේ උන්වහන්සේය, උන්වහන්සේ අප සුව කරනවා ඇත: පහරදෙන උන්වහන්සේ, අපේ තුවාළ බඳිනවා ඇත. (හොෂෙයා 6:1)**

කප්පාදුවෙහි හික්මවීම ඔබව නැවතත් දෙවියන් වහන්සේ වෙතට රැගෙන යාවි. ඔබ උන්වහන්සේ වෙතට නැවත හැරී ඒමෙන් පමණක් ආත්මිකව ඵලදරනු ඇත.

**දේශගුණය :**

ස්වභාවික ලොවෙහි පැලැටි සඳහා දේශ ගුණය වැදගත් වේ. සමහර දේශගුණවලදී පැලැටි වලට වර්ධනය වීමට අවශ්‍ය නියමිත උෂ්ණත්වය ලබා දීම සඳහා "උණුසුම් කුටි" තුල පැල රඳවනු ඇත. මෙම පැල බාහිර ලෝකයෙන් ආරක්ෂා කරනු ලැබ වේ. මෙලෙස "උණුසුම් කුටී" තුල සුරක්ෂිතව වැඩුනු පැලයක් ඉන් ඉවත් කොට ස්වභාවික පරිසරයට මුදා හැරියහොත් ඉතා ඉක්මනින් එම පැලය විනාශ වී යනු ඇත. එය පාලනය කරන ලද වාතාවරණයක සෑදී තිබූ බැවින් සත්‍ය ලෝකයෙහි සැබෑ වාතාවරණයට ඔරොත්තු නොදෙයි.

ආත්මික ලෙසට පවසන කල "උණුසුම් කුටී" තුල හැදෙන වැඩෙන කිතුණුවන් අපට අවශ්‍ය නොවේ. පාලනය කරන ලද වාතාවරණයෙහිදී මොවුන් හොඳ ලෙසට පෙනුනද යථාර්ථයට එනම් සැබෑ ලොවට මුදා හල විට ඵල දැරීමට ඔව්හු අපොහොසත් වෙති. ඔබ තුල පැල කරන ලද දේව වචනය නමැති බීජය සහ ඔබ සේවය කරමින් අන්‍යයන් තුල පැල කළාවූ බීජය ආත්මික දේශගුණය ඉතා අපහසු තත්ව වලදී පවා ඵල දැරිය යුතු වේ.

**සාරාංශය**

මෙම පරිච්ඡේදය ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම අවසානයට ගෙන එයි. මෙතෙක් අධ්‍යයනය කළ ආත්මික සත්‍යතාවල ස්වභාවික සමාන්තරය අපි පුනරීක්ෂණය කර බලමු.

- සෑම පැලැටියකටම නැවත-ඵල දැරිය හැක.
- අස්වැන්න නෙලීමට නම් වැපිරීම අවශ්‍යය.
- ඔබ වපුරන කන්නයෙහිම අස්වැන්න නෙලන්නේ නැත.
- බාහිර වටපිටාවේ තත්වය කුමක් වුවද ඔබ වැපිරිය යුතුය.
- ඔබ වැපිරූ ප්‍රමාණයට අනුකූලව අස්වැන්න කපා ගනු ඇත.
- ඔබට නෙලන්නට නොහැකි ස්ථානවල වැපිරීමට මෙන්ම ඔබ නොවැපිරවූ ස්ථානවලින් කපාගන්නටද හැකිය.
- ඔබ විශ්වාසවන්තව සිටියහොත් ඔබට අස්වැන්න නෙලාගත හැකිය.
- බීජයකින් නැවත-ඵල දැරීමට නම් එම බීජය මිය යා යුතුය.
- බීජ කිසියම් බාහිර සාධක වලට ප්‍රතිචාර දක්වමින් පැලවී වර්ධනය වේ.

මෙම ආත්මික ප්‍රතිපත්ති අවබෝධ කරගෙන අදාල කරගැනීමෙන් ඔබහට මහත් ආත්මික අස්වැන්නක් නෙලාගත හැකි වනු ඇත. එසේ ලබන අස්වැන්න නෙලාගත හැකි ක්‍රමය මීලඟ පරිච්ඡේදයෙහි පෙන්නුම් කර දෙනු ඇත.

## ස්වයං - පරීක්‍ෂණය

1. මතකයෙන් ප්‍රධාන පදය ලියන්න.

2. මෙම පරිච්ඡේදයෙහි අස්වැන්න සඳහා ඉගැන්වූ පලමුවන ප්‍රතිපත්තිය කුමක්ද?

3. මෙම පරිච්ඡේදයෙහි සාකච්ඡා කළා වූ වර්ධනය සඳහා පැවතිය යුතු ස්වභාවික තත්වයන් දහය නම් කරන්න. මෙම තත්වයන් ආත්මිකව අදාල කරගත හැකිය.

(මෙම පරික්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

miq.sh mßÉfþo foflys wd;añl i;H;djka ys iajNdúl iudka;r jQ jemsÍfï yd fk,Sfï uQ,O¾u úfYaf,aIKh flßks' fhaiqia jykafia fujka wOHhkhla jmqrkakdf.a Wmudj ;=,ska bÈßm;a l< fial' fuu Wmudj i|yka ia:dk ;=k jk uf;õ 13(3-9" ud¾la 4(3-20 iy Æla 8(5-15 g i|yka isoaê ixikaokh lr n,kak'

**1'** jemsrejdjq iajNdúl îcfhys wd;añl iudka;rh l=ula ùo@ ^Æla 8(11&

**2'** úúO jQ mia cd;s u.ska foaj jpkhg uyck;djfha m%;spdrh ksfhdackh lrhs' mia cd;sh yd tu mfiys îc jemsÍfuka ,efnk m%;sM,h i|yka lrñka my; i|yka j.=j iïmQ¾K lrkak'

**mia cd;sh** **mfiys îc jemsÍfuys m%;sM,h**

**3'** foaj jpkh wid th f;areï fkd.;a úg flfkl=g isÿjkafka l=ulao@ ^uf;õ 13(19&

**4'** .,a ìfuys îc ñh hkafka l=uk fya;=fjkao @
^uf;õ 13(20-21" Æla 8(6" 13&

**5'** foaj jpkh jid.kakdjQ lgq j,g iudk lr we;af;a fudkjdo@ ^uf;õ 13(22" ud¾la 4(18-19" Æla 8(14&

**6'** foaj jpkh lgq j,ska jeiS .sh úg l=ula isÿfõo@ ^uf;õ 13(22&' Tyq

____________________________________________________________

____________________________________________________________'

**7'** ire mfika fk,d .;a wiajekafkys úúO m%;sM, ;snqfkahhs Wmudj bÈßm;a lrkafkao@________________________________________________________________

____________

^uf;õ 13(23&______________________________

m%;sM, fudkjdo@

____________________________________________________________

8. මග අසල වැටුණු බීජ වලට කුමක් සිදුවීද? (මාර්ක් 4:4; ලූක් 8:5) ____________________

මෙහි ආත්මික සමාන්තරය කුමක්ද? (මාර්ක් 4:15) ____________________ ක්ෂණයකින්ම පැමිණ වැපුරූ වචනය සැණින් ඩැහැගනී.

9. සරු බිම වැනි හදවත් සහිත මනුෂ්‍යයන්ගේ හදවතෙහි චරිත ගුණාංග මොනවාද? (ලූක් 8:15).

ඔව්හු සතුව ____________________ සහ ____________________හදවතක් ඇත.

10. සරුබිම මෙන් වූ මනුෂ්‍යයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර තුන මොනවාද? (ලූක් 8:15)

11. දේව වචනයට දක්වන්නාවූ මෙම විවිධ ප්‍රතිචාර ශුභාරංචි පණිවුඩය පිළිගැනීමට පමණක් අදාළ නොවේ. එය දේව වචනය අප තුළ පැල කරන්නාවූ ඕනෑම සත්‍යයකට අදාළ වේ.

ඔබගේ ජීවිතයෙහි අස්වැන්න පිළිබඳ දර්ශනය පැලකොට තිබේ. එය ආත්මික සරුබිමක පැලකොට තිබේද? එහි ප්‍රතිඵලය කුමක් වේද?

එය මග අසල වැටී ගොස්ද? එසේ වී ඇත්නම් ඔබගේ ජීවිතයෙහි ප්‍රමුඛ පරමාර්ථය බවට එය පත් කොට නොමැති කමින් සාතන් දර්ශනය ඔබගෙන් ඩැහැගෙන ඇත.

එය ගල් බිමෙහි වැටී ඇත්ද? ඔබ සතුටින් යුක්තව අස්වැන්නේ දර්ශනය ලබාගත් නුමුදු සැබවින්ම එය ඔබගේ හදවතෙහි මුල් බැස නොමැත. දුෂ්කර කාලයක් පැමිණි විට ඔබ දර්ශනයෙන් ඉවත් වෙනවා ඇත. එය කටු පදුරු මැද පැලකරනු ලැබුවාද? ඔබ ජීවිතයෙහි කරුණු, වස්තුව, තෘප්තිය හා ආශාව පිළිබඳ ඕනෑවට වඩා සැලකිලිමත් වනවාද? දර්ශනයට වඩා මෙම තාවකාලික කරුණු ඔබට වැදගත්ද? එසේ නම්, ඔබහට කිසිදිනක අස්වැන්නක් දැරිය නොහැක. අස්වැන්න පිළිබඳ හෙළිදරව්ව සරුබිමක වැටී තිබේද? ඔබ දර්ශනය ලැබ, එය සුරැකිව තබාගනීද? එසේ නම් ඔබ පල දරා ආත්මිකව නැවත-ඵලදරනවා ඇත.

# හත්වන පරිච්ඡේදය

## ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම

## II කොටස

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබ හට :

- පැල වර්ධනය වීමේ ස්වභාවික මූලධර්මයෙහි ආත්මික සමාන්තරන් පැහැදිළි කිරීමට හැකිවෙනු ඇත.
- මෙම සමාන්තර ආත්මික අස්වැන්නේ උපක්‍රම අදාල කරගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**මක්නිසාද පොළොව ස්වකීය දළු උපදවන්නාක් මෙන්ද උයන එහි වපුළ දේ ලියලවන්නාක් මෙන්ද මහෝත්තම ස්වාමිවූ දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨකම හා ප්‍රශංසාව සියලු ජාතීන් ඉදිරියෙහි හටගනවන්වනවා ඇත. (යෙසායා 61:11)**

**හැඳින්වීම**

මෙම පරිච්ඡේදයෙහිදී අපි තව දුරටත් ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම ඉගෙනගනිමු. මෙහිදී අස්වැන්න පිළිබඳ අවසාන මූලධර්මයක් අපි හඳුනාගනිමු, එනම් : සමහර බාහිර සාධක වලට ප්‍රතිචාරයක් ලෙස බීජ වර්ධනය වේ.

ස්වභාවික ලෝකයෙහි බීජ පැලවීමට හා වර්ධනය වීමට කිසියම් නියමිත තත්වයන් පැවතීම අවශ්‍ය වේ. ආත්මික ලෝකයෙහි දේව වචනය නමැති බීජ පැලවීමට හා ආත්මික අස්වැන්නක් ගෙන ඒමට මෙම ස්වභාවික තත්වයන් වලට සමාන්තර ආත්මික සාධක පැවතිය යුතුය.

**වර්ධනය සඳහා සුදුසු තත්වයන්**

**ජීවනය:**

ජීවයෙන් තොරව වර්ධනයක් කිසිසේත් සිදුවිය නොහැක. බීජය තුල ජීවය තිබිය යුතුය. නැත්නම් එය පැල නොවේ. යේසුස්වහන්සේ දේව වචනයෙහි දෘෂ්‍යමාන එළිදරව්වය. උන්වහන්සේ බීජය විය, උන්වහන්සේ තුල ජීවනය විය.

**උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය, ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වූයේය. (යොහාන් 1:4)**

**මක්නිසාද පියාණන්වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක් මෙන් පුත්‍රයාටත් තමන් ජීවනය ඇතුව සිටින්ට උන්වහන්සේ වරය දුන් සේක. (යොහාන් 5:26)**

යේසුස්වහන්සේ පැමිණියේ මෙම ජීවනයේ බීජය ඔබ තුල පැල කොට ඔබ නැවත - එලදැරීමට සැලැස්වීමටය.

**සොරා එන්නේ සොරකම්කරන්නටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධික ලෙස ලැබෙන පිණිසත්ය. (යොහාන් 10:10)**

උන්වහන්සේගේ ජීවනය ඔබ තුල පවතී. ඔබ එතුමාගේ වචනය වන බීජ පැල කළ විට මෙලෙස සිදුවන බව දනී. එනම්.

**එලෙස වැස්ස හා හිම අහසෙන් බැස පොළොව පොගවා, සශ්‍රිකකර එල හටගන්වා, වපුරන්නාට බිජ ද, කන්නාට කෑමද දෙන තුරු එහි හැරී නොයන්නාක් මෙන් මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවිත්, මා කැමති දෙය සිදුකොට, මා නියම කල කාරණය සඵල කරනවා ඇත. (යෙසායා 55:10-11)**

**නියම පස් :**

කලින් සුදානම් නොකළ බිම මහත් අස්වැන්නක් සැපයීම වලක්වන බවත් හොඳ අස්වැන්නක් සඳහා නියමිත පස් අවශ්‍ය බවත් ඔබ මෙම පාඩමෙහිදී ඉගෙන ගත්තෙහිය.

**සරුබිමේ වපුරන ලද්දෝ නම්, වචනය අසා, පිළිගෙන. තිස් ගුණයක්ද සැට ගුණයක්ද සියක් ගුණයක්ද බැගින් එල දරන්නෝ යැයි කී සේක. (මාර්ක් 4:20)**

ඔබ ආත්මික ලොවෙහි ගොවිතැන් කරන කල ඔබගේ ප්‍රයත්නයන් කැටිකොට යෙදවිය යුත්තේ සරු බිම්වලටය. ඔබ මනා කොට බිම සකසා දේව වචනය නමැති බීජ නිසියාකාරයෙන් වැපිරිය යුතුය. අස්වැන්නක් නෙලා ගැනීමට නම් මෙම කාරණා දෙකම අවශ්‍ය වේ.
(හොෂෙයා 10:12, යෙරමියා 4:3).

වපුරන්නාගේ උපමාවට අනුව (මාර්ක් 4:3-20), අස්වැන්නක් හිමි නොවේ නම්, එයට හේතු විය හැකි වෙනසකට ඇත්තේ භූමිය වේ. මෙය අස්වැන්න සඳහා වැදගත් මූලධර්මයකි. ප්‍රතිචාර නොදක්වන භූමිය අත්හැර දැමිය යුතු නොවේ. යම් කිසිවෙක් එහි භූමිය පෙරලා සකසා වපුරා අස්වැන්න නෙලීම සඳහා සුදුසු කාලය හඳුනාගත යුතුය (ලූක් 13:6-9). නුමුත් ඔබගේ ආත්මික බලවේගයන් යොමු කළ යුතු ස්ථානය මෙය නොවේ. යේසුස් වහන්සේ වපුරන්නන්ගේ හිඟයක් පවතිවී යයි කිසිවිටක නොපැවසූ සේක. නමුත් අස්වැන්න නෙලන්නන්ගේ හිඟයක් ඇති බව පැවසූ සේක. ආත්මික කම්කරු බලවේගය වැඩිපුර යොමු කළ යුත්තේ ප්‍රතිචාර දක්වන්නාවූ එල ගෙනදෙන්නවූ අස්වැන්න ලැබිය හැකි භූමි වෙතටය.

අස්වැන්න නෙලීම සඳහා නියමිත කාලය ඉතා වැදගත් වේ. බීජ වැපිරූ ගමන්ම නැතහොත් පැලෑටි වල ගෙඩි තවමත් කොලපාටට ඇති කාලයෙහිදී අස්වැන්න නෙලන්නන්ගේ අවශ්‍යතාවයක් පැන නොගනී. එහෙත් සරු බිමෙහි අස්වැන්න මෝරා කපාගත යුතු ඉතා වැදගත් කෙටි කාලීන සුක්ෂම මොහොතක් එළැඹේ. අන්න එවිට බොහෝ නෙලන්නන්ගේ අවශ්‍යතාවයක් හටගනී. මෙවැනි තීරණාත්මක මොහොතකදී සියළුම කම්කරුවෝ ආත්මිකව ප්‍රතිචාර නොදක්වන්නාවූ නිසරු ගොවි බිම් වල වැඩ බහුලව නියැලී සිටිත් නම් නෙලීමට කම්කරුවෝ හිඟ වේ නම්, අස්වැන්න රැස්කරුගැනීමට තිබූ මහඟු අවස්ථාවක් සදාකාලයටම ගිලිහී යනු ඇත.

**ජලය :**

ස්වභාවික ලෝකයෙහි බීජයක් මුල් ඇද පැළවීමට නම් ජලය අවශ්‍ය වේ. දෙවියන් වහන්සේ පොරොන්දු වූයේ :

**මක්නිසාද පිපාස ඇත්තා කෙරෙහි වතුරද වියළි භූමිය කෙරෙහි ජලධාරාද වගුරුවන්නෙමි. නුඹේ වංශය කෙරෙහි මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරුවන්නෙමි. (යෙසායා 44:3)**

මෙලෙස ජලය වැගිරීම සංකේතවත් කරනුයේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලේපය වැගිරවීමකි.

**මාගේ ආත්මයද නුඹේ දරුවන් කෙරෙහි මාගේ ආශිර්වාදයද වගුරුවන්නෙමි. (යෙසායා 44:3)**

**මා කෙරෙහි අදහන්නා තුළින් ලියවිල්ලෙහි කියා තිබෙන හැටියට ජිවනදයක වතුර ඇති ගංගා ගලන්නේයයි කීසේක. (යොහාන් 7:38)**

පාපයෙහි මැරී සිටින පුද්ගලයන්ගේ හදවත් තුල දේව වචනය නම් බීජය මුල් ඇද පැලවීමට සලස්වනුයේ ශුද්ධාත්මයාණන් නම් ජලය වේ.

**මක්නිසාද ගහක් කපාදැමුවහොත් ඒක දෙවනු ලියලා ඒකේ රිකිලි හටගන්නේය යන බලාපොරොත්තුව ඇත්තේය. ඒකේ මුල බොහෝ කල් පොළොවෙහි පරණවී ඒකේ කඳ බිමෙහි මැරුණත්, වතුරට පෙගීමෙන් ඒක දළුලා පැළෑටියක් මෙන් අතු ලියලනවා ඇත. (යෝබ් 14:7-9)**

**ආලෝකය :**

ස්වාභාවික ලෝකයෙහි ශාඛා පැලවීම හා වැඩීම උත්තේජනය වනුයේ ආලෝකයට ප්‍රතිචාරයක් ලෙසටය, ආත්මික අස්වැන්න ලබාදීමට වර්ධනය ඇති කරවනුයේ දෙවියන් වහන්සේගේ ආලෝකයෙහි ප්‍රතිඵලයක් ලෙසටය.

**උන්වහන්සේ තුළ ජීවනය තිබුණේය, ඒ ජීවනය මනුෂ්‍යයන්ගේ ආලෝකය වූයේය. (යොහාන් 1:4)**

**එබැවින් යේසුස් වහන්සේ නැවත ඔවුන්ට කථාකරමින්, මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේ යයි කී සේක. (යොහාන් 8:12)**

දෙවියන්වහන්සේගේ ආලෝකය ආත්මික ජීවනය ගෙන දෙයි.

**වාතය :**

ස්වභාවික පැලෑටි අවට ඇති වාතයෙන් කාබන් ඩයොක්සයිඩ් නම් වැදගත් ද්‍රව්‍යයක් උරාගනී. පැලෑටියක වර්ධනයට වාතය අවශ්‍යයයි. බයිබලයෙහි ශුද්ධාත්මයාණන් වහන්සේ වාතයට හෝ සුළඟට සමාන කොට දක්වා ඇත.

**හුළඟ කැමති කැමති තැනට ගසයි, එහි ශබ්දය නුඹට ඇසෙයි, නුමුත් කොතැනින් එන්නේද කියාවත් කොතැනටයන්නේද කියාවක් නුඹ දන්නේ නැත. ආත්මයාණන්ගෙන් ඉපිද සිටින සියල්ලෝම එසේම යයි කී සේක. (යොහාන් 3:8)**

ශුද්ධාත්මයාණෝ දේව වචනය නමැති බීජයට හුස්ම හෙළයි. එමගින් ආත්මික වර්ධනය සිදුවේ.

**ඉඩකඩ :**

වපුරන්නාගේ උපමාවෙහි පැලවලට ඉඩ සඳහා තිබූ තරඟකාරිත්වය කරණකොටගෙන සමහර පැල මරනයට පත්විය.

**කටු අතරෙහි වපුරන ලද්දේ නම්, වචනය අසා, ලෝකය ගැන වෙහෙසීමෙන්ද වස්තුවේ රැවටිලිකාරකමෙන්ද වචනය යටවීමෙන් ඵල නොදරන තැනැත්තාය. (මතෙව් 13:22)**

**මූල පද්ධතිය :**

පැලයට පෝෂ්‍ය පදාර්ථ සැපයීමට හා පසෙහි රැඳී සිටීමට මූල පද්ධතියක් අවශ්‍යය. ඔබගේ ආත්මික ජීවිතයෙහි මූල පද්ධතිය සංවර්ධනය කළ හැකි ක්‍රමය ගීතාවලිය 1 හි සඳහන් වේ.

**දුෂ්ටයන්ගේ මන්ත්‍රණය අනුව නොයන්නාවූ, පව්කාරයන්ගේ මාර්ගයෙහි නොසිටින්නාවූ, නින්දකරන්නන්ගේ ආසනයෙහි නොහිඳින්නාවූ, ස්වාමින්ගේ ව්‍යවස්ථාවෙහි ප්‍රීතිවන්නාවූ, උන්වහන්සේගේ ව්‍යවස්ථාව රෑ දවල් මෙනෙහි කරන්නාවූ, මනුෂ්‍යයා ආශිර්වාදලද්දේය. ඔහු දිය ඇලවල් ළග හිඳුවූ , නියම කලට ඵල දෙන, නොමැලවෙන කොළ ඇති ගසක් හා සමාන වන්නේයඃ ඔහු කරන සියල්ල සඵල වෙයි. (ගීතාවලිය 1:1-3)**

**විවේකය :**

"නිද්‍රාගත කාලය" නම් කාල වකවානුවකදී පැලැටි විවේක ලබාගනී, ඉතා සීඝ්‍ර වර්ධනයකට සමීප කාලයකදී පැලැටි "නිද්‍රාගත" වේ. පැලැටිය මියගොස් මෙන් පෙනී යා හැක. එනමුත් එය මිය ගොස් නොමැත. එය තුල බීජ ජීවය තවමත් රැඳී පවතී.

ඔබ මනුෂ්‍යයන්ගේ ජීවත වල දේව වචනය තැන්පත් කළ පසුව ඔවුන්ගේ කිසිම වර්ධනයක් නොපෙනෙන කාල පරිච්ජේදයක් ගත කරනු ඔබට දැකිය හැක. ඔබගේ කාර්යයෙහි ඔබ අසමත් වී ඇතැයි ඔබට සිතෙන්නට පුළුවන. එනමුත් බීජය මියගොස් නොමැත.

ස්වභාවික ලෝකයෙහි මෙන්ම ආත්මික ලොවෙහිද ඉතා සීඝ්‍ර වර්ධනයකට හා අස්වැන්නකට පෙර ආත්මික නිද්‍රාකාලයක් පවතී. එවැනි අවදියෙහිද ඉවසිලිවන්තව අස්වැන්න බලාපොරොත්තුව සිටින්න.

> **එබැවින්, සහෝදරයෙනි, ස්වාමීන්වහන්සේගේ ඊම දක්වා ඉවසාපල්ලා. බලව, ප්‍රථම සහ අන්තිම වර්ෂාව පැමිණෙන තුරු ඉවසමින් ගොවියා පොළොවේ අනර්ඝ ඵල ගැන බලා සිටී. (යාකොබ් 5:7)**

**මිදිවැලට සම්බන්ධව පැවතිම :**

ස්වභාවික ලොවෙහි යම් පැළෑටියක අත්තක් ඵල දැරීමට නම් එම අත්ත ප්‍රධාන පැළෑටියකට යාවී පැවතිය යුතුය. අත්තට ජීවය සපයා ප්‍රධාන කඳෙන් හෝ වැලෙන් අත්ත කඩා දැමුවහොත් එහි ඵල හට ගත නොහැක.

යේසුස් වහන්සේ ප්‍රධාන මිද වැලය, අපි එහි අතු වෙමු. ඔබ ආත්මිකව ඵල දැරීමට නම් ඔබ උන්වහන්සේ තුල සම්බන්ධතාවයේ පැවති සිටිය යුතුය.

> **මම සැබෑවූ මිදිවැලය, මාගේ පියාණන් වහන්සේ ගොවියාය. මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරනසේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍ර කරන සේක. මා විසින් නුඹලාට කී වචනය කරණකොටගෙන නුඹලා දැන් පවිත්‍රය, මා තුළ පැවැතියල්ලා, මමත් නුඹලා තුළ පවතින්නෙමි. අත්ත මිදිවැලෙහි නොපවතිනම් තනියම ඵල දරන්ට බැරුවාක් මෙන්, නුඹලා මා තුළෙහි නොපවතිවූ නම්, ඵල දරන්ට නුඹලාට බැරිය. (යොහාන් 15:1-4)**

**කප්පාදුව :**

ස්වභාවික ලොවෙහි ගසක් ඵල දැරීමට හා නැවත නැවතත් ඵල නිපදවීමට නම් කප්පාදු කිරීම අවශ්‍ය වේ. ගොවියෙක් ගසක් කප්පාදු කරන විට ඵල නොදරන අතු කපා ඉවත් කොට අනෙක් අතුවලට වඩා ඵල දැරීමට අවස්ථාව සලසා දෙයි. ගසෙහි වර්ධනයට බාධා කරන සියළු දෑ ඔහු ඉවත් කර දමයි.

ආත්මික ලෝකයෙහිද කප්පාදු කිරීම අවශ්‍ය වේ. ආත්මික කප්පාදුව නම් දෙවියන් වහන්සේ විසින් අපව නිවැරදි කරවීමය. බයිබලය මෙයට හික්මවීම කියාද නම් කරනු ඇත. දෙවියන් වහන්සේ කප්පාදු කරන කල ඔබගේ ආත්මික ජීවිතයට බාධාවක් වන සියළු දේ ඉවත් කර දමන සේක. ඔබට ආත්මික පළ දැරීමට අවශ්‍ය නම් මෙම ක්‍රියවලිය අවශ්‍ය වේ.

> **මා තුළෙහි තිබී ඵල නොදරන සියලු අතු උන්වහන්සේ පහකරන සේක. ඵල දරන සියලු අතු වඩා ඵල දරන පිණිස උන්වහන්සේ පවිත්‍ර කරන සේක. (යොහාන් 15:2)**

සමහර අවස්ථාවලදී දෙවියන් වහන්සේ ඔබව නිවැරදි කරන පිණිස ජීවිතයෙහි විවිධ සිදුවීම් ඇති කරන නමුත් ඔබ එහිදී සාතන්ට චෝදනා කිරීමෙහි යෙදීම නිසා හික්මවීමේ කප්පාදුවෙහි ඵල අත් නොදකිනු ඇත. හොෂෙයා 6:1 හි දෙවියන් වහන්සේ විසින් අපව නිවැරදි කරවීමේ පරමාර්ථය පෙන්වා දේ.

**වරෙල්ලා , අපි ස්වාමීන්වහන්සේ වෙතට හැරීයමු, මක්නිසාද ඉරාදැමුවේ උන්වහන්සේය, උන්වහන්සේ අප සුව කරනවා ඇත; පහරදෙන උන්වහන්සේ, අපේ තුවාළ බඳිනවා ඇත. (හොෂෙයා 6:1)**

කප්පාදුවෙහි හික්මවීම ඔබව නැවතත් දෙවියන් වහන්සේ වෙතට රැගෙන යාවී. ඔබ උන්වහන්සේ වෙතට නැවත හැරී ඒමෙන් පමණක් ආත්මිකව ඵලදරනු ඇත.

**දේශගුණය :**

ස්වභාවික ලොවෙහි පැලෑටි සඳහා දේශ ගුණය වැදගත් වේ. සමහර දේශගුණවලදී පැලෑටි වලට වර්ධනය වීමට අවශ්‍ය නියමිත උෂ්ණත්වය ලබා දීම සඳහා "උණුසුම් කුටි" තුල පැල රඳවනු ඇත. මෙම පැල බාහිර ලෝකයෙන් ආරක්ෂා කරනු ලැබ වේ. මෙලෙස "උණුසුම් කුටි" තුල සුරක්ෂිතව වැඩුනු පැලයක් ඉන් ඉවත් කොට ස්වභාවික පරිසරයට මුදා හැරියහොත් ඉතා ඉක්මනින් එම පැලය විනාශ වී යනු ඇත. එය පාලනය කරන ලද වාතාවරණයක සෑදී තිබු බැවින් සත්‍ය ලෝකයෙහි සැබෑ වාතාවරණයට ඔරොත්තු නොදෙයි.

ආත්මික ලෙසට පවසන කල "උණුසුම් කුටී" තුල හැදෙන වැඩෙන කිතුණුවන් අපට අවශ්‍ය නොවේ. පාලනය කරන ලද වාතාවරණයෙහිදී මොවුන් හොඳ ලෙසට පෙනුනද යථාර්ථයට එනම් සැබෑ ලොවට මුදා හල විට ඵල දැරීමට ඔව්හු අපොහොසත් වෙති. ඔබ තුල පැල කරන ලද දේව වචනය නමැති බීජය සහ ඔබ සේවය කරමින් අන්‍යයන් තුල පැල කළාවූ බීජය ආත්මික දේශගුණය ඉතා අපහසු තත්ව වලදී පවා ඵල දැරිය යුතු වේ.

**සාරාංශය**

මෙම පරිච්ඡේදය ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම අවසානයට ගෙන එයි. මෙතෙක් අධ්‍යයනය කළ ආත්මික සත්‍යතාවල ස්වභාවික සමාන්තරය අපි පුනරීක්ෂණය කර බලමු.

- සෑම පැලෑටියකටම නැවත-ඵල දැරිය හැක.
- අස්වැන්න නෙලීමට නම් වැපිරීම අවශ්‍යය.
- ඔබ වපුරන කන්නයෙහිම අස්වැන්න නෙලන්නේ නැත.
- බාහිර වටපිටාවේ තත්වය කුමක් වුවද ඔබ වැපිරිය යුතුය.
- ඔබ වැපිරූ ප්‍රමාණයට අනුකූලව අස්වැන්න කපා ගනු ඇත.
- ඔබට නෙලන්නට නොහැකි ස්ථානවල වැපිරීමට මෙන්ම ඔබ නොවැපිරවූ ස්ථානවලින් කපාගන්නටද හැකිය.
- ඔබ විශ්වාසවන්තව සිටියහොත් ඔබට අස්වැන්න නෙලාගත හැකිය.
- බීජයකින් නැවත-ඵල දැරීමට නම් එම බීජය මිය යා යුතුය.
- බීජ කිසියම් බාහිර සාධක වලට ප්‍රතිචාර දක්වමින් පැලවී වර්ධනය වේ.

මෙම ආත්මික ප්‍රතිපත්ති අවබෝධ කරගෙන අදාල කරගැනීමෙන් ඔබහට මහත් ආත්මික අස්වැන්නක් නෙලාගත හැකි වනු ඇත. එසේ ලබන අස්වැන්න නෙලාගත හැකි ක්‍රමය මීලඟ පරිච්ඡේදයෙහි පෙන්නුම් කර දෙනු ඇත.

## ස්වයං - පරීක්‍ෂණය

1. මතකයෙන් ප්‍රධාන පදය ලියන්න.

2. මෙම පරිච්ඡේදයෙහි අස්වැන්න සඳහා ඉගැන්වූ පලමුවන ප්‍රතිපත්තිය කුමක්ද?

3. මෙම පරිච්ඡේදයෙහි සාකච්ජා කළා වූ වර්ධනය සඳහා පැවතිය යුතු ස්වභාවික තත්වයන් දහය නම් කරන්න. මෙම තත්වයන් ආත්මිකව අදාල කරගත හැකිය.

(මෙම පරික්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

පසුගිය පරිච්ඡේද දෙකෙහි ආත්මික සත්‍යතාවන් හි ස්වභාවික සමාන්තර වූ වැපිරීමේ හා නෙලීමේ මූලධර්ම විශ්ලේෂණය කෙරිනි. යේසුස් වහන්සේ මෙවන් අධ්‍යයනයක් වපුරන්නාගේ උපමාව තුලින් ඉදිරිපත් කළ සේක. මෙම උපමාව සඳහන් ස්ථාන තුන වන මතෙව් 13:3-9, මාර්ක් 4:3-20 සහ ලූක් 8:5-15 ට සඳහන් සිද්ධි සංසන්දනය කර බලන්න.

1. වැපිරූවාවූ ස්වභාවික බීජයෙහි ආත්මික සමාන්තරය කුමක් වීද? (ලූක් 8:11)

_______________________________________________

2. විවිධ වූ පස් ජාති මගින් දේව වචනයට මහජනතාවයේ ප්‍රතිචාරය නියෝජනය කරයි. පස් ජාතිය හා එම පසෙහි බීජ වැපිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය සඳහන් කරමින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

**පස් ජාතිය** **පසෙහි බීජ වැපිරීමෙහි ප්‍රතිඵලය**

_______________________________________________

_______________________________________________

_______________________________________________

_______________________________________________

3. දේව වචනය අසා එය තේරුම් නොගත් විට කෙනෙකුට සිදුවන්නේ කුමක්ද? (මතෙව් 13:19)

_______________________________________________

4. ගල් බිමෙහි බීජ මිය යන්නේ කුමන හේතුවෙන්ද ?
(මතෙව් 13:20-21, ලූක් 8:6, 13)

_______________________________________________

5. දේව වචනය වසාගන්නාවූ කටු වලට සමාන කර ඇත්තේ මොනවාද? (මතෙව් 13:22, මාර්ක් 4:18-19, ලූක් 8:14)

_______________________________________________

6. දේව වචනය කටු වලින් වැසී ගිය විට කුමක් සිදුවේද? (මතෙව් 13:22). ඔහු

_______________________________________________

_______________________________________________

7. සරු පසෙන් නෙලා ගත් අස්වැන්නෙහි විවිධ ප්‍රතිඵල තිබුනේයයි උපමාව ඉදිරිපත් කරන්නේද?_______________________________________________

(මතෙව් 13:23) _______________________________

ප්‍රතිඵල මොනවාද?_______________________________________________

8. මග අසල වැටුණු බීජ වලට කුමක් සිදුවීද? (මාර්ක් 4:4: ලූක් 8:5) ____________________

මෙහි ආත්මික සමාන්තරය කුමක්ද? (මාර්ක් 4:15) ____________________ ක්ෂණයකින්ම පැමිණ වැපුරූ වචනය සැණින් ඩැහැගනී.

9. සරු බිම වැනි හදවත් සහිත මනුෂ්‍යයන්ගේ හදවතෙහි චරිත ගුණාංග මොනවාද? (ලූක් 8:15).

ඔව්හු සතුව ____________________ සහ ____________________ හදවතක් ඇත.

10. සරුබිම මෙන් වූ මනුෂ්‍යයන්ගෙන් ලැබෙන ප්‍රතිචාර තුන මොනවාද? (ලූක් 8:15)

11. දේව වචනයට දක්වන්නාවූ මෙම විවිධ ප්‍රතිචාර ශුභාරංචි පණිවුඩය පිළිගැනීමට පමණක් අදාළ නොවේ. එය දේව වචනය අප තුළ පැල කරන්නාවූ ඕනෑම සත්‍යයකට අදාළ වේ.

ඔබගේ ජීවිතයෙහි අස්වැන්න පිළිබඳ දර්ශනය පැලකොට තිබේ. එය ආත්මික සරුබිමක පැලකොට තිබේද? එහි ප්‍රතිඵලය කුමක් වේද?

එය මග අසල වැටී ගොස්ද? එසේ වී ඇත්නම් ඔබගේ ජීවිතයෙහි ප්‍රමුඛ පරමාර්ථය බවට එය පත් කොට නොමැති කමින් සාතන් දර්ශනය ඔබගෙන් ඩැහැගෙන ඇත.

එය ගල් බිමෙහි වැටී ඇත්ද? ඔබ සතුටින් යුක්තව අස්වැන්නේ දර්ශනය ලබාගත් නුමුදු සැබවින්ම එය ඔබගේ හදවතෙහි මුල් බැස නොමැත. දුෂ්කර කාලයක් පැමිණි විට ඔබ දර්ශනයෙන් ඉවත් වෙනවා ඇත. එය කටු පඳුරු මැද පැලකරනු ලැබුවාද? ඔබ ජීවිතයෙහි කරුණු, වස්තුව, තෘප්තිය හා ආශාව පිළිබඳ ඕනෑවට වඩා සැලකිලිමත් වනවාද? දර්ශනයට වඩා මෙම තාවකාලික කරුණු ඔබට වැදගත්ද? එසේ නම්, ඔබහට කිසිදිනක අස්වැන්නක් දැරිය නොහැක. අස්වැන්න පිළිබඳ හෙළිදරව්ව සරුබිමක වැටී තිබේද? ඔබ දර්ශනය ලැබ, එය සුරැකිව තබාගනීද? එසේ නම් ඔබ පල දරා ආත්මිකව නැවත-ඵලදරනවා ඇත.

# අටවෙනි පරිච්ඡේදය

## එළිදරව්ව තුලින් නෙලාගැනීම

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසානයෙහි ඔබහට කළහැකි වන කරුණු

- ගුණනවත් කිරීම සඳහා දෙවියන්වහන්සේගේ ක්‍රමවේදය පැහැදිලි කිරීමට
- එළිදරව්ව මගින් නෙලාගැනීමට භාවිතවන ආත්මික උපකරණය හඳුනාගැනීමට
- ආශිර්වාද වලට ඔබ්බෙන් ගොස් ආත්මික බලය අත්දැකීමට

**ප්‍රධාන පදය**

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

### හැඳින්වීම

ආත්මික අස්වැන්න සඳහා උපක්‍රම දැන සිටීම පමණක් නොසෑහේ. ඔබ අස්වැන්න නෙලීමට ක්‍රමය සහ ආයුධ දැනගත යුතුය. ක්‍රමය නම් ඔබ ඉගෙනගත් උපක්‍රම භාවිත කළ යුතු අන්දම වේ. ඔබ දෙවියන්වහන්සේගේ කාර්යය එතුමාගේ ක්‍රමයට කළ යුතුය. එතුමාගේ ක්‍රමය නම් දිව්‍යමය එළිදරව්ව වන අතර එහි ප්‍රතිඵලය වනුයේ ආත්මික සඵලවත් බවය.

> **නුඹලා දකුණට හැරෙන විටද නුඹලා වමට හැරෙන විටද: මාර්ගය මේය. මෙහි හැසිරියල්ලායයි නුඹට පසුපසෙන් කියන හඬක් නුඹේ කන්වලට ඇසෙන්ටත් යෙදෙනවා ඇත. උන්වහන්සේද නුඹ පොළොවෙහි වපුරන නුඹේ බීජවලට වර්ෂාවද, බිමේ අස්වැන්නෙන් කෑමද දෙනසේක. එය සාරවත්ව වර්ධනයවන්නේය. ඒ දවසෙහි නුඹේ සිව්පාවෝ විශාල ගොදුරු බිම්වල තෘණ කන්නෝය. (යෙසායා 30:21, 23)**

මෙය නම් මනුෂ්‍යයාගේ ක්‍රමයට නොව දෙවියන්වහන්සේගේ එළිදරව්ව මගින් නෙලා ගැනීමකි.

### අභිරහසෙහි භාරකරුවෝ

ඇදහිලිවන්තයෝ "දෙවියන්වහන්සේගේ අභිරහස්වල භාරකරුවෝ" වෙති. භාරකරුවෙක් නම් වෙන පුද්ගලයෙකු වෙනුවෙන් යමක් රැකබලාගන්නා කෙනෙකි. අභිරහසක් නම් වෙන කිසිවෙකු නොදන්නාවූ කරුණකි. දෙවියන්වහන්සේ අපට අණ කර ඇත්තේ:

> **සියල්ල මැවූවාවූ දෙවියන්වහන්සේ තුළ සියලු කාලවල පටන් සැඟවී තිබුණාවූ රහසේ නියමය කිමෙක්ද කියා සියල්ලන්ට පෙන්වන පිණිසත්ය. එසේ කළේ අපගේ ස්වාමිවූ ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ දෙවියන්වහන්සේ විසින් අභිප්‍රාය කරන ලද සදාකාල අභිප්‍රායේ ප්‍රකාරයට, ස්වර්ගීය ස්ථානවල අධිපතීන්ටත් බලධාරීන්ටත් මේ කාලයෙහි සභාව කරණකොටගෙන උන්වහන්සේගේ අනේකවිධ ප්‍රඥාව දැනගන්ට ලැබෙන පිණිසය. (එපීස 3: 9-11)**

දෙවියන්වහන්සේ සභාවට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලබන ගැළවීම නම් අභිරහස හෙළිකර දී තිබේ. සභාව මගින් දෙවියන්වහන්සේ එම අභිරහස මුළු විශ්වයටම දැනගන්නට සලස්වන සේක.

> **එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

පාපිෂ්ඨ වූ මිනිසා හට දෙවියන්වහන්සේගේ අභිරහස් හෙළිකර දෙන ආයුධය වන්නේ සභාවය. අපගේ කාර්යභාරයෙන් එකක් වන්නේ "හෙළිදරව්ව මගින් නෙලාගැනීමය".

**බීජයක් උන්වහන්සේට මෙහෙකරනු ඇත**

ස්වභාවික අස්වැන්න නෙලීමේ චක්‍රය පදනම් වී ඇත්තේ ගුණනයවීමේ මූලධර්මය මතය. එක් අස්වැන්නක බීජ තුළ ඉන්පසු කන්නය සඳහා අස්වැන්න නිපදවීමට ගැබ් වී තිබේ.

> **තෘණද ඒ ඒ වර්ග ලෙස බීජ උපදවන පලාද ඒ ඒ වර්ග ලෙස බීජ සහිත ඵලදරන වෘක්ෂද පොළොවෙන් හටගත්තේය. දෙවියන්වහන්සේ ඒ යහපත් බව දුටුසේක. (උත්පත්ති 1:12)**

මෙම බීජවලට ගුණනය වී තවත් අස්වැන්නක් බිහිකළ හැකිය. එම චක්‍රය අවසානයක් නැති එකකි. මෙම ස්වභාවික චක්‍රයෙහි ශ්‍රේෂ්ඨ ආත්මික සත්‍යයක් රැඳී පවතී. යේසුස්වහන්සේ ශුභාරංචියෙන් ලෝකයා වෙතට පිවිසීම පැහැදිලිකිරීම සඳහා අස්වැන්න භාවිත කිරීමට එක් හේතුවක්ද මෙය වේ.

ස්වභාවික ලෝකයෙහි අස්වැන්නෙන් නෙලාගත් සෑම බීජයකටම නැවත ඵල දැරීමට හැකියාව එම බීජය තුළම ගැබ්ව පවතින්නාක් මෙන්ම ආත්මික ලොවෙහිද එම සත්‍යය එසේම පවතී.

යේසුස්වහන්සේව බීජය ලෙසට හඳුන්වනු ලැබූසේක.

> **පොළොවේ සියලු සීමාවෝ සිහිකරමින් ස්වාමින් වෙතට හැරෙන්නෝය. ජාතීන්ගේ සියලු ගෝත්‍රයෝ ඔබ ඉදිරියෙහි නමස්කාර කරන්නෝය. වංශයක් උන්වහන්සේට මෙහෙකරන්නේය. මතු පරම්පරාවට ස්වාමින් ගැන එපවත් කියනු ලබන්නේය. (ගීතාවලිය 22: 27, 30)**

සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසියෙහි මිය ගිය කල එතුමාගේ ජීවයෙහි බීජය රෝපණය කරන ලදී. එතුමාගේ රෝපණයෙන් අතිමහත් අස්වැන්නක් නෙලාගෙන ඇත. දස දහස් සංඛ්‍යාත ජනතාවක් පාපයෙන් මිදීම ලැබ මරණයෙන් ජීවනයට පමුණුවනු ලැබ සිටිති. නැවත උත්පාදනය ලද සෑම කිතුනුවෙකුම ස්වභාවික ලෝකයෙහි බීජයකට සමානය. සෑම කෙනෙකු තුළම ජීවය පවතී. සෑම කෙනෙකු තුළම නැවත ඵල දැරීමට හැකියාව ගැබ්වී පවතී. මෙය ස්වභාවික ලෝකයෙහි මෙන්ම ආත්මික ලෝකයෙහිද සත්‍යතාවයකි.

## ලෝකය වෙත පිවිස ඇත.

යේසුස්වහන්සේ තම ගෝලයන්ට අභියෝග කළේ මහත් බැරෑරුම් දර්ශනයක් මගිනි. ඔවුන් ඉදිරියෙහි මුළු මහත් ලෝකය නම් අස්වැන්න නෙලීමේ කෙත දිස්විය. ඔව්හු සතුව නූතන මාදිලියේ මුද්‍රණ යන්ත්‍ර, ගුවන් විදුලිය, රූපවාහිනිය හෝ පරිගණකය ශුභාරංචිය ප්‍රචාරය කිරීම පිණිස නොවිය. වේගයෙන් ගමනාගමනය සඳහා බස්, කාර්, දුම්රිය හෝ ගුවන් යානා එවකට නොවීය. එහෙත් බයිබලය වාර්තාකරනුයේ ඉතා කෙටි කලකින්ම ඔව්හු එවකට පැවති ලෝකය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා උඩු යටිකුරු කළ බවය.

> **නුමුත් ඔව්හු ඔවුන් සොයා නොදැක, යාසොන් සහ සමහර සහෝදරයන්ද නුවර මූලාදෑනීන් ළඟට ඇදගන ගොස්, ලෝකය පෙරළුවාවූ මොව්හු මෙහිත් ඇවිත් සිටිති. (ක්‍රියා 17:6)**

දර්ශනය සම්පූර්ණ කරන ලද්දේ දෙවියන්වහන්සේගේ ගුණනවත් කිරීමේ ක්‍රමවේදය අවබෝධකරගත් සහ ආත්මිකව අස්වැන්න නෙලීම කිරීමට දැනගත්තාවූ පුද්ගලයන් පිරිසක් විසිනි.

ලොව මුළුල්ලේ පැසී නෙලීමට සූදානම්ව පවතින ආත්මික කුඹුරු බොහෝ ඇත. එනමුත් නූතන තාක්ෂණය දියුණු යුගයක වුවද එම ප්‍රාණ විනාශවෙමින් පවතී. එයට හේතුව නම් බොහෝ

දෙනෙකු එළිදරව්වෙන් අස්වැන්න නෙලීමේ ක්‍රමය සහ උපකරණ අවබෝධ කරගෙන නොමැති කමය.

## ක්‍රමය

නූතන සභාවන් ශුභාරංචිය ව්‍යාප්ත කිරීම උදෙසාත් සාමාජිකත්වය වැඩිකරගැනීම සඳහාත් නොයෙකුත් ක්‍රම භාවිතා කර ඇත. ඔව්හු ජන සමූහයන් ආකර්ෂණය කර ගැනීම පිණිස නොයෙකුත් තරඟ, තෑගි සහ විශේෂ වැඩ සටහන් භාවිත කොට තිබේ. ඔව්හු ආත්මික කාර්ය ඉටුකිරීම සඳහා මිනිසා විසින් සාදන ලද විවිධ සැලසුම් භාවිත කොට තිබේ. ආත්මික කාර්ය කළ යුත්තේ ආත්මික ක්‍රම මගිනි. දෙවියන්වහන්සේ මෙවන් භාරදූර කාර්යයන් ඉටුකිරීම සඳහා යථාර්ථවාදී ක්‍රම වේදයක් නොසපයා තම ගෝලයන් හට විශාල දර්ශනයක් නොදෙනු ඇත.

එල අස්වැන්න පිළිබඳ ස්වභාවික නිදර්ශනයේ ආත්මික සමාන්තරය තුළ ක්‍රමය දැකිය හැක. එය 2 තිමෝති 2:2 හි සාරාංශ කොට දක්වා තිබේ.

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න. (2 තිමෝති 2:2)**

ලෝකය දිනාගනු ලැබුවේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මුල් ගෝලයෝ එකලොස් දෙනාගෙන් පමණක් නොවේ. සෑම ඇදහිලිවන්තයෙකුම නැවත-එල දරන්නාවූ කිතුනුවෙකු විය. අද දින ලෝකය වෘත්තිමය ලෙස කිතුනු සේවයෙහි යෙදෙන්නන් හා ධර්මදූත ප්‍රචාරකයන් මගින් පමණක් දිනාගත නොහැක. එවන් අය පමණක් නොසෑහේ. සභාවෙහි සියයට අනූ නවයක් සමන්විත වනුයේ ගිහි ප්‍රජාවෙන්ය. බිලියන තුනක් වන ලෝක ජනගහනය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනාගැනීමට අවශ්‍ය නම් පෙළඹවිය යුත්තේ එම ගිහි ප්‍රජාවය. බයිබලය වාර්තා කරනුයේ යෙරුසලමෙහි පැවති මුල් සභාවට එරෙහිව මහත් පීඩාව පැවති බවද එබැවින් ....

> **ඔහු මරාදැමීම ගැන සාවුල්ද එකඟව සිටියේය. ඒ දවසේදී යෙරුසලමෙහිවූ සභාවට විරුද්ධව මහත් පීඩාව පීඩාවක් හටගත්තේය. එවිට ප්‍රේරිතයන් හැර ඔවුන් සියල්ලෝ යුදයේද සමාරියේද පළාත්වල විසුරුවනු ලැබුවෝය.**
> **එබැවින් විසුරුවනු ලැබූ ඔව්හු ගිය ගිය ස්ථානවල වචනය ප්‍රකාශකළෝය. (ක්‍රියා 8:1, 4)**

සභා නායකයන් හා සම්පූර්ණ කාලීන සේවකයන් වූ ප්‍රේරිතවරු යෙරුසලමෙහි රැඳී සිටියෝය. සෑම තැනම දේව වචනය දේශනා කරමින් ගියේ විසුරුවනු ලැබූ ඇදහිලිවන්තයෝය. සෑම ඇදහිලිවන්තයෙකුම තවත් ඇදහිලිවන්තයන් බිහි කරමින් ඔවුන්ව දේව රාජ්‍යයෙහි ගෝලයන් බවට පත් කළහ. විසුරුවනු ලැබූ අය වෘත්තියෙන් මසුන් මරන්නන්, කුඩාරම් ගසන්නන්, රෙදි පිළි මසන්නන් වූ නුමුදු ඔවුන්ගේ මූලික සැලකිල්ල යොමු වූයේ ශුභාරංචිය ව්‍යාප්ත කිරීම කෙරෙහිය.

සාවුල් මුල් කාලීන සභාවට පීඩා කළ යුගයෙහි ඔහු දේවස්ථාන වලට පමණක් නොව ඇදහිලිවතුන් සිරභාරයට ගන්නා පිණිස "සෑම නිවසකටම" ඇතුල් වූ බව (ක්‍රියා 8:3) සඳහන් වේ. මෙයට හේතුව නම් සෑම නිවසක්ම ආත්මික අස්වැන්නේ මධ්‍යස්ථානයක් වීමය. සෑම ඇදහිලිවන්තයෙක්ම එල දැරීමෙන් හා සෑම නිවසක්ම ශුභාරංචි ප්‍රචාරක මධ්‍යස්ථානයක් වීම නිසා සභාව වසාදැමීමෙන් ශුභාරංචිය පතලවීම වැලැක්විය නොහැකි විය. මුල් යුගයේ සභාවෙහි සෑම ඇදහිලිවන්තයෙකුම නැවත-එල දැරූ සේම සෑම නිවසකටම විශේෂ වූ සේවාවක් පැවතිනි.

උදාහරණ ලෙස පහත සඳහන් සිදුවීම් ඇදහිලිවතුන්ගේ නිවෙස් වල සිදුවිය. එනම්:

- ක්‍රියා 2:1, 46: පෙන්තකොස්තය සිදුවූයේ නිවසක උඩුමහලේය. පෙන්තකොස්තයෙන් පසුව ඇදහිලිවන්තයෝ දිනපතා නිවෙස්වල හමුවූහ.
- ක්‍රියා 9:11, 17: අනනියස් යූදස්ගේ නිවෙසට ගොස් පාවුල්ට මෙහෙකළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස අන්‍යජාතීන් වෙතට ශුභාරංචිය පතලවිය.
- ක්‍රියා 10-11: පේතෘස් නිවසක සිට යාච්ඤා කරන අතර එළිදරව්වීමක් ලැබුවේය. එහි ප්‍රතිඵලයක් ලෙසට ශුභාරංචිය අන්‍යජාතීන් වෙතට පතල විය.
- ක්‍රියා 12:12, 16:15, 21-24, 40: ඇදහිලිවතුන්ගේ යාච්ඤා රැස්වීම් මරියා, ලිදියා හා යායිරස්ගේ නිවෙස්වල පැවැත්විනි.

- ක්‍රියා 20:20: පාවුල් ප්‍රසිද්ධියේ පමණක් නොව නිවෙස්වලදීද ඉගැන්විය.
- ක්‍රියා 21:8-14: පිලිප්ගේ නිවසෙහි සිටියදී අනාගතමය එළිදරව්වීමක් පාවුල්ට ලැබිණි.
- ක්‍රියා 28:30-31: පාවුල්තුමා කුලියට ගත් නිවසක සිටිමින් දේශනා කොට ඉගැන්නුවේය.
- රෝම 16:5: 1 කොරින්ති 16:15, 19: කොලොස්සි 4:15: පිලමොන් 2: ප්‍රිසිලා හා අකිලාගේ, ස්තෙපානස්ගේ, නිම්පස්ගේ හා ආකිපස්ගේ නිවසෙහි පිහිටි සභා ගැන සඳහන් වේ.

සෑම නිවසක්ම ආත්මික ප්‍රචාරණයේ නැවත එලදෑරීමේ මධ්‍යස්ථානයක් විය. සෑම ඇදහිලිවන්තයෙකුම ඵල නිපදවිය.

ඔබගේ නිවෙස සතුරාගේ පහරදීම් වලින් ආත්මිකව ආරක්ෂාකිරීම සඳහා සටන්කරන මධ්‍යස්ථානයක් පමණක් නොව සතුරාගේ සියලු සීමා මායිම් දෙවියන්වහන්සේ වෙතට දිනාගන්නාවූ ශුභාරංචි පණිවුඩය ව්‍යාප්ත කරන්නාවූ පහරදීමෙන් සටන් කරන මධ්‍යස්ථානයක් විය යුතුය.

**එක් අයෙකුහට තව කෙනෙකු දිනාගැනීමට උගන්වන්න.**

ක්‍රමය ඉතා සරලය. සෑම ඇදහිලිවන්තයෙකුම තවත් ඇදහිලිවන්තයන් බිහිකොට අන් අයට ඉගැන්වීමට සමත් වූ විශ්වාසවන්ත මනුෂ්‍යයන්ට ඉගැන්විය යුත=ය. එල අස්වැන්නේ ස්වභාවික චක්‍රය නිම නොවන්නාක් මෙන්ම මෙයද නිම නොවේ. මෙම සැලැස්මෙහි ප්‍රතිඵලය ඔබහට මුල් කාලීන සභාව "ලෝකය උඩු යටිකුරු කළ" ආකාරය කෙසේදැයි වටහා ගැනීමට පහසු කරවනු ඇත.

මීළඟ පිටුවෙහි ඇති වගුව බලන්න. මෙම වගුවෙහි කෙනෙකුට ශුභාරංචිය කියාදී ඔහුව ඵල දරන කිතුනුවෙකු කිරීමට ගත වන කාලය සාමාන්‍යයෙන් වසරක් ලෙසට ගණනය කර ඇත. සැබෑ ජීවිතයෙහි මෙම කාර්ය සම්පූර්ණ කිරීමට එහි නියැලි පුද්ගලයනට අනුකූලව මීට අඩු කාලයක් හෝ වැඩි කාලයක් ගතවිය හැකිය.

නමුත් දළ වශයෙන් කෙනෙකුට ශුභාරංචිය කියාදී ගෝලයෙකු බවට පත් කිරීම වසරකින් ඉටු කළායැයි යන මතයෙහි පිහිටා එක් ඇදහිලිවන්තයෙකු වසරකට එක් අයෙක් දිනාගතහොත්, එම පුද්ගලයාද තව කෙනෙකු ගෝලයෙකු බවට පත් කිරීමට අධිෂ්ඨානය කළහොත් ඉතා පහසුවෙන් මුළු ලොවට ශුභාරංචිය ව්‍යාප්ත කළ හැකිය. වගුව පෙන්වා දෙන ආකාරයට පළමු වසරෙහි කිතුනුවා එක් පුද්ගලයෙකු ගෝලයෙකු කරයි. වසර අවසානයෙහි විශ්වාසවන්ත පුද්ගලයන් දෙදෙනෙක් වෙති (ඇදහිලිවන්තයා සහ ඔහු ගෝලයෙකු කළ පුද්ගලයා)

ඊළඟ වසරේදී ඔව්හු දෙදෙනාම තව එක් අයෙකු බැගින් දිනා ගනිති. දෙවන වසර අවසානයෙහි සතර දෙනෙකු සිටිති. ඊළඟ වසරෙහි මෙම සතරදෙනාම තව සතර දෙනෙකු දිනාගෙන ගෝලයන් කරති. මෙම ක්‍රමය වසර ගණනාවක් මුළුල්ලේ දියත් කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලය වගුවේ ඉහළින්ම පෙන්නුම් වේ. එදෙස බලන්න.

ඔබ ප්‍රාදේශිය සභාවක සාමාජිකයෙකු නම්, ඔබ දේවස්ථානයෙහි සිටින සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව 131,072 න් ගුණ කර බලන්න. ඔබ සභාවෙහි සිටින සෑම ඇදහිලිවන්තයෙකුම නැවත ඵල දරාවී නම් තව වසර 17 කින් ඔබ සභාවට නෙලාගත හැකි අස්වැන්නේ සංඛ්‍යාත්මක අගය ඔබගේ පිළිතුර වේ.

| | ගෝලයන් කරන්නන් | ගෝලයන් | | එකතුව |
|---|---|---|---|---|
| 17 වෙනි වසර | 65,536 | 65,536 | = | 131,072 |
| 16 වෙනි වසර | 32,768 | 32,768 | = | 65,536 |
| 15 වෙනි වසර | 16,384 | 16,384 | = | 32,768 |
| 14 වෙනි වසර | 8,192 | 8,192 | = | 16,384 |
| 13 වෙනි වසර | 4,096 | 4,096 | = | 8,192 |
| 12 වෙනි වසර | 2,048 | 2,048 | = | 4,096 |
| 11 වෙනි වසර | 1,024 | 1,024 | = | 2,048 |
| 10 වෙනි වසර | 512 | 512 | = | 1,024 |
| 9 වෙනි වසර | 256 | 256 | = | 512 |
| 8 වෙනි වසර | 128 | 128 | = | 256 |
| 7 වෙනි වසර | 64 | 64 | = | 128 |
| 6 වෙනි වසර | 32 | 32 | = | 64 |
| 5 වෙනි වසර | 16 | 16 | = | 32 |
| 4 වෙනි වසර | 8 | 8 | = | 16 |
| 3 වෙනි වසර | 4 | 4 | = | 8 |
| 2 වෙනි වසර | 2 | 2 | = | 4 |
| 1 වෙනි වසර | 1 | 1 | = | 2 |

දෙවියන්වහන්සේ තම කැමැත්ත සම්පූර්ණ කිරීම සඳහා සැමවිටම භාවිත කරන්නේ කාන්තාවන් හා පුරුෂයන්ය. දෙවියන්වහන්සේගේ අස්වැන්න නෙලීමේ ක්‍රමය උදෙසා මනුෂ්‍යයෝ අවශ්‍ය වෙති. මනුෂ්‍යයා වඩා හොඳ ක්‍රම සොයයි, නමුත් දෙවියන්වහන්සේ වඩා හොඳ මනුෂ්‍යයන්ව සොයයි. ලෝකය හැකියාව ඇති දක්ෂතා සහිත පුද්ගලයන්ව ගෙන ඔවුනට යහපත් චරිතයක් දීමට උත්සාහ දරයි. නමුත් දෙවියන්වහන්සේ පවසන්නේ චරිතවත් මනුෂ්‍යයන්, විශ්වාසවන්ත මනුෂ්‍යයන්ව ගන්නා ලෙසය, එවිට උන්වහන්සේ ඔවුන්ව හැකියාව ඇති අය බවට පත් කරනු ඇත කියාය.

> **මනුෂ්‍යයෝ අප ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයන් මෙන්ද දෙවියන්වහන්සේගේ රහස්වල ගබඩාකාරයන් මෙන්ද ගණන්ගනිත්වා. ඇරත් මෙහිදී ගබඩාකාරයන්ගෙන් ඕනැකරන්නේ එක එක මනුෂ්‍යයා විශ්වාසව සිටීමය (1 කොරින්ති 4:1-2)**

ඔබ උගත් හෝ දක්ෂ කෙනෙකුවීමට අවශ්‍ය නොවේ. ඔබගෙන් අපේක්ෂා කරනුයේ ඔබ විශ්වාසවන්තවීම පමණකි.

අස්වැන්න නෙලීම සඳහා දෙවියන්වහන්සේගේ එළිදරව්ව නම් මේය... එනම්, විශ්වාසවන්ත කාන්තාවෝ සහ පුරුෂයෝ ශුභාරංචිය අන් අයට ඉගැන්විය හැකි විශ්වාසවන්ත තවත් අයට භාරදීමට කැපවීමය.

**ආයුධය**

ස්වභාවික ලෝකයෙහි අස්වැන්න සඳහා උපක්‍රම, ක්‍රමවේද පමණක් නොව භාවිත කරන්නාවූ උපකරණ හෝ ආයුධ තිබේ. එහිදි භාවිත කරන ආයුධ සරල දෑකැත්තක සිට සංකීර්ණ යන්ත්‍ර සූත්‍ර දක්වා විහිදී තිබේ.

දෙවියන්වහන්සේගේ ආත්මික අස්වැන්න සඳහා උපකරණයක් සපයා දී තිබේ. යේසුස්වහන්සේ පැවසුවේ:

> **යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක. (මතෙව් 28:18-20)**

මෙම කොටසෙහි "සියලු" යන පදය පිළිබඳ හතර වරක් සඳහන් වේ. ඇදහිලිවතුන්ට අණ ලැබී ඇත්තේ

- **සියලු** ජාතීන්ට ඉගැන්වීමට
- **සියලු** කාරණා

මෙම රාජකාරි දෙක අපගේ වගකීමය. එය අස්වැන්නේ දර්ශනයෙහි සාරාංශයයි.

දෙවියන්වහන්සේගේ වගකීම වනුයේ:

- අපගේ කාර්යය ඉටු කිරීමට අවශ්‍ය **සියලු** බලය සැපයීම
- අප සමඟ (**සියලුම** අවස්ථාවලදී) සැමකල්හිම සිටීම

යේසුස්වහන්සේ එතුමාගේ ගෝලයන්ට පැවසූයේ:

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

යේසුස්වහන්සේ තම ගෝලයන්හට අස්වැන්නේ දර්ශනය සම්පූර්ණ කිරීම සඳහා සපයා දුන් ආයුධය නම් ශුද්ධාත්මයාණන්ගේ බලය වේ. සාර්ථක ලෙස ගුණනවත්වීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නම් එය ශුද්ධාත්ම බලයෙන් බලවත් විය යුතුය.

බොහෝ දෙනෙකු ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආශිර්වාද අත් දකිති. ඔව්හු ආලේපය ලබති, ප්‍රීතිවෙති, අන්‍ය භාෂාවලින් කතා කරති. එහෙත් ශුද්ධාත්මයාණන්වහන්සේගේ සත්‍ය සාක්ෂිය නම් ආශිර්වාද පමණක් හෝ නොදන්නා භාෂාවකින් කතා කිරීම පමණක් හෝ නොවේ. ශුද්ධාත්මයාණන්වහන්සේගේ සත්‍ය සාක්ෂිය නම් බලය වේ. එම බලය දේශ පාලනමය බලයක් හෝ ශාරීරික බලයක් නොවේ. එය ආත්මික බලය වේ.

ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආශිර්වාද පමණක් අත් දැකීමෙන් ඔබ සෑහීමට පත් නොවිය යුතුය. ඔබ ආශිර්වාදවලට ඔබ්බෙන් ගොස් දෙවියන්වහන්සේගේ බලයෙහි එළිදරව්ව වෙතට යා යුතුය.

## යොමුකරන ලද බලය

යොමු නොවූ බලය භයානකය. මහා ජල ධාරාවක ගලා බැස්මෙන් ජනතාවට බලය හා ජලය සපයා දිය හැකි අතර එම ජලධාරාව නිසියාකාරව යොමු නොකළහොත් සම්පූර්ණ ප%ජාවක් එක්වර විනාශ කර දැමීමටද එම ජල පහරට බලය තිබේ.

යේසුස්වහන්සේ තම ගෝලයන්ව බලවත් කළාවූ බලය නම් ලෝකයා වෙත සාක්ෂිකාරයන් වීමට ඔවුන්ට බලය සැපයූ යොමු කරන ලද බලයකි. එය ඔව්හු දර්ශනය සම්පූර්ණ කිරීම සඳහා භාවිතාවට ගත් ආයුධය නම් වූ බලය විය.

මෙම බලයෙහි සැපයුම් උල්පත දෙවියන්වහන්සේය.

> **දෙවියන්වහන්සේ එක් වරක් කීසේක. මම මෙය දෙවරක් ඇසීමි: එනම් බලය දෙවියන්වහන්සේට අයිති බවත්, (ගීතාවලිය 62:11)**

ඇදහිලිවතුන්හට එම බලය ලබාගන්නා ලෙස අණ ලැබී ඇත.

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි. නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක. (ලූක් 24:49)**

"සරසනු ලැබීම" යනු බලයෙන් පළඳවනු ලැබීමය. ඔබ ලෝකයාහට සාක්ෂිකරුවෙකු වෙන පිණිස දෙවියන්වහන්සේ ඔබව එතුමාගේ බලයෙන් වසාගෙන සිටීමට කැමති වන සේක.

## බලයෙහි පරමාර්ථය

ඔබට කාර්යක්ෂම සාක්ෂිකරුවෙකු වීම පිණිස ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය අවශ්‍ය වනුයේ එය වචනයෙහි බලය වන බැවිනි.

එතුමාගේ බලය ඔබ කතාකරන වචන ගෙන ඒවා සාර්ථක කරනු ඇත.

> **උන්වහන්සේගේ වචනය බලයෙන් යුක්තවූ බැවින් උන්වහන්සේගේ ඉගැන්වීමට ඔව්හු විස්මිතවූවෝය. සියල්ලෝ විස්මිතව: මේ වචනය කිමෙක්ද? මක්නිසාද උන්වහන්සේ බලයෙන්ද ආනුභාවයෙන්ද අශුද්ධාත්මයන්ට අණදෙන සේක. ඔව්හු පිටවෙතියි ඔවුනොවුන් අතරෙහි කථාකරගත්තෝය. (ලූක් 4:32, 36)**

උන්වහන්සේගේ බලය වචනය තහවුරු කරයි.

> **ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමින්වහන්සේද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිර කළ සේක. (මාර්ක් 16:20)**

දෙවියන්වහන්සේ එතුමාගේ වචනය සළකුණු මගින් සනාථ කරනු ඇත. ඔබ දේව වචනය බෙදා ගැනීමට පෙර භාස්කමේ සළකුණු දකින තුරු බලා සිටිය නොහැක. ඔබ පළමුකොට දේව වචනය බෙදා ගත යුතුය. ඉන් අනතුරුව ඔබ කතාකළ වචන සනාථ කරමින් උන්වහන්සේ ඔබ සමඟ ක්‍රියා කරනු ඇත.

සෑම සාක්ෂිදරන්නාවූ ඇදහිලිවන්තයෙකුගේ වචනයක් සමඟම දේශකයෙකුගේ දේශනාවන් සමඟම වචනය සනාථ කරමින් දෙවියන්වහන්සේගේ ක්‍රියා ප්‍රදර්ශනය වූවා නම් එය ශුභාරංචිය පතල වීම කෙරෙහි ඇතිකරන්නාවූ බලපෑම පිළිබඳව ටිකකට සිතා බලන්න' මෙම බලය කරන්නාවූ දෙය පහතින් දැක්වේ.

**එය සුවය ගෙනදෙයි:**

උන්වහන්සේගේ බලය සුවකිරීම සඳහා ඔබ සමඟ සිටිනු ඇත.

**ඒ දවස්වලින් එකකදී උන්වහන්සේ උගන්වන කල, ගලීලයේ හා යුදයේ සෑම ගම්වලින්ද යෙරුසලමෙන්ද ආවාවූ ඵරිසිවරුත් ව්‍යවස්ථාව උගන්වන්නොත් එහි හිඳගෙන උන්නෝය. සුවකරන පිණිස ස්වාමින්වහන්සේගේ ආනුභාවය උන්වහන්සේ සමඟ වූයේය. (ලූක් 5:17)**

**එය මිදීම ගෙනදෙයි:**

ඔබ ලෝකය නමැති කෙතට අවතීර්ණවීමත් සමඟම දෙවියන්වහන්සේගේ බලය දුක්විඳින ජනතාව කෙරෙහි මිදීම ගෙන දෙනු ඇත.

**තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරු කරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමටද ඔවුන්ට බලය දුන් සේක. (මතෙව් 10:1)**

**එය ආරක්ෂාව සපයා දෙයි**

ඔබ දෙවියන්වහන්සේ උදෙසා වෙහෙසෙන කල එතුමාගේ බලය ඔබව සුරකිනු ඇත.

**බලව, සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය. (ලූක් 10:19)**

**එය ශුභාරංචිය තහවුරු කරදෙයි:**

"තහවුරු කරදීම" යනු යමක් ඔප්පු කරදීමය. ශුද්ධාත්ම බලය දේව වචනයෙහි සත්‍යතාවය තහවුරු කර දෙයි.

**මහත් සමූහයක් උන්වහන්සේ අනුව ගියෝය. මක්නිසාද රෝගීන් කෙරෙහි උන්වහන්සේ විසින් දැක්වූ ලකුණු ඔව්හු දුටුවෝය. (යොහන් 6:2)**

යේසුස්වහන්සේ වෙතට මනුෂ්‍යයන් ගෙන එනු ලැබුවේ එතුමා කළාවූ බලවත් හාස්කම්ය.

ස්ත්‍රී, පුරුෂයන් ශුභාරංචිය වෙත ඇදී එනුයේ ශ්‍රේෂ්ඨ සංවිධාන හෝ නිකායන් හෝ දක්ෂ කථිකයන් නිසා නොව ජීවමාන දෙවියන්වහන්සේගේ බලය විදහා දැක්වීම මගිනි.

**එය මනුෂ්‍යයා දෙවියන්වහන්සේ වෙතට යොමු කරවයි:**

පාවුල් ලියුවේ:

**මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයෙන්ද ප්‍රකාශකිරීමෙන් විය.**
**එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4, 5)**

පාවුල් සතුව මහා අධ්‍යාපනයක් වූ බැවින් ඔහුට මනුෂ්‍ය ඥානයෙන් කතා කිරීමට හැකියාව තිබුණි. එනමුත් ඔහු දෙවියන්වහන්සේගේ බලයෙන් මෙහෙකොට ශුද්ධාත්මයාණන්වහන්සේ විදහා දැක්වීමෙන් සේවය කළේය.

එයට ඔහු දුන් හේතුව කුමක්ද? මනුෂ්‍යයන්ගේ ඇදහිල්ල මිනිස් ප්‍රඥාව මත නොව දෙවියන්වහන්සේගේ බලය මත පදනම් විය යුතුය.

## සියලු බලය

යේසුස්වහන්සේ පැවසුවේ:

> **බලව, සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය. (ලූක් 10:19)**

සියලු බලය යේසුස්වහන්සේ හට දී තිබුණි (මතෙව් 28:18)' ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින් යේසුස්වහන්සේ එම බලය ඇදහිලිවතුන් වෙතට පවරා දී තිබේ. ඔබ අස්වැන්න සඳහා කෙතට පිවිසෙන කල ඔබගේ ක්‍රමය වනුයේ ගුණනවත්වීමය. ඔබගේ ආයුධය වනුයේ බලයය.

## බලය සතුවීම

දෙවියන්වහන්සේගේ සෑම පොරොන්දුවකටම කොටස් දෙකක් ඇත. පොරොන්දුව සහ පොරොන්දුව හිමිකරගැනීම' යේසුස්වහන්සේ සියලු බලය පොරොන්දු වූ සේක. ඔබගේ වගකීම වනුයේ එම බලය සතු කරගැනීමය. එය කිරීමට ඔබ කළ යුතු දේ.

**එය අද දිනට බව හඳුනාගන්න(**

යොහන් 11 හි යේසුස්වහන්සේ ලාසරස්ව මළවුන්ගෙන් නැගිටුවීමට පැමිණි විට, මාර්තා උන්වහන්සේ හමුවී මෙලෙස පැවසුවාය.

> **එසේ හෙයින් මාර්තා යේසුස්වහන්සේට කියන්නී. ස්වාමිනි, ඔබ මෙහි සිටි සේක් නම් මාගේ සහෝදරයා නොමැරෙයි. (යොහන් 11:21)**

යේසුස්වහන්සේ ඇයට පැවසුවේ:

> **නුඹේ සහෝදරයා නැවත නැගිටින්නේ යැයි යේසුස්වහන්සේ ඇට කීසේක. (යොහන් 11:23)**

මාර්තා උන්වහන්සේට කතාකොට:

> **අන්තිම දවසේ නැවත-නැගිටීමේදී ඔහු නැවත නැගිටින බව දනිමියි මාර්තා උන්වහන්සේට කීවාය. (යොහන් 11:24)**

යේසුස්වහන්සේ බලවත් මූලධර්මයක් ඇතුළත්වූ ප්‍රකාශනයකින් පිළිතුරු දුන්සේක.

> **යේසුස්වහන්සේ: නැවත-නැගිටීමද ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නුමුත් ජීවත්වන්නේය. (යොහන් 11:25)**

යේසුස්වහන්සේ නියමිත වේලාවට එනම්, මීට කලින් පැමිණියා නම් තම සොහොයුරා සුව වන්නට ඉඩ තිබුණායැයි මාර්තා විශ්වාස කළාය.

අනාගතයේ තම සොහොයුරා නැවත නැගිටින බවද මාර්තා විශ්වාස කළාය.

නුමුත් මාර්තා හට පිළිතුරු දීමෙහිදී යේසුස්වහන්සේ: "මම වෙමි" යයි ප්‍රකාශ කිරීමෙහිදී වැදගත් සත්‍යයක් එළිදරව් කළ සේක. භාස්කම් සඳහා අතීත හෝ අනාගත දිනයක් ඇතැයි යන කරුණක් නොමැත. සෑම යුගයකම මනුෂ්‍යන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට බලය ඇත. සෑම යුගයකම අවශ්‍යතා සැපයීමට දෙවියන්වහන්සේ (මම වෙමි) සෑහේ. "මාර්තා, භාස්කමේ දිනය අදයි. නැවත නැගිටීමද ජීවනයද මම වෙමි" (වර්තමාන කාලය).

භාස්කමේ දිනය පසුවී ඇති බව පවසන සමහර අය සිටිති. ඔව්හු ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය පිළිනොගනිති. බයිබලය එවන් අය පිළිබඳව අනතුරු අඟවයි...

> **දේවභක්තියේ වේසය දරන නුමුත්, එහි බලය එපාකළ අයව සිටින්නෝය. එබඳු අයගෙන් අහක්වෙයන්න. (2 තිමෝති 3:5)**

විවරණය කරන ලද බයිබලයෙහි මෙය සඳහන් වනුයේ ඔව්හු දේවභක්තික බවක් පෙන්වන නමුත් "එහි බලයට ආගන්තුකයෝව සිටිති" යනුවෙනි.

ඔව්හු යේසුස්වහන්සේගේ ශාපකිරීමට ලක්වූ අත්තික්කා ගස වැනිය. බාහිරයෙන් ඔව්හු දේව භක්තික කමක් පෙන්නුම් කරන නමුත් ඔවුන් සතුව සවිලවත් බවක් නොමැත. අත්තික්කා ගසට ඵල නිපදවීම සඳහා යුෂ ගලායාම නොවූවාක් මෙන්ම ඔවුන් තුළද දෙවියන්වහන්සේගේ බලය ගලායාමක් නොමැති බැවින් ආත්මිකව ඵල දැරිය නොහැකිය.

**සැපයීමේ උල්පත අවබෝධ කරගන්න(**

බලය සැපයීමේ උල්පත දෙවියන්වහන්සේය.

> **මිදිවැල මමය, නුඹලා අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිම්ද, ඒ තැනැත්තේ බොහෝ ඵල දරයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹලාට බැරිය. නුඹලා මා තුළෙහි පවතින්නෝ නම්, මාගේ වචනය නුඹලා තුළෙහි පවති නම්, නුඹලා කැමති දෙයක් ඉල්ලාපල්ලා, එවිට නුඹලාට ලැබේ. (යොහන් 15:5, 7)**

යේසුස්වහන්සේ මිදිවැලය. ඔබ අත්තය. ජිවය පැමිණෙන්නේ මිදිවැලෙන්ය. අතු කරන්නේ ඵල දැරීමය. ඔබ ඵල නිපදවන්නේ නැත. ඔබට පැවරී ඇත්තේ නිපදවන ලද ඵලය දරාගැනීම පමණකි.

ක්‍රියාව කරන්නේ යේසුස්වහන්සේය. "අප දෙවියන්වහන්සේගේ කාර්යය ඉටුකරන පිණිස කුමක් කරමුදැ?යි කියා යේසුස්වහන්සේගෙන් විමසූ කල දිව්‍යමය සුවය පිළිබඳ පාඨමාලාවක් හෝ හාස්කම් කරන ක්‍රමය විදහා දැක්වීමක් එතුමා නොකළ සේක. ඒ වෙනුවට උන්වහන්සේගේ පිළිතුර වූයේ.

> **දෙවියන්වහන්සේගේ වැඩය නම් උන්වහන්සේ විසින් එවූ තැනැත්තා කෙරෙහි නුඹලා විසින් අදහාගැන්ම යයි කීසේක. (යොහන් 6:29)**

උන්වහන්සේම දෙවියන්වහන්සේගේ ක්‍රියාව වූසේක. බලයේ, හාස්කමේ හා සුවයේ උල්පත උන්වහන්සේ වූ සේක.

බලය ඇත්තේ මිනිසා තුළ හෝ මිනිසා සතු කිසිවක් තුළ නොවේ. බලය පිළිබඳ පොරොන්දුවේ ඉටුවීම දෙවියන්වහන්සේ තුළම හා එතුමාගේ වචනය තුළම රැඳී පවති.

සභාය සපයා දෙන මිදිවැල යේසුස්වහන්සේය. අපි අතුවල මනුෂ්‍යයෝ වෙමු. මිදිවැලෙන් බලය ගලායමින් දර්ශනය සම්පූර්ණ කරනු ඇත.

**ආධිපත්‍යය බලය පිළිගන්න(**

ඔබහට යම් කාර්යයක් ඉටු කිරීම සඳහා වගකීම පවරන කල එය කිරීමට ආධිපත්‍යය බලයක්ද පවරා දිය යුතු වේ.

යේසුස්වහන්සේ ඇදහිලිවතුන්හට අස්වැන්නේ වගකීම භාරදී එම කාර්යය කිරීම සඳහා ආධිපත්‍ය බලයද පවරා දුන් සේක. එනමුත් ඔබ පෞද්ගලිකව එම ආධිපත්‍යය පිළිගත යුතුය. යේසුස්වහන්සේ පැවසූයේ "සියලූ බලය" (ආධිපත්‍යය) එතුමාට දී ඇති බවය. උන්වහන්සේ එම බලය (ආධිපත්‍යය) ඔබහට පවරා දී තිබේ. ඔබ එය පිළිගෙන ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා එය නිසිලෙස භාවිත කළ යුතුය.

ඇදහිලිවතුන්ද තම සභාවලදී මෙම බලය පිළිගත යුතුය. යේසුස්වහන්සේ එක් උපමාවකදී මෙසේ පැවසූ සේක.

**ඒ දාසයා ඇවිත් තමාගේ ස්වාමියාට මේ කාරණා දැන්නුවේය. එවිට ගෙදර ස්වාමියා කෝපවී: නුඹ නුවර වීථිවලටද අතුරු පාරවලටද වහාම ගොස්, දිළිඳුන්ද අබ්බගාතයන්ද අන්ධයන්ද කොරුන්ද මෙහි ගෙනෙන්නැයි තමාගේ දාසයාට කීවේය. (ලූක් 14:21, 23)**

සභාව උදෙසා දෙවියන්වහන්සේගේ සැලැස්ම වනුයේ එතුමාගේ බලය විදහා දක්වන්නාවූ ස්ථානය බවට එය පත්වීමය. බොහෝ අවස්ථාවලදී සභාව විනෝදවෙන ස්ථානය, මැහුම් ගෙතුම් මධ්‍යස්ථානය හෝ සමාජසේවා මධ්‍යස්ථානය බවට පත්ව ඇත.

අපගේ සභාවල දෙවියන්වහන්සේගේ බලය ගලායෑමක් සිදු නොවේ නම්, දුගී, අසරණ, අන්ධ හා පාපයෙහි විනාශවූවන් කිසිම වෙනසකට භාජනය නොවී අපගේ දොරටුවලින් පිටව යනු ඇත. ඔව්හු සභාවට පැමිණි ආකාරයටම ඉන් පිටව යනු ඇත.

සභාව සෑදී ඇත්තේ එක් එක් පුද්ගලයන් එකමුතුවීමෙනි. සභාවක් ලෙස දේව බලය ගලායාම අත්දැකීමට නම්, එහි සාමාජිකයන් තනි තනිව එම බලය අත්දැකිය යුතුය.

### ජේතෘස්: පෙර සහ පසුව

ඔබ අකාර්යක්ෂම නෙලන්නෙකුගේ සිට එළිදරව්වේ අස්වැන්නෙහි සාර්ථක නෙලන්නෙකු බවට වෙනස් කරන්නාවූ ආයුධය නම් දෙවියන්වහන්සේගේ බලය වේ. ප්‍රේරිත වූ ජේතෘස්ගේ උදාහරණය සලකා බලන්න.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවාවෙහි ශ්‍රේෂ්ඨතම මොහොතෙහි (මාර්ක් 14:32-34) නිදා සිටින ජේතෘස් නම් පුද්ගලයෙක= අප දකී. බියගුළු ජේතෘස් උන්වහන්සේව නාඳුනන බව ප්‍රකාශ කරනු දකී (මතෙව් 26). මනුෂ්‍යන් අල්ලන්නෙක් වීමට කැඳවීම ලද ජේතෘස් අස්වැන්නට පිටු පා යනු අපි දකිමු. ඔහු ඔහුගේම ආත්මාර්ථකාමී කාර්යයට නැවත හැරී ගියේය (යොහන් 21).

එහෙත්, හදිසියේම බයිබලය අලුත් ජේතෘස් කෙනෙක් පිළිබඳව වාර්තා කරයි. මේ මිනිසා නිර්භීතව ශුභාරංචි පණිවුඩය කතාකළ පළමු අවස්ථාවේදීම 3,000 ක් දෙනා ගැළවීම ලැබුවෝය. ඔහු දේශනාකළ ඊළඟ වතාවේ සභාවට තවත් 5,000 ක් එකතු විය. මෙසේ පලා දුවගිය, ශාපකළාවූ මිනිසා මුල් යුගයෙහි සභාවෙහි ප්‍රබල නායකයෙක් බවට පත්වීමට වෙනස් කළේ කුමකින්ද?

ජේතෘස් බලයෙහි අත්දැකීමක් ලැබුවේය. එම බලය ඔහුව කොර මනුෂ්‍යයා හට මෙලෙස පැවසීමට බලවත් කළේය.

**ජේතෘස් යොහන් සමඟ ඔහු දෙස ඇස් හෙළා, අප දෙස බලාපන්නැයි කීවේය. ජේතෘස්ද රන් රිදී මට නැත, නුමුත් මට ඇති දේ නුඹට දෙමි. නාසරීය යේසුස්වහන්සේගේ නාමයෙන්, ඇවිදපන්නැයි කියා, ඔහුගේ දකුණත අල්ලා ඔහු නැගිටෙවුවේය. එකෙණෙහිම ඔහුගේ පාද සහ ඇස්වට සවිවිය. (ක්‍රියා 3:4, 6-7)**

දුක් විඳින ජනතාවට "අප දෙස බලන්න" යැයි කීමට නම් ඔවුන්ගේ අවශ්‍යතා සැපිරීමට ඔබ සතුව යමක් ඇති බව නිසැකවම ඔබ දැන සිටිය යුතුය. කොර මනුෂ්‍යයෙක්ගේ අතින් අල්ලා ඔහුව දෙපයින් නැඟී සිටුවීමට නම් ඔබ තුළ ඔබගේම බලයට වඩා වැඩි ශ්‍රේෂ්ඨ බලයක් තිබෙන බව ඔබ දැන සිටිය යුතුය. ජේතෘස් හට ඔහුගේම කිසි බලයක් නොවීය. එහෙත් ඔහු තුළින් දෙවියන්වහන්සේගේ බලය ගලා යන බව ඔහු දැන සිටියේය. දෙවියන්වහන්සේගේ බලය කොරුන්ව කොරුන් ලෙසම පැවතීමට නොව ඔවුන්ව දෙපයින් නැගී සිටුවීමට සලස්වන සේක.

බලයේ අත්දැකීම ජේතෘස් වැනි මසුන් අල්ලන්නන්ව මනුෂ්‍යයන් අල්ලන්නන් බවට පරිවර්තනය කරයි.

### ව්‍යාප්ත වන්නාවූ වෘත්තය.

ශුභාරංචිය බලවත් සේ සාක්ෂිදැරීමෙන් බිහිවන්නාවූ නිරතුරු පැතිරී යන වෘත්තයෙහි රටාව යේසුස්වහන්සේ සැකිල්ලක් ලෙස පෙන්වා දුන් සේක.

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

අස්වැන්න සඳහා උපක්‍රම මෙහෙයුම එතුමාගේ වචනයෙහි එළිදරව් කර දී තිබේ.

- ක්‍රමය නම් ගුණනවත් වීමය.
- ආයුධය නම් ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයය.
- බලය නිසි මගට යොමු වූවකි. එය සපයනු ලැබුවේ ගෝලයන් හට සාක්ෂිකරුවන් වීමට හැකියාව ලබා දීමටය.
- බලයෙහි ඉලක්කය වූයේ ලෝකයෙහි ජාතීන්ය. එය නිරතුරුවම පුළුල් වන්නාවූ වෘත්තයකි... යෙරුසලම ඉන්පසු යුදය සහ සමාරිය පසුව ලොව මුළුල්ලෙහිම.

ගෝලයෝ සිටි ස්ථානයෙන් අරඹා ගුණනවත්වීමේ ක්‍රමය භාවිතකොට, බලයේ ආයුධය ඇසුරින් ලොව එහා කෙළවර දක්වා ශුභාරංචිය ප්‍රචලිත කළහ.

**පොරොන්දුව හිමිකරගැනීම**

මෙම පොරොන්දුව බොහෝවිට අයිතිකර ගැනීමට ප්‍රකාශ කරනුයේ ඇදහිලිවන්තයෝය.

**... මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කී සේක (මතෙව් 28:20)**

නුමුත් මතක තබාගත යුතු කරුණ නම් දෙවියන්වහන්සේගේ සැම පොරොන්දුවකදීම එම පොරොන්දුව හිමි කරගැනීමට කොන්දේසියක්ද පවතින බවය. මෙම පොරොන්දුව දෙන ලද්දේ විශේෂ ඇදහිලිවතුන් කණ්ඩායමකටය. එනම් අස්වැන්නේ දර්ශනය ඉටු කරන්නාවූ ඇදහිලිවන්තයන්ටය.

**එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තිස්මකරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක. (මතෙව් 28:19-20)**

දර්ශනය දැකීමට කැමති අය උදෙසා... ලෝකයෙහි ජාතීන් වෙතට බලවත් සාක්ෂියක් සමඟ යාමට කැමති අය උදෙසා... එවන් අයට එතුමා පොරොන්දු වී ඇත්තේ ... "බලව, මමද ලෝකාන්තිමය දක්වා නුඹලා සමඟ සිටිමි" යනුවෙනි.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

2. දෙවියන්වහන්සේගේ ගුණනවත් කිරීමේ ක්‍රමය එළිදරව් කරදෙන බයිබල් යොමුවන් මොනවාද?

3. අස්වැන්නෙහි ආයුධය කුමක්ද?

4. බලයෙහි පොරොන්දුව හිමිකරගැනීමට පියවර තුන නම් කරන්න.

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

2 තිමෝති 2:2 හි සපයා දී ඇති ගුණනවත්වීම සඳහා දෙවියන්වහන්සේගේ ක්‍රමය පළමුකොට යෙරුසලමෙහි අදාළ කර ගෙන ඉන්පසුව ලොව පුරා ප්‍රචලිත විය යුතු විය. ඔබ සිටින ස්ථානයෙහි පළමුකොට අස්වැන්න නෙලීමට ඇරඹිය යුතුය. එවිට දෙවියන්වහන්සේ ඔබගේ දර්ශනය සහ සේවාව පුළුල් කරනු ඇත. ඔබගේ "යෙරුසලමෙහි" "එළිදරව්ව මගින් නෙලීමට" පහත සඳහන් යෝජනා ඔබට සහාය වනු ඇත.

1. යෝෂුවා පොත අධ්‍යනය කරන්න. ඉශ්‍රායෙල් හට පලස්තින දේශය හිමි කර ගැනීමට දෙවියන්වහන්සේ යෝෂුවා හට දුන් ප්‍රතිපත්ති සොයා බලන්න. ඔබගේම ප්‍රජාව දෙවියන්වහන්සේ වෙතට හිමි කරගැනීම සඳහා මෙම ප්‍රතිපත්ති කිහිපයක් ඔබට භාවිත කළ හැකිද?

2. ඔබගේ ප්‍රජාව වෙත ශුභාරංචිය ගෙනයාමට අරමුණු පිහිටුවාගන්න. අරමුණු නම් ඔබගේ ඉලක්ක හෝ සැලසුම් පිළිබඳ ප්‍රකාශනයකි. ඔබ කරන්නට යන්නේ කුමක්ද? කවදාද? දැනට ශුභාරංචිය ව්‍යාප්ත වී නොමැති ප්‍රජාවක් තෝරාගෙන ඔවුන් වෙතට ශුභාරංචිය ගෙන යාමට හැකි වන පරිදි අරමුණු පිහිටුවාගන්න. රෝම 15:20-21 දක්වා පාවුල්ගේ ප්‍රමුඛතාව වූයේ මෙයයි. ඔබ සලකා බැලිය යුතු අරමුණු කිහිපයක් නම්:

   - ඔබගේ ප්‍රදේශයෙහි ඇති සෑම නිවසකටම ගොස් පෞද්ගලිකව අසල්වැසියන් සමඟ ශුභාරංචිය බෙදාගන්න.
   - නව ආර්ථික ඉලක්ක පිහිටුවාගෙන දේශය හා අන්තර්ජාතික ධර්මදූත සේවාවනට මුදල් දෙන්න.
   - තවමත් ශුභාරංචිය ගෙනගොස් නොමැති ඔබ ප්‍රදේශයෙහි සුළු ජන කොටසකට මෙහෙ කිරීමට සිතා බලන්න.
   - විශේෂිත සේවාවක් නිවාඩු නිකේතනයක හෝ සරගෙදර හෝ රෝහලක ආරම්භ කරන්න. මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන්, දුප්පතුන්, මධ්‍යසාරයට ඇබ්බැහිවූවන්, අවිවාහක මව්වරු යනාදින්ට සේවයක් කිරීම සලකා බලන්න. විශේෂ කණ්ඩායම් ලෙසට කාන්තාවනට, පුරුෂයනට, දරුවන්ට, යුවලවලට, පවුල්වලට හෝ යුද්ධ හමුදාවල සේවය කිරීමට තිරණය කරන්න.

3. ඔබගේ සේවය ඔබගේ "යෙරුසලමේ" සිට ලෝකයෙහි අනෙකුත් ජාතීන් වෙතට ව්‍යාප්ත කරන්න. යාච්ඤාවෙන් ලෝකයට කා වැදීමට ආරම්භ කරන්න.

   - ලෝක සිතියමක් සොයාගෙන ලෝකයෙහි ජාතීන් උදෙසා යාච්ඤා කරන්න. අන්‍යජාතීන් ඔබගේ උරුමය කොට ඉල්ලා සිටින්න. ඔබව ජාතීන්ට ආශිර්වාදයක් කිරීම පිළිබඳව දෙවියන්වහන්සේට ස්තුති කරන්න.
   - ඔබට දිනපතා පුවත් පත ලබාගත හැකි නම්, විවිධ ජාතීන්ගේ ප්‍රශ්න ගැටලු ඉදිරිපත් කෙරෙන සිරස්තල වලට යාච්ඤා කරන්න. රාජ්‍ය නායකයන්, මිෂනාරිවරු, සේවකයන් හා අනෙකුත් ඇදහිලිවතුන් පිළිබඳව යාච්ඤා කරන්න.

**හතරවන කොටස: බලාපොරොත්තුවීම**

**ඔබ දර්ශනයෙහි කොටසක් වේ**

# නමවන පරිච්ජේදය

## වියගහ කඩා දැමීම

**අරමුණ:**

මෙම ජේදය අවසානයෙහි ඔබ හට කළ හැකි වන කරුණු:

- වහල්කමේ තුන්-ආකාර වියගහ හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ තුන්-ආකාර වියගහ විස්තර කිරීමට
- වහල්කමේ වියගහ සහ දෙවියන්වහන්සේගේ වියගහ අතර ඇති පරතරය යා කරන පාලමෙහි පියවර නම් කිරීමට
- වහල්කමේ වියගහ බිඳීමෙහි ආත්මික ප්‍රතිඵල හඳුනාගැනීමට

**ප්‍රධාන පදය:**

> **වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි. මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

**හැඳින්වීම**

මෙම පාඨමාලාවෙහිදී මෙතෙක් අධ්‍යයනය කොට ඇති අංග නම්:

> මනඃකල්පනය/සිතින් මවා ගැනීම: දර්ශනය හඳුනාගැනීම.
> සංකල්ප බිහිකිරීම : දර්ශනය පසුපස ඇති පරමාර්ථයෙහි සංකල්පය අවබෝධ කැගරනීම.
> අරමුණු ඉටුකරගැනීම : දර්ශනය සම්පූර්ණකිරීම සඳහා අරමුණු

පාඨමාලාවේ අවසාන කොටස වන බලාපොරොත්තුව නම් මෙම කොටසෙහිදී ඔබ දර්ශනය සම්පූර්ණ කිරීමේ කොටසක් බවට පත්වෙනු ඇත.

දෙවියන්වහන්සේගේ ආශාව නම් ඔබ අපේක්ෂිත අවසානයකට රැගෙන ඒමය.

> **මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙරමියා 29:11)**

එම අපේක්ෂිත අවසානය නම් දර්ශනය සම්පූර්ණ කිරීමය. එනම් දෙවියන්වහන්සේගේ වැඩය අවසන් කිරීමය.

> **යේසුස්වහන්සේද: මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්තකොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. (යොහන් 4:34)**

ඔබ කිසියම් අලුත් දෙයකට අතුළු වන සෑම විටම කිසියම් පැරණි දෙයක් අත්හැරීමට සිදුවේ. උපත සඳහා ගර්භාෂයෙහි සුරක්ෂිතභාවය අත්හැරිය යුතු වේ.

දෙවියන්වහන්සේ ඔබහට ඇදහිල්ලෙන් නව පියවරක් ගැනීමට ඉල්ලා සිටින සේක.

**පළමු කාරණ සිහි නොකරල්ලා, පුරාණ දේවල්ද කල්පනා නොකරල්ලා. බලව මම අමුත-දෙයක් කරන්නෙමි දැන් ඒක හටගන්නවා ඇත . නුඹලා ඒක නොදන්නහුද,මම කාන්තාරයේ පවා මාර්ගයක්ද වනයේහි ගංගාද සාදන්නෙමි. (යෙසායා** 43 :18,19)

දෙවියන්වහන්සේගේ බලය අද දවසට නොවන බව විශ්වාසකරන දේව ධර්මයකින් ඔබ බැඳී සිටියා විය හැක. ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත කිරීම දේව සේවකයන්ගේ හා ධර්මදූත සේවකයන්ගේ වගකීම යැයි ඔබ සිතා සිටියා විය හැක. ඔබ සමහරවිට නිකායක හෝ චාරිත්‍ර චාරිත්‍ර වලට බැඳී අස්වැන්න නෙලීම සඳහා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි අනෙක් කොටස් සමඟ අත් වැල් බැඳ ගැනීමට නොහැකි වූවෙකු විය හැකිය.

නුමුත් දෙවියන්වහන්සේ ඔබහට නව දර්ශනයක් දී ඇත. පරමාර්ථයෙහි එකමුතුකමින් එකට බැඳී සිටින්නාවූ ආත්මික ශ්‍රම බලකායකින් යුත් නව ජාලයක ඔබත් කොටස්කරුවෙකු වෙමින් සිටී.

**නව ජාලයක්**

බයිබලයෙහි, ස්වභාවික ලෝකයෙහි දැලක් ^ජාලයක් &භාවිත කළ අවස්ථාවන් දෙකක් වාර්තා වේ. එමගින් අගනා ආත්මික සත්‍යයක් විදහා දක්වයි.

පළමුවන සිදුවීම ක්‍රිස්තුස්වහන්සේගේ භෞමික සේවයෙහි මුල් යුගයේ සිදුවූ අතර එය ලූක් 5 හි වාර්තාකර තිබේ. ගෝලයෝ මුළු රාත්‍රියෙහිම මසුන් ඇල්ලීමට වෙහෙස වුවද කිසිවක් අල්ලාගෙන නොතිබුණාහ. යේසුස්වහන්සේ ඔවුන්ට පැවසුයේ:

**උන්වහන්සේ කථාකොට නිමවූ කල ගැඹුරට ගොස් මසුන් අල්ලන්ට දැල් හෙළාපල්ලායයි සීමොන්ට කීසේක. (ලූක්** 5:4)

පේතෘස් කතාකොට:

**සීමොන් උත්තරදෙමින්: ස්වාමිනි, අපි මුළු රාත්‍රියෙහිම වෙහෙසවීමුව, නුමුත් මොකවත් ඇල්ලුවේ නැත. එහෙත් ඔබගේ වචනය නිසා දැල් හෙළමියි කීවේය. (ලූක්** 5:5)

ඔව්හු දැළ හෙළු කල මසුන් මහත් රාශියක් හසුවූ බැවින් දැළ ඉරෙන්නට පටන් ගත් බැවින් අහල පහල සිටි අනෙක් සහෝදර මාළු අල්ලන්ගේ සහාය පැතීමට සිදුවිය. ඇල්ලූ මසුන් ඉතා රාශියක් බැවින් බෝට්ටු දෙකම පුරවා බෝට්ටු ගිලෙන තරම් විය. මේ දුටු පේතෘස් මවිත විය. නුමුත් යේසුස්වහන්සේ ඔහුට පැවසුවේ:

**යේසුස්වහන්සේ: භයනොවන්න, මෙතැන් පටන් නුඹ මනුෂ්‍යයන් අල්ලනවා ඇතැයි සීමොන්ට කීසේක. (ලූක්** 5:10)

පේතෘස් ස්වභාවික ලොවෙහි අත්දුටු මෙම මසුන් ඇල්ලීම ඔහු ආත්මික ලොවෙහි මිනිසුන් අල්ලන්නෙක් වූ පසු නෙලාගැනීමට යන මහත් අස්වැන්න හා කිසිසේත්ම සංසන්දනය කළ නොහැකි විය.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවයෙහි අවසාන භාගයේදීද එවැනිව සිදුවීමක් පිළිබඳව යොහන් 21 හි වාර්තා වේ. ගෝලයෝ මුළු රාත්‍රියෙහිම වෙහෙස වූ නමුත් කිසිවක් අල්ලාගත නොහැකි විය. ක්‍රිස්තුස්වහන්සේගේ අණට අනුව ඔව්හු දැල හෙලූ කල නැවත වතාවක් දැල මසුන්ගෙන් පිරී ගියේය. නුමුත් මේ වර වෙනසක් සිදු විය. දැල ඉරුනේ නැත.

**එබැවින් සීමොන් පේතෘස් ඔරුවට නැගී, ලොකු මසුන් එකසිය පණස් තුන් දෙනෙකුගෙන් පිරුණු දැල ගොඩට ඇද්දේය. එපමණ තිබුණු නුමුත් දැල ඉරුණේ නැත. (යොහන්** 21:11)

මෙම සිදුවීම් දෙක ඇත්තවශයෙන්ම ස්වභාවික ලෝකයෙහි සිදුවිය. නුමුත් ඒවා මහත් ආත්මික සත්‍යයන්හි සමාන්තර කරුණු විය. පළමුවර දැල ඉරී ගිය නමුත් දෙවන වර එසේ නොවිය. වෙනසට හේතුව කුමක්විද?

පළමු දැල මනුෂ්‍යයන්ගේ උත්සාහයේ උදාහරණයකි. පේතෘස් වෘත්තියෙන්ම මසුන් අල්ලන්නෙකි. ඔහු මසුන් අල්ලන්නන්ගේ ස්වභාවික ක්‍රමවේදය හා චාරිත්‍ර වාරිත්‍ර දැන සිටියේය. ඉරී ගිය දැල තුළින් යේසුස්වහන්සේ ඔහුට පෙන්වා දුන්නේ මනුෂ්‍යයාගේ උත්සාහයෙන් දෙවියන්වහන්සේගේ දර්ශනය හෝ ක්‍රියාව සම්පූර්ණ කළ නොහැකි බවය.

දෙවියන්වහන්සේ පේතෘස්ව කැඳවන්නාවූ ශ්‍රේෂ්ඨ කාර්යය ඔහු හඳුනාගත් කල ඔහු මොරදුන්නේ:

> **සීමොන් පේතෘස් ඒ දැක, යේසුස්වහන්සේගේ දණ ළඟ වැටී: ස්වාමිනි, මා වෙතින් ගිය මැනව: මම පව්කාර මනුෂ්‍යයෙකැයි කීවේය. (ලූක් 5:8)** කියාය.

පේතෘස් මනුෂ්‍යයන් අල්ලන්නෙක් බවට පත්වෙනු ඇත. ඔහුගේ පැරණි දැල (ජාලය) මහත් ආත්මික අස්වැන්න දැරීමට තරම් නොසෑහෙනු ඇත. පේතෘස්හට මනුෂ්‍යයාගේ පැරණි ගතානුගතික සිරිත් විරිත් අත්හැර දැමීමට සිදුවේවි. ඔහු යුදෙව්වන් හා අන්‍යජාතීන් වෙන්කරන සීමාව පැතිය යුතුය. පැරණි ජාලයෙන් (දැල) කැඞී ගොස් ඔහු අලුත් ජාලයක කොටසක් බවට පත්විය යුතුය.

යේසුස්වහන්සේ පැමිණියේ පැරණි දෙය විනාශ කිරීමට නොව, අලුත් දෙයක් තුළින් එය සම්පූර්ණ කිරීමටය. උන්වහන්සේගේ ව්‍යවස්ථාව විනාශ නොකොට එයට නව අරුතක් එකතු කළ සේක. එතුමා පාපය උදෙසා ලේ වැගිරීමේ පූජාව අවලංගු කළේ නැත. ඒ වෙනුවට පාපයට කමාව පිණිස තම රුධිරය වැගිරවීමෙන් පාප පූජාව සම්පූර්ණ කළ සේක.

අලුත් මුද්‍රිකපානය, පැරණි සම් භාජනවල දැමීම පිළිබඳව යේසුස්වහන්සේ අනතුරු ඇඟවූ සේක. පැරණි සම් භාජනයට අලුත් මිදියුෂය දැරීමට නොහැකි වනු ඇත. එය පැරණි දැලට මසුන් රාශියට දැරීමට නොහැකි වුවාක් මෙන්ය. මහා නියෝගයෙහි අභියෝගය ජයගත හැක්කේ ආත්මික ලොවෙහි අලුත් දැලක් භාවිතයෙන් පමණකි.

පළමුවර හා දෙවනවර මසුන් ඇල්ලීමේ සිද්ධීන් දෙක අතරතුර අලුත් ජාලයක් බිහිවී තිබුණි. මෙම ස්වභාවික මසුන් ඇල්ලීමේ සිදුවීම් දෙක ආත්මික ලොවෙහි සිදුවී තිබූ මහත් ක්‍රියාවක සමාන්තරය දැක්වීය.

මෙම නව ආත්මික ජාලයට යේසුස්වහන්සේ දුන්නාවූ දර්ශනය දැරිය හැකිය. නුමුත් කෙනෙකු එයට ඇතුල්වීමට නම් පැරණි දෙයින් පීවත් වී අලුත් දෙයට පා තැබිය යුතු වේ. පැරණි වියගහ කැඩිය යුතු වේ. අලුත් දැලට දරාගැනීමට ඉඩ දී පැරණි දැළ විනාශවිය යුතුය.

### වියගහ

පුරාණ කාලයෙහි මුළු ලෝකයෙහිම කුඹුරු වල සතුන් එකට වැඩෙහි යෙදවීම පිණිස වියගහ සුලබ ලෙස භාවිත විය. අද දින පවා ලෝකයෙහි බෝහෝ ජාතීන් වියගහ භාවිත කරති.

යේසුස්වහන්සේ වියගහ පිළිබඳ මෙලෙස කතා කළ සේක.

> **වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි. මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

උන්වහන්සේ දී ඇති දර්ශනය නම් අස්වැන්නේ කෙතය. අද දින එම කෙත බිලියන තුනක් තවම ශුභාරංචිය අසා නැති ජනතාවකගෙන් නියෝජනය වේ... උන්වහන්සේ අපට කියා සිටින්නේ එම අභියෝගය "පහසු" හා "සැහැල්ලු" බවක්ය. ?

උන්වහන්සේ සැබවින්ම පවසන දෙය එය වේ. නමුත් පැරණි වියගහට, පැරණි දැලට මෙම දර්ශනය දැරිය නොහැක. ඔබට ද එය තනිවම සම්පූර්ණ කළ නොහැක. ඔබට එය මනුෂ්‍ය උත්සාහයෙන් කළ නොහැක. ඔබ නව ජාලයෙහි කොටසක් බවට පත් වී උන්වහන්සේ සමඟ වියගහට ඇඳිය යුතුය.

## වහල්කමේ වියගහ

අපි සියලු දෙනාම කිසියම් මාදිලියක වියගහක බැඳී සිටිමු. එක්කෝ ඔබ වහල්කමේ වියගහෙහි බැඳී සිටී නැත්නම් දෙවියන්වහන්සේගේ වියගහෙහි බැඳී සිටී.

වහල්කමේ වියගහ තුන් ආකාරයකි. ඔබ පාපයට, මමත්වයට හෝ මනුෂ්‍යයාට වහල් බැම්මෙන් බැඳී සිටිය හැකිය.

**පාපයෙහි වියගහ:**

> **මම වනාහි නුඹලා මිසරවරුන්ගේ වහලුන්ව නොසිටින පිණිස මිසර දේශයෙන් නුඹලා පිටතට ගෙනාවාවූ නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේය: මම නුඹලාගේ වියගහේ බැඳුම් බිඳ නුඹලාට කෙලින්ව යන්ට සැලැස්වීමි. (ලෙවී කථාව 26:13)**

මිසරයේ වියගහ යනු පාපයේ වියගහය. ඔබ යේසුස්වහන්සේ සමඟ එක වියගහකට ඇඳීමට නම්, ඔබගේ ජීවිතයෙහි පාපයේ වියගහ බිඳිනු ලබන්නට අවශ්‍යය.

**මමත්වයෙහි වියගහ:**

වහල්කමේ වියගහ තමාටම  වහල්වී සිටීමක් විය හැක.

> **මක්නිසාද මා කරන දේ මම නොදනිමි. මා කරන්නේ මා කැමති දේ නොව මා ද්වේෂකරන දේය. (රෝම 7:15)**

ආත්මාර්ථකාමීබව හා අහංකාරය මමත්වයෙහි වියගහෙහි උදාහරණ වේ.

**මනුෂ්‍යයාගේ වියගහ:**

මනුෂ්‍ය වියගහ නම් අනෙකුත් අය ඔබ වෙත දමා ඇති බැඳීමය.

> **එසේය, ඔව්හු උසුලන්ට අමාරු මහත් බර බැඳ මනුෂ්‍යයන්ගේ කරේ තබති. නුමුත් තමුන්ගේ ඇඟිල්ලවත් ඒවාට තබන්ට කැමති නොවෙති. (මතෙව් 23:4)**

මනුෂ්‍යය වියගහ දෝෂාරෝපණය, චාරිත්‍ර, නිකාය හෝ පැවැත්විය නොහැකි තරමේ අපහසු හැසිරීම් රටාවන් අනෙක් අය විසින් ඔබ මත පැටවීමය.

වහල්කමේ තුන්-ප්‍රකාර වියගහ වන පාපය, මමත්වය හා මිනිසා සංකේතවත් කරනුයේ බලෙන් පැවරූ බරපතල වැඩ, දැරීමට අපහසු බර හා නොසන්සුන් බවය.

## දෙවියන්වහන්සේගේ තුන්-ප්‍රකාර වියගහ

දෙවියන්වහන්සේගේ වියගහ බලෙන් පැවරූ වැඩ වෙනුවට සාමූහික වැඩය පිළිබඳ පවසයි. එහි බර වෙනුවට සැහැල්ලුව පවසයි. එය අවිවේකී නොසන්සුන් බව වෙනුවට විවේකී සන්සුන් බව පවසයි.

දෙවියන්වහන්සේගේ තුන්-ප්‍රකාර වියගහ පහසුය, සැහැල්ලුය විවේකිය

> **වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි. මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

## පරතරය යා කිරීමට පියවර තුන

වහල්කමේ වියගහේ සිට දෙවියන්වහන්සේගේ වියගහ වෙතට ළඟාවීමට පරතරය යා කිරීමට යේසුස්වහන්සේ පියවර තුනක් සපයා දුන් සේක. පැරණි ක්‍රමයෙන් ඉවත් වී අලුත් දෙයට ඇතුළු වීමට මාර්ගය මෙයයි. එනම්:

**එන්න:** ඔබ කැමැත්තෙන්ම එතුමා වෙතට පැමිණිය යුතුය. එය පාපයේ වියගහ බිඳ දමයි.

**ගන්න:** ඔබ එතුමාගේ වියගහ ගත යුතුය. එසේ කිරීමෙන් මිනිස් වියගහ විනාශ වී යයි.

**ඉගෙනගන්න:** උන්වහන්සේගෙන් ඉගෙන ගැනීමෙන් ඔබ මමත්වයෙහි වියගහ බිඳ හෙළයි.

දෙවියන්වහන්සේගේ වියගහ උන්වහන්සේ කියා දෙනවා පමණක් නොව ඔබ සමඟ හවුලේ බෙදාගනී.

**වියගහ කැඩීම**

දෙවියන්වහන්සේගේ ආශාව නම් ඔබගේ ජීවිතයෙහි පාපය, මමත්වය හා මිනිසා යන සෑම වියගහක්ම විනාශ කොට දැමීමය. ඔබට දර්ශනය සම්පූර්ණ කිරවීමට අවශ්‍ය නම් මෙම විනාශ කිරීම අත්‍යවශ්‍ය වේ.

පැරණි ගිවිසුම් වාර්තාවලට අනුව ඉශ්‍රායෙල් ජනතාව විරුද්ධවාදී අසරියානු හමුදාව මගින් වට කරනු ලැබ සිටියහ. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට කතාකොට ප්‍රකාශ කළේ.

> **සේනාවල ස්වාමින්වහන්සේ දිවුරා කථාකොට: මා යෝජනාකළ ලෙසම සිදුවන්නේය, මා අදහස්කළ ලෙසම ස්ථිරවන්නේය. එනම්, මම අෂූරියයා මාගේ දේශයේදී සුන්කොට මාගේ කඳු පිට ඔහු පාගාදමන්නෙමි. එවිට ඔහුගේ වියගහ ඔවුන් කෙරෙන් පහවන්නේය. ඔහුගේ බරද ඔවුන්ගේ කරෙන් පහවන්නේයයි කීසේක. (යෙසායා 14:24-25)**

දෙවියන්වහන්සේට ඉශ්‍රායෙල් කෙරෙන් වියගහ බිඳ දැමීමට අවශ්‍ය විය. එනමුත් උන්වහන්සේගේ පරමාර්ථය ඉශ්‍රායෙලයෙන් ඔබ්බට, ලෝකයෙහි ජාතීන් වෙතට යොමු වී පැවතුණි.

> **මුළු පොළොව කෙරෙහි අදහස්කර තිබෙන අදහස මේය. සෑම ජාතීන් කෙරෙහි දිඟුකර තිබෙන හස්තයත් මේය. (යෙසායා 14:26)**

දෙවියන්වහන්සේගේ පරමාර්ථය කුමක්විද? එතුමාගේ පරමාර්ථය වූයේ ලෝකයෙහි ජාතීන් කෙරෙන් වහල්කමේ වියගහ බිඳ දැමීමය.

මින් පරිච්ඡේද කිහිපයකට පසුව මෙසේ වාර්තා වේ.

> **ඒ රාත්‍රියේදී ස්වාමින්වහන්සේගේ දූතයා පිටත්ව ගොස් අෂූර්වරුන්ගේ කඳවුරෙහි එක් ලක්ෂ අසූපන්දහස් දෙනෙකුට පහරදුන්නේය. මිනිසුන් අලුයම නැගිටුණු විට, බලව, ඒ සියල්ලෝ මළකඳන් වූය. (යෙසායා 37:36)**

ඔබගේ ජීවිතයෙහි ඇති සෑම වියගහක්ම මිය ගිය මළමිණී බවට පත් වීමට දෙවියන්වහන්සේ අපේක්ෂා කරන සේක. එතුමා සමඟ එක වියගහ යටතට ඔබව ගෙන ඒමට මේ සියල්ල විනාශ කර දැමීමට එතුමාට අවශ්‍යය.

**එය කැඩිය හැක්කේ කෙලෙසද?**

> **තවද ඒ දවසේදී ඔහුගේ බර නුඹේ කරෙන්ද ඔහුගේ වියගහ නුඹේ බෙල්ලෙන්ද පහවන්නේය, නුඹේ තරකම නිසා වියගහද කැඩෙන්නේයයි කියන සේක. (යෙසායා 10:27)**

- එය ගැඹුරු ඉගැන්වීම් මගින් විනාශ කළ නොහැක. එය අධ්‍යාපනයට මගින් හෝ මනෝවිද්‍යාව මගින් විනාශ කළ නොහැක.
- එය උපදේශනය මගින් හෝ සංවිධාන මගින් හෝ නිකායන් මගින් විනාශ කළ නොහැක.

- එය විනාශ කළ හැක්කේ දෙවියන්වහන්සේගේ බලය වන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේපය මගිනි.

වියගහ කැඩීමේ දෙවියන්වහන්සේගේ පරමාර්ථයට" ඔබගේ ජීවිතයට ඔබ්බෙන් ලෝකයෙහි ජාතීන් කරා යොමු වී තිබේ. ඔබගේ ජීවිතයෙහි වහල්කමේ වියගහ එතුමා කඩා හෙළනු ලබන්නේ ඒ මගින් ලෝකයෙහි ජාතීන් කෙරෙහි පවතින්නාවනු වියගස කැඩීමේ දර්ශනය ඔබ හට සම්පූර්ණ කිරීමට හැකිවන පිණිස.

**මුළු පොළොව කෙරෙහි අදහස්කර තිබෙන අදහස මේය. සැම ජාතීන් කෙරෙහි දිගුකර තිබෙන හස්තයත් මේය. මක්නිසාද සේනාවල ස්වාමින්වහන්සේ අදහස්කළ සේක. එය අවලංගුකරන්නේ කවුද? උන්වහන්සේගේ අත දිගුකර තිබේ, එය ආපසු හරවන්නේ කවුද? (යෙසායා 14:26-27)**

**වියගහ කැඩීමේ ප්‍රතිඵල**

දෙවියන්වහන්සේ කියනසේක්:

**මා විසින් තෝරාගත් උපවාසය නම් දුෂ්ටකමේ විලංගු මුදාහැරීමත්, වියගහේ බැඳුම් ලිහීමත්, සියලුම වියගස් නුඹලා විසින් කඩාදැමීමත් නොවේද? (යෙසායා 58:6)**

ඉන්පසු වියගහ කැඩීමේ ප්‍රතිඵල එතුමා සඳහන් කළ සේක.

**එවිට නුඹ යාච්ඤාකරන්නෙහිය, ස්වාමින්වහන්සේ උත්තරදෙනසේක. නුඹ මොරගසන කල්හි, මම මෙහියයි උන්වහන්සේ කියනසේක. නුඹ වියගහද ඇඟිල්ල දික්කිරීමද දුෂ්ටලෙස කථා කිරීමද නුඹ වෙතින් පහකරන්නෙහි නම්, බඩගිනි ඇත්තා කෙරෙහි කරුණාව පෙන්වා, අසරණ ප්‍රාණය තෘප්තියට පමුණුවන්නෙහි නම්, අඳුරේදී නුඹේ එළිය නැගී එන්නේය, නුඹේ කළුවරකම ඉරමුදුන් වේලාව මෙන් වන්නේය. ස්වාමින්වහන්සේ නිතරම නුඹට මගපෙන්වා, වියළි තැන්වලදී නුඹේ ප්‍රාණය තෘප්තියට පමුණුවා, නුඹේ ඇටද ශක්තිමත්කරන සේක. නුඹ වතුර ඇති උයනක් මෙන්ද දිය සිඳී නොයන උල්පතක් මෙන්ද වන්නෙහිය. නුඹෙන් පැවතඑන්නෝ පරණ නටබුන් තැන් ගොඩනගන්නෝය, නුඹ බොහෝ පරම්පරාවල අත්තිවාරම් ගොඩනගන්නෙහිය. කැඩුම් හරිගස්සන්නාය, වාසය පිණිස මාවත් අලුත්වැඩියා කරන්නායයි නුඹට කියනු ලැබේ. (යෙසායා 58:9-12)**

වහල්කමේ වියගහ කැඩීමෙහි ප්‍රතිඵල වනුයේ:

- ඔබ දෙවියන්වහන්සේගේ හඬ හඳුනනු ඇත. අපි අඩගසන කල ස්වාමින්වහන්සේ පිළිතුරු දෙනු ඇත. "මම මෙහිය" (9 පදය)
- ඔබ දර්ශනය සම්පූර්ණ කිරීමෙහිදී සාර්ථක වනු ඇත. අඳුරේදී ඔබගේ එළිය නැගී එනු ඇත. එමගින් සාර්ථක බව පෙන්නුම් කරයි. (10 පදය)
- ස්වාමින්වහන්සේ නිරතුරුව ඔබට මග පෙන්වනු ඇත. (11 පදය)
- ඔබ සවිලවත් ජලය සහිත උයනක් මෙන් වනු ඇත. ඔබ ඵල දරන අතර ඔබ නිපදවූ අයද නැවත ආත්මික ලොවෙහි ඵල දරනු ඇත. ඔව්හු නැගී සිට පරණ ගොඩනැගිලි නැවත වතාවක් නිවැරදි අත්තිවාරම් මත ගොඩනගනු ඇත.

දෙවියන්වහන්සේ ස්වභාවික ලෝකයෙහි ඉශ්‍රායෙල්ට පොරොන්දු වූයේ:

**කෙතේ ගස්වල ඵල හටගන්නේය, දේශය ඒකේ අස්වැන්න දෙන්නේය. ඔව්හු උපද්‍රව රහිතව තමුන්ගේ රටෙහි සිටින්නෝය. ඔව්හු මා විසින් ඔවුන්ගේ වියගස් කඩා, ඔවුන් වාල් කරගත් අයගේ අත්වලින් ඔවුන් ගළවාගත්තාම, මා ස්වාමින්වහන්සේ බව ඔවුන් දැනගන්නවා ඇත. (එසකියෙල් 34:27)**

ආත්මික ලෝකයෙහිද මෙය සත්‍යයකි. වියගහ කැඩීම ආත්මික ඵලදායිතාව ගෙන දෙයි.

පරණ දැල (ජාලය) නොසැහේ, ඉරී ගොසිනි, එය හිස්ය. එයට අති මහත් අස්වැන්න දැරිය නොහැක. පරණ වියගස් නැමැති චාරිත්‍ර, නිකායභේද, ස්වයං-ප්‍රයත්න, නොසැලකිලිමත් බව යනාදිය කඩා දැමිය යුතුය. පාපිෂ්ඨ මිනිසා හා ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ අතර පරතරය යා කිරීම සඳහා

අලුත් අත්තිවාරම්, අලුත් වියගස්, අලුත් ජාලයන් අවශ්‍ය වේ. දර්ශනය සම්පූර්ණ කළ හැක්කේ වියගහ කැඩීමට සමත් ආලේපය අත්දකින ලද ස්ත්‍රී පුරුෂයන් මගින් පමණකි.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________________________

______________________________________________

2. වහල්කමේ වියගස් තුන මොනවාද?

______________ ______________ ______________

3. දෙවියන්වහන්සේගේ වියගස විස්තර කරන වචන තුන මොනවාද?

______________ ______________ ______________

4. වහල්කමේ වියගස හා දෙවියන්වහන්සේගේ වියගස අතර පරතරය යා කිරීමට ඔබ ගත යුතු පියවර තුන මොනවාද?

______________________________________________

______________________________________________

______________________________________________

5. යෙසායා 58 හි සඳහන් පරිදි වියගස කැඩීමෙහි ප්‍රතිඵල 5 ක් නම් කරන්න.

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ඔබව දෙවියන්වහන්සේගේ කාර්යය කිරීමෙන් වලක්වා තබන වහල්කමේ වියගස් වලින් කිහිපයක් වන්නේ කුමක්ද?

_______ පාපය
_______ නිකාය
_______ බය
_______ ස්වභාවික දක්ෂතා සහ හැකියාව මදකම
_______ දෝෂාරෝපණය
_______ ස්වයං-උත්සාහය
_______ වෙනයම් කරුණු _______

යෙසායා 14:24-27 කියවන්න.

යෙසායා 10:27 පොරොන්දුව හිමි කරගන්න.

මෙලෙස යාච්ඤා කරන්න.

ස්වාමිනි, මා හද තුළ ජනිත කළාවූ අස්වැන්න පිළිබඳ දර්ශනයට ස්තුතියි.

මාගේ ජීවිතයෙහි සියලු ආකාර වහල්කමේ වියගස් කඩා දමන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමි. යේසුස්වහන්සේගේ නාමයෙන් මා තුළ ඇති _______, _______, _______, සහ _______ (ඔබගේ ජීවිතයෙහි ඇති වියගස් නම් කරන්න) වියගස් කඩා දමන්න.

මාව යේසුස්වහන්සේ සමඟ එකට වියගසේ බඳින්න. මා තුළ අලුත් ජාලයක් බිහිකොට එමගින් මහත් අස්වැන්නක් ගෙන දෙන්න.

මාගේ සියලුම ආකාර වහල්බැම් සහිත වියගස් කඩා දැමූ ආලේපය ගැන මම ඔබවහන්සේට ස්තුති කරමි.

යේසුස්වහන්සේගේ නාමයෙනි,

ආමෙන්.

**හතරවන කොටස: බලාපොරොත්තුවීම**

**ඔබ දර්ශනයෙහි කොටසක් වේ**

# නමවන පරිච්ඡේදය

## වියගහ කඩා දැමීම

**අරමුණ:**

මෙම ඡේදය අවසානයෙහි ඔබ හට කළ හැකි වන කරුණු:

- වහල්කමේ තුන්-ආකාර වියගහ හඳුනාගැනීමට
- දෙවියන්වහන්සේගේ තුන්-ආකාර වියගහ විස්තර කිරීමට
- වහල්කමේ වියගහ සහ දෙවියන්වහන්සේගේ වියගහ අතර ඇති පරතරය යා කරන පාලමෙහි පියවර නම් කිරීමට
- වහල්කමේ වියගහ බිඳීමෙහි ආත්මික ප්‍රතිඵල හඳුනාගැනීමට

**ප්‍රධාන පදය:**

> **වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි. මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

**හැඳින්වීම**

මෙම පාඩමාලාවෙහිදී මෙතෙක් අධ්‍යයනය කොට ඇති අංග නම්:

> මනඃකල්පනය/සිතින් මවා ගැනීම: දර්ශනය හඳුනාගැනීම.
> සංකල්ප බිහිකිරීම : දර්ශනය පසුපස ඇති පරමාර්ථයෙහි සංකල්පය අවබෝධ කැගරනීම.
> අරමුණු ඉටුකරගැනීම : දර්ශනය සම්පූර්ණකිරීම සඳහා අරමුණු

පාඩමාලාවේ අවසාන කොටස වන බලාපොරොත්තුව නම් මෙම කොටසෙහිදී ඔබ දර්ශනය සම්පූර්ණ කිරීමේ කොටසක් බවට පත්වෙනු ඇත.

දෙවියන්වහන්සේගේ ආශාව නම් ඔබ අපේක්ෂිත අවසානයකට රැගෙන ඒමය.

> **මා විසින් නුඹලා ගැන කරන යෝජනා මමම දනිමි. නුඹලාට මතු කාලයේදී බලාපොරොත්තුවක් දීමට ඒවා විපත්තියේ නොව සමාදානයේ යෝජනායයි ස්වාමින්වහන්සේ කියනසේක. (යෙරමියා 29:11)**

එම අපේක්ෂිත අවසානය නම් දර්ශනය සම්පූර්ණ කිරීමය. එනම් දෙවියන්වහන්සේගේ වැඩය අවසන් කිරීමය.

> **යේසුස්වහන්සේද: මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්තකොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. (යොහන් 4:34)**

ඔබ කිසියම් අලුත් දෙයකට අතුළු වන සෑම විටම කිසියම් පැරණි දෙයක් අත්හැරීමට සිදුවේ. උපත සඳහා ගර්භාෂයෙහි සුරක්ෂිතභාවය අත්හැරිය යුතු වේ.

දෙවියන්වහන්සේ ඔබහට ඇදහිල්ලෙන් නව පියවරක් ගැනීමට ඉල්ලා සිටින සේක.

**පළමු කාරණ සිහි නොකරල්ලා, පුරාණ දේවල්ද කල්පනා නොකරල්ලා. බලව මම අමුත-දෙයක් කරන්නෙමි දැන් ඒක හටගන්නවා ඇත . නුඹලා ඒක නොදන්නහුද,මම කාන්තාරයේ පවා මාර්ගයක්ද වනයේහි ගංගාද සාදන්නෙමි.** (යෙසායා 43 :18,19)

දෙවියන්වහන්සේගේ බලය අද දවසට නොවන බව විශ්වාසකරන දේව ධර්මයකින් ඔබ බැඳී සිටියා විය හැක. ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත කිරීම දේව සේවකයන්ගේ හා ධර්මදූත සේවකයන්ගේ වගකීම යැයි ඔබ සිතා සිටියා විය හැක. ඔබ සමහරවිට නිකායක හෝ චාරිත්‍ර චාරිත්‍ර වලට බැඳී අස්වැන්න නෙලීම සඳහා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙහි අනෙක් කොටස් සමඟ අත් වැල් බැඳ ගැනීමට නොහැකි වූවෙකු විය හැකිය.

නුමුත් දෙවියන්වහන්සේ ඔබහට නව දර්ශනයක් දී ඇත. පරමාර්ථයෙහි එකමුතුකමින් එකට බැඳී සිටින්නාවූ ආත්මික ශ්‍රම බලකායකින් යුත් නව ජාලයක ඔබත් කොටස්කරුවෙකු වෙමින් සිටී.

**නව ජාලයක්**

බයිබලයෙහි, ස්වභාවික ලෝකයෙහි දැලක් ^ජාලයක් &භාවිත කළ අවස්ථාවන් දෙකක් වාර්තා වේ. එමගින් අගනා ආත්මික සත්‍යයක් විදහා දක්වයි.

පළමුවන සිදුවීම ක්‍රිස්තුස්වහන්සේගේ භෞමික සේවයෙහි මුල් යුගයේ සිදුවූ අතර එය ලූක් 5 හි වාර්තාකර තිබේ. ගෝලයෝ මුළු රාත්‍රියෙහිම මසුන් ඇල්ලීමට වෙහෙස වුවද කිසිවක් අල්ලාගෙන නොතිබුණාහ. යේසුස්වහන්සේ ඔවුන්ට පැවසුයේ:

**උන්වහන්සේ කථාකොට නිමවූ කල ගැඹුරට ගොස් මසුන් අල්ලන්ට දැල් හෙළාපල්ලායයි සීමොන්ට කීසේක.** (ලූක් 5:4)

ජේතෲස් කතාකොට:

**සීමොන් උත්තරදෙමින්: ස්වාමිනි, අපි මුළු රාත්‍රියෙහිම වෙහෙසවීමුව, නුමුත් මොකවත් ඇල්ලුවේ නැත. එහෙත් ඔබගේ වචනය නිසා දැල් හෙළමියි කීවේය.** (ලූක් 5:5)

ඔව්හු දැළ හෙළු කල මසුන් මහත් රාශියක් හසුවූ බැවින් දැළ ඉරෙන්නට පටන් ගත් බැවින් අහල පහල සිටි අනෙක් සහෝදර මාළු අල්ලන්ගේ සහාය පැතීමට සිදුවිය. ඇල්ලූ මසුන් ඉතා රාශියක් බැවින් බෝට්ටු දෙකම පුරවා බෝට්ටු ගිලෙන තරම් විය. මේ දුටු ජේතෲස් මවිත විය. නුමුත් යේසුස්වහන්සේ ඔහුට පැවසුවේ:

**යේසුස්වහන්සේ: භයනොවන්න, මෙතැන් පටන් නුඹ මනුෂ්‍යයන් අල්ලනවා ඇතැයි සීමොන්ට කීසේක.** (ලූක් 5:10)

ජේතෲස් ස්වභාවික ලොවෙහි අත්දුටු මෙම මසුන් ඇල්ලීම ඔහු ආත්මික ලොවෙහි මිනිසුන් අල්ලන්නෙක් වූ පසු නෙලාගැනීමට යන මහත් අස්වැන්න හා කිසිසේත්ම සංසන්දනය කළ නොහැකි විය.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සේවයෙහි අවසාන භාගයේදීද එවැනිව සිදුවීමක් පිළිබඳව යොහන් 21 හි වාර්තා වේ. ගෝලයෝ මුළු රාත්‍රියෙහිම වෙහෙස වූ නමුත් කිසිවක් අල්ලාගත නොහැකි විය. ක්‍රිස්තුස්වහන්සේගේ අණට අනුව ඔව්හු දැල හෙලූ කල නැවත වතාවක් දැල මසුන්ගෙන් පිරී ගියේය. නුමුත් මේ වර වෙනසක් සිදු විය. දැල ඉරුනේ නැත.

**එබැවින් සීමොන් ජේතෲස් ඔරුවට නැගී, ලොකු මසුන් එකසිය පණස් තුන් දෙනෙකුගෙන් පිරුණු දැල ගොඩට ඇද්දේය. එපමණ තිබුණු නුමුත් දැල ඉරුණේ නැත.** (යොහන් 21:11)

මෙම සිදුවීම් දෙක ඇත්තවශයෙන්ම ස්වභාවික ලෝකයෙහි සිදුවිය. නුමුත් ඒවා මහත් ආත්මික සත්‍යයන්හි සමාන්තර කරුණු විය. පළමුවර දැල ඉරී ගිය නමුත් දෙවන වර එසේ නොවිය. වෙනසට හේතුව කුමක්විද?

පළමු දැල මනුෂ්‍යයන්ගේ උත්සාහයේ උදාහරණයකි. පේතෘස් වෘත්තියෙන්ම මසුන් අල්ලන්නෙකි. ඔහු මසුන් අල්ලන්නන්ගේ ස්වභාවික ක්‍රමවේදය හා චාරිත්‍ර වාරිත්‍ර දැන සිටියේය. ඉරී ගිය දැල තුළින් යේසුස්වහන්සේ ඔහුට පෙන්වා දුන්නේ මනුෂ්‍යයාගේ උත්සාහයෙන් දෙවියන්වහන්සේගේ දර්ශනය හෝ ක්‍රියාව සම්පූර්ණ කළ නොහැකි බවය.

දෙවියන්වහන්සේ පේතෘස්ව කැඳවන්නාවූ ශ්‍රේෂ්ඨ කාර්යය ඔහු හඳුනාගත් කල ඔහු මොරදුන්නේ:

> **සීමොන් පේතෘස් ඒ දැක, යේසුස්වහන්සේගේ දණ ළඟ වැටී: ස්වාමිනි, මා වෙතින් ගිය මැනව: මම පව්කාර මනුෂ්‍යයෙකැයි කීවේය. (ලූක් 5:8)** කියාය.

පේතෘස් මනුෂ්‍යයන් අල්ලන්නෙක් බවට පත්වෙනු ඇත. ඔහුගේ පැරණි දැල (ජාලය) මහත් ආත්මික අස්වැන්න දැරීමට තරම් නොසෑහෙනු ඇත. පේතෘස්හට මනුෂ්‍යයාගේ පැරණි ගතානුගතික සිරිත් විරිත් අත්හැර දැමීමට සිදුවේවි. ඔහු යුදෙව්වන් හා අන්‍යජාතීන් වෙන්කරන සීමාව පැනිය යුතුය. පැරණි ජාලයෙන් (දැල) කැඩී ගොස් ඔහු අලුත් ජාලයක කොටසක් බවට පත්විය යුතුය.

යේසුස්වහන්සේ පැමිණියේ පැරණි දෙය විනාශ කිරීමට නොව, අලුත් දෙයක් තුළින් එය සම්පූර්ණ කිරීමටය. උන්වහන්සේගේ ව්‍යවස්ථාව විනාශ නොකොට එයට නව අරුතක් එකතු කළ සේක. එතුමා පාපය උදෙසා ලේ වැගිරීමේ පූජාව අවලංගු කළේ නැත. ඒ වෙනුවට පාපයට කමාව පිණිස තම රුධිරය වැගිරවීමෙන් පාප පූජාව සම්පූර්ණ කළ සේක.

අලුත් මුද්‍රිකපානය, පැරණි සම් භාජනවල දැමීම පිළිබඳව යේසුස්වහන්සේ අනතුරු ඇඟවූ සේක. පැරණි සම් භාජනයට අලුත් මිදියුෂය දැරීමට නොහැකි වනු ඇත. එය පැරණි දැලට මසුන් රාශියට දැරීමට නොහැකි වුවාක් මෙන්ය. මහා නියෝගයෙහි අභියෝගය ජයගත හැක්කේ ආත්මික ලොවෙහි අලුත් දැලක් භාවිතයෙන් පමණකි.

පළමුවර හා දෙවනවර මසුන් ඇල්ලීමේ සිද්ධීන් දෙක අතරතුර අලුත් ජාලයක් බිහිවී තිබුණි. මෙම ස්වභාවික මසුන් ඇල්ලීමේ සිදුවීම් දෙක ආත්මික ලොවෙහි සිදුවී තිබූ මහත් ක්‍රියාවක සමාන්තරය දැක්වීය.

මෙම නව ආත්මික ජාලයට යේසුස්වහන්සේ දුන්නාවූ දර්ශනය දැරිය හැකිය. නුමුත් කෙනෙකු එයට ඇතුල්වීමට නම් පැරණි දෙයින් ජීවත් වී අලුත් දෙයට පා තැබිය යුතු වේ. පැරණි වියගහ කැඩිය යුතු වේ. අලුත් දැලට දරාගැනීමට ඉඩ දී පැරණි දැළ විනාශවිය යුතුය.

## වියගහ

පුරාණ කාලයෙහි මුළු ලෝකයෙහිම කුඹුරු වල සතුන් එකට වැඩෙහි යෙදවීම පිණිස වියගහ සුලබ ලෙස භාවිත විය. අද දින පවා ලෝකයෙහි බෝහෝ ජාතීන් වියගහ භාවිත කරති.

යේසුස්වහන්සේ වියගහ පිළිබඳ මෙලෙස කතා කළ සේක.

> **වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි. මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

උන්වහන්සේ දී ඇති දර්ශනය නම් අස්වැන්නේ කෙතය. අද දින එම කෙත බිලියන තුනක් තවම ශුභාරංචිය අසා නැති ජනතාවකගෙන් නියෝජනය වේ... උන්වහන්සේ අපට කියා සිටින්නේ එම අභියෝගය "පහසු" හා "සැහැල්ලු" බවක්ය. ?

උන්වහන්සේ සැබවින්ම පවසන දෙය එය වේ. නමුත් පැරණි වියගහට, පැරණි දැලට මෙම දර්ශනය දැරිය නොහැක. ඔබට ද එය තනිවම සම්පූර්ණ කළ නොහැක. ඔබට එය මනුෂ්‍ය උත්සාහයෙන් කළ නොහැක. ඔබ නව ජාලයෙහි කොටසක් බවට පත් වී උන්වහන්සේ සමඟ වියගහට ඇඳිය යුතුය.

## වහල්කමේ වියගහ

අපි සියලු දෙනාම කිසියම් මාදිලියක වියගහක බැඳී සිටිමු. එක්කෝ ඔබ වහල්කමේ වියගහෙහි බැඳී සිටී නැත්නම් දෙවියන්වහන්සේගේ වියගහෙහි බැඳී සිටී.

වහල්කමේ වියගහ තුන් ආකාරයකි. ඔබ පාපයට, මමත්වයට හෝ මනුෂ්‍යයාට වහල් බැම්මෙන් බැඳී සිටිය හැකිය.

**පාපයෙහි වියගහ:**

> **මම වනාහි නුඹලා මිසරවරුන්ගේ වහලුන්ව නොසිටින පිණිස මිසර දේශයෙන් නුඹලා පිටතට ගෙනාවාවූ නුඹලාගේ දෙවිවූ ස්වාමින්වහන්සේය: මම නුඹලාගේ වියගහේ බැඳුම් බිඳ නුඹලාට කෙලින්ව යන්ට සැලැස්විමි. (ලෙවී කථාව 26:13)**

මිසරයේ වියගහ යනු පාපයේ වියගහය. ඔබ යේසුස්වහන්සේ සමඟ එක වියගහකට ඇඳීමට නම්, ඔබගේ ජීවිතයෙහි පාපයේ වියගහ බිඳිනු ලබන්නට අවශ්‍යය.

**මමත්වයෙහි වියගහ:**

වහල්කමේ වියගහ තමාටම වහල්වී සිටීමක් විය හැක.

> **මක්නිසාද, මා කරන දේ මම නොදනිමි. මා කරන්නේ මා කැමති දේ නොව මා ද්වේෂකරන ද්‍ය. (රෝම 7:15)**

ආත්මාර්ථකාමීබව හා අහංකාරය මමත්වයෙහි වියගහෙහි උදාහරණ වේ.

**මනුෂ්‍යයාගේ වියගහ:**

මනුෂ්‍ය වියගහ නම් අනෙකුත් අය ඔබ වෙත දමා ඇති බැඳීමය.

> **එසේය, ඔව්හු උසුලන්ට අමාරු මහත් බර බැඳ මනුෂ්‍යයන්ගේ කරේ තබති. නුමුත් තමුන්ගේ ඇඟිල්ලවත් ඒවාට තබන්ට කැමති නොවෙති. (මතෙව් 23:4)**

මනුෂ්‍යය වියගහ දෝෂාරෝපණය, චාරිත්‍ර, නිකාය හෝ පැවැත්විය නොහැකි තරමේ අපහසු හැසිරීම් රටාවන් අනෙක් අය විසින් ඔබ මත පැටවීමය.

වහල්කමේ තුන්-ප්‍රකාර වියගහ වන පාපය, මමත්වය හා මිනිසා සංකේතවත් කරනුයේ බලෙන් පැවරූ බරපතල වැඩ, දැරීමට අපහසු බර හා නොසන්සුන් බවය.

## දෙවියන්වහන්සේගේ තුන්-ප්‍රකාර වියගහ

දෙවියන්වහන්සේගේ වියගහ බලෙන් පැවරූ වැඩ වෙනුවට සාමුහික වැඩය පිළිබඳ පවසයි. එහි බර වෙනුවට සැහැල්ලුව පවසයි. එය අවිවේකී නොසන්සුන් බව වෙනුවට විවේකී සන්සුන් බව පවසයි.

දෙවියන්වහන්සේගේ තුන්-ප්‍රකාර වියගහ පහසුය, සැහැල්ලුය විවේකිය

> **වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි. මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද, මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)**

## පරතරය යා කිරීමට පියවර තුන

වහල්කමේ වියගහේ සිට දෙවියන්වහන්සේගේ වියගහ වෙතට ළඟාවීමට පරතරය යා කිරීමට යේසුස්වහන්සේ පියවර තුනක් සපයා දුන් සේක. පැරණි ක්‍රමයෙන් ඉවත් වී අලුත් දෙයට ඇතුළු වීමට මාර්ගය මෙයයි. එනම්:

**එන්න:** ඔබ කැමැත්තෙන්ම එතුමා වෙතට පැමිණිය යුතුය. එය පාපයේ වියගහ බිඳ දමයි.

**ගන්න:** ඔබ එතුමාගේ වියගහ ගත යුතුය. එසේ කිරීමෙන් මිනිස් වියගහ විනාශ වී යයි.

**ඉගෙනගන්න:** උන්වහන්සේගෙන් ඉගෙන ගැනීමෙන් ඔබ මමත්වයෙහි වියගහ බිඳ හෙළයි.

දෙවියන්වහන්සේගේ වියගහ උන්වහන්සේ කියා දෙනවා පමණක් නොව ඔබ සමඟ හවුලේ බෙදාගනී.

## වියගහ කැඩීම

දෙවියන්වහන්සේගේ ආශාව නම් ඔබගේ ජීවිතයෙහි පාපය, මමත්වය හා මිනිසා යන සෑම වියගහක්ම විනාශ කොට දැමීමය. ඔබට දර්ශනය සම්පූර්ණ කිරවීමට අවශ්‍ය නම් මෙම විනාශ කිරීම අත්‍යවශ්‍ය වේ.

පැරණි ගිවිසුම් වාර්තාවලට අනුව ඉශ්‍රායෙල් ජනතාව විරුද්ධවාදී අසරියානු හමුදාව මගින් වට කරනු ලැබ සිටියහ. දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්ට කතාකොට ප්‍රකාශ කළේ.

> **සේනාවල ස්වාමින්වහන්සේ දිවුරා කථාකොට: මා යෝජනාකළ ලෙසම සිදුවන්නේය, මා අදහස්කළ ලෙසම ස්ථිරවන්නේය. එනම්, මම අෂූරියයා මාගේ දේශයේදී සුන්කොට මාගේ කඳු පිට ඔහු පාගාදමන්නෙමි. එවිට ඔහුගේ වියගහ ඔවුන් කෙරෙන් පහවන්නේය. ඔහුගේ බරද ඔවුන්ගේ කරෙන් පහවන්නේයයි කීසේක. (යෙසායා 14:24-25)**

දෙවියන්වහන්සේට ඉශ්‍රායෙල් කෙරෙන් වියගහ බිඳ දැමීමට අවශ්‍ය විය. එනමුත් උන්වහන්සේගේ පරමාර්ථය ඉශ්‍රායෙලයෙන් ඔබ්බට, ලෝකයෙහි ජාතීන් වෙතට යොමු වී පැවතුණි.

> **මුළු පොළොව කෙරෙහි අදහස්කර තිබෙන අදහස මේය. සෑම ජාතීන් කෙරෙහි දිගුකර තිබෙන හස්තයත් මේය. (යෙසායා 14:26)**

දෙවියන්වහන්සේගේ පරමාර්ථය කුමක්වීද? එතුමාගේ පරමාර්ථය වූයේ ලෝකයෙහි ජාතීන් කෙරෙන් වහල්කමේ වියගහ බිඳ දැමීමය.

මින් පරිච්ඡේද කිහිපයකට පසුව මෙසේ වාර්තා වේ.

> **ඒ රාත්‍රියේදී ස්වාමින්වහන්සේගේ දූතයා පිටත්ව ගොස් අෂූර්වරුන්ගේ කඳවුරෙහි එක් ලක්ෂ අසූපන්දහස් දෙනෙකුට පහරදුන්නේය. මිනිසුන් අලුයම නැගිටුණු විට, බලව, ඒ සියල්ලෝ මළකඳන් වූය. (යෙසායා 37:36)**

ඔබගේ ජීවිතයෙහි ඇති සෑම වියගහක්ම මිය ගිය මළමිණී බවට පත් වීමට දෙවියන්වහන්සේ අපේක්ෂා කරන සේක. එතුමා සමඟ එක වියගහ යටතට ඔබව ගෙන ඒමට මේ සියල්ල විනාශ කර දැමීමට එතුමාට අවශ්‍යය.

## එය කැඩිය හැක්කේ කෙලෙසද?

> **තවද ඒ දවසේදී ඔහුගේ බර නුඹේ කරෙන්ද ඔහුගේ වියගහ නුඹේ බෙල්ලෙන්ද පහවන්නේය, නුඹේ තරකම නිසා වියගහද කැඩෙන්නේයයි කියන සේක. (යෙසායා 10:27)**

- එය ගැඹුරු ඉගැන්වීම් මගින් විනාශ කළ නොහැක. එය අධ්‍යාපනයට මගින් හෝ මනෝවිද්‍යාව මගින් විනාශ කළ නොහැක.
- එය උපදේශනය මගින් හෝ සංවිධාන මගින් හෝ නිකායන් මගින් විනාශ කළ නොහැක.

- එය විනාශ කළ හැක්කේ දෙවියන්වහන්සේගේ බලය වන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේපය මගිනි.

වියගහ කැඩීමේ දෙවියන්වහන්සේගේ පරමාර්ථයට" ඔබගේ ජීවිතයට ඔබ්බෙන් ලෝකයෙහි ජාතීන් කරා යොමු වී තිබේ. ඔබගේ ජීවිතයෙහි වහල්කමේ වියගහ එතුමා කඩා හෙළනු ලබන්නේ ඒ මගින් ලෝකයෙහි ජාතීන් කෙරෙහි පවතින්නාවනු වියගස කැඩීමේ දර්ශනය ඔබ හට සම්පූර්ණ කිරීමට හැකිවන පිණිස.

> **මුළු පොළොව කෙරෙහි අදහස්කර තිබෙන අදහස මේය. සැම ජාතීන් කෙරෙහි දිගුකර තිබෙන හස්තයත් මේය. මක්නිසාද සේනාවල ස්වාමින්වහන්සේ අදහස්කළ සේක. එය අවලංගුකරන්නේ කවුද? උන්වහන්සේගේ අත දිගුකර තිබේ, එය ආපසු හරවන්නේ කවුද? (යෙසායා 14:26-27)**

## වියගහ කැඩීමේ ප්‍රතිඵල

දෙවියන්වහන්සේ කියනසේක්:

> **මා විසින් තෝරාගත් උපවාසය නම් දුෂ්ටකමේ විලංගු මුදාහැරීමත්, වියගහේ බැඳුම් ලිහීමත්, සියලුම වියගස් නුඹලා විසින් කඩාදැමීමත් නොවේද? (යෙසායා 58:6)**

ඉන්පසු වියගහ කැඩීමේ ප්‍රතිඵල එතුමා සඳහන් කළ සේක.

> **එවිට නුඹ යාච්ඤාකරන්නෙහිය, ස්වාමින්වහන්සේ උත්තරදෙනසේක. නුඹ මොරගසන කල්හි, මම මෙහියයි උන්වහන්සේ කියනසේක. නුඹ වියගහද ඇඟිල්ල දික්කිරීමද දුෂ්ටලෙස කථා කිරීමද නුඹ වෙතින් පහකරන්නෙහි නම්, බඩගිනි ඇත්තා කෙරෙහි කරුණාව පෙන්වා, අසරණ ප්‍රාණය තෘප්තියට පමුණුවන්නෙහි නම්, අඳුරේදී නුඹේ එළිය නැගී එන්නේය, නුඹේ කළුවරකම ඉරමුදුන් වේලාව මෙන් වන්නේය. ස්වාමින්වහන්සේ නිතරම නුඹට මගපෙන්වා, වියළි තැන්වලදී නුඹේ ප්‍රාණය තෘප්තියට පමුණුවා, නුඹේ ඇටද ශක්තිමත්කරන සේක. නුඹ වතුර ඇති උයනක් මෙන්ද දිය සිඳී නොයන උල්පතක් මෙන්ද වන්නෙහිය. නුඹෙන් පැවතඑන්නෝ පරණ නටබුන් තැන් ගොඩනගන්නෝය, නුඹ බොහෝ පරම්පරාවල අත්තිවාරම් ගොඩනගන්නෙහිය. කැඩුම් හරිගස්සන්නාය, වාසය පිණිස මාවත් අලුත්වැඩියා කරන්නායයි නුඹට කියනු ලැබේ. (යෙසායා 58:9-12)**

වහල්කමේ වියගහ කැඩීමෙහි ප්‍රතිඵල වනුයේ:

- ඔබ දෙවියන්වහන්සේගේ හඬ හඳුනනු ඇත. අපි අඬගසන කල ස්වාමින්වහන්සේ පිළිතුරු දෙනු ඇත. "මම මෙහිය" (9 පදය)
- ඔබ දර්ශනය සම්පූර්ණ කිරීමෙහිදී සාර්ථක වනු ඇත. අඳුරේදී ඔබගේ එළිය නැගී එනු ඇත. එමගින් සාර්ථක බව පෙන්නුම් කරයි. (10 පදය)
- ස්වාමින්වහන්සේ නිරතුරුව ඔබට මග පෙන්වනු ඇත. (11 පදය)
- ඔබ සවිලවත් ජලය සහිත උයනක් මෙන් වනු ඇත. ඔබ ඵල දරන අතර ඔබ නිපදවූ අයද නැවත ආත්මික ලොවෙහි ඵල දරනු ඇත. ඔව්හු නැගී සිට පරණ ගොඩනැගිලි නැවත වතාවක් නිවැරදි අත්තිවාරම් මත ගොඩනගනු ඇත.

දෙවියන්වහන්සේ ස්වභාවික ලෝකයෙහි ඉශ්‍රායෙල්ට පොරොන්දු වූයේ:

> **කෙතේ ගස්වල ඵල හටගන්නේය, දේශය ඒකේ අස්වැන්න දෙන්නේය. ඔව්හු උපද්‍රව රහිතව තමුන්ගේ රටෙහි සිටින්නෝය. ඔව්හු මා විසින් ඔවුන්ගේ වියගස් කඩා, ඔවුන් වාල් කරගත් අයගේ අත්වලින් ඔවුන් ගළවාගත්තාම, මා ස්වාමින්වහන්සේ බව ඔවුන් දැනගන්නවා ඇත. (එසකියෙල් 34:27)**

ආත්මික ලෝකයෙහිද මෙය සත්‍යයකි. වියගහ කැඩීම ආත්මික ඵලදායිතාව ගෙන දෙයි.

පරණ දැල (ජාලය) නොසැහේ, ඉරී ගොසිනි, එය හිස්ය. එයට අති මහත් අස්වැන්න දැරිය නොහැක. පරණ වියගස් නැමැති චාරිත්‍ර, නිකායභේද, ස්වයං-ප්‍රයත්න, නොසැලකිලිමත් බව යනාදිය කඩා දැමිය යුතුය. පාපිෂ්ඨ මිනිසා හා ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ අතර පරතරය යා කිරීම සඳහා

අලුත් අත්තිවාරම්, අලුත් වියගස්, අලුත් ජාලයන් අවශ්‍ය වේ. දර්ශනය සම්පූර්ණ කළ හැක්කේ වියගහ කැඩීමට සමත් ආලේපය අත්දකින ලද ස්ත්‍රී පුරුෂයන් මගින් පමණකි.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමින් ලියන්න.

______________________________

______________________________

2. වහල්කමේ වියගස් තුන මොනවාද?

__________ __________ __________

3. දෙවියන්වහන්සේගේ වියගස විස්තර කරන වචන තුන මොනවාද?

__________ __________ __________

4. වහල්කමේ වියගස හා දෙවියන්වහන්සේගේ වියගස අතර පරතරය යා කිරීමට ඔබ ගත යුතු පියවර තුන මොනවාද?

______________________________

______________________________

______________________________

5. යෙසායා 58 හි සඳහන් පරිදි වියගස කැඩීමෙහි ප්‍රතිඵල 5 ක් නම් කරන්න.

______________________________

______________________________

______________________________

______________________________

______________________________

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

## තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

ඔබව දෙවියන්වහන්සේගේ කාර්යය කිරීමෙන් වලක්වා තබන වහල්කමේ වියගස් වලින් කිහිපයක් වන්නේ කුමක්ද?

_______ පාපය
_______ නිකාය
_______ බය
_______ ස්වභාවික දක්ෂතා සහ හැකියාව මදකම
_______ දෝෂාරෝපණය
_______ ස්වයං-උත්සාහය
_______ වෙනයම් කරුණු _______

යෙසායා 14:24-27 කියවන්න.

යෙසායා 10:27 පොරොන්දුව හිමි කරගන්න.

මෙලෙස යාච්ඤා කරන්න.

ස්වාමිනි, මා හද තුළ ජනිත කළාවූ අස්වැන්න පිළිබඳ දර්ශනයට ස්තුතියි.

මාගේ ජීවිතයෙහි සියලු ආකාර වහල්කමේ වියගස් කඩා දමන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමි. යේසුස්වහන්සේගේ නාමයෙන් මා තුළ ඇති _______, _______, _______, සහ _______ (ඔබගේ ජීවිතයෙහි ඇති වියගස් නම් කරන්න) වියගස් කඩා දමන්න.

මාව යේසුස්වහන්සේ සමඟ එකට වියගසේ බඳින්න. මා තුළ අලුත් ජාලයක් බිහිකොට එමගින් මහත් අස්වැන්නක් ගෙන දෙන්න.

මාගේ සියලුම ආකාර වහල්බැමි සහිත වියගස් කඩා දැමූ ආලේපය ගැන මම ඔබවහන්සේට ස්තුති කරමි.

යේසුස්වහන්සේගේ නාමයෙනි,

ආමෙන්.

# දහවන පරිච්ඡේදය

## ජාතින්ට ආශිර්වාද කිරීම

**අරමුණු:**

මෙම ජේදය අවසානයෙහිදී ඔබහට කළ හැකි වන දේ:

- ආබ්‍රහම් හට ජාතින්ට ආශිර්වාද කිරීමට හැකිවූ ඔහු සතුවූ ආත්මික ගුණාංග හඳුනාගැනීමට
- ඔබ ආබ්‍රහම්ගේ පොරොන්දුවේ උරුමක්කාරයෙක් බව වටහාගැනීම.
- උරුමක්කාරයෙක් ලෙසට ලෝකයෙහි ජාතින්හට ආශිර්වාද කිරීමට ඔබට ඇති වගකීම අවබෝධ කරගැනීමට

**ප්‍රධාන පදය**

> **ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ නම්, නුඹලා ආබ්‍රහම්ගේ වංශය ද පොරොන්දුව ලෙස උරුමක්කාරයෝද වන්නහුය. (ගලාති 3:29)**

### හැඳින්වීම

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ව බොහෝ ජාතින්ට පියෙකු වීමට තෝරාගත් සේක. ඔහු තුළින් මිහිපිට සියලු ජාතින් ආශිර්වාද ලබනු ඇත.

> **මාගේ ශබ්දයට නුඹ කීකරු වූ නිසා නුඹේ වංශය කරණකොටගෙන පොළොවේ සියලු ජාතිහු ආශිර්වාද ලබන්නෝය කියා මා ගැනම දිවුළෙමියි ස්වාමින්වහන්සේ කියනසේකැයි කීයේය. (උත්පත්ති 22:18)**

ඇදහිලිවන්තයෝ දෙවියන්වහන්සේ ආබ්‍රහම් හට දුන් සියලු පොරොන්දු වල උරුමක්කාරයෝ බව නව ගිවිසුම හෙළිකර දෙයි. "උරුමක්කාරයෙක්" යනු ඔබට ඔහුගෙන් යමක් උරුම වී ඇති බවය.

> **එබැවින් ඇදහිල්ලෙහි පිහිටෙන්නෝම ආබ්‍රහම්ගේ පුත්‍රයන් බව දැනගනිල්ලා, තවද දෙවියන්වහන්සේගේ ඇදහිල්ල කරණකොටගෙන අන්‍යජාතීන් ධර්මිෂ්ඨකරන බව ලියවිල්ල කල්මත්තෙන් දැක නුඹ තුළ සියලු ජාතිහු ආශිර්වාද ලබන්නෝය කියා ශුභාරංචිය ආබ්‍රහම්ට කලින් ප්‍රකාශ කළේය. මෙසේ ඇදහිල්ලේ පිහිටෙන්නෝ ඇදහිලිවන්තවූ ආබ්‍රහම් සමඟ ආශිර්වාද ලබති. (ගලාති 3:7-9)**

ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ආබ්‍රහම්ගේ බීජය බවට පත් වී ඇති බැවින් ඔබ උරුමක්කාරයෙක් වී සිටී:

> **ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ නම්, නුඹලා ආබ්‍රහම්ගේ වංශය ද පොරොන්දුව ලෙස උරුමක්කාරයෝද වන්නහුය. (ගලාති 3:29)**

ඔබ ආබ්‍රහම්ගේ බීජය ලෙසට ගැළවීමේ පොරොන්දුවට උරුමක්කාරයෙකි. නමුත් උරුමක්කාරයෙකු ලෙසට ශුභාරංචියේ පණිවුඩය මගින් ලෝකයේ ජාතින්ට ආශිර්වාද කිරීමේ වගකීමද ඔබට පැවරී තිබේ.

ඔබගේ උරුමය ඉල්ලා සිටින ලෙස ඔබට පවසා තිබේ.

> **මාගෙන් ඉල්ලව, එවිට නුඹේ උරුමයට ජාතීන්ද නුඹේ කොටසට පොළොවේ සීමාන්තය දක්වාද දෙන්නෙමි. (ගීතාවලිය 2:8)**

ආබ්‍රහම් කරණකොටගෙන ලෝකයෙහි ජාතිහු ආශිර්වාද ලැබූහ. යේසුස්වහන්සේ කරණකොටගෙන ජාතීන් ඔබගේ ද උරුමය වේ.

### ආත්මික ගුණාංග

ආබ්‍රහම් හට ජාතීන්ට ආශිර්වාදයක් වීමට හැකි වූ ඔහු තුළ පැවති ආත්මික ගුණාංග සහ එම ගුණාංග අස්වැන්නේ දර්ශනයට සම්බන්ධ වූ ආකාරය පහතින් දැක් වේ.

**ඔහු සම්පූර්ණයෙන්ම විශ්වාස කළේය.**

ආබ්‍රහම්, දෙවියන්වහන්සේ ඔහුට පෙන්වූ දර්ශනය විශ්වාස කළේය. ඔහු තුළින් දෙවියන්වහන්සේ ලෝකයෙහි ජාතීන්ට ආශිර්වාද කරන බව සම්පූර්ණයෙන්ම විශ්වාස කළේය.

> **පොරොන්දු වූ දේ ඉෂ්ටකරන්ට උන්වහන්සේට පුළුවන කියා නිසැකව විශ්වාසකළේය. (රෝම 4:21)**

අස්වැන්නේ දර්ශනය සත්‍යයක් වීමට නම්, ඔබ සම්පූර්ණයෙන්ම නිසැක ලෙස විශ්වාස කළ යුතු වේ. දෙවියන්වහන්සේ මහත් අස්වැන්නක් පොරොන්දු වී තිබේ. උන්වහන්සේ ක්‍රමවේද හා උපක්‍රම සපයා දී තිබේ. ඔබ ලෝකයේ ජාතීන්ට ආශිර්වාදයක් වීම සඳහා ග්‍රාම බලකායට කැඳවනු ලැබ සිටී.

**ඔහු ආත්මික කාරණාවල ආයෝජනය කළේය**

ආබ්‍රහම්, ස්වභාවික ලොවෙහි පෙනෙන්නට නොතිබූ දෙයක් උදෙසා තම මුළු ජිවිතයම ආයෝජනය කළේය.

දෙවියන්වහන්සේ ආබ්‍රහම් හට අලංකාර දේශයක් පිළිබඳ පොරොන්දුව දී තිබූ නමුත් ඔහුට එම දේශයෙහි පා තැබීමට නොහැකි විය.

> **එහි එක පියවරක් තබන්ට පමණවත් ඔහුට උරුමයක් නොදී ඔහු දරුවෙකු නොලැබ සිටියදී, මේ දේශය ඔහුටද ඔහුගෙන් පසු ඔහුගේ වංශයටද උරුමකොට දෙන්ට පොරොන්දු වූ සේක. (ක්‍රියා 7:5)**

ආබ්‍රහම් නොදුටු දේශයක් ඔහුට පොරොන්දුවෙන් ලැබී තිබුණි. ආබ්‍රහම්ට නොසිටි පුතෙකු සඳහා එය උරුමයක් වන බව පොරොන්දුව ලැබී තිබුණි. එහෙත් ආබ්‍රහම් දෙවියන්වහන්සේව සැක කළේ නැත. දෙවියන්වහන්සේගේ පොරොන්දුව අනාගත පරම්පරාවකදී ඉටු වන පිණිස ඔහු තම ජීවිතය දෙවියන්වහන්සේගේ සැලැස්මෙහි ආයෝජනය කළේය.

අස්වැන්නහෙි දර්ශනය සදාකාලික ස්වභාවයක් දරයි. ඔබගේ මුළු ජීවිත කාලයම පෙනෙන්නට නොමැති දෙයක් කෙරෙහි ආයෝජනයෙන් ගෙවිය හැකිය. නමුත් එහි ප්‍රතිඵල සදාතනිකය. ඔබ දර්ශනය සම්පූර්ණ කරන බැවින් ඉදිරි පරම්පරාවන් ආශිර්වාද ලබනු ඇත.

**ඔහු කැඳවීමට කීකරු විය.**

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට යම් ස්ථානයකට යාමට කැඳවූ කල ඔහු එයට කීකරු විය. පසු කලෙක එම ස්ථානය ඔහුට උරුමයක් ලෙස ලැබෙනු ඇත.

> **ඇදහිල්ලෙන්, ආබ්‍රහම් කැඳවනු ලැබූ කල තමාට උරුමයක් පිණිස පසුව ලැබෙන්ට තිබුණු ස්ථානයකට පිටත්ව යන හැටියට කීකරුවී, තමා කොතැනට යනවාදැයි නොදැන පිටත්ව ගියේය. (හෙබ්‍රෙව් 11:8)**

අස්වැන්නේ දර්ශනයට කැඳවීම ලැබීම පමණක් නොසෑහේ. ඔබ එම කැඳවීමට කීකරුකමින් ප්‍රතිචාර දැක්විය යුතුය.

> **මාගේ ශබ්දයට නුඹ කීකරු වූ නිසා නුඹේ වංශය කරණකොටගෙන පොළොවේ සියලු ජාතීහු ආශිර්වාද ලබන්නෝය කියා මා ගැනම දිවුලෙමියි ස්වාමින්වහන්සේ කියනසේකැයි කීයේය. (උත්පත්ති 22:18)**

**ඔහු තනිවම නැගී සිටීමට කැමති විය.**

දෙවියන්වහන්සේ ආබ්‍රහම් පිළිබඳව පවසන්නේ:

> **නුඹලාගේ පියවූ ආබ්‍රහම්ද නුඹලා වැදූ සාරාද බලාපල්ලා. මක්නිසාද ඔහු එක්කෙනෙක්ව සිටියදී මම ඔහු කැඳවාගෙන ඔහුට ආශිර්වාදකොට, ඔහු වැඩි කළෙමි. (යෙසායා 51:2)**

ආබ්‍රහම්ව හුදකලාව කැඳවනු ලැබීය. එම කැඳවීමට පිළිතුරක් ලෙස ඔහුට තම මව් බිමෙන්, තම පවුල් පරිසරයෙන් පිටත්ව යාමට සිදුවිය.

ඔබව දෙවියන්වහන්සේ ගැළවීමට කැඳවන කල එය පෞද්ගලික හුදකලා කරුණකි. සෑම පුද්ගලයෙකුට තනි තනිව එම කැඳවීමට ප්‍රතිචාර දැක්විය යුතුය. අස්වැන්නේ කෙතට ලැබෙන කැඳවීමද එයාකාරය. ආබහම්ට මෙන් ඔබටද තනිවම කැඳවනු ලැබේ. ඔබ තීරණයක් ගත යුතු වේ. දර්ශනයට ප්‍රතිචාර දැක්වීමෙන් ඔබට සමහර විට පවුල නිවස අතහැරයාමට පවා සිදුවිය හැක. නියතවශයෙන්ම තවමත් දර්ශනය අල්ලාගෙන නොමැති නොසැලකිලිමත් ඇදහිලිවතුන් කෙරෙන් පිටවී යාමට ඔබට සිදුවේවි.

**ඔහුට ආත්මික දර්ශනයක් තිබිය.**

ආබ්‍රහම් සතුව ආත්මික දර්ශනයක් පැවතියේය.

> **මක්නිසාද අත්තිවාරම් ඇත්තාවූ, දෙවියන්වහන්සේ විසින් යෝජනාකර සෑදුවාවූ නුවර ගැන ඔහු බලාසිටියේය. (හෙබ්‍රෙව් 11:10)**

ඔහුගේ දර්ශනය පදනම් වී තිබුණේ ආත්මික කාරණා මතය. ඔහුගේ දර්ශනය වූයේ දෙවියන්වහන්සේ විසින් සෑදූ නුවරක් කෙරෙහිය. ඔහුගේ දර්ශනය නිසා ඔහුට ආගන්තුක දේශයක වසන්නට සිදුවිය. ඔහුට කූඩාරම්වල දිවි ගෙවමින් තම නිවසින්ද පවුලෙන්ද ඈත්ව ජීවත්වන්ට සිදුවිය. දර්ශනය ඔහුගේ ජිවිතය වෙනස් කළේය.

අස්වැන්නේ දර්ශනය ඔබගේ ජිවිතය වෙනස් කොට ඇත. ඔබ මින් මතු කිසිදිනක පෙර කල විසූ පුද්ගලයා නොවනු ඇත. ඔබහට ජීවිතයෙහි තාවකාලික කාරණා මගින් තෘප්තිමත් විය නොහැක. ඔබ සදාකාලික හේතුවක් සොයනු ඇත.

**ඔහු දෙවියන්වහන්සේව ඉතා සමීප ලෙස දැනසිටියේය.**

ආබ්‍රහම් "දෙවියන්වහන්සේගේ මිතුරා" යයි හඳුන්වනු ලැබීය.

> **මෙසේ: ආබ්‍රහම් දෙවියන්වහන්සේ විශ්වාස කළේය. එය ධර්මිෂ්ඨකම කොට ඔහුට ගණන්ගනු ලැබුවේය කියා තිබෙන ලියවිල්ල සම්පූර්ණවුණේය: තවද ඔහු දෙවියන්වහන්සේගේ මිත්‍රයායයි කියනු ලැබුවේය. (යාකොබ් 2:23)**

ඔබහට දර්ශනය සම්පූර්ණ කිරීමට නම් දෙවියන්වහන්සේ හා සමඟ ඉතා සමීප පෞද්ගලික ඇසුරක් පැවැත්වීම අවශ්‍ය වේ. ඔබ එතුමාගේ මාර්ග ඉගෙන ගෙන එතුමාගේ හඬට සවන් දීමට ඉගෙන ගත යුතුය. ඔබ දෙවියන්වහන්සේගේ මිතුරා බවට පත්විය යුතුය.

**ඔහු බලාපොරොත්තුවලින් පිරී සිටියේය.**

පාවුල් ආබ්‍රහම් පිළිබඳව පවසනුයේ:

> **නුඹේ වංශය මෙසේ වන්නේය කියා තිබෙන ලෙස, ආබ්‍රහම්, බොහෝ ජාතීන්ගේ පියා වන පිණිස, බලාපොරොත්තුවීමට ඉඩ නැති තැන බලාපොරොත්තුවෙන් විශ්වාසකෙළේය. (රෝම 4:18)**

ආබ්‍රහම් සතුව පුත්‍රයෙකු නොසිටි නමුත් ඔහු බොහෝ ජාතීන්ගේ පියා වන බවට පොරොන්දුවක් ලැබුවේය. ස්වභාවික ලෝකයෙහි එය බලාපොරොත්තු විරහිත විය. එහෙත් බලාපොරොත්තු විරහිත මොහොතේ ඔහු එයට විරුද්ධව බලාපොරොත්තුව විශ්වාස කළේය.

ඔබ වටා වාතාවරණය කෙලෙස වුවද, ඔබ සිටින තත්වය කොතරම් බලාපොරොත්තු විරහිත වුවත් දෙවියන්වහන්සේ ඔබව පුස්වැන්නේ දර්ශනයට කැඳවා ඇති බවත්, එය සම්පූර්ණවන්නට යන බවත් දැනගන්න.

බලාපොරොත්තු විරහිත බවට නිසැක කමින් යුතුව එනම්, "උන්වහන්සේ පොරොන්දු වූ කාරණය ඉටු කිරීමට සමත් දෙවියන්වහන්සේය" යන බව දැන මුහුණ දෙන්න. (රෝම 4:21)

**ඔහු සතුව දැඩි ඇදහිල්ලක් පැවතිය.**

> **එසේය, දෙවියන්වහන්සේගේ පොරොන්දුව දෙස බලා ඇදහිල්ලෙන් බලවත්ව දෙවියන්වහන්සේට ගෞරව කරමින්** (රෝම 4:20)

ආබ්‍රහම් සතුව කෙතරම් දැඩි ඇදහිල්ලක් පැවතියාදයත්, දර්ශනය ඉටුවීමට පෙරම ඔහු ඒ පිළිබඳව දෙවියන්වහන්සේට ප්‍රශංසා කළේය. දෙවියන්වහන්සේ පොරොන්දු වූ ඕනෑම කාරණාවක් ඉටු කිරීමට එතුමාට හැකි බව ඔහු මුළුමනින්ම නිසැකව දැන සිටියේය. (රෝම 4:20)

දෙවියන්වහන්සේ ඔබව කැඳවා ඇති දර්ශනයේ ශ්‍රේෂ්ඨබව දරාගැනීමට අපහසු තරම් බලවත්ය... තවමත් ශුභාරංචිය අසා නැති බිලියන තුනක් ජනතාව... මොවිහු මිථ්‍යා දෘෂ්ටික වෙති. ඔවිහු ඔබගේ උරුමය වේ. ඔබ කරණකොටගෙන ඔවිහු ආශිර්වාද ලැබිය යුතුය.

දෙවියන්වහන්සේගේ පොරොන්දුව ඉදිරියෙහි පසු නොබසින්න. ඔබ ඉදිරියෙහි ඇති කාර්යයෙහි මහත් බව දෙස නොබලා ඔබ ඉදිරියෙහි සිටින දෙවියන්වහන්සේගේ ශ්‍රේෂ්ඨබව දෙස බලන්න. දෙවියන්වහන්සේ අති මහත් ආත්මික අස්වැන්නක් පොරොන්දු වී තිබේ. එබැවින් ආබ්‍රහම් මෙන් වන්න. ඔහු:

> **නුඹේ වංශය මෙසේ වන්නේය කියා තිබෙන ලෙස, ආබ්‍රහම්, බොහෝ ජාතීන්ගේ පියා වන පිණිස, බලාපොරොත්තුවීමට ඉඩ නැති තැන බලාපොරොත්තුවෙන් විශ්වාසකෙළේය.**
> **(රෝම 4:18)**

**ඔහු ධර්මිෂ්ඨ විය.**

ආබ්‍රහම් දෙවියන්වහන්සේ විශ්වාස කළ බැවින්:

> **ඒ නිසා එය ඔහුට ධර්මිෂ්ඨකම කොට ගණන්ගන්නා ලද්දේය. (රෝම 4:22)**

මෙම පාඩමාලාවෙහි මීට පෙර ඉගෙනගත් පරිදි, ඔබගේ අස්වැන්නේ සේවයෙහි අත්තිවාරම විය යුත්තේ ධර්මිෂ්ඨ කමය.

**ඔහු යටහත් විය:**

ආබ්‍රහම් දෙවියන්වහන්සේ මහිමයට පත් කළ බව පාවුල් සඳහන් කරයි. (රෝම 4:20)

දර්ශනයෙහි සම්පූර්ණ වීම පැමිණීමට යන්නේ දෙවියන්වහන්සේ තුළින් පමණක් බව ආබ්‍රහම් දැන සිටියේය. උන්වහන්සේ පමණක්ම මහිමය ලැබිය යුතුය.

ලෝකයෙහි ජාතීන් නම් අස්වැන්නේ කෙතෙහි මහත් දර්ශනයක් දෙවියන්වහන්සේ ඔබහට දී ඇත. නමුත් එහි සම්පූර්ණත්වය පැමිණෙනුයේ එතුමාගෙන්ම පමණකි. දර්ශනය පිළිබඳව හෝ එහි අස්වැන්නේ ප්‍රතිඵල පිළිබඳ ඔබට මහිමය ලබාගත නොහැක. සම්පූර්ණ වූ දර්ශනය පිළිබද සියලු මහිමය දෙවියන්වහන්සේ වෙතට පිදිය යුතුය.

**ඔහු සාමකාමී විය:**

උත්පත්ති 13 හි ආබ්‍රහම්ගේ සේවකයන් සහ ලොත්ගේ සේවකයන් අතර වතුරවල අයිතිය උදෙසා ගැටුමක් හටගැනිනි. ආබ්‍රහම් එම ගැටලුව විසඳීමට සාමකාමී විසඳුමකට එළැඹිනි.

යේසුස්වහන්සේගේ උපතෙහිදී දේව දූතයන් ගෙන ආ පණිවුඩය සාමයේ පණිවුඩයකි. ඔබ ලෝකයෙහි ජාතීන් වෙත ගෙන යනු ඇත්තේ සාමයේ පණිවුඩයකි. මන්ද සැබෑ සාමය අත් කර ගත හැක්කේ දෙවියන්වහන්සේ තුළින් පමණක් බැවිනි.

**ඔහු දේව කැමැත්ත සැණෙන් ඉටු කළේය.**

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට කතාකොට, ඔහුත් දෙවියන්වහන්සේත් අතර පවතින ගිවිසුමෙහි සළකුණ චර්මඡේදනය බව පැවසූ කල, බයිබලය වාර්තා කරනුයේ ඔහු එදිනම තම පවුලේ සියලු පිරිමි චර්මඡේදනය කළ බවය (උත්පත්ති 17).

පසු කලෙක දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට දුන් පොරොන්දුව ඉටුකරමින් ආබ්‍රහම් සහ ඔහුගේ භාර්යාව වන සාරාට පුතෙකු දුන් සේක. ඊසාක්ගේ උපතින් පසුව දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට අපහසු පරීක්ෂණයක් දුන් සේක. එනම් ඔහුගේ පුත්‍රයාව පූජා කරන ලෙස පැවසීමය. (උත්පත්ති 22)

ඊසාක් තුළ දෙවියන්වහන්සේගේ පොරොන්දුවෙහි අනාගතය විය. ආබ්‍රහම්ගේ පරම්පරාව ඉදිරියට ගෙන යනු ඇත්තේ ඊසාක්ගේ උරුමක්කාරකමය. ඊසාක් තුළින් ඉශ්‍රායෙල් ජාතිය බිහිවීමටත්, ඉශ්‍රායෙල් තුළින් මුළු ලොවම ආශිර්වාද ලැබීමටත් නියමව තිබීය. එනමුත් දෙවියන්වහන්සේ ආබ්‍රහම් හට මෙම පුත්‍රයාව පූජා කිරීමට ඉල්ලා සිටි සේක.

බයිබලය උත්පත්ති 22:3 හි වාර්තා කර ඇති පරිදි ආබ්‍රහම්ට දෙවියන්වහන්සේගෙන් මෙම පණිවුඩය ලැබීමෙන් අනතුරුව, ඔහු "ඉතා අලුයමින් පිබිද" උපදෙස් අනුව ක්‍රියා කිරීමට කීකරුවීමට නැගී සිටියේය. දෙවියන්වහන්සේගේ කැමැත්ත අපහසු වූ විට පවා ආබ්‍රහම් පමා නොවීය. දෙවියන්වහන්සේ ඔහුට කතාකළ සැණෙන් ඔහු ක්‍රියාත්මක විය. ඔහුගේ කීකරුකම හේතුකොටගෙන දෙවියන්වහන්සේ ඊසාක්ගේ ජීවිතය බේරා ඒ උදෙසා වෙනත් පූජාවක් සපයා දුන් සේක.

අස්වැන්නේ කෙතෙහි මෙහෙකිරීම සැමවිටම පහසු කාර්යයක් නොවනු ඇත. එනමුත් දෙවියන්වහන්සේ කතා කළ සැණින් ඔබ ක්‍රියා කළ යුතුය. ඔබ එතුමාට එකඟව කීකරුවෙමින් ඉදිරියට පා තබන සැමවිටම දෙවියන්වහන්සේ ඔබ උදෙසා ක්‍රියා කරනු ඇත.

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට ඊසාක් පූජා කිරීමට උපදෙස් දුන් විට ආබ්‍රහම් එයට පූජාවක් යයි නොපැවසීය. ඔහු එය නමස්කාරයක් ලෙස නම් කළේය. අපගේ නමස්කාරයේ ඉහළම ප්‍රකාශනය නම් අප ප්‍රේමකරන ඊසාක්ට ඔබ්බෙන් දෙවියන්වහන්සේ දෙස බැලීමය.

දෙවියන්වහන්සේ ඔබට දර්ශනයක් දී ඇත. එය ඔබගේ ජීවිතය වෙනස් කොට තිබේ. එනමුත් කිසිම විටක දර්ශනය දෙවියන්වහන්සේට වඩා වැදගත් විය නොහැක. ඔබගේ මූලික වගකීම එතුමා සමඟ සම්බන්ධතාවය දරා ගැනීමය.

දෙවියන්වහන්සේ ආබ්‍රහම්ව පරීක්ෂණයකට ලක් කොට ඔහුගේ ඉහළම පක්ෂපාතිබව පැවතියේ ඊසාක් කෙරෙහිද නැත්නම් දෙවියන්වහන්සේ කෙරෙහිද කියා විමසා බැලූ සේක. සැමවිටම ඔබගේ උසස්ම පක්ෂපාතිබව දැරිය යුත්තේ දෙවියන්වහන්සේ වෙතටය. දර්ශනය කිසිවිටකත් දර්ශනය දුන් තැනැන්වහන්සේගේ ස්ථානය හිමි කර නොගත යුතුය.

**ඔහු දෙවියන්වහන්සේ උදෙසා සංක්‍රමණිකයෙක් විය.**

ආබ්‍රහම් ඉතා සරල ජීවිත රටාවක් ගත කළ බැවින් දෙවියන්වහන්සේ උදෙසා ඔබ මොබ යෑමට ඔහුට හැකිවිය. දෙවියන්වහන්සේ අණකළ සැණින් ඔහුට පිටවී යා හැකිවිය (උත්පත්ති 12).

**ඔහු කිසිවිට ආපසු නොබැලිය.**

ආබ්‍රහම් කිසිවිටකත් ඔහු හැර දමා පැමිණී පැරණි ජීවිතය දෙස නෙත් යොමු නොකළේය. එයට ආගා නොවිය. ඒ වෙනුවට දෙවියන්වහන්සේ කිරීමට යන්නාවූ නවතම කාරණා දෙස බැලිය.

> **නුමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේව ප්‍රසන්නකරන්ට නුපුළුවන. මක්නිසාද, දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නා විසින් උන්වහන්සේ විද්‍යාමාන බවත්, උන්වහන්සේ සොයන්නන්ට විපාකදෙන කෙනෙකු බවත් විශ්වාසකරන්ට ඕනෑය. (හෙබ්‍රෙව් 11:6)**

**ඔහු එළිදරව්විම ත=ළින් ලැබෙන්නාවූ දැනගැන්ම තුළ හැසිරුණේය.**

අබ්‍රහම් මනුෂ්‍යයාගේ හේතු සාධක මත නොව දෙවියන්වහන්සේ සැපයූ එළිදරව්ව මත ක්‍රියා කළේය.

> **ස්වාමින්වහන්සේ: මා කරන්ට යනදේ ආබ්‍රහම්ගෙන් සඟවම්ද? (උත්පත්ති 18:17)**

**ඔහු තමාගේ ස්වභාවික හැකියාවන් දෙස නොබැලුවේය.**

ජාතින් උදෙසා වූ දෙවියන්වහන්සේගේ පොරොන්දුව පැන නැගුනේ "මැරී ඇති තරමට" පත් වූ කෙනෙකු තුලිනි. ස්වභාව ධර්මයට අනුව ආබ්‍රහම් හට දේව පොරොන්දුව ඉටු කිරීමට හැකියාවක් නොතිබුණි.

> **එහෙයින් මළ කෙනෙකු වැනි එක තැනැත්තෙකුගෙන් පවා ගණනින් අහසේ තාරකා මෙන්ද ගණන්කළ නොහැකි මුහුදු වෙරළේ වැලි මෙන්ද වූ සමූහයක් හටගත්තේය. (හෙබ්‍රෙව් 11:12)**

**ඔහු දෙවියන්වහන්සේ සෙවිය.**

උත්පත්ති 12 වෙනි පරිච්ඡේදය ආබ්‍රහම් පූජාසනය ගොඩ නැඟූ බවද ස්වාමින්ගේ නාමය නිසා හඬ ගැසූ බවද වාර්තා කරයි.

**ඔහු අන්‍යයන් උදෙසා වගකීම භාරගත්තේය.**

අබ්‍රහම් සහ ලොත්ගේ කතාව උත්පත්ති 14 හි කියවන්න. ඔබ "ලෝකයටම කිතුනුවෙක්" වීමට කැමති නම්, ඔබ අවට ලොවෙහි සිටින අයගේ අවශ්‍යතාවයනට වගකීම දැරිය යුතුය.

**ඔහු ත්‍යාගශීලි විය යුතුය.**

ආබ්‍රහම් තමා සතු සියල්ලෙන් දසයෙන් කොටස ගෙවිය.

> **නුඹේ සතුරන් නුඹේ අතට පාවාදුන් මහෝත්තම දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවයි කීය. ආබ්‍රහම්ද සියල්ලෙන් දසයෙන් කොටසක් ඔහුට දුන්නේය. (උත්පත්ති 14:20)**

**ඔහු ආගන්තුක දේශයක වාසය කිරීමට කැමති විය.**

> **ඇදහිල්ලෙන්, ඔහු අන් දේශයක මෙන් පොරොන්දුවේ දේශයෙහි පොරොත්තුවී, එම පොරොන්දුවට උරුමක්කාරයන් වූ ඊසාක් සහ යාකොබ් සමඟ කූඩාරම්වල වාසය කළේය. (හෙබ්‍රෙව් 11:9)**

ඔහු අනෙකුත් පුද්ගලයන්ගේ සංස්කෘතියට ගෞරව දැක්වීමට කැමති විය. උදාහරණයක් ලෙස දේශයෙහි මනුෂ්‍යයන්ගේ චාරිත්‍රය ලෙසට ඔහු මනුෂ්‍යයන් ඉදිරියෙහි නැමී සිටියේය.

> **ආබ්‍රහම්ද ඒ දේශයේ සෙනඟට නැමී ආචාරකොට, (උත්පත්ති 23:12)**

**ඔහු තමා වැනිම කැපවීමෙන් යුත් මනුෂ්‍යයන් බිහිකළේය.**

ඔහුගේ සේවකයා වූ එලියාසර්ගේ ජීවිතයෙන් මෙය දැකිය හැක (උත්පත්ති 24)

**ඔහු දෙවියන්වහන්සේට මහිමය දුන්නේය.**

> **සොදොම්හි රජද ආබ්‍රම්ට කථාකොට: මිනිසුන් මට දියන්න, සම්පත් නුඹටම ගනින්නැයි කිය. ආබ්‍රම් සොදොම්හි රජුට කථාකොට, මම ආබ්‍රම් පොහොසත්කළෙමියි නුඹ නොකියන පිණිස යෞවනයන් කෑ දේ සහ මා සමඟ ගියාවූ මිනිසුන්ගේ කොටස හැර නූල්පටක්වත් මිරිවැඩි පටියක්වත් නුඹ සන්තක කිසි දෙයක්වත් නොගන්නෙමියි අහසත් පොළොවත් හිමිවූ මහෝත්තම දෙවිවූ ස්වාමින්වහන්සේට මාගේ අත ඔසවා දිවුළෙමි. අනේර්ද එෂ්කොල්ද මම්රේද තමන්ගේ කොටස් ගනිත්වයි කිය. (උත්පත්ති 14:21-24)**

සැමවිටම මතක තබාගත යුතු කරුණක් නම්, නිරතුරුව මහිමය දෙවියන්වහන්සේට පුදන්න.

## සම්පූර්ණ වූ දර්ශනය

ආබ්‍රහම්, ආත්මික දර්ශනයකින් යුක්තවූ මනුෂ්‍යයා... ලෝකයෙහි සියලු ජාතීන් ඔහු හේතු කොටගෙන ආශිර්වාද ලැබීමට නියම විය. එම දර්ශනය සම්පූර්ණ විය.

> **එහෙයින් මළ කෙනෙකු වැනි එක තැනැත්තෙකුගෙන් පවා ගණනින් අහසේ තාරකා මෙන්ද ගණන්කළ නොහැකි මුහුදු වෙරළේ වැලි මෙන්ද වූ සමූහයක් හටගත්තේය. (හෙබ්‍රෙව් 11:12)**

ආබ්‍රහම්ට දර්ශනය ලැබෙන කල ඔහුගේ අතිතය සඵලවත් වූවක් නොවිය. වර්තමානයද ඵල රහිත විය. එනමුත් ඔහු තම සිරුරේ අප්‍රාණික බව හෝ සාරාගේ කුසෙහි අප්‍රාණික බව පිළිනොගත්තේය.

සමහරවිට ඔබේ අතිතය ආත්මිකව සඵලවත් වූවක් නොවිය හැකිය. එසේම වර්තමානයද ඵල රහිත විය හැක. නමුත් දැන් ඔබට අස්වැන්නෙහි දර්ශනය ලැබී තිබේ.

එබැවින් ආබ්‍රහම් මෙන්, ඇදහිල්ලේ දෑතින් අනාගතය දෙස බලා "පොරොන්දුව දුන් තැනැන්වහන්සේට එය ඉටු කිරීමට හැකි බව" දැනගන්න.

## ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය කටපාඩමෙන් ලියන්න.

______________________________________________

2. ඇදහිලිවන්තයෝ ආබ්‍රහම්ගේ උරුමක්කාරයෙක් බව සනාථ කිරීමට බයිබල් පද දෙකක් ඉදිරිපත් කරන්න. ______________________________

3. අපි ____________________ ගේ පොරොන්දුවෙහි උරුමක්කරුවෝය.

4. අපි ____________________ ගේ වගකීමෙහි උරුමක්කරුවෝ වෙමු.

5. ලෝකයෙහි ජාතීන්ට ආශිර්වාදයක් වීමට ලැබූ දර්ශනය සම්පූර්ණකිරීමට ආබ්‍රහම්ට හැකිවූ ඔහු තුළ පැවති ආත්මික ගුණාංග නම් කරන්න.

| | |
|---|---|
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |
| ______________________ | ______________________ |

(මෙම පරීක්ෂණ වලට පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව ඇත)

# තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා

1. ආබ්‍රහම් හට ලෝකයෙහි ජාතීන්ට ආශිර්වාදයක් වීමට හැකියාව ලබා දුන් ඔහු තුළ පැවති ආත්මික ගුණාංග වල ලැයිස්තුවක් පහතින් සඳහන් වේ. ඔබ ලෝකයාට එසේ ආශිර්වාදයක් වීමේ දර්ශනය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරයි නම් ඔබද එම ගුණාංග ඔබ තුළ වර්ධනය කරගත යුතුය. එක එක් ගුණාංග පුනරීක්ෂණය කර බලන්න. ඔබගේ ජීවිතයෙහි එම ගුණාංග කෙතරම් දුරට වර්ධනය වී ඇත්දැයි විස්තර කරන්න.

**ගුණාංග** **මාගේ ජීවිතයෙහි මෙම ගුණාංගය කෙතරම් දුරට දැකිය හැකිද?**

සම්පූර්ණයෙන් නිසැකවීම

___

ආත්මික කාරණාවල අයෝජනය කිරීම

___

කීකරුකම

___

හුදකලාව නැගී සිටීමට කැමැත්ත

___

ආත්මික දර්ශනය

___

දෙවියන්වහන්සේව සමීපතම ලෙස දැනගැනීම

___

බලාපොරොත්තුව

___

ඇදහිල්ල

___

ධර්මිෂ්ඨකම

___

යටහත්කම

___

සටන්කාමී බව

සැණෙකින් දේව කැමැත්ත ඉටුකිරීම

දෙවියන්වහන්සේ උදෙසා සංක්‍රමණයෙහි යෙදීම

කිසිවිට ආපසු නොබැලීම

එළිදරව්වේ දැනගැන්මෙහි හැසිරීම

ස්වභාවික හැකියාවන් දෙස නොබැලීම

දෙවියන්වහන්සේ සෙවීම

අන්‍යයන් උදෙසා වගකීම දැරීම

ත්‍යාගශීලි බව

ඔබ මෙන්ම කැපවූ මනුෂ්‍යයන් බිහි කිරීම

දෙවියන්වහන්සේට මහිමය දීම

ආගන්තුක දේශයක විසීමට කැමති වීම

2. ඔබගේ විශ්ලේෂණය අනුව ඔබගේ ආත්මික ගුණාංගවල මදිකම මගහරවා ගැනීමට වර්ධනය කිරීමට පහත සඳහන් අංශ වලින් ඔබට ගත හැකි ක්‍රියා මාර්ග මොනවාද?

මගේ දිනපතා බයිබල් අධ්‍යයනය:

මගේ දිනපතා යාච්ඤා ජීවිතය:

මගේ පවුල හා නිවස:

මගේ සභාව:

මගේ අනාගත සැලසුම්:

මම අස්වැන්නේ දර්ශනයට ඇති සම්බන්ධතාවය:

මගේ ආර්ථිකය:

# එකොළොස්වන පරිච්ඡේදය

## දර්ශනය යථාර්ථයක් බවට පත්වේ

**අරමුණු:**

මෙම පරිච්ඡේදය සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබ හට කළ හැකි දේ:

- දෙවියන්වහන්සේගේ අස්වැන්න නෙලන්නන් ලෙසට කැඳවාගන්නේ ක=මන ආකාරයේ පුද්ගලයන්ද යන්න හඳුනාගැනීමට.
- දෙවියන්වහන්සේගේ මහත් අස්වැන්නේ පොරොන්දුව අත්පත් කරගැනීමට ඉල්ලා සිටීම
- දර්ශනය ඔබගේ ජීවිතයෙහි යථාර්ථයක් බවට පත්කර ගැනීමට

**ප්‍රධාන පදය**

> **තවද යහපත්කම්කිරීමට මැළිනොවෙමු, මක්නිසාද අපි ක්ලාන්ත නොවෙමු නම්, නියම කාලයේදී කපාගන්නෙමුව. (ගලාති 6:9)**

### හැඳින්වීම

ඔබ මෙම අධ්‍යයනය ඇරඹූ කල දර්ශනයක් වෙතට පළමුව යොමු වී පසුව එය යථාර්ථයක් බවට පත් වන අත්දැකීමක් ඇරඹිය.

ඔබ තුළ අස්වැන්නේ දර්ශනයක ජනිතවීමේ සිට දෙවියන්වහන්සේගේ දෑසින් ලොව දැකීම, හා ලෝකයේ ජාතීන් උදෙසා එතුමාගේ පරමාර්ථය අවබෝධ කරගැනීම තෙක් ඔබ දැක ඇත. ඔබ අස්වැන්න වලක්වාලන කාරණ ඉගෙන ගෙන ඇත. සාර්ථක අස්වැන්නක් උදෙසා උපක්‍රම, ක්‍රමවේද, ආයුධ ඉගෙන ගෙන ඇත. ඔබ වහල්බැම්මේ, චාරිත්‍රයේ වියගහ බිඳ දමා දෙවියන්වහන්සේගේ බලය අලුතින් අත් දැක ඇත.

මෙම අවසාන පරිච්ඡේදයෙහි දී ඔබ අස්වැන්නේ දර්ශනය සම්පූර්ණ කිරීමේ සහභාගිවීමත් සමඟම දර්ශනය සැබෑවක් බවට පත්වෙනු ඇත.

### දෙවියන්වහන්සේ පාවිච්චි කරනුයේ කාවද?

අස්වැන්නේ දර්ශනය සම්පූර්ණ කිරීමට දෙවියන්වහන්සේ භාවිත කරන්නේ කවුරුන්ද? ලෝකයෙහි ජාතීන් වෙතට ශුභාරංචිය ගෙන යාමට දෙවියන්වහන්සේ කැඳවන්නේ කුමන ආකාර කාන්තාවකටද? පුරුෂයෙකුටද?

ඔබගේ බයිබලයෙහි මාර්ක් 16 වෙනි පරිච්ඡේදය කියවන්න. මෙම පරිච්ඡේදයෙහි ඉහත ප්‍රශ්නවලට පිළිතුරු ඇතුළත් වේ. මෙම ජේදයෙහි යේසුස්වහන්සේගේ අනුගාමික ස්ත්‍රීහු එතුමාගේ සිරුර ආලේප කිරීමට යනු දැකිය හැක. ඔව්හු සොහොන ළඟට පැමිණී විට, දක්නට ලැබුනේ...

> **එකල ඔව්හු සොහොන්ගෙට ඇතුල්ව, සුදු සළුවක් පැළඳගත් තරුණයෙක් දකුණු පැත්තේ ඉඳගෙන ඉන්නවා දැක, හිතවූහ. ඔහු ඔවුන්ට කථාකොට: හිත නොවෙල්ලා. නුඹලා වනාහි කුරුසියෙහි ඇණගසනලද නාසරීය යේසුස්වහන්සේ සොයන්නහුය. උන්වහන්සේ නැගුටුණුසේක. උන්වහන්සේ මෙහි නැත. මෙන්න, ඔවුන් උන්වහන්සේ තැබූ ස්ථානය. (මාර්ක් 16:5-6)**

ස්ත්‍රීහු ගෝලයන් සමඟ මේ ශුභ ආරංචිය බෙදා ගැනීමට ගියෝය. යේසුස්වහන්සේ මද්ගලායේ මරියාට පෙනුන නමුත්, උන්වහන්සේ උත්ථාන වූ බව ගෝලයෝ විශ්වාස නොකළහ (මාර්ක් 16:11). පසුව උන්වහන්සේගේ ගෝලයන් දෙදෙනෙකු රට මැද ගමන්කරමින් සිටින අතර ඔවුන්ට පෙන්නුම්

වූ සේක. ඔව්හු ගොස් අනෙක් අයට පැවසූ විට අනෙක් ගෝලයෝ ඔවුන්ව විශ්වාස නොකළෝය (මාර්ක් 16:12-13).

අවසාන වශයෙන් යේසුස්වහන්සේ ගෝලයන්ට දර්ශනය වී ...

> **පසුව උන්වහන්සේ එකොළොස්දෙන කෑමට හාන්සිවී සිටියදී ඔවුන්ට පෙනී, නැගුටුණායින් පසු තමන්වහන්සේව දුටු අයව ඔවුන් විශ්වාස නොකළ නිසා, ඔවුන්ගේ විශ්වාසය නැතිකමටත් සිත් දැඩිකමටත් ඔවුන්ට දොස්තැබූ සේක. (මාර්ක් 16:14)**

ඔවුන්ගේ අවිශ්වාසකම පිළිබඳ කතාකොට ඒ සමඟම උන්වහන්සේ ඔවුන්ට පැවසුවේ:

> **උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. (මාර්ක් 16:15)**

සැබවින්ම උන්වහන්සේට වැරදීමක් සිදුවන්නට ඇත. යේසුස්වහන්සේගේ උත්ථානය සමරනු වෙනුවට මේ අය එතුමාගේ මිනිය ආලේප කිරීමට ගිය අය වූහ. මොවුන් උන්වහන්සේගේ දුෂ්කර මොහොතෙහි නින්දට ගිය, නාඳුනන බව පැවසූ බයෙන් හැංගුනාවූ පුද්ගලයන් වේ'

යේසුස්වහන්සේ තමාගේ මරණය හා උත්ථානයට මෙම පුද්ගලයන්ව වසර තුනක සිට සූදානම් කළ නමුත් එතුමාගේ තීරණාත්මක පැයේදී එතුමාව මඟ හැර ගොස්, උත්ථානයට පසුව ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ සාක්ෂිය විශ්වාස නොකළෝය. එක් මොහොතක ඔවුන්ගේ අවිශ්වාසවන්තකම පිළිබඳව ඔවුන්ව හරිගස්වන එතුමා ඊළඟ මොහොතේ ඔවුනට ලෝකයෙහි ජාතීන්ගෙන් සමන්විත අස්වැන්නේ දර්ශනය පිළිබඳව අභියෝග කරන සේක.

මෙම ගෝලයන්ගේ දෑතට ශුභාරංචියේ අනාගතය භාරදීමට එතුමාට හැකි වූයේ කෙසේද?

එයට හේතුව නම් උන්වහන්සේ ඔවුන් දෙස දැන් සිටින අයුරින් නොබැලීමය. උන්වහන්සේ ඔවුන්ගේ පසුගිය ක්‍රියාකලාපය හෝ වර්තමාන තත්වය දෙස නොබැලූසේක. උන්වහන්සේ ඔවුන් දෙස බැලුවේ ශුද්ධාත්ම බලයෙන් ඔවුන්ව සැරසූ පසු සිටින්නට යන තත්වයෙනි.

දෙවියන්වහන්සේ ඔබගේ අතීතය දෙස හෝ අසමත්කම් දෙස හෝ ඔබගේ සැකය" අවිශ්වාසය දෙස නොබලනසේක. උන්වහන්සේ ඔබ දෙස බලන්නේ ශුද්ධාත්ම බලයෙන් ඔබව සැරසුන පසු ඔබ සිටින්නට යන ආකාරයෙනි.

### දෙවියන්වහන්සේ පාවිච්චි කළාවූ මනුෂ්‍යයෝ

මුළු ඉතිහාසය පුරා දෙවියන්වහන්සේගේ පරමාර්ථය ඉටු කිරීමට එතුමා තෝරාගත් මනුෂ්‍යයන් දෙස අපි බලමු.

**යාකොබ්**

දෙවියන්වහන්සේට යාකොබ් එනම් කුළුඳුල්කම එතරම්ම උසස් කොට සලකා එය ලබාගැනීමට වංචා කළාවූ තැනැත්තා හා කුළුඳුල්කම සැහැල්ලුවට ලක්කොට කොල්ලු පිගානකට එය පවරා දුන් ඒසව් අතර තෝරා ගැනීමක් කිරීමට සිදුවිය. උන්වහන්සේද ඉශ්‍රායෙල් ජාතිය බිහිකරන පිණිස තෝරාගත්තේ යාකොබ්වය.

**ආබ්‍රහම්**

ආබ්‍රහම් බොහෝ ජාතීන්ගේ පියා විය යුතු විය. ඔහුට මෙම එළිදරව්ව ලැබූ කල ඔහු දෙවියන්වහන්සේ ඉදිරියෙහි මුහුණින් වැටී අවිශ්වාසයෙන් සිනහ විය (උත්. 17:1-3). පසු කලෙක ඇදහිල්ලේ මෙම ශ්‍රේෂ්ඨ පුද්ගලයා තමාගේ ජීවිතයට ඇති බය නිසා සතුරන්ට බොරු කියමින් සාරා ඔහුගේ සහෝදරියයි කීය. මේ සියල්ල මධ්‍යයෙහි පවා ආබ්‍රහම්ට "දෙවියන්වහන්සේගේ මිත්‍රයා" යයි හඳුන්වනු ලැබූ අතර ඔහු බොහෝ ජාතීන්ට පියෙකු විය.

**මෝසෙස්**

ඔහුගේ අකීකරුකම ඔහුව පොරොන්දු දේශයට පිවිසීමෙන් වලක්වාලිය. එනමුත් ඔහු මිලියන දෙකක් ජනතාව මිසරයේ වහල්කමෙන් මුදාගෙන දෙවියන්වහන්සේගේ සැලසුමට අනුව කාන්තාරයේ මඟ පෙන්විය.

**දාවිත්**

ඔහු වෙන පුරුෂයෙකුගේ භාර්යාව රැගෙන තමාගේ පාපය සඟවාලීමට එම පුරුෂයාව ඝාතනය කළේය. එනමුත් ඔහුට "දෙවියන්වහන්සේගේ හදවතට සමීප පුද්ගලයා" යයි නම් කළ අතර දෙවියන්වහන්සේ ඔහුට රාජ්‍යය ලබාදුනි.

**ගිඩියොන්**

ගිඩියොන් තම සතුරන්ගෙන් බේරීමට සැඟවී තිරිඟු මඩිමින් සිටි අතර දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල්හි ගැළවුම්කරුවීමට ඔහුව කැඳවීය (විනිශ්චයකාරයා 6)

## සාමාන්‍ය මනුෂ්‍යයෝ

දෙවියන්වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ කිරීමට සාමාන්‍ය ජනතාව පාවිච්චි කළ සේක. යේසුස්වහන්සේ තම පළමුවන හාස්කම වූ වතුර මිදියුෂයට පරිවර්තනය කිරීම සිදුකිරීම සඳහා සාමාන්‍ය මනුෂ්‍යයන් හට සාමාන්‍ය වතුර භාජනවලට පිරවීමට පැවසූ සේක. උන්වහන්සේ මහත් සමූහයකට කන්ට දුන් කල රොටී සහ මාළු වැඩිවීමට සලස්වා සාමාන්‍ය ජනතාවට දුන් විට, ඔව්හු ගොස් මහා ජනතාවට කන්ට දුන්නෝය. යේසුස්වහන්සේගේ සේවාවෙහි විශිෂ්ට හාස්කමක් විය හැකි ලාසරස්ව මළවුන්ගෙන් නැගිටවීම සිදුකිරීමේදී සොහොනේ ගල ඉවත් කිරීම සඳහා එතුමා සාමාන්‍ය මනුෂ්‍යයන් කෙරෙහි රැඳී සිටි සේක. ලාසරස්ව මළවුන්ගෙන් නැගිටවීමට හැකි වූ දෙවියන්වහන්සේට ගල ඉවත් කිරීමට බලය නොතිබුණිද?

දෙවියන්වහන්සේ තම සැලැස්ම ඉටු කිරීමට සැමවිටම මනුෂ්‍යයන් භාවිත කරයි. උන්වහන්සේගේ ක්‍රමය මනුෂ්‍යයන්ය. දෙවියන්වහන්සේ සාමාන්‍ය මනුෂ්‍යයන් කැඳවා ඔවුන්ව අසාමාන්‍ය අය බවට පත් කරන සේක. දෙවියන්වහන්සේ මනුෂ්‍යයන්ව එතුමාගේ සැලැස්මෙහි නරඹන්නන්ගේ සිට සහභාගිවන්නන් බවට පත් කරන සේක.

- දෙවියන්වහන්සේට අපව භාවිත කිරීමට බැරි යැයි සිතූ සියලුම සාමාන්‍ය ජනයනි,
- හාස්කමට කොටසක් විය නොහැකියයි සිතූ සියලුම සාමාන්‍ය ජනයනි,
- උන්වහන්සේව නොහඳුනන බව පැවසූ, අසමත්වූ සියලුම ජනයනි,

දෙවියන්වහන්සේ ඔබගේ අතීතය දෙස හෝ වර්තමාන ක්‍රියාකාරකම පිළිබඳව නොබලන සේක. ඔබ ඔබවම දකින ආකාරයෙන් එතුමා ඔබව නොදකියි. උන්වහන්සේ ඔබව දකින්නේ ඔබ ලෝකයෙහි අස්වැන්නේ කෙතට යාමට අභියෝගය භාරගත් විට සිටින ආකාරයටය. උන්වහන්සේ ඔබව දකින්නේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයෙන් ඔබ සැරසුන පසුව සිටින ආකාරයටය.

දෙවියන්වහන්සේ ඔබගේ ඇදහිල්ල, අධ්‍යාපනය, දක්ෂතා හෝ ආත්මික මට්ටම කෙරෙහි රැඳී නොසිටින සේක. ඔබගේ කිසිම දෙයක් මත එතුමා රැඳී නොසිටී. ඔබ ඔබගේ ජීවිතය එතුමාගේ කැමැත්තට හා පරමාර්ථයට සම්පූර්ණයෙන්ම යටත් කළ විට ඔබට විය හැකි පුද්ගලයා කවුදැයි එතුමා දැනගෙන ඒ මත රැඳී සිටින සේක.

මුල් කාලීන සභාව දිනාගනු ලැබුවේ දක්ෂ දේශනා මගින් නොවේ. එය දිනාගනු ලැබුවේ ඔබත් මමත් වැනි සාමාන්‍ය මිනිසුන් මගිනි. නමුත් ඔව්හු තමුන්ගේ අසමත්කම දෙසින් දැස් ඉවතට ගෙන අස්වැන්නේ දර්ශනය හසු කරගත්තෝ විය. ඔව්හු ස්වභාවිකව දුර්වල වන කල ආත්මිකව ශක්තිමත් වන බව අවබෝධ කරගත්තෝය. දෙවියන්වහන්සේ පොරොන්දු වූයේ.

> **උන්වහන්සේද: මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවෙන්නේයයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස්වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි. (2 කොරින්ති 12:9)**

**අති මහත් අස්වැන්නක්**

අස්වැන්නේ දර්ශනය අල්ලාගෙන දෙවියන්වහන්සේගේ කැමැත්ත හා කාර්යය ඉටු කරන්නන් හට, මහත් අස්වැන්නක් පොරොන්දු වී තිබේ.

> **මක්නිසාද සමාදන බීජ තිබෙයි; මුද්‍රිකවැල එහි ඵලද භූමිය එහි අස්වැන්නද ආකාශය එහි පිනිද දෙනවා ඇත. මේ සෙනඟගෙන් ඉතිරි අයට මේ සියල්ල උරුමකරදෙන්නෙමි. (සෙකරියා 8:12)**

කාන්තාරය උන්වහන්සේ සරුබිමකට හරවන සේක.

> **උන්වහන්සේ කාන්තරයක් දිය පොකුණක්ද වියළි බිමක් දිය උල්පත්ද කරන සේක. බඩගිනිවූවන් විසින් වාසයට යෝග්‍යවූ නුවරක් සාදන පිණිසත්, කෙත් වපුරා, මිදිවතු වවා, ඵල ලබාගන්නා පිණිසත්, ඔවුන් එහි වාසයකරවන සේක. (ගීතාවලිය 107:35-37)**

ඵලදාව මද ස්ථානවලට උන්වහන්සේ අස්වැන්න ගෙන දෙන සේක.

> **පොළොවේ කඳු මුදුන්හි බොහෝ ශස්‍ය වන්නේය. එහි කරල් ලෙබනොන් මෙන් ලෙළ දෙන්නේය. නුවර වැසියෝ පොළොවේ තෘණ මෙන් සඵලවන්නෝය. (ගීතාවලිය 72:16)**

එතුමාගේ සැලසුම සඳහා වයස බාධාවක් නොවේ.

> **ස්වාමින්වහන්සේ අවංක බවත්, මාගේ පර්වතය බවත්, උන්වහන්සේ තුළ කිසි අධර්මිෂ්ඨකමක් නැති බවත් පෙන්වන පිණිස, (ගීතාවලිය 92:14)**

ඔබ එතුමාගේ දර්ශනය බිහිකිරීමට විලිරුජාවෙන් හඬමින් නික්ම යා හැක. නමුත් ...

> **කඳුළු සහිතව වපුරන්නෝ ප්‍රීතියෙන් කපන්නෝය. ඔහු බීජ මල්ල රැගෙන හඬමින් පිටත්ව යන්නේ නුමුත්, තමාගේ ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් එන්නේය. (ගීතාවලිය 126:5-6)**

මෙම අවසාන කාලයෙහි අස්වැන්නෙහි අති මහත් බව ඔබට වටහාගත නොහැක.

> **බීජ තවම අටුවෙහිද? එසේම මිදිවැලත් අත්තික්කා ගසත් දෙළුම් ගසත් ඔලිව ගසත් තවම ඵල දුන්නේ නැත. අද පටන් මම නුඹලාට ආශිර්වාදකරන්නෙමියි කීසේක. (හග්ගයි 2:19)**

දෙවියන්වහන්සේ මහත් වූ අස්වැන්නක නොකඩවා පැවැත්මක් පිළිබඳ පවසන සේක.

> **හීහාන්නා ගොයම් කපන්නාටත් මුද්‍රිකඵල මඩින්නා බීජ වපුරන්නාටත් කිට්ටුවෙන දවස් පැමිණෙන්නේය. කඳු මිහිරි මිදිපැන් වස්වන්නේය, සෑම හෙල් දියවන්නේයයි ස්වාමින්වහන්සේ කියනසේක. (ආමොස් 9:13)**

එක් කන්නයක අස්වැන්න මැඩ අවසන්වන්නට පෙර අනෙක් අස්වැන්න ලැබී තිබෙනු ඇත.

කෙතෙහි වැඩ කිරීමට කම්කරුවන්ගේ අවශ්‍යතාවට ඉතා හදිසි වන්නේ එබැවිනි. හාන්නා නෙලන්නාව පසුකර යයි. අස්වැන්නේ දර්ශනය ඔබ දෑස ඉදිරියෙහිය.

- මහත් අස්වැන්න හිමිකරගැනීමට ප්‍රකාශ කරන්න.
- ඔබගේ උරුමය ලෙස ජාතීන් ඉල්ලන්න.
- ලෝකයෙහි කෙත ඔබ දෑස් ඉදිරියෙහිය. ඔබගේ දෑස් ඔසවා බලන්න.

## අවසාන අස්වැන්න

අවසාන අස්වැන්නේ දිනය පැමිණෙනු ඇත. එවිට දෙවියන්වහන්සේ දේව දූතයන්ට මෙසේ අණ කෙරෙනු ඇත.

> **වෙන දේවදූතයෙක්ද දේවමාලිගාවෙන් නික්ම ඇවිත්, වලාකුළ පිට වැඩහුන් තැනන්වහන්සේට මහත් ශබ්දයකින් මොරගසා: ඔබවහන්සේගේ දෑකැත්ත යොමා කැපුවමැනව. මක්නිසාද පොළොවේ ගොයම් පැසී තිබෙන බැවින් කපන කාලය පැමිණ තිබේයයි කීය.**
> **(එළිදරව් 14:15)**

මුළු ලෝකය පුරාවටම පෙරහැර පැමිණේවි.

දෙවියන්වහන්සේගේ සිංහාසන කාමරයට අප්‍රිකාවෙන්, ඔස්ට්‍රේලියාවෙන්, ආසියාවෙන්, උතුරු හා දකුණු ඇමරිකාවෙන් යුරෝපයෙන් හා සමුද්‍රයේ සියලු දිවයින්වලින් අස්වැන්න නෙලන්නෝ ගංගාවක් මෙන් ගලා එනු ඇත.

දර්ශනය තමුන්ගේ ජීවිතයෙහි යථාර්ථයක් කරගත්තාවූ ස්ත්‍රීහු, පුරුෂයෝ... ජීවත්වීමට මූලික හේතුව ලෙස දර්ශනය සැලකූ අය ... එම පොරොන්දු වැළඳගෙන මිය ගිය අය...

ඔව්හු සෑම පොළොවේ අස්වැන්නෙන් පලදාව මිටි ඔසවාගෙන එනු ඇත.

> **ඉන්පසු සියලු ජාතීන්ගෙනුත් ගෝත්‍රවලිනුත් සෙනඟගෙනුත් භාෂාවන්ගෙනුත් කිසිවෙකුට ගණන්කළ නොහැකි මහත් සමූහයක් සුදු සළු පැළඳ, තමුන්ගේ අත්වල තාලපත්‍ර ඇතුව, සිංහාසනය ඉදිරියෙහිත් බැටළුවාණන් ඉදිරියෙහිත් සිටිනවා දුටිමි. ඔව්හු සිංහාසනයෙහි වැඩහිඳින අපේ දෙවියන්වහන්සේටත් බැටළුපැටවාණන්ටත් ගැළවීම අයිතිය කියා මහත් ශබ්දයකින් හඬගැසුවෝය. සියලු දේවදූතයෝ සිංහාසනයද වැඩිමහල්ලන්ද ජීවමාන සත්ත්වයන් සතරදෙනාද වටකර සිට, සිංහාසනය ඉදිරියෙහි මුහුණින් වැටී, දෙවියන්වහන්සේට නමස්කාර කරමින්: ආමෙන්. ප්‍රශංසාවද තේජසද ප්‍රඥාවද ස්තුතියද ගෞරවයද බලයද පරාක්‍රමයද සදාකාලේටම අපේ දෙවියන්වහන්සේට වේවා, ආමෙන්යයි කීවෝය. (එළිදරව් 7:9-12)**

## ස්වයං පරීක්ෂණය

1. කටපාඩමෙන් ප්‍රධාන පදය ලියන්න.

2. මහත් අස්වැන්න පොරොන්දු වන බයිබල් පද 3 ක් ලියන්න.

3. මෙම ඡේදයෙහි සාකච්ඡා කළ තමුන්ගේ දුර්වලතා මධ්‍යයේ පවා දෙවියන්වහන්සේ භාවිත කළ පස් දෙනෙකුගේ නම් ලියන්න.

4. දේව දූතයන් සිදු කරන පොළොවෙහි අවසාන අස්වැන්න නෙලීම සඳහන් පද මොනවාද?

# ස්වයං-පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමු පරිච්ඡේදය

1. දර්ශනයක් නැති කළ මනුෂ්‍යයෝ මුලාවෙති. (හිතෝපදේශ 29:18)

2. ආත්මික දර්ශනයට ස්වභාවික ලෝකයට ඔබ්බෙන් ආත්මික ලෝකය වෙත දැකීම ඇතුළත්ය. එනම් දෙවියන්වහන්සේගේ දිව්‍යමය පරමාර්ථය අවබෝධ කරගෙන එම සැලැස්මෙහි ඔබගේ කොටස වටහාගැනීමය. එය දෙවියන්වහන්සේ ඔබගෙන් ඉටු කිරීමට කැමති වන කාරණය පිළිබඳ පැහැදිලි සේයාවක් හා එම ඉලක්කය වෙත යාමට ඔබගේ කිතුනු ජීවිතයෙහි සෑම පියවර එදෙසට යොමු කිරීමකි.

3. 2, 3, 1, 4, 6, 5

4. 3, 1, 4, 2

## දෙවන පරිච්ඡේදය

1. තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි. නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැසී තිබෙන බව බලන්න. (යොහාන් 4:35)

2. ආත්මික සත්‍යයක ස්වභාවික සමාන්තරය ලෙස අප දක්වන්නේ ආත්මික සත්‍යයක් පැහැදිලි කිරීමට හෝ නියෝජනය කිරීමට දෙවියන්වහන්සේ ස්වභාවික නිදර්ශනයක් උපයෝගී කරගැනීමකි.

3. උදාහරණය නම් අස්වැන්නය.

4. කෙත නම් ලෝකයය. මතෙව් 13:38

5. ඔබ පහත සඳහන් හේතු වලින් ඕනෑ එකක් සඳහන් කර තිබිය හැක. අස්වැන්න එතුමාගේ ගෝලයන්ට පහසුවෙන්ම අවබෝධ කරගැනීමට පහසු වූ උදාහරණයක් වූයේ:

   - ඉශ්‍රායෙල්හි ආර්ථිකය කෘෂිකර්මය මත පදනම්ව පැවති නිසාය.
   - ආගමික උත්සව අස්වැන්න වටා රැඳී පැවතීම
   - අස්වැන්න නෙලීම වසර පුරා නොකඩවා සිදු වුවකි.
   - වැපිරීමේ හා නෙලීමේ ස්වභාවික ප්‍රතිපත්ති පැවති අතර එය ආත්මික අස්වැන්නටද අදාළ විය.
   - ස්වභාවික අස්වැන්න මගින් නියෝජනය වූ නෙලීමේ හදිසි බව ගෝලයෝ වටහා ගත්තෝය.

6. යොහන් 4:35
   තව භාරමසක්: එය පසු නොකරන්න.
   තිබේයයි නොකියන්න: අස්වැන්න ගැන කතා කරමින් පමණක් නොසිටින්න
   මම ඔබට කියමි: යේසුස්වහන්සේ පවසන දෙයට සවන් දෙන්න.
   ඔබේ ඇස් ඔසවා: වෙනතකට යොමු කරවන කාරණා වලින් හැරෙන්න.
   කුඹුරු දෙස බලන්න: දෙවියන්වහන්සේගේ දෑස තුළින් ලෝකය දකින්න.

## තුන්වන පරිච්ඡේදය

1. උන්වහන්සේගේ ඇස් ජාතීන් කෙරෙහි යොමා තිබේ (ගීතාවලිය 66:7)

2. දළ වශයෙන් බිලියන තුනක් ජනතාව

3. භාෂා 2000 ක් පමණ

4. ලෝකය ආත්මික කම්කරුවන් අවශ්‍යතාවයෙන් පෙලෙන අස්වැන්නේ කෙතක් ලෙස දැකීමට

5. පාපය

6. අ. අ    ආ. අ    ඇ. ස

7. ලෝක කිතුනුවෙකු යනු තමාගේ ජීවිතයෙහි සෑම දිනයක්ම ක්‍රිස්තුස්වහන්සේගේ විශ්ව පතල පරමාර්ථය උදෙසා ගත කරන කෙනෙකි. විශේෂයෙන්ම තවමත් ශුභාරංචියෙන් ස්පර්ශ නොවූ අය උදෙසා

## හතරවන පරිච්ජේදය

1. එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)

2. අ. අ    ආ. ස    ඇ. ස    ඈ. ස

3. ඔබගේ පිළිතුරට පහත සඳහන් එක් කරුණක් හා එක් බයිබල් පදයක් ඇතුලත් විය යුතුය.

   ලෝක ආරම්භයේ සිට දෙවියන්වහන්සේගේ පරමාර්ථය වූයේ මුළු ස්වර්ගයත් පොළොවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ එකමුතු කිරීමටය. (එපීස 1:9-10)

   එතුමාගේ කැමැත්ත නම් කිසිවෙකු විනාශ නොවී, සියලු ජාතීන්ගේ සියලු මනුෂ්‍යයෝ පසුතැවිලි වී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දැනගැනීමට පැමිණීමය. (2 පේතෘස් 3:9)

## පස්වන පරිච්ජේදය

1. නොරැවටෙල්ලා, දෙවියන්වහන්සේට සරදම්කරන්ට කාටවත් බැරිය. මක්නිසාද මනුෂ්‍යයෙක් තමා වපුරන දේම කපාගන්නේය.
   ඒ හැටියට තමාගේ මාංසය සඳහා වපුරන්නා මාංසයෙන් කුණුවීම කපාගන්නේය.
   ආත්මයාණන්වහන්සේ සඳහා වපුරන්නා ආත්මයාණන්වහන්සේගෙන් සදාකාල ජීවනය කපාගන්නේය. (ගලාති 6:7-8)

2. අ. ස    ආ. අ    ඇ. අ    ඈ. අ    ඉ. ස    ඊ. ස

3. එකඟතාවයක් නොමැතිකම, අපරාධය, තරඟය, මාංශය

4. මුදනු ලැබූ මනුෂ්‍යයෝ මුදනු ලැබූ ජීවිත ගත කිරීම

5. යෙසායා 16:10 හෝ යෝවෙල් 1:10-12, 16

6. යෝවෙල් 1:13-14; 2:12-13

7. මෙම පරිච්ජේදයෙහි අනු මාතෘකා පුනරීක්ෂණය කරන්න.

   දේව වචනයට අකීකරුවීම
   දෙවියන්වහන්සේව අමතක කිරීම
   නියමාකාර නොවූ වැපිරීම
   නොසැලකිලිමත් බව
   ස්වයං ප්‍රයත්නය

ගාපලත් ඵල ඉපදවීමේ ක්‍රියාදාමය
අවට වාතාවරණය සැලකීම
යොමු නොවූ උත්සාහය
කෘමි හා රෝග
නුසුදුසු නෙලීම
අස්වැද්දීමක් නොකළ භූමිය (නොවැපුරවූ භූමිය)
අධර්මිෂ්ඨ අත්තිවාරම්
කම්කරුවෝ මද බව

## හයවන පරිච්ඡේදය

1. කඳුළු සහිතව වපුරන්නෝ ප්‍රීතියෙන් කපන්නෝය. ඔහු බීජ මල්ල රැගෙන හඬමින් පිටත්ව යන්නේ නුමුත්, තමාගේ ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් එන්නේය. (ගීතාවලිය 126:5-6)

2. උපක්‍රම නම් කිසියම් නිශ්චිත ඉලක්කයක් සපුරාගැනීම සඳහා උපයෝගී කරගන්නාවූ ප්‍රතිපත්ති, ක්‍රමවේද හෝ සැලසුම්ය.

3. ඔබට පහත සඳහන් උපක්‍රම කිසිවක් අතපසු වූවානම් පරිච්ඡේදයෙහි අනු මාතෘකා නැවත බලන්න.

   - සෑම පැලයකටම නැවත ඵල නිපදවිය හැකිය
   - අස්වැන්න නෙලීමට නම් වැපිරීම අවශ්‍ය වේ.
   - ඔබ වපුරන කන්නයෙහිම අස්වැන්න නෙලා ගනු නොලැබේ.
   - ඔබ වපුරන දෙය නෙලා ගනු ඇත.
   - වාතාවරණය කුමක් වුවද ඔබ වැපිරිය යුතුය.
   - ඔබ වැපිරූ ප්‍රමාණයට අනුකූලව නෙලාගනු ඇත.
   - ඔබ වපුරන තැනින් කපා නොගැනීමත්, නොවැපුරවූ තැනින් කපා ගැනීමත් සිදු විය හැක.
   - ඔබ විශ්වාසවන්ත වුවහොත් අස්වැන්න නෙලාගනු ඇත.
   - නැවත ඵල දරන පිණිස (පැලවීමට), බීජය මිය යා යුතුය.

## හත්වන පරිච්ඡේදය

1. මක්නිසාද පොළොව ස්වකීය දළු උපදවන්නාක්මෙන්ද උයන එහි වපුළ දේ ලියලවන්නාක්මෙන්ද ස්වාමිවූ දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨකම සහ ප්‍රශංසාව සියලු ජාතීන් ඉදිරියෙහි හටගන්නවා ඇත. ^යෙසායා 61:11&

2. බීජ වර්ධනය වනුයේ නියත බාහිර සාධක වලට ප්‍රතිචාර දැක්වීමෙනි.

3. වර්ධනය සඳහා සුදුසු තත්වයන් ඔබට අතපසු වූවානම් පරිච්ඡේදයෙහි අනු මාතෘකා නැවත බලන්න. ජීවනයඃ නියමිත පසඃ වතුරඃ ආලෝකයඃ වාතයඃ අවකාශයඃ මූල පද්ධතියඃ විවේකයඃ මිදි වැලටඃ සම්බන්ධව පැවතිමඃ කප්පාදුවඃ දේශගුණය.

## අටවන පරිච්ඡේදය

1. නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණිකල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)

2. 2 තිමෝති 2:2

3. බලය

4. එය අද දිනට බව හඳුනාගන්න. එහි උල්පත අවබෝධ කරගන්න. පෞද්ගලිකව හා ඔබගේ සභාවෙහි එහි ආධිපත්‍යය බලය පිළිගන්න.

## නවවන පරිච්ඡේදය

1. වෙහෙසවෙන්නාවූ, බර උසුලන්නාවූ සියල්ලෙනි. මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටට ගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා, එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය. මක්නිසාද, මාගේ වියගහ පහසුය. මාගේ බරද සැහැල්ලුයයි කීසේක. (මතෙව් 11:28-30)

2. පාපය, මමත්වය, මනුෂ්‍යයා

3. පහසු, සැහැල්ලු, විවේකී

4. එතුමා වෙතට පැමිණ එතුමාගේ වියගහ ගන්න, එතුමාගෙන් ඉගෙන ගන්න.

5. ඔබ දෙවියන්වහන්සේගේ හඬ දැනගනු ඇත. ඔබගේ දර්ශනය ඉටු කිරීමෙහි සාර්ථක වනු ඇත. ස්වාමින්වහන්සේ නිරතුරුවම ඔබට මඟ පෙන්වනු ඇත. එතුමා ඔබගේ සැපයීම වනු ඇත. ඔබ නැවත ඵල දරනු ඇත.

## දහවන පරිච්ඡේදය

1. ඉඳින් නුඹලා ක්‍රිස්තුස්වහන්සේගේ නම්, නුඹලා ආබ්‍රහම්ගේ වංශය ද පොරොන්දුව ලෙස උරුමක්කාරයෝද වන්නහුය. (ගලාති 3:29)

2. ගලාති 3:10 සහ ගලාති 3:29

3. ගැළවීම

4. ලෝකයේ ජාතීන්ට ආශිර්වාද කිරීම

5. නිසැකව විශ්වාසකිරීම
   ආත්මික කාරණාවල ආයෝජනය කිරීම
   කැඳවීමට කීකරුවීම
   හුදකලාව නැඟී සිටීමට කැමතිවීම
   දර්ශනයේ මනුෂ්‍යයා
   දෙවියන්වහන්සේ සමීප ලෙස දැන සිටීම
   දෙවියන්වහන්සේ උදෙසා සංක්‍රමණය වීම
   එළිදරව්වේ දැනගැන්මෙහි හැසිරුණෝය.
   අන්‍යයන් උදෙසා වගකීම දැරීය.
   කැපවීමේ මනුෂ්‍යයන් නැවත බිහි කළේය.
   ඔහුගේ ස්වභාවික හැකියාවන් දෙස නොබැලිය.
   ආගන්තුක දේශයක ජීවත්වීමට කැමති විය.
   බලාපොරොත්තුවෙන් පූර්ණවූ
   ඇදහිල්ලෙහි ශක්තිමත්
   ධර්මිෂ්ඨ
   යටහත්
   සමාදානයේ මනුෂ්‍යයෙක්
   දේව කැමැත්ත ක්ෂණයකින්ම කළාවූ
   කිසිවිට ආපසු නොබැලූ
   දෙවියන්වහන්සේ සෙවූ
   ත්‍යාගශීලී
   දෙවියන්වහන්සේට මහිමය දුන්නාවූ

## එකළොස්වන පරිච්ඡේදය

1. තවද යහපත්කම්කිරීමට මැළිනොවෙමු. මක්නිසාද අපි ක්ලාන්ත නොවෙමු නම්, නියම කාලයේදී කපාගන්නෙමුව. (ගලාති 6:9)

2. ඔබහට පහත සඳහන් බයිබල් පද ඕනෑම එකක් භාවිත කළ හැක.
ගීතාවලිය 72:16; ගීතාවලිය 92:4; ගීතාවලිය 107:33-37; ගීතාවලිය 126:5-6; ආමොස් 9:13; හග්ගයි 2:19; සෙකරියා 8:12.

3. යාකොබ්, ආබ්‍රහම්, මෝසෙස්, දාවිත්, ගිඩියොන්.

4. එළිදරව් 14:15